178 වන කාණ්ඩය - 2 වන කලාපය | 2008 නොවැම්බර් 07 වන සිකුරාදා

தொகுதி 178 - இல. 2 | 2008 நவம்பர் 07, வெள்ளிக்கிழமை

**Volume 178 - No. 2** | **Friday, 07th November, 2008**


# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

**OFFICIAL REPORT**

(අශෝධිත පිටපත/பிழை திருத்தப்படாதது/**Uncorrected**)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන :**

**වරප්‍රසාද :**

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ දී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිලධරයන්ගේ අයථා හැසිරීම

පාර්ලිමේන්තුවට පැමිණීම අවහිර කිරීම සහ නිවසට එල්ල කළ අත් බෝම්බ ප්‍රහාර

ආරක්ෂක මාර්ග බාධකවලදී හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2009 [පළමු වන වෙන් කළ දිනය] :**

දෙ වන වර කියවීම - විවාදය කල් තබන ලදී.

**කල් තැබීමේ යෝජනාව :**

විදේශ විනිමය නීති උල්ලංඝනය කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள் :**

**சிறப்புரிமை :**

இறைவரி ஆணையாளர் நாயகம் தகவல் வழங்க மறுத்தமை

சுகாதார நலத்துறை, போசணை பற்றிய ஆலோசனைக் குழுவில் இலங்கை மருத்துவ சங்க அதிகாரிகளின் தரக்குறைவான நடத்தை

பாராளுமன்றத்துக்கு வருவதைத் தடை செய்தமையும் வீட்டின் மீதான 'கிறனேட்' தாக்குதலும்

சோதனைச் சாவடிகளில் தொல்லைப்படுத்தலுக்கும் அவமதிப்புக்கும் உட்படுத்தியமை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2009** [ஒதுக்கப்பட்ட முதலாம் நாள்] :

இரண்டாம் மதிப்பு – விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை :**

அந்நியச் செலாவணிச் சட்ட மீறுகை

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

PRIVILEGE:

Refusal to Provide Information by Commissioner General of Inland Revenue

Derogatory Conduct of Officers of Sri Lanka Medical Council at the Consultative Committee on Healthcare and Nutrition

Obstruction in Attending Parliament and Hand-grenade Attack on Residence

Harassment and Disrespectful Treatment at Security Checkpoints

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2009 – [FIRST ALLOTTED DAY]

Second Reading – Debate Adjourned

ADJOURNMENT MOTION:

Violation of Foreign Exchange Laws

2 — PL 003385 — 1600 — (2008/11)

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

2008 නොවැම්බර් 07 වන සිකුරාදා
2008 நவம்பர் 07, வெள்ளிக்கிழமை
*Friday, 07th November, 2008*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு டபிள்யு. ஜே. எம். லொக்குபண்டார] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9.30 a. m.* MR. SPEAKER [ THE HON. W. J. M. LOKUBANDARA] *in the Chair.*

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

I

### වරප්‍රසාද : දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම
**சிறப்புரிமை : இறைவரி ஆணையாளர் நாயகம் தகவல் வழங்க மறுத்தமை**
PRIVILEGE : REFUSAL TO PROVIDE INFORMATION BY COMMISSIONER - GENERAL OF INLAND REVENUE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බිමල් රත්නායක මහතා විසින්, තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2007 නොවැම්බර් මස 23 වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

II

### වරප්‍රසාද : සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ දී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිලධරයන්ගේ අයථා හැසිරීම
**சிறப்புரிமை : சுகாதார நலத்துறை, போசணை பற்றிய ஆலோசனைக் குழுவில் இலங்கை மருத்துவ சங்க அதிகாரிகளின் தரக்குறைவான நடத்தை**
PRIVILEGE : DEROGATORY CONDUCT OF OFFICERS OF SRI LANKA MEDICAL COUNCIL AT THE CONSULTATIVE COMMITTEE ON HEALTHCARE AND NUTRITION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2007 නොවැම්බර් මස 28 වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

III

### වරප්‍රසාද : පාර්ලිමේන්තුවට පැමිණීම අවහිර කිරීම සහ නිවසට එල්ල කළ අත් බෝම්බ ප්‍රහාර
**சிறப்புரிமை : பாராளுமன்றத்துக்கு வருவதைத் தடைசெய்தமையும் வீட்டின் மீதான 'கிறனேட்' தாக்குதலும்**
PRIVILEGE : OBSTRUCTION IN ATTENDING PARLIAMENT AND HAND - GRENADE ATTACK ON RESIDENCE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සිවනාදන් කිශෝර් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2008 පෙබරවාරි මස 05 වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

IV

### වරප්‍රසාද : ආරක්ෂක මාර්ග බාධකවලදී හිරිහැරයට සහ අගෞරවයට ලක් කිරීම
**சிறப்புரிமை : சோதனைச் சாவடிகளில் தொல்லைப்படுத்தலுக்கும் அவமதிப்புக்கும் உட்படுத்தியமை**
PRIVILEGE : HARASSMENT AND DISRESPECTFUL TREATMENT AT SECURITY CHECKPOINTS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සෙන්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2008 මාර්තු මස 05 වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

# පෙත්සම
## மனு
## PETITION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මහින්ද විජේසේකර මහතා — පැමිණ නැත.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - தொழில் உறவுகள், மனிதவலு அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Labour Relations and Manpower)

ගරු කථානායකතුමනි, නුරිය, දොඩාවත්ත පදිංචි ඩී. ඩබ්ලිව්. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ෆීලික්ස් පෙරේරා මහතා — පැමිණ නැත.
ගර දයාශ්‍රිත තිසේරා මහතා — පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මහා භාරකාර දෙපාර්තමේන්තුවේ දූෂණ : මූලික විමර්ශන වාර්තාව
### பொது நம்பிக்கைப்பொறுப்பாளர் திணைக்கள ஊழல்கள் : ஆரம்பிக்கப்பட்ட விசாரணை அறிக்கை
### CORRUPTION AT DEPARTMENT OF PUBLIC TRUSTEE : INITIAL INVESTIGATION REPORT

0165/'08

4. **ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,— (1)

(අ) පිළියන්දල, කහපොල, රෙජිඩේල්වත්ත විකිණීම හා සම්බන්ධව මෙන්ම, සමරකෝන් බූදලයට අදාළව සිදු වී ඇති අකටයුතු පිළිබඳවත්, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පොදු දේපල පිළිබඳ විවිධ දූෂණ සම්බන්ධවත් 2006 වසරේ මූලික විමර්ශන වාර්තාවක් නිකුත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති එකී වාර්තාව අනුව, චෝදනා ලැබුවන් සම්බන්ධයෙන් හා සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மத அலுவல்கள், ஒழுக்க மேம்பாடுகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) பிலியந்தல, கஹபொல, ரெஜிடேல்வத்தயை விற்பனை செய்தல் தொடர்பாகவும் சமரக்கோன் முதுசொத்து தொடர்பாக ஏற்பட்டுள்ள குளறுபடிகள் தொடர் பாகவும் பொது நம்பிக்கை பொறுப்பாளர் திணைக்களத்தில் பொதுச் சொத்துக்கள் தொடர்பாக எழுந்துள்ள பல்வேறு ஊழல்கள் தொடர்பாகவும் 2006 ஆம் ஆண்டில் ஆரம்பக்கட்ட விசாரணை அறிக்கையொன்று வெளியிடப் பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) சமய அலுவல்கள் அமைச்சின் செயலாளருக்கு ஆற்றுப்படுத்தப்பட்டுள்ள மேற்படி அறிக்கையின் பிரகாரம் குற்றச்சாட்டிற்கு உள்ளாகியவர்கள் தொடர்பாகவும், ஏற்பட்டுள்ள முறைகேடுகள் தொடர்பாகவும் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Religious Affairs and Moral Upliftment,—(1)

(*a*) Is he aware that an initial investigation report was issued in the year 2006 regarding various acts of corruption with connection to public property managed by the Department of Public Trustee, including the sale of Regidalewatta, Kahapola, Piliyandala as well as the improper dealings with the Samarakoon property?

(*b*) Will he inform this House of the steps taken regarding the persons against whom allegations were leveled and the irregularities that have taken place according to the aforesaid report which has been referred to the Secretary to the Ministry of Religious Affairs?

(*c*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Urban Development and Sacred Area Development and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(ආ) පහත සඳහන් පියවර ගෙන ඇත.

(i) නීති හා විමර්ශන කටයුතු විධිමත් කරමින් එම අංශයේ වගකීම් නියෝජ්‍ය මහා භාරකාරවරයකු යටතට පත් කර ඇත.

(ii) භාර දේපළ කළමනාකරණය වඩාත් විධිමත් කර ඇත.

(iii) පාලන අංශය ශක්තිමත් කර ඇත.

අතිරේක මහා භාරකාර (පාලන) තනතුරක් ඇති කර, ඒ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරිනියකු පත් කර ඇත. පරිපාලන නිලධාරි තනතුරක් සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරියකු පත් කර ඇත.

(iv) අභ්‍යන්තර විගණන කටයුතු විධිමත්ව ඉටු කරනු ලැබේ.

(v) චෝදනා ලැබුවන් සම්බන්ධයෙන් විනය පියවර ගෙන ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, සමහර විට මේ සම්බන්ධව චෝදනා ලබපු නිලධාරීන් ගොඩක් ඇති. මූලිකවම වග කිව යුතු නිලධාරීන් කවුද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමා චෝදනා කරන්නේ කාටද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

මේ විමර්ශන වාර්තාව අනුව පිළිගන්නවා නේ. දූෂණ හා අක්‍රමිකතා සිද්ධ වෙලා තිබෙනවා කියලා. එතකොට එහෙම සිද්ධ වෙලා තිබෙනවා නම් ඒකට වග කියන්න ඕනෑ ප්‍රධානම නිලධාරීන් වන්නේ කවුද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපි අදාළ නිලධාරීන්ට විරුද්ධව චෝදනා පත්‍ර ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ චෝදනා පත්‍ර විභාග වීමෙන් පසුව තමයි වැරදිකරුද නිවැරදිකරුද කියන එක නිශ්චය කරන්න වෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
දැනට මූලිකවම ඒ චෝදනා පත්‍ර ඉදිරිපත් කර ඇති නිලධාරීන් කවුද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැනට මට ඒක දැනුම් දෙන්න බැහැ, ගරු කථානායකතුමනි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළව, ඒක කියන්න බැහැයි කියලා මම හිතන්නේ නැහැ. එතුමා තමයි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තුන් වන අතුරු ප්‍රශ්නය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පළමු වැනි අතුරු ප්‍රශ්නය අහලා අවසානයි. දෙ වැනි එකත් අවසානයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ තුන් වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
නැහැ, නැහැ. මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ නේ. උත්තරය ලැබුණේ නැති නිසා, - බාධා කිරීමක්

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තරය ලැබුණේ නැති වුණාට අතුරු ප්‍රශ්න අවසානයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අවසාන වන්නේ උත්තරය දුන්නොත් නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ප්‍රශ්නය ඇහුවාට පස්සේ උත්තරය ලැබුණේ නැහැ. මා අහන්නේ මේ සඳහා, - බාධා කිරීමක්

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර ඇහුම්කන් දෙන්න. පක්ෂ නායක රැස්වීමේදී ඉතා පැහැදිලිව තීරණයක් අරගෙන තිබෙනවා මිනිත්තු දෙකක කාලයක් තුළ ප්‍රශ්නය විසඳා ගන්නවාය කියා. එයට පක්ස නායකයෝ එකඟ වෙලා තිබුණා. තමුන්නාන්සේගේ පක්ෂ නායකතුමාගෙන් අහන්න පුළුවන්. මා ඉතා තදින් එය පිළිපදින්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු කථානායකතුමනි, එහෙම නම් මිනිත්තු දෙක ඉවර වුණාට පස්සේ සීනුවක් හෝ නාද කරන්න වෙනවා. එහෙම නැත්නම් අපට මෙය නිරාකරණය කර ගන්න බැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මා අහපු අතුරු ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ, ගරු කථානායකතුමනි. ඒකයි මා මේ අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පෙරවරු 10.00ට විවාදය පටන් ගන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මා අහන්නේ ඒ චෝදනා පත්‍ර ඉදිරිපත් කරපු, ඒ සඳහා වග කිව යුතු මූලිකම නිලධාරීන් කවුද කියලායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පෙරවරු 10.00ට විවාදය පටන් ගන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
හරිම සරල ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමාට සරල නැති බවයි පේන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ ඔබතුමා ඒකට උත්තර දෙන්න කැමැති නැද්ද? ඒක කිව්වා නම්, - [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එයට උත්තර දීම සාධාරණ නැහැ. ඒ නිසායි උත්තර නොදෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා ප්‍රතික්ෂේප කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉතාම පැහැදිලිව නිලධාරීන් කිහිප දෙනකුට චෝදනා පත්‍ර ඉදිරිපත් කර තිබේද්දී මේක ප්‍රචාරය කිරීම සඳහා පරීක්ෂණය හමාර වීමට කලින් වැරැදිකරුවන් කිරීම සාධාරණ නැහැ. එයයි අපේ රටේ පිළිගත්තු සාමාන්‍ය නීතිය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වැරදිකරුවන් කවුද කියන එකත් අපට තේරෙනකවා. - [බාධා කිරීමක්] අපි අහන්නේ මේකයි. මෙතුමාම කියනවා යම් නිලධාරි කණ්ඩායමකට චෝදනා පත්‍ර ඉදිරිපත් කර තිබෙනවාය කියා. අපි අහන්නේ ඒ නිලධාරීන් කවුරුන්ද කියායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රශ්නය එහෙම අහලා තිබුණා නම් ඒ ගැන සලකා බලන්න තිබුණා. ඊට වඩා උත්තරයක් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අද දෙන්න බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා එක වතාවක් කිව්වා නේ චෝදනා ඉදිරිපත් කරන්න, වැරැදිකරුවන් කරන්න, - [බාධා කිරීමක්] එහෙම වුවමනාවක් නොවෙයි තිබෙන්නේ. මෙහිදී හරි පැහැදිලියි ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] එහෙම නම් අතුරු ප්‍රශ්න කියා එකක් පැන නඟින්නේම නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නම් ඉදිරිපත් කරන්න බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayakea)
එහෙම නම් අතුරු ප්‍රශ්න කියලා එකක් පැන නඟින්නේම නැහැ. ඔය කියන විධියට ප්‍රශ්නයට විස්තර සියල්ලම ඇතුළත් කරන්න වෙනවා. ඔබතුමා පිළිගන්නවා, අක්‍රමිකතාවක් තිබෙන බවත්, චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇති බවත්. ඉතින් අපි අහන්නේ ඒ කාටද, කියලායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අහලා තිබෙන ප්‍රශ්නයට පිළිතුරු දීලා තිබෙනවා. අතුරු ප්‍රශ්නයෙන් නම් ගම් අහනවා. මේ අවස්ථාවේදී නම් ගම් ලබා දීම සාධාරණ නැති නිසා ඒවා ලබා දෙන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සාධාරණ නැහැ කියලා කියන්නේ ඔබතුමා ගාව ඒ විස්තර නැද්ද, නැත්නම් දෙන්න බැරිද. මොකක්ද සාධාරණ නැහැයි කියන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පරීක්ෂණයක් කෙරෙද්දී විස්තර සපයන එක සාධාරණ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම නම් ගරු කථානායකතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කළත් පිළිතුරු හම්බ වෙන්නේ නැහැ නේ. මෙතුමා කියන විධියට මේ චෝදනා පත්‍රය ඉදිරිපත් කරලා තිබෙන්නේ කාටද කියන එක සාධාරණ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සාධාරණ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සාධාරණ නැහැයි කියන එකෙන් පෙන්වන්නේ අතුරු ප්‍රශ්නයේ වැරැද්දක් නොවෙයි. ප්‍රශ්නය දැම්මත් ඒකට උත්තරය දෙන්නේ නැහැයි කියන එකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඕනෑම අතුරු ප්‍රශ්නයක් සාධාරණ වෙන්න පුළුවන්. නමුත් අපි ඒවාට පිළිතුරු දීමේදීත් සාධාරණත්වයන් තියෙන්න ඕනෑ. ඔබතුමා ප්‍රශ්නයක් අහන්නන් වාලේ අහලා පිළිතුරු බලාපොරොත්තු වන්න එපා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක වැරදියි. එහෙම කරන්න බැහැ. එතුමා කියන්නේ මේක ප්‍රශ්නයට ඇතුළත් කළත් උත්තර දෙන එක සාධාරණ නැහැයි කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා ළඟ ඒ විස්තර නැත්නම් නැහැයි කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රජයේ නිලධාරීන්ට යම් කිසි -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සාධාරණ නැහැයි කියන එකෙන් තේරුම් යන්නේ, න්‍යාය පත්‍රයට ඇතුළු කරලා ඒ ප්‍රශ්නය හරියට ඇහුවත් පිළිතුරු දෙන්නේ නැහැ කියන එකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ, අහලා නැහැ නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කියන්නේ එහෙම පිළිතුරු දෙන එක සාධාරණ නැහැ කියලා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අහලා නැහැ. අහලා නැති දෙයක් ගැන යළි විස්තර ඉල්ලුවත් ලැබෙන පිළිතුර එපමණයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොකක්ද ගරු කථානායකතුමනි, ඔබතුමා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහලා නැති ප්‍රශ්නයක් නිසා එතුමා ළඟ ඒකට පිළිතුරු නැතුවා වෙන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, හරි පැහැදිලියි නේ. චෝදනා පත්‍ර ඉදිරිපත් කළාය කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාගෙන් අහලා නැති ප්‍රශ්නයක් පිළිබඳව බල කරන්න බැහැ, පිළිතුරු දෙන්න කියලා. එතුමා ළඟ ඒ තොරතුරු නැතුව ඇති.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බල කිරීමක් නොවෙයි ගරු කථානායකතුමනි. දැන් මේක හරි පැහැදිලියි. චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර තිබෙනවාය කියනවා. ඉතින් අපි අහනවා, චෝදනා පත්‍රය ඉදිරිපත් කරලා තිබෙන්නේ කාටද කියලා. එතුමා කියනවා, එහෙම අහන එක සාධාරණ නැහැයි කියලා. එහෙම නම් එතුමා කියන්න ඕනෑ, දැන් ඒ විස්තර එතුමා ළඟ නැහැ, ඒක දෙන්නම් කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අහන එක සාධාරණ නැහැයි කියන එක නොවෙයි මම කිව්වේ. ඕනෑ එකක් අහන්න පුළුවන්. ඒක තමුන්නාන්සේගේ අයිතියක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පිළිතුරු දෙන එක සාධාරණ නැහැ ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමා අවසර දෙනවා නම් ඕනෑම දෙයක් අහන්න පුළුවන්. පිළිතුරු දීමේදී අපි සාධාරණ වෙන්න ඕනෑ. රාජ්‍ය නිලධාරීන් කාට හෝ චෝදනාවක් තියෙනවා නම් ඒ විස්තර මේ සභාවට ඉදිරිපත් කරන්න බැහැ. ඒකයි රටේ -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේකේ තියෙනවා වෙන ප්‍රශ්නයක්. එතුමා කියන විධියට මේක අතුරු ප්‍රශ්නයකින් පැන නගින ප්‍රශ්නයක් නොවෙයි. එතුමා කියන විධියටයි මම මේ කියන්නේ. ඒ ප්‍රශ්නය ලිඛිතව ආවත්, පිළිතුරු දෙන්නේ නැහැ කියලායි එතුමා කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක රාජ්‍ය ප්‍රතිපත්තිය නම් ඒක මේ වෙලාවේ -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ අදාළ නිලධාරීන් ඒක දන්නවා. ඒ අමාත්‍යාංශ නිලධාරීනුත් දන්නවා. ආයතනයේ නිලධාරීනුත් දන්නවා. හැබැයි, පාර්ලිමේන්තුවේ ඉන්න අපට කියන්නේ නැහැ ඒක. මේක අරුම පුදුම කථාවක් නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
නැහැ, කියන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කොහොමද ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
කියන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ප්‍රධාන සංවිධායකතුමා පිළිතුරු දෙන්නේ, ආගමික කටයුතු හා සදාචාර වර්ධන ඇමතිතුමා වෙනුවෙන්. එතුමා පිළිතුරු දෙන්නේ එතුමාගේ අමාත්‍යාංශයක් ගැන නොවෙයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නොවෙයි නේ, ඒක නේ. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
කුමන අමාත්‍යාංශයක්, - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, ඒක නිසා නොවෙයි. මම කියන්නේ, - [බාධා කිරීමක්]

**ගරු විජිත හේරත් මහතා**
(சபாநாயகர் விஜித ஹெரத்)
(The Hon. Vijitha Herath)
දන්වලා නැහැයි කිව්වා නම් ඉවරයි නේ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා ඒ අතුරු ප්‍රශ්නයට සූදානම් වෙලා එන්න නැතිව ඇති. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
පිළිතුරු තියෙනවා. ඕනෑ නම් දෙන්න පුළුවන්. වෙනම අහනවා නම් දෙන්නම්. අමාත්‍යාංශයට ගිහිල්ලා අහනවා නම්, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට පෙනෙන විධියට අමාත්‍යතුමා ප්‍රශ්නයට පිළිතුරු දෙන්න සූදානම් නැතිව ඇති.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
රාජ්‍ය නිලධාරීන් හැටියට ඒ අයට යම්කිසි චෝදනාවක් කරන කොට අපි සාධාරණ වෙන්න ඕනෑ. චෝදනාවක් කරන්න පුළුවන්, ගරු කථානායකතුමනි, ඒක සත්‍යය ද, නැද්ද කියන එක ගැනත් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මන්ත්‍රීතුමනි, මෙතැන පිළිතුරු දෙන්න බැරි නිලධාරීන්ට මඩ ගැසීමේ චේතනාවෙන් ප්‍රශ්න අහන්න එපා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, කිසිසේත්ම මේක මඩ ගැසීමක් නොවෙයි. එතුමාම කියනවා චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරලා තිබෙනවාය කියා. ඉතින් අපි හරි සාධාරණ ලෙස අහන්නේ, ඉදිරිපත් කළේ කාටද ? ඒක පරීක්ෂණයෙන් පස්සේ කියනවාය කියන්නේ මොකක්ද ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
ඒක පරීක්ෂණයෙන් පස්සේ -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
වැරදිකරුවන් කවුද කියලා නොවෙයි අහන්නේ. වැරදිකරුවන් කවුද කියලා ඇහුවොත්, පරීක්ෂණයෙන් පස්සේ උත්තර දෙන්න. දැන් අපි සාධාරණ ප්‍රශ්නයක් අහන්නේ එතුමාම කියනවා, චෝදනා පත්‍ර ඉදිරිපත් කරලා තියෙනවා කියා. ඒ ඉදිරිපත් කරපු කට්ටිය කවුද ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් වේලාව 9.43යි.

## පිළියන්දල "රෙජිඩේල්වත්ත" ඉඩම : සැලසුම්
### பிலியந்தல, " ரெஜிடேல்" காணி : திட்டங்கள்
"REGIDALEWATTA" LAND IN PILIYANDALA : PLANS

0166/'08

5. **ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය , (1) :

(අ) (i) පිළියන්දල රෙජිඩේල්වත්ත ඉඩම, ආයෝජන මණ්ඩල අනුමැති ව්‍යාපෘතියක් ලෙස මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතියක් සඳහා සෙලින්කෝ ඩිවලපර්ස් ආයතනයට ලබා දී තිබූ බවත්;

(ii) එකී ව්‍යාපෘතියට මෙම ඉඩම විකිණීම නීති විරෝධී මෙන්ම පරිසර හානියක්ද සිදුවන බව සඳහන් කරමින් ජනතා විරෝධයක් පැන නැගුන බවත්;

(iii) ඒ අනුව ඉහත නිවාස ව්‍යාපෘතිය අවලංගුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිවාස ව්‍යාපෘතිය අවලංගු කිරීමෙන් පසු, මෙම ඉඩම පිළිබඳව කටයුතු කර ඇත්තේ කවර ආකාරයකටද;

(ii) ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණය කොපමණද;

(iii) ඉඩම පිළිබඳව තිබෙන සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி, காணி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) பிலியந்தல, "ரெஜிடேல்" தோட்டத்தின் காணி, முதலீட்டு சபையின் அங்கீகாரம் பெற்ற மிலேனியம் சிட்டி வீடமைப்பு கருத்திட்டத்திற்காக செலிங்கோ டெவலப்பர்ஸ் நிறுவனத்திற்கு வழங்கப்பட்டிருந்த தென்பதையும்,

(ii) மேற்படி கருத்திட்டத்திற்காக இக்காணியை விற்பனை செய்யும் செயற்பாடு, சட்ட விரோதமானதென்றும், சூழலுக்கு குந்தகம் விளைவிக்கக்கூடியதென்றும் தெரிவித்து மக்களின் எதிர்ப்பு எழுந்ததென்றும்,

(iii) இதற்கமைய மேற்படி வீடமைப்பு கருத்திட்டம் இரத்துச் செய்யப்பட்டதென்றும்

அவர் அறிவாரா?

(ஆ) (i) வீடமைப்புத் திட்டம் இரத்துச் செய்யப்பட்டதன் பின்னர், இக்காணி தொடர்பாக பின்பற்றப்பட்டுள்ள நடவடிக்கை யாதென்பதையும்,

(ii) காணியின் மொத்த பரப்பளவு எவ்வளவென்பதையும்,

(iii) இக்காணி தொடர்பிலான திட்டங்கள் யாவையென்ப தையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Land Development, :

(*a*) Is he aware that,—

(i) the land named "Regidalewatta" in Piliyandala had been given to Ceylinco Developers Company for a Millennium City Housing Project which was to be implemented as a project approved by the Board of Investment;

(ii) a public protest emerged claiming that it was illegal to sell the aforesaid land for the aforesaid project and it would also cause damage to the environment; and

(iii) the aforesaid housing project has been cancelled accordingly?

(*b*) Will he inform this House,—

(i) the manner in which this land has been dealt with, after cancelling the housing project;

(ii) the total extent of the land; and

(iii) the current plans regarding the land?

(c) If not, why?

**ගරු ජීවන් කුමාරණතුංග මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - காணி, காணி அபிவிருத்தி அமைச்சர் )
(The Hon. Jeewan Kumaranatunga - Minister of Lands and Land Development)

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) පසුබිම් විස්තරයේ (ආ) (I) න් පැහැදිලි කර ඇති පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ කටයුතු කර ඇත.

(ii) හෙක්ටයාර 31,237යි.

(iii) ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මූලික කටයුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**පසුබිම් විස්තරය**

(ආ) (I) පිළියන්දල, කහපොළ, රෙපිඩෙල්වත්ත නැමැති ඉඩම නගර සහා සංවර්ධන සැලැස්මට අනුව පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා වූ නාගරික සංවර්ධන අධිකාරියෙහි ඒකාබද්ධ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන අධිකාරියට අත්කර ගැනීම සඳහා යෝජනාවක් නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මා විසින් අංක එල්ඩී/05/2006/යූඩීඒ/225 හා 2006.06.16 දිනැති 2 වැනි වගන්තිය යටතේ නියමය කැස්බෑව ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇත. ප්‍රාදේශීය ලේකම් විසින් 2 වගන්තිය යටතේ දැන්වීම 2006.06.30 දින නිකුත් කර ප්‍රසිද්ධ කර ඇත. තවද මෙම අත්කර ගැනීම සඳහා 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත යටතේ 2 වැනි වගන්තිය යටතේ නියමය අතිගරු ජනාධිපතිතුමා විසින් 2006.06.13 දින අංක 1449/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇත. අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධිවිධානය යටතේ 2006 අංක 336 ආඥාව 1470/11 හා 2006.11.07 දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව කැස්බෑව ප්‍රාදේශීය ලේකම් ඉඩමේ නිරවුල් භුක්තිය 2006.12.08 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් හා සෙලින්කෝ ඩිවලොපර්ස් ලිමිටඩ් ආයතනයෙන් භාර ගෙන එදිනම නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත.

(II) 2006.10.02 දින මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති අංක සීඕ/කේඑස්බී/2006/272 ප්‍රගමන අනුරේඛනය අනුව ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 31.237 කි.

(III) 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත පනත) අනුව මෙම ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම ගරු නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විසින් අංක 1504/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇත. ඒ අනුව දැනට මෙම ඉඩමේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මූලික කටයුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ සම්පූර්ණ ඉඩමේම ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදි කරනවාද? මේක විශාල ඉඩමක්.

**ගරු ජීවන් කුමාරතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaratunga)
ඔව්. පාරිසරික තත්ත්වයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් හැටියට ඒ සම්පූර්ණ ඉඩමේම ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ඉදි කරන්නට අවශ්‍ය කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු කථානායකතුමනි, මගේ දෙ වන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ඉඩම ආයෝජන මණ්ඩලයට දී තිබෙන්නේ පරිගණක මෘදුකාංග මධ්‍යස්ථානයක් ඉදි කරන්නයි. නමුත් ඒ තත්ත්වයට පිටුපා තමයි නිවාස ව්‍යාපෘතියක් හදන්නට ගියේ. ඇයි, එහෙම වෙලා තිබෙන්නේ?

**ගරු ජීවන් කුමාරතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaratunga)
ඔව්. මෙතැන දී යම් වැරැද්දක් සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා නැවත ඒක පවරා ගෙන ඒ අදාළ කටයුත්තටයි භාර දී තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
නැවත පවරා ගැනීමේදී සෙලින්කෝ ඩිවලපර්ස් ආයතනයට කිසියම් මුදලක් ගෙවා තිබෙනවාද?

**ගරු ජීවන් කුමාරතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaratunga)
නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගෙවා නැහැ? ගෙවන්න කියා ඉල්ලීමක් කර තිබෙනවාද?

**ගරු ජීවන් කුමාරතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaratunga)
ඒත් නැහැ. එහෙම ගෙවන්නය කියා ඉල්ලීමක් කරලා නැහැ. පිළිතුරේ එහෙම සඳහන් වෙන්නේ නැහැ.

## ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා : නිල නිවස

**நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சர் : உத்தியோகபூர்வ வசிப்பிடம்**

MINISTER OF WATER SUPPLY AND DRAINAGE : OFFICIAL RESIDENCE

0197/'08

6. **ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)
(The Hon. R. P. A. Ranaweera Pathirana)

ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,—(1):

(අ) (i) ජලසම්පාදන හා ජලාපවහන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිත කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) நீர் வழங்கல், வடிகாலமைப்பு (அமைச்சரவை) அமைச்சருக்கு உத்தியோக பூர்வ விடுதியொன்று வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) ஆமெனில், அது அரசாங்க உடமையா என்பதையும்,

(iii) அரசாங்க உடமை இல்லையெனில், எந்த அடிப்படையில் அவ்விடுதி வழங்கப்பட்டுள்ளதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ விடுதியொன்று வழங்கப்பட்டிருப்பின், அது 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் திருத்தப்பட்டு அல்லது மேம்படுத்தப் பட்டுள்ளதா என்பதையும்,

(ii) திருத்தப்பட்டிருப்பின் மேற்படி ஒவ்வொரு ஆண்டிலும் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்,

(iii) மேற்படி விடுதியின் பாவனைக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் அரசாங்கச் செலவில் தளபாடங்கள் அல்லது வேறு உபகரணங்கள் கொள்வனவு செய்யப்பட்டுள்ளதா என்பதையும்,

(iv) ஆமெனில், செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்

அவர் வெவ்வேறாக இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி உத்தியோகபூர்வ விடுதிக்காக 2005, 2006 மற்றும் 2007 ஆம் ஆண்டுகளில் பயன்படுத்தப் பட்டுள்ள மின்சாரம் மற்றும் நீர் அலகுகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்,

(ii) மேற்படி ஒவ்வொரு ஆண்டிலும் ஒவ்வொரு மாதமும் அரசாங்கத்தினால் செலவிடப்பட்ட தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage, :

(*a*) Will he inform this House,—

(i) whether an official residence has been provided for the Minister of Water Supply and Drainage (Cabinet);

(ii) if so, whether it is a property owned by the State; and

(iii) if it is not owned by the State, the basis on which it has been allocated?

(*b*) Will he submit to this House separately,—

(i) if an official residence has been allocated, whether it has been repaired or upgraded during the years 2005, 2006 and 2007;

(ii) if it has been repaired, the amount of money spent in each year for that purpose;

(iii) whether furniture or any other equipment for the use of the aforesaid official residence, has been purchased at Government expense during the years 2005, 2006 and 2007; and

(iv) if so, the amount spent on them?

(*c*) Will he state,—

(i) separately, the number of units of electricity and water that have been used at this official residence during each month of the years 2005, 2006 and 2007; and

(ii) the amount of money spent by the relevant Ministry for electricity and water used at the above mentioned official residence in each month of the aforesaid years?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර**
***** *சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled.*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) පැන නොනඟී.

(ආ) (i) ඔව්.

(ii)

| වර්ෂය | වැය කළ මුදල රු. |
|---|---|
| 2005 | 1,00,000 |
| 2006 | 8,93,632 |
| 2007 | 4,85,392.50 |

(iii) 2007 වර්ෂයේ පමණක් ලබා දී ඇත.

(iv)

| වර්ෂය | වැය කළ මුදල රු. |
|---|---|
| 2007 | 3,84,680.22 |

(ඇ) (i) විස්තර ඇමුණුමෙහි දැක්වේ.

(ii) විස්තර ඇමුණුමෙහි දැක්වේ.

(ඈ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல்:*
*Annexes tabled* :

ඇමුණුම

| | | විදුලිය | | ජලය | |
|---|---|---|---|---|---|
| වර්ෂය | මාසය | ඒකක ගණන | වියදම | ඒකක ගණන | වියදම |
| 2005 | ජනවාරි | 2019 | 19,842.67 | | |
| | පෙබරවාරි | 1907 | 18,438.75 | | |
| | මාර්තු | 2586 | 26,950.01 | | |
| | අප්‍රේල් | 2418 | 24,844.13 | | |
| | මැයි | 2760 | 29,131.10 | | |
| | ජූනි | 2416 | 24,819.06 | | |
| | ජූලි | 1982 | 19,378.87 | | |
| | අගෝස්තු | 2485 | 25,683.98 | | |
| | සැප්තැම්බර් | 3233 | 35,060.16 | | |
| | ඔක්තෝබර් | 3324 | 36.200.84 | | |
| | නොවැම්බර් | 3309 | 36,012.82 | | |
| | දෙසැම්බර් | 3359 | 36,639.57 | | |
| 2006 | ජනවාරි | 3032 | 32.540.62 | | |
| | පෙබරවාරි | 3172 | 34,537.02 | | |
| | මාර්තු | 2682 | 28,394.87 | | |
| | අප්‍රේල් | 2682 | 28,394.87 | | |
| | මැයි | 4299 | 48,663.97 | | |
| | ජූනි | 2357 | 24,321.00 | | |
| | ජූලි | 2436 | 25,298.73 | | |
| | අගෝස්තු | | | | |
| | සැප්තැම්බර් | බිල්පත් ලැබීනැත | | | |
| | ඔක්තෝබර් | | | | |
| | නොවැම්බර් | 2700 | 44,615.40 | | |
| | දෙසැම්බර් | 2670 | 44,122.74 | | |
| 2007 | ජනවාරි | 2952 | 48,753.74 | | |
| | පෙබරවාරි | 2800 | 40,000.00 | | |
| | මාර්තු | 2300 | 33,084.00 | | |
| | අප්‍රේල් | 2434 | 34,997.52 | | |
| | මැයි | 2233 | 26,812.70 | | |
| | ජූනි | 2233 | 32,127.24 | | |
| | ජූලි | 1565 | 18,863.50 | | |
| | අගෝස්තු | 1818 | 26,201.04 | | |
| | සැප්තැම්බර් | 2241 | 32,241.48 | 81 | 5,366.63 |
| | ඔක්තෝබර් | බිල්පත් ලැබී නැත | | 143 | 10,803.37 |
| | නොවැම්බර් | 1848 | 26,615.16 | 156 | 11,715.00 |
| | දෙසැම්බර් | 1558 | 22,488.24 | 163 | 12,292.50 |

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)
(The Hon. R. P. A. Ranaweera Pathirana)
ගරු අමාත්‍යතුමනි. එම පිළිතුරේ පළමු වන කොටස කියවන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) පැන නොනඟී.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)
(The Hon. R. P. A. Ranaweera Pathirana)
ගරු ඇමතිතුමා, මට (ආ)(ii) කොටසේ පිළිතුර කියවනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එම ප්‍රශ්නයේ (ආ)(ii) කොටසට පිළිතුරු මෙසේයි.

2005 වර්ෂයේ වැය කළ මුදල රු. 1,00,000 යි.
2006 වර්ෂයේ වැය කළ මුදල් රු. 8,93,632 යි.
2007 වර්ෂයේ වැය කළ මුදල රු. 4,85,392/50 යි.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)
(The Hon. R. P. A. Ranaweera Pathirana)
ප්‍රශ්නයේ "ඇ" (i) වන කොටස අනුව විදුලි බිල් කොහොමද තිබෙන්නේ කියා කියන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නවලට අපි උත්තර දීලා තිබෙනවා. ඊට අදාළ විස්තර අමුණා තිබෙනවා.

## අතිරේක වැවිලි භෝග : විස්තර
**துணைப் பயிர்கள் : விபரம்**
SUPPLEMENTARY PLANTATION CROPS : DETAILS

641/'08

10. **ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- — (1) :

(අ) (i) අදාළ අමාත්‍යාංශය යටතේ අතිරේක වැවිලි භෝග ලෙස සලකන වැවිලි භෝග කවරේද;

(ii) ඒ අතුරින් අපනයනය කර විදේශ විනිමය උපයන භෝග වර්ග කවරේද;

(iii) ඒවා වගා කරන බවට හඳුනාගෙන ඇති දිස්ත්‍රික්ක කවරේද;

(iv) එම දිස්ත්‍රික්කවල අදාළ භෝග වගාකරන හෙක්ටයාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අපනයනය කරන ඉහත එක් එක් භෝග වර්ගය ව්‍යාප්ත කිරීමට ඒ ඒ දිස්ත්‍රික්කය වෙනුවෙන් 2008 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) විදේශ විනිමය බහුල ලෙස උපයාගත හැකි බවට හඳුනාගත් භෝග වර්ග ව්‍යාප්ත කිරීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

துணைப்பயிர் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) சம்பந்தப்பட்ட அமைச்சின் கீழ் துணைப்பயிர்களாகக் கருதப்படுகின்ற பயிர்கள் யாவையென்பதையும்,

(ii) இவற்றுள் ஏற்றுமதி செய்யப்பட்டு அந்நியச் செலாவணி ஈட்டுகின்ற பயிர்கள் யாவையென்பதையும்,

(iii) அவை பயிரிடப்படுவதாக இனங்காணப்பட்டுள்ள மாவட்டங்கள் யாவை என்பதையும்,

(iv) மேற்படி, மாவட்டங்களில் உரிய பயிர்ச்செய்கை மேற்கொள்ளப்படுகின்ற ஹெக்டயார் அளவு தனித்தனியாக எவ்வளவு எண்பதையும்

அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(ஆ) ஏற்றுமதி செய்யப்படுகின்ற மேற்படி ஒவ்வொரு பயிர்வகையினையும் விஸ்தரிப்பதற்காக அந்தந்த மாவட்டம் சார்பாக 2008 ஆம் ஆண்டின் பொருட்டு ஒதுக்கப்பட்ட தொகை வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு கூறுவாரா?

(இ) அந்நியச் செலாவணியை பெருமளவில் ஈட்டித்தரக் கூடியதென இனங்காணப்பட்டுள்ள பயிர்வகைகளை விஸ்தரிப்பதற்காக தற்போது எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Supplementary Plantation Crops Development,:

(*a*) Will he inform this House,—

(i) the plantation crops that are regarded as the supplementary plantation crops by the relevant Ministry;

(ii) out of the aforesaid crops, the crops that are exported for the generation of foreign exchange;

(iii) the districts identified as areas where these crops are cultivated; and

(iv) separately, the number of hectares in which the relevant crops are cultivated in each of the aforesaid districts?

(*b*) Will he submit to this House separately, the amount of money allocated for each district for the year 2008 to expand the cultivation of each of the above mentioned crops that are exported?

(*c*) Will he state the steps taken by now to expand the cultivation of the varieties of crops which have been identified as crops that can generate substantial foreign exchange?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) කජු, උක්, තල් හා පලතුරු.

(ii) කජු භෝගය පමණි.

(iii) කරුණාකර ඇමුණුම I බලන්න.

(iv) කරුණාකර ඇමුණුම I බලන්න.

(ආ) කරුණාකර ඇමුණුම I බලන්න.

(ඇ) කරුණාකර ඇමුණුම II බලන්න.

(ඈ) පැන නොනඟී.

ඇමුණුම I

කජු භෝගයෙහි ව්‍යාප්තිය සම්බන්ධ තොරතුරු

| *වගා කෙරෙන දිස්ත්‍රික්ක* | *දිස්ත්‍රික් අනුව වගා කර ඇති ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)* | *කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා 2008 වසරට දිස්ත්‍රික් අනුව වෙන් කරන ලද මුදල දළ වශයෙන් රු. මිලියන* |
|---|---|---|
| පුත්තලම | 11,189 | 7.54 |
| කුරුණෑගල | 12,202 | 6.24 |
| අනුරාධපුරය | 2,710 | 4.55 |
| හම්බන්තොට | 2,636 | 3.41 |
| මොණරාගල | 1,825 | 5.58 |
| මාතලේ | 1,556 | 3.95 |
| මඩකලපුව | 1,362 | 5.57 |
| පොලොන්නරුව | 1,242 | 1.65 |
| අම්පාර | 985 | 7.10 |
| බදුල්ල | 867 | 1.49 |
| රත්නපුරය | 464 | 0.83 |
| නුවර | 262 | 0.21 |
| ත්‍රිකුණාමලය | | |
| මන්නාරම | 4,441 | 5.71 |
| වව්නියාව | | |

ඇමුණුම II

**කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා ගෙන ඇති පියවර**

වසර 2006 දී ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධාන කජු නිෂ්පාදන කරන රටවල් 10 අතරට පැමිණීමේ දර්ශනය සහිතව පහත සඳහන් වැඩසටහන් දියත් කරනු ලැබේ.

1. 2008 වසරේ සිට වසරකට හෙක්ටෙයාර් 3,400 බැගින් 2012 වසර වන විට හෙක්ටෙයාර් 17,000ක් වගා කිරීම මඟින් වසර 2016 වන විට මෙට්‍රික්ටොන් 50,000ක අස්වැන්න ලබා ගැනීමේ ඉලක්කය සමඟ වගා කටයුතු පුළුල් කිරීම.

2. වගාව ව්‍යාප්ත කිරීම සඳහා උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබා දීමට එළුවන්කුලම, නාඋල, මහඔය, මොණරාගල, ලග්ගල, විලච්චිය යන ප්‍රදේශවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන (බීජ උද්‍යාන) අක්කර 491ක් ඇති කිරීම සහ ඉදිරියේදී එම ප්‍රමාණය අක්කර 1,000 දක්වා වැඩි කිරීම.

3. කජු වගාව සඳහා නව ප්‍රභේද 6ක් පමණ දැනට හඳුන්වා දී ඇති අතර, ඉදිරියේදී තව දුරටත් ප්‍රභේද වර්ග හඳුන්වා දීම, පොහොර නිර්දේශ, රෝග හා පළිබෝධ නිර්දේශ, පුහුණුව හා කප්පාදු කිරීම් සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් වයඹ විශ්වවිද්‍යාලයේ වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධ සිදු කිරීම හා ඒවායේ තාක්ෂණයන්, ගොවි පුහුණු පන්ති, අත් පත්‍රිකා, සීඩී තැටි වැනි ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවලින් වගාකරුවන් වෙත ලබා දීම මඟින් දැනට භූමියේ නිෂ්පාදකතාව වන හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 371ක නිෂ්පාදනය දැනට නිෂ්පාදන වගාවෙන් හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 650 දක්වා වැඩි කිරීම. නව ප්‍රභේදවලින් හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 2,000ක නිෂ්පාදනයෙන් ලබා ගැනීම.

4. කජුවල කජු ලෙලි, පුහුලන් සඳහා වූ අතුරු ඵල නිෂ්පාදන තාක්ෂණය කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සමඟ ඒකාබද්ධව සිදු කරන අතර, මෙම නිෂ්පාදන තාක්ෂණය ආයෝජකයන් වෙත හඳුන්වා දීම.

5. පිරිසැකසුම් කර්මාන්තයේ ප්‍රමිතීන් උසස් කිරීම් සඳහා ආහාර නිෂ්පාදන ප්‍රමිතීන් එම කර්මාන්තයට හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම මඟින් අපනයන වෙළෙඳ පොළේන් ඉහළම තත්ත්වයක් පවත්වා ගෙන යාම.

## නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුරින් විනාශ වූ නිවාස : ඉඩම් සහ වන්දි

### நாகொட பிரதேச செயலகப்பிரிவில் வெள்ளத்தினால் பாதிக்கப்பட்ட வீடுகள் : காணி மற்றும் நட்டஈடு

### HOUSES DESTROYED BY FOLLDS IN NAGODA DIVISIONAL SECRETARY'S DIVISION : LAND AND COMPENSATION

0642/'08

11. **ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ගාල්ල නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2003 ගංවතුරින් සම්පූර්ණයෙන් විනාශ වූ නිවාස 54 ක් පිහිටා තිබූ ස්ථාන අනාරක්ෂිත බවට රජයේ නිලධාරීන් හඳුනාගත් බවත්;

(ii) එම අයට නාගොඩ, තල්ගස්වල රජයට පවරාගත් වත්තෙන් ඉඩම් ලබාදීමට ඉඩම් අමාත්‍යාංශයෙන් නිර්දේශකර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු උපදේශක කාරක සභා යෝජනා අංක 860 සහ 1433 අනුව ඔවුනට හිඟ වන්දි ලබාදීම සඳහා ආපදා සහන සේවා අමාත්‍යාංශය මඟින් අවශ්‍ය මුදල් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී ඇති බවත්;

(ii) නාගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත හිඟ වන්දි මුදල් 2007 දෙසැම්බර් 31 වැනි දින නැවත මහා භාණ්ඩාගාරයට හරවා යවා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මහජන නියෝජිතයින් සහ අදාළ ඉඩම්ලාභීන් විසින් දිගින් දිගටම ඉල්ලීම් කළ ද, මේවන තෙක් නිවාස විනාශ වූ පිරිසට ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් ලබාදී නොමැති බැවින් අදාළ නිර්දේශිත ඉඩම් ලබාදීමට කොපමණ කාලසීමාවක් තුළ පියවර ගන්නේද;

(ii) නිර්දේශිත ඉඩම් ලබාදීම ප්‍රමාද කරන නිලධාරීන්ට එරෙහිව ගනුලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) காலி, நாகொட பிரதேச செயலகப் பிரிவில் 2003 ஆம் ஆண்டு ஏற்பட்ட வெள்ளத்தின் காரணமாக முழுமையாக அழிந்த 54 வீடுகள் அமைந்திருந்த இடங்கள் பாதுகாப்பற்றதென அரசாங்க அதிகாரிகள் இனங்கண்டனர் என்பதையும்,

(ii) இவர்களுக்கு நாகொட, தல்கஸ்வலயில் அரசாங்கம் சுவீகரித்துக் கொண்ட தோட்டத்தில் காணிகளைப் பெற்றுக்கொடுப்பதற்கு காணி அமைச்சு விதப்புரை செய்துள்ளது என்பதையும்

அவர் அறிவாரா?

[ගරු තිලකරත්න විතානාච්චි මහතා]

(ஆ) (i) பாராளுமன்ற ஆலோசனைக்குழுவின் பிரேரணை இலக்கம் 860 மற்றும் 1433 இன்படி இவர்களுக்கு நிலுவை நட்ட ஈடு வழங்குவதற்காக அனர்த்த நிவாரண சேவைகள் அமைச்சினால் தேவையான பணம் நாகொட பிரதேச செயலகத்திற்கு வழங்கப் பட்டுள்ளதென்பதையும்,

(ii) நாகொட பிரதேச செயலாளரினால் மேற்படி நிலுவை நட்ட ஈட்டுத் தொகை 2007 ஆம் ஆண்டு திசெம்பர் 31 ஆம் திகதி மீண்டும் பொதுத்திறைசேரிக்கு திருப்பி அனுப்பப்பட்டுள்ளது என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) மக்கள் பிரதிநிதிகளினாலும் சம்பந்தப்பட்ட காணி பெறுநர்களினாலும் தொடர்ச்சியாக வேண்டுகோள்கள் விடுக்கப்பட்டாலும் இதுவரை வீடுகள் அழிந்து போனவர்களுக்கு பிரதேச செயலாளர் காணிகளை வழங்கவில்லையென்பதால் உரிய விதப்புரை செய்யப் பட்ட காணிகளைப் பெற்றுக் கொடுப்பதற்கு எவ்வளவு காலவரையறைக்குள் நடவடிக்கையெடுக்கப்படும் என் பதையும்,

(ii) விதப்புரை செய்யப்பட்ட காணிகள் வழங்கப்படுவதை தாமதிக்கின்ற உத்தியோகத்தர்களுக்கு எதிராக எடுக் கப்படும் நடவடிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs,— (1)

(*a*) Is he aware that,—

(i) the places where the 54 houses that were completely destroyed by the floods of 2003 were situated in Nagoda Divisional Secretariat Division in Galle have been identified as unsafe places by the Government officials; and

(ii) the Ministry of Lands has recommended that those people be provided with plots of lands from the estate that was taken over by the state in Thalgaswala, Nagoda?

(*b*) Will he admit that,—

(i) the funds required to provide them with outstanding compensation have been provided to Nagoda Divisional Secretariat by the Ministry of Disaster Relief Services in accordance with Parliamentary Consultative Committee resolution No.860 and 1433; and

(ii) the aforesaid outstanding compensation monies have been reverted to the Treasury by the Divisional Secretary of Nagoda on 31st December, 2007?

(*c*) Will he state,—

(i) the time span within which steps will be taken to provide the relevant recommended lands as lands have not yet been provided by the Divisional Secretary to the group of people whose houses were destroyed, despite the repeated requests made by the people's representatives and the relevant land recipients; and

(ii) the steps that will be taken against the officials who delay the provision of recommended lands?

(d) If not, why?

**ගරු කරු ජයසූරිය මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு கரு ஜயசூரிய - பொது நிருவாக, உள்நாட்டலு வல்கள் அமைச்சர்)
(The Hon. Karu Jayasuriya - Minister of Public Administration and Home Affairs)

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(ඇ) (i) 2008.03.05 දින ඉඩම් ලබා දී ඇත.

(ii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය අහනවා. ඉඩම් ලබා දී ඇත කිව්වත් 54 දෙනාගෙන් 25 දෙනෙකුට පමණයි ඉඩම් ලබා දී තිබෙන්නේ. ඉඩම් ලබා දී තිබෙනවාය කියා ඔබතුමා කිව්වේ මේ 54 දෙනාටමද ? මම අහලා තිබෙන්නේ 54 දෙනෙක් ගැන.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නයට අදාළව මට ලබා දුන්න විස්තර අනුව උත්තරය, ඉඩම් ලබා දුන්නා කියන එකයි. මට නම් ටික දුන්නොත් සතියක් ඇතුළත ඉතුරු විස්තර ලබා දෙන්න පුළුවන්.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පැහැදිලිව සවිස්තරාත්මකව අහලා තිබෙනවා. පැහැදිලිවම 25 දෙනකුට තමයි ඉඩම් දීලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, එතුමා සතියකින් පිළිතුරු දෙන්න අවශ්‍ය නැහැ. නිලධාරීන් භාගයකටයි උත්තරය දීලා තිබෙන්නේ. ගරු ඇමැතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර මොකක්ද?

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ පැහැදි කිරීමක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මා එය ඔබතුමාට කියන්නම්.

2003.06.12 දිනැති ලිපිය අනුව නාගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් 2003.06.21 දිනැතිව තල්ගස්වල වත්ත ඉඩම අත් පත් කර ගැනීමේ ඉල්ලීමක් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යවා තිබෙනවා. ඒ අනුව ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ ඉඩම්

සඳහා 2003.10.22 දිනැතිව, ඉඩම් අත් පත් කර ගැනීමේ පනතේ දෙ වන වගන්තිය නිකුත් කර අත් පත් කර ගැනීමේ කටයුතු සිදු කර ගෙන තිබෙනවා. ඊට පසුව අත් පත් කර ගත් ඉඩමෙන් පර්චස් 15 බැගින් ඉඩම් කට්ටි 25ක් සම්පූර්ණයෙන්ම නිවාස හානි වූ, ඉඩම් ලබා දීමට නිර්දේශිත පවුල් 54න් 25ක් සඳහා මේ වන විට ලබා දී ඇත. ඉතිරි පවුල් 25 අනාරක්ෂිත ස්ථානවලම නිවාස තනා ගෙන ඇති බැවින් ඒ අයට නිර්වන්දි ගිවිසුම් මත ඉඩම් ලබා නොදී, නිවාසවල වැඩ නිම කර ගැනීම සඳහා මුදල් ලබා දීමට 2007.09.27 දින පැවැති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මඟින් තීරණය කර තිබෙනවා.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු කථානායකතුමනි, ඒකට -[බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු ඇමතිතුමනි, තව 4ක් අඩුයි.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ඒ ගැන මා සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි. ඒ තීරණය අනුව තමයි දීලා තිබෙන්නේ. හතරක අඩුවක් තිබෙනවා නම් ඒ පිළිබඳ විස්තර මට දෙන්න, ගරු මන්ත්‍රීතුමනි. ඒකත් මා සොයා බලන්නම්.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
මගේ අවසාන අතුරු ප්‍රශ්නය මේකයි. ඒ අය අනාරක්ෂිත ස්ථානවල නිවාස හදා ගෙන තිබෙනවා නම් නිර්වන්දි ගිවිසුම යටතේ ප්‍රාදේශීය ලේකම්වරයාට නියෝගයක් නිකුත් කරන්න පුළුවන්ද, අනාරක්ෂිත ස්ථානවල නිවාස හදපු අයට වන්දි මුදල් ගෙවන්නය කියා?

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
වන්දි මුදල් ලබා දීම දැන් අනුමත කර තිබෙනවා. ඒ අවශ්‍ය උපදෙස් මා දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
බොහොම ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, පසු ගිය දවස්වල පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් පැන නැගුණා. ස්වදේශ කටයුතු අමාත්‍යතුමා එයට පිළිතුරු ලබා දෙන්න කාලයක් ගත්තා. නමුත් තවමත් පිළිතුරු ලබා දීලා නැහැ. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේදී විශේෂයෙන්ම දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටිමින් ඒ සඳහා තරග කරන තරගකරුවන්ට සිදු වී තිබෙන අසාධාරණයත්, ඒ වාගේම බඳවා ගැනීමේ දී කලින් තිබුණාට වඩා වෙනස් ලකුණු ක්‍රමයක් හඳුන්වා දීම පිළිබඳවත් ඔබතුමාගෙන් විමසලා පාර්ලිමේන්තුවට පිළිතුරක් ලබා දෙනවා කියා එතුමා එකඟ වුණා. නමුත් තවම ඒ සම්බන්ධයෙන් පිළිතුරක් නොදුන් නිසා ඔබතුමාගෙන් ඒ පිළිබඳ තත්ත්වය දැන ගන්න කැමැතියි.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මම කථා කරලා බලලා ඔබතුමාට පිළිතුරු දෙන්නම්.

## දේශීය වෛද්‍ය උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් : පත්වීම්

**சுதேச மருத்துவப் பட்டதாரிகள் மற்றும் டிப்ளோமாதாரிகள் : நியமனம்**

INDIGENOUS MEDICAL GRADUATES AND DIPLOMA HOLDERS : APPOINTMENTS

0643/'08

12. **ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1) :

(අ)(i) දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ (පළාත් සෞඛ්‍ය සේවය ද ඇතුළුව) සේවය කරන දේශීය වෛද්‍ය ක්‍රමයට අනුබද්ධ ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍යවරු සංඛ්‍යාව සහ ඔවුන් සේවය කරන රෝහල් වෙන් වෙන්ව කවරේද;

(ii) මේ වන විට එම රෝහල්වල ඇති වෛද්‍ය පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලයෙන්, බොරැල්ල දේශීය වෛද්‍ය විද්‍යාලයෙන් සහ යාපනය දේශීය වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා මේවන විට රැකියා නොමැතිව සිටින වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iv) ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලයෙන් ඩිප්ලෝමාධාරීන් ලෙස සමත් වූ වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) මේ වන විට දේශීය වෛද්‍ය විද්‍යාලවලින් සමත්වන සියල්ලන්ම උපාධිධාරීන් වන බැවින් ඉහත ඩිප්ලෝමාධාරීන් සියල්ලන්ටම රැකියා ලබා දීමට විශේෂ වැඩ පිළිවෙලක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) දැනට උපාධිය සමත් වී සිටින දේශීය වෛද්‍යවරුන් සියල්ලටම 2008 වර්ෂයේ රැකියා ලබාදීමට කොපමණ කාල සීමාවක් තුළ අවශ්‍ය කටයුතු සිදු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுதேச மருத்துவத்துறை அமைச்சரைக் கேட்ட வினா :

(அ)(i) சுதேச மருத்துவத்துறை அமைச்சின் கீழ் (மாகாண சுகாதார சேவை அடங்கலாக) பணியாற்றுகின்ற சுதேச மருத்துவ முறையுடன் இணைந்து ஆயுர்வேத, சித்த மற்றும் யுனானி மருத்துவர்களின் எண்ணிக்கையும் இவர்கள் பணியாற்றுகின்ற வைத்தியசாலைகளும் வெவ்வேறாக யாவை,

(ii) தற்போது வைத்தியசாலைகளில் நிலவுகின்ற மருத்துவர்களுக்கான வெற்றிடங்களின் எண்ணிக்கை எத்தனை,

(iii) கம்பஹ விக்கிரமாரச்சி மருத்துவக் கல்லூரி, பொறளை சுதேச மருத்துவக் கல்லூரி மற்றும் யாழ்ப்பாண சுதேச மருத்துவக் கல்லூரி என்பவற்றிலிருந்து மருத்துவப்பட்டம் பெற்று தற்போது வேலையின்றி உள்ள மருத்துவர்களின் எண்ணிக்கை எத்தனை,

(iv) கம்பஹ விக்கிரமாரச்சி மருத்துவக் கல்லூரியில் டிப்ளோமாதாரிகளாக சித்தியெய்திய மருத்துவர்களின் எண்ணிக்கை எத்தனை,

[ගරු තිලකරත්න විතානාච්චි මහතා]

(v) தற்போது சுதேச மருத்துவக்கல்லூரியிலிருந்து சித்தியடைகின்ற சகலரும் பட்டதாரிகள் என்பதால் மேற்படி டிப்ளோமாதாரிகள் சகலருக்கும் தொழில் வழங்குவதற்கு விசேட வேலைத்திட்டம் உருவாக்கப்படுமா

என்பதை அவர் இச்சபைக்குக் கூறுவாரா?

(ஆ) தற்போது பட்டப்பரீட்சையில் சித்தியெய்தியுள்ள சுதேச மருத்துவர்கள் சகலருக்கும் 2008 ஆம் ஆண்டில் தொழில் வழங்குவதற்கு எவ்வளவு காலவரையறைக்குள் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Indigenous Medicine, :

(*a*) Will he submit to this House,—

(i) separately, the number of the Ayurvedic, Siddha and Yunani doctors who are affiliated to the indigenous medical system and who serve under the Ministry of Indigenous Medicine (including Provincial Health Service) and the hospitals where they serve;

(ii) the number of vacancies that exists for doctors at those hospitals at present;

(iii) the number of unemployed doctors who have graduated from Wickramarachchi Medical College at Gampaha, Indigenous Medical College at Borella and the Indigenous Medical College at Jaffna, by now;

(iv) the number of doctors who have passed out as diploma holders from Wickramarachchi Medical College of Gampaha; and

(v) as all those who pass out from Indigenous Medical Colleges at present are graduates, whether a special programme will be formulated to provide employment to all of the aforesaid diploma holders?

(*b*) Will he state the period of time within which necessary action will be taken to provide employment to all the indigenous doctors who have already obtained their degrees during the year 2008?

(*c*) If not, why?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Indigenous Medicine)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) - වෛද්‍යවරුන් සංඛ්‍යාව : මධ්‍යම රජය -

| | | |
|---|---|---|
| 1. | බොරැල්ල රෝහල - | 92 |
| 2. | නාවින්න පර්යේෂණායතනය- | 19 |
| 3. | කයිතඩි රෝහල - | 07 |
| | එකතුව - | 118 |

පළාත් සේවය -

| | | |
|---|---|---|
| 1. | වයඹ - | 214 |
| 2. | මධ්‍යම - | 115 |
| 3. | ඌව - | 86 |
| 4. | දකුණ- | 121 |
| 5. | සබරගමුව - | 90 |
| 6. | උතුරු මැද - | 80 |
| 7. | උතුර - | 95 |
| 8. | නැගෙනහිර - | 44 |
| 9. | බස්නාහිර - | 138 |
| | මුළු එකතුව - | 1,101 |

| පළාත | රෝහල් | මධ්‍යම බෙහෙත් ශාලා | නිදහස් බෙහෙත් ශාලා |
|---|---|---|---|
| බස්නාහිර | 09 | 13 | 37 |
| මධ්‍යම | 05 | 13 | 25 |
| වයඹ | 08 | 29 | 11 |
| උතුරු මැද | 06 | 12 | 07 |
| ඌව | 03 | 20 | 10 |
| දකුණ | 08 | 23 | 40 |
| සබරගමුව | 08 | 11 | 25 |
| උතුර | 04 | 18 | 53 |
| නැගෙනහිර | | | |

(අ) (ii) 2008.09.17 වන විට සියලුම පුරප්පාඩු පුරවා අවසන් කර ඇත.

(iii) ආයුර්වේද 08
යුනානි 31

(iv) 378 යි.

(v) ඔව්. ඔවුන් සහකාර වෛද්‍යවරුන් ලෙස බඳවා ගැනීමට දැනටමත් පරිපාටි සකස් කිරීමේ කටයුතු කෙරෙමින් පවතී.

(ආ) ඔව්.

දැනට සුදුසුකම් ලබා සිටින වෛද්‍යවරුන්ට 2008 සැප්තැම්බර් මස 15 වන දින වන විට පත්වීම් ලබා දී අවසන් කර ඇත. පවත්නා සංඛ්‍යාව 271කි.

ඉදිරිවර්ෂයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව කැඳවා සුදුසුකම් ලබන අයට ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පත්වීම් ලබා දී පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

ගරු ඇමතිතුමනි, (අ) v කොටසට පිළිතුර කියවන්න.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த )
(The Hon. Tissa Karalliyadde)

එම ප්‍රශ්නයට පිළිතුර "ඔව්., ඔවුන් සහකාර වෛද්‍යවරුන් ලෙස බඳවා ගැනීමට දැනටමත් පරිපාටි සකස් කිරීමේ කටයුතු කෙරෙමින් පවතී."

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

ගරු කථානායකතුමනි, මට එක අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සියලු ඩිප්ලෝමාධාරීන්ට කොච්චර කාලයක් ඇතුළත රැකියා ලබා දීමක් කරනවාද?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**

(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த )

(The Hon. Tissa Karalliyadde)

ගරු මන්ත්‍රීතුමනි, කාල වකවානු කියනවා නම් මම මේක හැකිතාක් ඉක්මනින් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මට යම්කිසි කාල සීමාවක් අවශ්‍ය වෙනවා. ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතිවල සහයෝගය ලැබෙනවා නම් ඒක කඩිනම් කර ගන්න පුළුවන්.

## හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : වැව් රක්ෂිත

**சிலாபம் பிரதேச செயலாளர் பிரிவு : குளத்துக்கான ஒதுக்கம்**

CHILAW DIVISIONAL SECRETARY'S DIVISION : TANK RESERVATIONS

0673/'08

13. **ගරු සමන්සිරි හේරත් මහතා**

( மாண்புமிகு சமன்சிறி ஹெரத்)

(The Hon. Samansiri Herath)

වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1) :

(අ) (i) හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ගවලට අයත් සමස්ත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැව්වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(iii) මෙම රක්ෂිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අවසන් වරට මිනුම් කටයුතු කර ඇති වර්ෂය කවරේද;

(iv) රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(v) එසේ නම් ඔවුන් පදිංචි ව සිටින්නේ කිසියම් නෛතික තත්ත්වයක් තුළද;

(vi) අදාළ වර්ෂය, පදනම සහ කොපමණ කාල සීමාවක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සුළු වාරිමාර්ග හා මහ වාරිමාර්ග අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වැව් රක්ෂිතවල පදිංචිකරුවන්ට ලබා දීමට විකල්ප ඉඩම් හඳුනා ගෙන තිබේද;

(iii) එසේ නම් එම ස්ථාන කවරේද;

(iv) විකල්ප ඉඩම් හඳුනා ගෙන නොමැති නම් ඒවා ලබා දීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் முகாமைத்துவ அமைச்சரும் துறைமுகங்கள், விமானச் சேவைகள் அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ)(i) சிலாபம் பிரதேச செயலாளர் பிரிவிலுள்ள சிறு நீர்ப்பாசன மற்றும் பெரிய நீர்ப்பாசனங்களுக்குரிய குளங்களின் மொத்த எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு,

(ii) இக்குளங்களுக்காக, ஒதுக்கப்பட்ட காணிப்பரப்பு வெவ்வேறாக எவ்வளவு,

(iii) இவ்வொதுக்கக் காணிகளை அடையாளம் காண்பதற்காக இறுதியாக நில அளவை மேற்கொள்ளப்பட்ட ஆண்டு யாது,

(iv) ஒதுக்கக் காணிகளில் குடியிருப்பவர்கள் உள்ளனரா,

(v) அவ்வாறாயின், அவர்கள் ஏதேனும் சட்டபூர்வமான அடிப்படையில் குடியிருக்கின்றனரா,

(vi) அதற்கான ஆண்டு, அடிப்படை மற்றும் எவ்வளவு காலத்திற்கானது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)(i) குறிப்பிட்ட ஒதுக்கக் காணிகளில் குடியிருப்பவர்களின் பெயர், முகவரி ஆகியவை சிறு நீர்ப்பாசனம் மற்றும் பெரிய நீர்ப்பாசன அடிப்படையில் வெவ்வேறாக யாவை,

(ii) குள ஒதுக்கங்களில் குடியிருப்பவர்களுக்கு வழங்க மாற்றுக் காணிகள் இனங்காணப்பட்டுள்ளனவா,

(iii) அவ்வாறாயின், அவ்விடங்கள் யாவை,

(iv) மாற்றுக்காணிகள் இனங்காணப்படவில்லையாயின் அவற்றை வழங்கு வதற்காக எப்போது நடவடிக்கை எடுக்கப்படும்

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Management and Minister of Ports and Aviation,:

(*a*) Will he inform this House,—

(i) separately, the total number of tanks that belong to the categories of minor irrigations and major irrigations in the Chillaw Divisional Secretary's Division;

(ii) separately, the extent of reservations of the aforesaid tanks;

(iii) the year in which the surveys have been carried out for the last time for the purpose of identifying the aforesaid reservations;

(iv) whether there are occupants in the aforesaid reservations;

(v) if there are occupants, whether they occupy the aforesaid reservations on any legal basis; and

(vi) the relevant year, the basis and the duration of their occupation?

(*b*) Will he submit to this House,—

(i) separately, the names and addresses of the persons occupying the aforesaid reservations in respect of minor irrigations and major irrigations;

(ii) whether alternative lands have been identified for the distribution to the aforesaid occupants of the reservations of tanks;

(iii) if so, the locations of those lands; and

(iv) if alternative lands have not been identified, the date on which action will be taken to grant them?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, මේකේ සම්පූර්ණ උත්තරය තිබෙනවා. එකින් එක කියවන්න ඕනෑද?

**ගරු සමන්සිරි හේරත් මහතා**
(மாண்புமிகு சமன்சிறி ஹெரத்)
(The Hon. Samansiri Herath)
ඔව්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් මහා වාරිමාර්ග ලෙස ක්‍රියාත්මක වන වැව් කිසිවක් නැත. මධ්‍යම වාරිමාර්ග ව්‍යාපාරයක් වන කරව්ට වැව පිහිටා ඇත. සුළු වාරිමාර්ග 24ක් ඇත. ඒවා පාලනය වන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟිනි.

(ii) කරව්ට වැවට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය අක්කර 280 පර්චස් 05කි.

(iii) 1973-1976 වර්ෂවලදී.

(iv) ඔව්.

(v) වාරිමාර්ග ආඥාපනත හා රජයේ ඉඩම් ආඥාපනතට අනුව රක්ෂිත සම්බන්ධයෙන් බලධාරියා වනුයේ දිසාපති/ප්‍රාදේශීය ලේකම් හෙයින් හලාවත ප්‍රාදේශීය ලේකම්ගෙන් තොරතුරු විමසා ඇත. පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටී.

(vi) නොදනී.

(ආ) (i) නොදනී.

(ii) නැත.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු සමන්සිරි හේරත් මහතා**
(மாண்புமிகு சமன்சிறி ஹேரத்)
(The Hon. Samansiri Herath)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි ගරු ඇමතිතුමාගෙන් මා මේ කාරණය දැන ගන්න කැමතියි. මේ වැවේ අවසන් වරට මිනුම් කටයුතු කර තිබෙන්නේ 1976 වර්ෂයේදීයි. විශේෂයෙන්ම මධ්‍යම වාරිමාර්ග ව්‍යාපාරයක් වන කරව්ට වැව කියන වැවේ අවුරුදු 25-30කට ආසන්න කාලයකින් මිනුම් කටයුතු කර නැහැ. ගරු ඇමතිතුමාට දීලා තිබෙන තොරතුරු බොහොමයක්ම සත්‍යතාවෙන් තොරයි. මේ වන විට වැවට අයිති රක්ෂිතයේ අනවසරයෙන් පදිංචි වී සිටින විශාල පිරිසක් ඉන්නවා. මම මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ ඒ අය හඳුනා ගෙන තිබෙනවා නම් ඒ අයට විකල්ප ඉඩම් ලබා දෙන්න කටයුතු කරනවාද කියන එකයි. මේ පිළිබඳව ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි, මේකට ලබා දෙන පිළිතුර මොකක්ද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
5 වන ප්‍රශ්නයට පිළිතුරක් දී තිබෙනවා. ඒ වාර්තාව ලබා ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙත යවා තිබෙනවා. ඒ වාර්තාව ලැබීමෙන් පසුව තමයි ඒ පිළිබඳ ගන්නා විසඳුම් ක්‍රියා මාර්ගය දැනුම් දෙන්න පුළුවන් වන්නේ. මොකද, ඔබතුමා කියන කාරණය මත දිසාපති , ප්‍රාදේශීය ලේකම් වෙත යවා තිබෙනවා, තොරතුරු වහාම එවන්න කියලා.

## පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : රක්ෂිත වැව්

### பல்லம பிரதேச செயலாளர்பிரிவு : குளத்துக்கான ஒதுக்கம்

### PALLAMA DIVISIONAL SECRETARY'S DIVISION : TANK RESERVATIONS

0674/'08

14. **ගරු සමන්සිරි හේරත් මහතා**
(மாண்புமிகு சமன்சிறி ஹேரத்)
(The Hon. Samansiri Herath)
වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,— (1) :

(අ) (i) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ගවලට අයත් සමස්ත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැව්වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(iii) මෙම රක්ෂිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අවසන් වරට මිනුම් කටයුතු කර ඇති වර්ෂය කවරේද;

(iv) රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(v) එසේ නම් ඔවුන් පදිංචි ව සිටින්නේ කිසියම් නෛතික තත්ත්වයක් තුළද;

(vi) අදාළ වර්ෂය, පදනම සහ කොපමණ කාල සීමාවක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සුළු වාරිමාර්ග හා මහ වාරිමාර්ග අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වැව් රක්ෂිතවල පදිංචිකරුවන්ට ලබා දීමට විකල්ප ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම් එම ස්ථාන කවරේද;

(iv) විකල්ප ඉඩම් හඳුනා ගෙන නොමැති නම් ඒවා ලබා දීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் முகாமைத்துவ அமைச்சரும் துறைமுகங்கள், விமானச் சேவைகள் அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) (i) பல்லம பிரதேச செயலாளர் பிரிவிலுள்ள சிறு நீர்ப்பாசன மற்றும் பெரிய நீர்ப்பாசனங்களுக்குரிய குளங்களின் மொத்த எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு,

(ii) இக்குளங்களுக்காக, ஒதுக்கப்பட்ட காணிப்பரப்பு வெவ்வேறாக எவ்வளவு,

(iii) இவ்வொதுக்கக் காணிகளை அடையாளம் காண்பதற்காக இறுதியாக நில அளவை மேற்கொள்ளப்பட்ட ஆண்டு யாது,

(iv) ஒதுக்கக் காணிகளில் குடியிருப்பவர்கள் உள்ளனரா,

(v) அவ்வாறாயின், அவர்கள் ஏதேனும் சட்டபூர்வமான அடிப்படையில் குடியிருக்கின்றனரா,

(vi) அதற்கான ஆண்டு, அடிப்படை மற்றும் எவ்வளவு காலத்திற்கானது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குறிப்பிட்ட ஒதுக்கக் காணிகளில் குடியிருப்பவர்களின் பெயர், முகவரி ஆகியவை சிறு நீர்ப்பாசனம் மற்றும் பெரிய நீர்ப்பாசன அடிப்படையில் வெவ்வேறாக யாவை,

(ii) குள ஒதுக்கங்களில் குடியிருப்பவர்களுக்கு வழங்க மாற்றுக் காணிகள் இனங்காணப்பட்டுள்ளனவா,

(iii) அவ்வாறாயின், அவ்விடங்கள் யாவை,

(iv) மாற்றுக்காணிகள் இனங்காணப்படவில்லையாயின் அவற்றை வழங்கு வதற்காக எப்போது நடவடிக்கை எடுக்கப்படும்

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Management and Minister of Ports and Aviation,—(1) :

(*a*) Will he inform this House,—

(i) separately, the total number of tanks that belong to the categories of minor irrigations and major irrigations in the Pallama Divisional Secretary's Division;

(ii) separately, the extent of reservations of the aforesaid tanks;

(iii) the year in which the surveys have been carried out for the last time for the purpose of identifying the aforesaid reservations;

(iv) whether there are occupants in the aforesaid reservations;

(v) if there are occupants, whether they occupy the aforesaid reservations on any legal basis; and

(vi) the relevant year, the basis and the duration of their occupation?

(*b*) Will he submit to this House,—

(i) separately, the names and addresses of the persons occupying the aforesaid reservations in respect of minor irrigations and major irrigations;

(ii) whether alternative lands have been identified for the distribution to the aforesaid occupants of the reservations of tanks;

(iii) if so, the locations of those lands; and

(iv) if alternative lands have not been identified, the date on which action will be taken to grant them?

(*c*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ මහා වාරිමාර්ග ලෙස ක්‍රියාත්මක වන වැව් කිසිවක් නැත. සුළු වාරිමාර්ග 75කි. ඒවා පාලනය වන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙනි.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(vi) පැන නොනඟී.

(ආ) (i) පැන නොනඟී.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

## මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : වැව් රක්ෂිත

**முந்தல் பிரதேச செயலாளர் பிரிவு : குளத்துக்கான ஒதுக்கம்**
**MUNDALAMA DIVISIONAL SECRETARY'S DIVISION : TANK RESERVATIONS**

**0675/'08**

15. **ගරු සමන්සිරි හේරත් මහතා**
(மாண்புமிகு சமந்சிரி ஹெரத் )
(The Hon. Samansiri Herath)

වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ගවලට අයත් සමස්ත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැව් වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(iii) මෙම රක්ෂිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අවසන්වරට මිනුම් කටයුතු කර ඇති වර්ෂය කවරේද;

(iv) රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(v) එසේනම්, ඔවුන් පදිංචි ව සිටින්නේ කිසියම් නෛතික තත්ත්වයක් තුළද;

(vi) අදාළ වර්ෂය, පදනම සහ කොපමණ කාලසීමාවක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සුළු වාරිමාර්ග හා මහ වාරිමාර්ග අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වැව් රක්ෂිතවල පදිංචිකරුවන්ට ලබාදීමට විකල්ප ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේනම්, එම ස්ථාන කවරේද;

(iv) විකල්ප ඉඩම් හඳුනා ගෙන නොමැතිනම් ඒවා ලබාදීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் முகாமைத்துவ அமைச்சரும் துறைமுகங்கள், விமானச் சேவைகள் அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) (i) முந்தல் பிரதேச செயலாளர் பிரிவிலுள்ள சிறு நீர்ப்பாசன மற்றும் பெரிய நீர்ப்பாசனங்களுக்குரிய குளங்களின் மொத்த எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு,

(ii) இக்குளங்களுக்காக, ஒதுக்கப்பட்ட காணிப்பரப்பு வெவ்வேறாக எவ்வளவு,

(iii) இவ்வொதுக்கக் காணிகளை அடையாளம் காண்பதற்காக இறுதியாக நில அளவை மேற்கொள்ளப்பட்ட ஆண்டு யாது,

(iv) ஒதுக்கக் காணிகளில் குடியிருப்பவர்கள் உள்ளனரா,

(v) அவ்வாறாயின், அவர்கள் ஏதேனும் சட்டபூர்வமான அடிப்படையில்குடியிருக்கின் றனரா,

(vi) அதற்கான ஆண்டு, அடிப்படை மற்றும் எவ்வளவு காலத்திற்கானது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු සමන්සිරි හේරත් මහතා]

(ஆ) (i) குறிப்பிட்ட ஒதுக்கக் காணிகளில் குடியிருப்பவர்களின் பெயர், முகவரி ஆகியவை சிறு நீர்ப்பாசனம் மற்றும் பெரிய நீர்ப்பாசன அடிப்படையில் வெவ்வேறாக யாவை,

(ii) குள ஒதுக்கங்களில் குடியிருப்பவர்களுக்கு வழங்க மாற்றுக் காணிகள் இனங்காணப்பட்டுள்ளனவா,

(iii) அவ்வாறாயின், அவ்விடங்கள் யாவை,

(iv) மாற்றுக்காணிகள் இனங்காணப்படவில்லையாயின் அவற்றை வழங்குவதற்காக எப்போது நடவடிக்கை எடுக்கப்படும்

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Management and Minister of Ports and Aviation :

(*a*) Will he inform this House,—

(i) separately, the total number of tanks that belong to the categories of minor irrigations and major irrigations in the Mundalama Divisional Secretariat Division;

(ii) separately, the extent of reservations of the aforesaid tanks;

(iii) the year in which the surveys have been carried out for the last time for the purpose of identifying the aforesaid reservations;

(iv) whether there are occupants in the aforesaid reservations;

(v) if there are occupants, whether they occupy the aforesaid reservations on any legal basis; and

(vi) the relevant year, the basis and the duration of their occupation?

(b) Will he submit to this House,—

(i) separately, the names and addresses of the persons occupying the aforesaid reservations in respect of minor irrigations and major irrigations;

(ii) whether alternative lands have been identified for the distribution to the aforesaid occupants of the reservations of tanks;

(iii) if so, the locations of those lands; and

(iv) if alternative lands have not been identified, the date on which action will be taken to grant them?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) (i) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ මහා වාරිමාර්ග ලෙස ක්‍රියාත්මක වන වැව් කිසිවක් නැත. සුළු වාරිමාර්ග 18කි. ඒවා පාලනය වන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙනි.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(vi) පැන නොනඟී.

(ආ) (i) පැන නොනඟී.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමනි, එයත් එසේමයි. මේ ප්‍රශ්නය වැරදි අමාත්‍යාංශය වෙතයි යොමුකර තිබෙන්නේ. දැන් සති දෙකකට කලිනුත් මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නය මේ හා සමාන වුණා. මේක ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් විය යුතු ප්‍රශ්නයක්. එම නිසා දිය හැකි පිළිතුර එපමණයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන වටය. ප්‍රශ්න අංක 1 - 0071/'08 - (1) ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කල් ඉල්ලනවා ගරු කථානායකතුමනි,

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පළමු වන ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා ද.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

සභාගත කරනවා නොවෙයි, කල් ඉල්ලනවා .

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා සිතුවේ මෙවැනි වෙලාවක කාලය ඉතිරි කර ගන්නට ඕනෑ නිසා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවාය කියලායි. අපි එදත් කථා කරපු ප්‍රශ්නය මෙය දැන් මාස දෙකක් කල් ඉල්ලනවා. එතකොට මේ ප්‍රශ්නය අහන්නේ ඇයි? [බාධා කිරීමක්] එදා එතුමාත් මෙතැන සිටිය. සුහදතාවෙන් ගෙන යනවාය, පැය භාගයක් පමණක් වැය කර වැඩේ කරනවාය කියලා එකඟ වුණා. අය වැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා. මේවා

දෙන්න බැරි නම්, එහෙනම් අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යා ලේඛන සම්පූර්ණයෙන්ම වැරැදියි. [බාධා කිරීමක්] විකල්ප අය වැයෙන් විතරයි දැන් මේ රට බේරා ගන්න පුළුවන් වෙන්නේ. විකල්ප අය වැයේ අපි ඔක්කොම සඳහන් කර තිබෙනවා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, ඔබතුමා අතේයි තීන්දුව තිබෙන්නේ. එදාත් ඔබතුමාගේ නායකත්වය තුළින් තමයි මේ තීන්දුව ගත්තේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට කල් ඉල්ලා තිබෙනවා. විදේශගත වීම් පිළිබඳව විස්තරාත්මක තොරතුරු ඉල්ලා තිබෙනවා. ඒ නිසා මාස දෙකකින් මෙයට පිළිතුරු සපයනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා අසා තිබෙන්නේ අපේක්ෂා කරන වියදම් නොවෙයි, කර තිබෙන වියදම්. ඉතින් ඒවා දෙන්නේ නැත්නම් වැඩක් නැහැ. එහෙනම් මේ අය වැය ගණනය කර තිබෙන්නේ කොහොමද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අයවැයට සම්බන්ධ නැහැ නේ මේක.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ඒක තමයි ගරු කථානායකතුමනි, ඔබතුමාගේ තීන්දුවක් අභිබවා යන්න හදනවා. ඒක තමයි අද රටේ සිදු වෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. කිසිදු අභිබවා යාමක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සෑම ආයතනයකම ක්ලාක්, මැනේජර්ට වැඩියේ වැඩේ දෙනවා. මෙතැන මන්ත්‍රීතුමා, කථානායකතුමාට වඩා ඉදිරියෙන් කටයුතු කරන්නට හදනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ, දැන් අපි මේක මේ විධියට විසඳා ගනිමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, කමක් නැහැ. දැන් අනෙක් ප්‍රශ්න අහන්නත් වෙලාව මදි වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු තිබෙන ප්‍රශ්න ටික පමණක් මට දෙනවාද? ඒ විධියට අපට පිළිවෙළක් කර ගන්න පුළුවන්ද බලමු. මේ කාලය තුළ අප ඒ කරුණු දෙකම ඉෂ්ට කර ගන්න ඕනෑ නේ. ඒ නිසා අපි —

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේක දෙ වන වටය ගරු කථානායකතුමනි, අප ඉතා පැහැදිලිව කියනවා, මේකට පිළිතුරු දෙන බව. පිළිතුරු දෙන්න බැහැ කියා නැහැ. ඒකට අවශ්‍ය විස්තර ලබා ගැනීම සඳහා කාලය ලබා ගෙන තිබෙනවා. සභාගත කිරීම තමයි සාමාන්‍යයෙන් දෙ වන වටයේදී සිද්ධ වන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එවැනි දෙයක් අහන්න ඕනෑ නැහැ නේ. පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් අහන්නේ මතු ආරක්ෂාවට නොවෙයි නේ. එදිනෙදා තිබෙන දේවල් පිළිබඳව නේ අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළමු වන වටය පිළිබඳව අපි එකඟතාවකට පැමිණියා. දෙ වන වටය ගැනත් එකඟතාවක් තිබෙනවා. ඊට අතිරේකවයි ඔබතුමා ඉදිරියේදී අපි මේක කතා කරන්නේ. අප පැමිණි සම්මුතින්, එකඟතාවන් ක්‍රියාත්මක වීම වඩා හොඳයි. එහෙම නැත්නම් අපට මේ විවාදයේ කාලය තමයි මේ සඳහා ගන්න වෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අතේයි ඒක තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, මගේ අතේ නොවෙයි. ගරු කථානායකතුමා පක්ෂ නායකයන් එක්ක ගත් තීරණයක් මතයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්න 15ක් දමනවාය; පැය භාගයකට සීමා කරනවාය; ප්‍රශ්නවල සියලු දෙයටම උත්තර දෙනවාය කියා තිබෙනවා. නිකම් වෙලාව නාස්ති කරලා වැඩක් නැහැ. කොහොමත් වැඩ බැරි අය නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඊයේ ඉදිරිපත් කළ අය වැය ඉතාමත් සාර්ථක වීම නිසා විපක්ෂය මෙනවා කියන්න හදනවාද දන්නේ නැහැ. TNA එක ගැන බලන්න. TNA එක ඊයේ නැගිටලා ගිහිල්ලා අද ඇවිල්ලා ඉඳ ගෙන ඉන්නවා. මේක තමයි අද වන කොට විපක්ෂයේ සම්පූර්ණ තත්ත්වය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් පත්තු වෙලායි තිබෙන්නේ. ඒ අය විකල්ප ලෝකයකයි ජීවත් වන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අපි දෙ වන ප්‍රශ්නයට යමු. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගින්දර විතරයි මෙහෙන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කතා කරන්න තිබෙන නිසා දැන් අපි දෙ වන ප්‍රශ්නයට යමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් විකල්ප කඩදාසිය සොයනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආකල්පයක් නැති නිසා විකල්පයක් සොයනවා. කමක් නැහැ. අපි ඒක ඉදිරිපත් කරන්නම් කෝ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලංකා විදුලිබල මණ්ඩලය : ලාභය සහ බැරකම්
## இலங்கை மின்சாரசனப : இலாபமும் பொறுப்புகளும்
CEYLON ELECTRICITY BOARD : PROFIT AND LIABILITY

0072/'08

2. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය—(1):

(අ) 1994 අප්‍රේල් මස 25 වැනි දිනට සහ අද වන විට—
- (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ලාභය කොපමණද;
- (ii) ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු බැරකම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1994 සිට මේ දක්වා විදුලිබල අංශයේ, විදුලිබලය හා සම්බන්ධයෙන් විශේෂ වැඩිදියුණු වීමක් හෝ විශාල වර්ධනයක් සිදු වී තිබේද;
- (ii) එසේ නම් සනාථ කළ හැකි සාක්ෂි සහිතව ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1994 අප්‍රේල් මස 25 වැනි දිනට පාරිභෝගිකයාගෙන් අය කළ මුදල් ප්‍රමාණයත්, අද වන විට අය කරන මුදල් ප්‍රමාණයත් වෙන් වෙන් වශයෙන් කොපමණද;
- (ii) 1994 අප්‍රේල් මස 25 වැනි දිනට සහ මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය නිසා ඇති වී තිබෙන ඒක පුද්ගල ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

மின்வலு, சக்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) இலங்கை மின்சார சபை (CEB)யின் இலாபத் தினையும்,
- (ii) இலங்கை மின்சார சபையின் மொத்தப் பொறுப்புக் களையும்

1994 ஆம் ஆண்டு ஏப்பிறல் 25 இல் உள்ளவாறாகவும் இன்றுள்ளவாறாகவும் அவர்இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 1994 ஆம் ஆண்டில் இருந்து இன்றுவரையில் மின்வலுத்துறையில் பெரும் முன்னேற்றம் அல்லது வளர்ச்சி ஏற்பட்டுள்ளதா என்பதையும்,
- (ii) அவ்வாறாயின் அவை என்னவென்றும், அதற்கான சான்றுகளையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) நுகர்வோரிடமிருந்துஅறவிடப்படுகின்ற தொகையினை
- (i) 1994 ஆம் ஆண்டு ஏப்பிறல் 25 இல் உள்ளவாறும், இன்றுள்ளவாறும் வெவ்வேறாகவும்,
- (ii) இலங்கை மின்சார சபையிடமிருந்தான தலாநபர் கடனை 1994 ஆம் ஆண்டு ஏப்பிறல் 25 இல் உள்ளவாறாகவும் இன்றுள்ளவாறாகவும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

To asked the Minister of Power and Energy:

(*a*) Will he inform this House as at 25th April 1994 and as of today—
- (i) the profit of the Ceylon Electricity Board (CEB); and
- (ii) the total liability of the Ceylon Electricity Board?

(*b*) Will he state,—
- (i) whether there has been a major improvement or augmentation of power in the power sector from 1994 to-date; and
- (ii) if so, what they are and corroborative evidence?

(*c*) Will he also state,—
- (i) the amount that the consumer was being charged as at 25th April 1994 and as of today separately; and
- (ii) the per capita debt as at 25th April, 1994 to date due to the Ceylon Electricity Board (CEB)?

(*d*) If not, why?

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன - மின்வலு, சக்தி அமைச்சர்)
(The Hon. W. D. J. Senewiratne Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, මේ පිළිතුරෙහි පිටු 6ක් තිබෙනවා. මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

*Answer tabled:*

(අ) වර්ෂ අවසානය වන තෙක් ගිණුම් පිළියෙළ කිරීම සාමාන්‍ය සම්ප්‍රදාය වේ. තවද 1994 අප්‍රේල් 25 වන දිනට ගණනය කිරීම් නොමැත. එම නිසා සංසන්දනය කිරීමේ කාර්යය සඳහා සංඛ්‍යා ලේඛන දී ඇත්තේ 1993.12.31 දිනට සහ 2007.12.31 දිනට වේ.

| | | 1993 | 2007 (කෙටුම්පත් ගිණුම්) |
|---|---|---|---|
| (i) | ලාභය/(පාඩුව) ජන. 01 සිට දෙසැ. 31 දක්වා කාලය සඳහා | 1,264,324,165 | (14,812,361.460) |
| (ii) | මුළු වගකීම (ලංවිම) (දෙසැ. 31 දිනට) | 30,602,192,871 | 113,708,957,989 |

(ආ) (i) 1994 සිට මේ දක්වා විදුලි බල අංශය තුළ විශාල දියුණුවක් දක්නට තිබේ.

(ii) සාක්ෂි පහත පරිදි වේ.

| | 1994 | 2007 | 2008 ජුනි |
|---|---|---|---|
| මුළු විදුලි බලාගාර සංඛ්‍යාව | 20 | 97 | 104 |
| ලංවිම බලාගාර සංඛ්‍යාව | 20 | 23 | 23 |
| පෞද්ගලික බලාගාර සංඛ්‍යාව | - | 74 | 81(තාප බලා. 10) |
| මුළු ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | 1409 | 2444 | 2458 |
| ලංවිම (මෙ. වො.) | 1409 | 1758 | 1758 |
| පෞද් (මෙ. වො.) | - | 686 | 700 (තාප මෙ. වො. 567) |

(මෙ. වො. 3 සුළං බලාගාරයක්, මෙ. වො. 70 කුකුළේ ගඟ ජල විදුලි බලාගාරය, මෙ. වො. 115 කැලණි තිස්ස ගෑස් ටර්බයිනය, මෙ. වො. 80 සපුගස්කන්ද ඩීසල් බලාගාරය, මෙ. වො. 165 කැලණිතිස්ස චක්‍රිය ඒකාබද්ධ බලාගාරය සහ කුඩා ජල විදුලි බලාගාරය ආදිය එම කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලදි. ජාතික විදුලි බල පද්ධතියට නව විදුලි බලාගාර සම්බන්ධ කරන තෙක් 1996 සිට 2004 දක්වා කාලය තුල අවශ්‍ය අවස්ථාවන්හිදී විදුලිබල ඉල්ලුම සපුරාලීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඩීසල් විදුලි බලාගාරය කුලියට ගෙන තිබේ.)

| | | 1994 | 2007 |
|---|---|---|---|
| විදුලි උත්පාදනය | ගිවොපැ | 4365 | 9814 (දෙගුනයකට වැඩි) |
| ලංවිම | ගිවොපැ | 4365 | 5941 |
| පෞද්ගලික | ගිවොපැ | - | 3873 |
| විදුලිය විකුණුම් | ගිවොපැ | 3565 | 8276 (දෙගුනයකට වැඩි) |
| ඒක පුද්ගල විකුණුම් | කිවොපැ | 200 | 414 |
| පද්ධති හානි | % | 18.3 | 15.7 |
| උපරිම ඉල්ලුම | මෙවො | 911 | 1842(දෙගුනයකට වැඩි) |
| පාරිභෝගික ගිණුම් | සංඛ්‍යාව | 1,413,481 | 3,866,987 (දෙගුනයකට වැඩි) |
| විදුලිය ලබා දුන් නිවාස සංඛ්‍යාව | % | 44.5 | 80.0 |
| සම්ප්‍රේෂණ මාර්ග | කි. මී. | 1683 | 2047 |
| බෙදා හැරීමේ මාර්ග | කි. මී. | 53,791 | 113,842 (දෙගුනයකට වැඩි) |

**නව විදුලි ව්‍යාපෘති (ගිවිසුම්ගත)**

කෙරවලපිටිය චක්‍රිය ඒකාබද්ධ

| | |
|---|---|
| ධාරිතාව | මෙ. වො. 300 |
| ආරම්භ කළ වර්ෂය | මෙ. වො. 200 ගෑස් ටර්බයින් 2008 දී<br>මෙ. වො. 100 තාප ටර්බයින් 2009 දී |

ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය

| | |
|---|---|
| ධාරිතාව | මෙ. වො. 150. |
| ක්‍රියාත්මක වන වර්ෂය | 2011 |

පුත්තලම් ගල් අඟුරු ව්‍යාපෘතිය

| | |
|---|---|
| ධාරිතාව | මෙ. වො. 300 |
| ක්‍රියාත්මක වන වර්ෂය | 2011 |

ත්‍රිකුණාමලය ගල් අඟුරු ව්‍යාපෘතිය

| | |
|---|---|
| ධාරිතාව | මෙ. වො. 500 |
| ක්‍රියාත්මක වන වර්ෂය | 2012 |

උමා ඔය ජල විදුලිබල ව්‍යාපෘතිය මෙ. වො. 100, ඉරාන අරමුදල් මගින් ක්‍රියාත්මක වීමට නියමිතය.

**වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය සමඟ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති**

| | |
|---|---|
| බ්‍රෝඩ්ලෑන්ඩ් ජල විදුලිබල ව්‍යාපෘතිය | මෙ. වො. 35, ශක්‍යතා අධ්‍යයනය සිදු කර ඇති අතර ටෙන්ඩර් කැඳවීමට නියමිතය. |
| මොරගොල්ල ජල විදුලිබල ව්‍යාපෘතිය | මෙ. වො. 27, ශක්‍යතා අධ්‍යයනය ඉතා කෙටි කලකින් ඇරඹීමට නියමිතය. |
| ගිං ගඟ ජල විදුලිබල ව්‍යාපෘතිය | මෙ. වො. 49, පූර්ව ශක්‍යතා අධ්‍යනය ඉංජිනේරු කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශය මඟින් සිදු කරනු ඇත. |

(ඇ) (i) යා කොට ඇත 1994 සඳහා විදුලි ගාස්තු ඇමුණුම C (i)- 1 ලෙස සහ 2008 සඳහා විදුලි ගාස්තු ඇමුණුම C (i) - 2 ලෙස

| | | 1994 | 2007 |
|---|---|---|---|
| (ii) | ඒක පුද්ගල ණය (දෙසැ. 31 දිනට) | 30,602,192,871<br>17,646,000 | 113,708,957,989<br>20,010,000 |
| | | රු. 1,734.22 | 5,682.60 |

(ඈ) අදාළ නොවේ.

**Annex C(i)**

**C. E. B. TARIFF – EFECTIVE FROM 01- 02 - 1994**

**DOMESTIC** - First 60 units (first block) @ Rs. 1.70 per unit
61 - 180 units (Second block) @ Rs. 4.40 per unit
Above 180 units (third block) @ Rs. 5.25 per unit

**MONTHLY**– Fixed charge - Rs. 8.50 for consumption upto 60 units/ month
Rs. 17.00 for consumption over 60 units/month

**RELIGIOUS & CHARITABLE INSTITUTIONS :-**

First 150 units @ Rs. 1.35 per units
Above 150 units @ Rs. 5.50 per units
Fixed charge for a month is Rs. 17.00

| *OTHER CATEGORIES :* | *General purpose* | *Industrial* | *Industrial (Time of Day)* |
|---|---|---|---|
| **Supply at 400/230 V Contact demand less than 50 kVA** | | | |
| Unit charge (Rs./Unit) | 5.30 + | 4.00 + | 3.00 (off peak) 8.35( peak 6 pm) to 9 p.m. |
| Fixed charge (upto 10 10 kVA) Rs | 43.00 or | 43.00 or | 43.00 or |
| Fixed charge (above 10 kVA) Rs. | 205.00 | 205.00 | 205.00 |
| **Supply at 400/230V Contact demand 50kVA and above** | | | |
| Demand charge (Rs/kVA | 256.00 + | 222.00 + | 102.00 + |
| Unit charge (Rs./Unit) | 5.20 + | 3.80 + | 3.60 (off-peak + 8.40 (peak 6p.m. to 9 p.m. + |
| Fixed charge (Rs.) | 408.00 | 408.00 | 408.00 |

**HT Supply at 11 kV 33kV And 132kV**

| | | | |
|---|---|---|---|
| Demand charge (Rs./kVA) | 239.00 + | 196.00 + | 94.00 + |
| Unit charge (Rs./Unit) | 5.00 + | 3.65 + | 3.40 (off-peak + 8.00 (peak 6 p.m. to 9 p.m. + |
| Fixed charge (Rs.) | 408.00 | 408.00 | 408.00 |

Average Price for 1994—3.76 Rs/ Kwh.

**Annex C. (i) - 2**

**ELECTRICITY BOARD**
***Effective from 15th March ,2008***

| *Tariff category* | *Unit charge (Rs/kWh)* | *Fixed Charge (Rs/month)* | *Demmand Charge (Rs/kVA)* |
|---|---|---|---|
| **Domestic Purpose** | | | |
| for those who confume | | | |
| Up to 30 units per month | 3.00 | 60.00 | |
| in excess of 30 and up to 60 units per month | 4.00 | 90.00 | |
| in excess of 60 and up to 90 units per months | 5.50 | 90.00 | |
| in excess of 90 and up to 120 units per month | 10.00 | 90.00 | |
| in excess of 120 and up to 180 units per month | 11.00 | 90.00 | |
| in excess of 180 and up to 240 units per month | 15.00 | 90.00 | |
| in excess of 240 and up to 360 units per month | 18.00 | 90.00 | |
| in excess of 360 and up to 600 units per month | 21.00 | 90.00 | |
| above 600 units | 25.00 | 3000.00 | |
| **Religious Purpose** | | | |
| For those who consume — | | | |
| Up to 30 units per month | 2.50 | 60.00 | |
| in excess of 30 and up to 60 units per month | 3.00 | 90.00 | |
| in excess of 60 and up to 90 units per months | 4.50 | 90.00 | |
| in excess of 90 and up to 120 units per month | 9.00 | 90.00 | |
| in excess of 120 and up to 180 units per month | 10.00 | 90.00 | |
| in excess of 180 and up to 240 units per month | 14.00 | 90.00 | |
| in excess of 240 and up to 360 units per month | 15.00 | 90.00 | |
| in excess of 360 and up to 600 units per month | 20.00 | 90.00 | |
| above 600 units | 22.00 | 3000.00 | |
| **LECO** | | | |
| L - 1 | 12.00 | | 675.00 |
| L - 2 | 8.50 | | 650.00 |
| **General purpose** | | | |
| GP - 1 | 15.00 | 240.00 | |
| GP - 2 | 13.80 | 3000.00 | 750.00 |
| GP - 3 | 13.60 | 3000.00 | 675.00 |
| **Industrial purpose** | | | |
| 1 - 1 | 10.00 | 240.00 | |
| 1 - 2 | 8.10 | 3000.00 | 675.00 |
| 1 - 3 | 8.00 | 3000.00 | 650.00 |
| 1 - 2 (T D ) peak | 22.00 | 3000.00 | 650.00 |
| Off - peak | 7.50 | | |
| 1 - 3 (T D) peak | 20.00 | 3000.00 | 650.00 |
| Off - peak | 7.10 | | |
| **Hotel purpose** | | | |
| H -1 (GP) | 15.00 | 240.00 | |
| H- 2 (GP) | 13.80 | 3000.00 | 675.00 |
| H – 2 | 8.10 | 3000.00 | 650.00 |
| H-3 | 8.00 | 3000.00 | 650.00 |
| H-2 (1-TD) peak | 22.00 | 3000.00 | 650.00 |
| Off peak | 7.50 | | |
| H –3 (1-TD) peak | 20.00 | 3000.00 | 650.00 |
| Off –peak | 7.10 | | |
| **Standby Tariff** | | | |
| 1 –2 (ST) | 8.10 | 3000.00 | 675.00 |
| 1 –3 (ST) | 8.00 | 3000.00 | 650.00 |
| **Street Lights** | 19.00 | | |
| **3 part Time of Day Tariff** | | | |
| **Industrial Hotel purpose** | | | |
| 1– 2(TD3) Peak (18.30 hrs - 22.30hrs) | 23.00 | 3000.00 | 650.00 |
| day (04.30hrs-18.30hrs) | 7.30 | | |
| off peak (rest of the time) | 5.30 | | |
| 1-3 (TD3) peak (18.30hrs. - 22.30hrs) | 21.00 | 3000.00 | 650.00 |
| day (04.30hrs –18.30 hrs | 6.90 | | |
| Off-peak (rest of the time) | 5.00 | | |

Fuel Adjustment Charge—30%
A Fuel Adjustment Charge of 30% charged on all units consumed by all consumers
Except for domestic consumers consuming less than 90 units per month & all RPconsumers
Average Price without Fuel Adjustment Charge—11.62 Rs/kwh
Average Price with Fuel Adjustment Charge—14.50 Rs/kwh

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, a (ii)හි total liability එක කීයද? [බාධා කිරීමක්] Hon. Minister, I am asking a question: the total liability as per a (ii).

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)

I am not going to answer it in detail for the reason that I tabled the Answer. The Answer is running into about six pages.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am only asking the answer for a (ii): the total liblility. That is a one - line question.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)

That is also a very detailed reply.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Liability is liability.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)

I think the understanding is to table Answer during the second round.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

No, It is not so. Hon. Speaker, we have decided that if the relevant Member is here, supplementary question can be asked by him.— [*Interruption*]. So, what is the purpose?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙමත් තීරණයක් තිබෙනවා, දෙ වන වටයේදී අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්ය කියා. තව මිනිත්තුවක් විතර තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක ඇමතිතුමාට කියලා දෙන එක හොඳයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම දෙයක් ඔතැන තිබෙනවා ද?

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)
ගරු කථානායකතුමනි, පිළිතුර තිබෙනවා. What is your question, Hon. Member?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

What is the total liability of the Ceylon Electricity Board?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය ෆයිල් එක දුන්නා නම් හරි නේ.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)
(ඇ) (ii) 1994 ඒක පුද්ගල ණය රුපියල් 1,734.22යි. 2007 ඒක පුද්ගල ණය රුපියල් 5,682.60යි.

## ප්‍රතිසංස්කරණ හා සංවර්ධන නියෝජිත ආයතනය : වෙන් කළ මුදල්

### மின்கட்டமைப்பு மற்றும் அபிவிருத்தி முகவர் நிலையம் : பண ஒதுக்கீடு

### RECONSTRUCTION AND DEVELOPMENT AGENCY : MONEY ALLOCATED

0074/'08

3. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2005 සහ 2006 යන වර්ෂවලදී අය වැය මගින් ප්‍රතිසංස්කරණ හා සංවර්ධන නියෝජිත ආයතනය (RADA) සඳහා මුදල් වෙන් කරනු ලැබ තිබුණේද;

(ii) එම මුදල් ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ වැයශීර්ෂය මගින් රාඩා (RADA) ආයතනයට මාරු කර තිබුණේද;

(iii) එසේ නම් එම මුදල් ප්‍රමාණය සහ එය ලබා දුන් දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත බී ඇන්ඩ් කේ හෝල්ඩින්ග්ස් හරහා දෙන ලද මුදල් යොදා ගෙන නිවාස ඉදි කරනු ලැබුවේද යන්න පිළිබඳව රජය සොයා බලා තිබේද;

(ii) ඔවුන්ට පසු විපරම් කිරීමට නොහැකි වූයේ නම්, ඔවුන්ට එය ලබා දීමට හේතුව කවරේද;

(iii) මෙය රජය විසින් ප්‍රසිද්ධියේම ක්‍රියාත්මක කරන ලද ''මහ දවල් සිදු කළ මං කොල්ලයක්'' නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

பிரதம அமைச்சரும் உள்ளக நிர்வாக அமைச்சரும் பாதுகாப்பு, பொதுமக்கள் பாதுகாப்பு, சட்டமும் ஒழுங்கும் பிரதியமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) (i) 2005, 2006 ஆம் ஆண்டுகளில் வரவு செலவுத் திட்டம் ஊடாக, மீள்கட்டமைப்பு மற்றும் அபிவிருத்தி முகவர்களுக்கு (RADA) பணம் ஒதுக்கப்பட்டதா என்பதையும்,

(ii) இந்தப்பணம் RADA விற்கு தேசிய வரவு செலவுத்திட்ட திணைக்களத் தலைப்பு மூலம் மாற்றி அனுப்பப்பட்டுள்ளதா என்பதையும்,

(iii) ஆமெனில், அப்பணத்தொகையையும் திகதியையும்

அவர் சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) பி அன் கே கோல்டிங்ஸ் லிமிரெட் ஊடாக வழங்கப்பட்ட பணத்தில் இருந்துதான் வீடுகள் கட்டப்பட்டன என்ற விடயத்தை அரசாங்கம் கவனத்தில் எடுத்து விசாரித்ததா என்பதையும்,

(ii) அவ்வாறு அவர்களால் பின்தொடர் நடவடிக்கை எடுக்க முடியாது இருப்பின், அதை இவர்களுக்கு வழங்கியதற்கான காரணம் என்ன எனவும்

(iii) இது வெளிப்படையாகவே அரசாங்கத்தால் உந்தப்பட்ட ஒரு "பகற் கொள்ளையல்லவா" என்பதையும்

அவர் இச்சபைக்குக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன் ?

asked the Prime Minister, Minister of Internal Administration and Deputy Minister of Defence, Public Security, Law and Order:

(*a*) Will he inform this House,—

(i) whether money had been allocated for Reconstruction and Development Agency (RADA) in 2005, and 2006 through the Budget;

(ii) whether the money had been transferred to RADA through the National Budget Department Head; and

(iii) if so, the amount and the date?

(*b*) Will he state,—

(i) whether, the Government has looked into that the houses had been built from the monies given through B&K Holdings Limited;

(ii) if they could not follow up, what the reason was to give it to them; and

(iii) whether this is not a 'daylight robbery' openly pursued by the Government?

(*c*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) (i) නැත.
(ii) ඔව්.
(iii) ප්‍රතිපාදන ලබා දී ඇති දිනයන් රු. මිලියන 200-2006.02.08
රු. මිලියන 166 - 2006.11.29

(ආ) (i) ඔව්.
රාඩා ආයතනයේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා විසින් ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවල මුදා නොගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිවාස ඉදි කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට ජීඑස් බිල්ඩර්ස් ඇන්ඩ් කන්සල්ටන් ආයතනයට පවරන ලදී. ඒ අනුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ නිවාස ඒකක 400ක් ඉදි කිරීමේ කටයුතු සඳහා බී ඇන්ඩ් කේ හෝල්ඩින්ස් සමාගම තෝරා ගන්නා ලදී. බී ඇන්ඩ් කේ හෝල්ඩින්ස් සමාගමේ කටයුතු සුපරීක්ෂණය හා අධීක්ෂණය ජීඑස් බිල්ඩර්ස් ඇන්ඩ් කන්සල්ටන් සමාගම විසින් සිදු කරන ලද අතර ඔවුන්ගේ සහතික කිරීම මත රු. මිලියන 43ක් බී ඇන්ඩ් කේ හෝල්ඩින් සමාගමට ගෙවන ලදී. රු. 43,687,068.20ක ගෙවීම රාඩා ආයතනයේ සභාපති හා ප්‍රධාන මෙහෙයුම් නිලධාරි විසින් 2006 වසරේදී අනුමත කරන ලදී.
(ii) පසු විපරම් කරන ලදී.
(iii) නැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මෙම ප්‍රශ්නයේ "b" කොටසට පිළිතුර කියවනවා නම් හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අපි එකඟතාවකට පැමිණ ඇති පරිදි අය වැය විවාදය ආරම්භ කළ යුතු වෙලාව දැන් පැමිණ තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් වෙලාව පෙ. ව. 10.00යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම එක ප්‍රශ්නයකට උත්තරයක් ඇහැව්වේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මේකෙන් අහලා තිබෙන්නේ මේ එල්ටීටීඊ කොම්පැනියට; B & K Holdings Limited එකට සල්ලි දීලා තිබෙනවාද නැද්ද කියලායි. එච්චරයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

සම්පූර්ණ පිළිතුර තිබෙනවා නේද? [බාධා කිරීමක්]

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රචාරක කටයුතු : වාහන
### அபிவிருத்தி லொத்தர் சபையின் பிரச்சார நடவடிக்கைகள் : விபரம்
### PROPAGANDA ACTIVITIES OF DEVELOPMENT LOTTERIES BOARD : VEHICLES

0368/'08

**7. ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ගරු රංජිත් අලුවිහාරේ මහතා වෙනුවට)**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே - சார்பாக)
(The Hon. M. Joseph Michael Perera - on behalf of The Hon. Ranjith Aluvihare)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය ,—(1) :

(අ) (i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රචාරක කටයුතු සඳහා ඇති වාහන සංඛ්‍යාව කොපමණද;
(ii) මෙම වාහන අතුරින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතු වාහන කවරේද;
(iii) ඒවායේ වර්ගය සහ ලියාපදිංචි අංක කවරේද;
(iv) මෙම ආයතනයට මාසික කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන කවරේද;
(v) එම වාහනවල වර්ගය, අංකය සහ මාසික කුලිය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මෙම වාහන පාවිච්චි කරන්නේ කවුරුන් විසින්ද;
(ii) මෙම වාහන සඳහා මාසිකව වැය කරන ඉන්ධනවල වටිනාකම කොපමණද;
(iii) කුලී පදනම මත ලබා ගෙන ඇති වාහනවල අයිතිකරුවන් කවුරුන්ද;
(iv) මෙම වාහනවල අයිතිකරු සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා අතර ඇති සම්බන්ධතාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) அபிவிருத்தி லொத்தர் சபையின் பிரச்சார நடவடிக்கைகளுக்காக உள்ள வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்,
(ii) இவற்றுள் அபிவிருத்தி லொத்தர் சபைக்கு சொந்தமான வாகனங்கள் யாவை யென்பதையும்,
(iii) அவற்றின் வகை மற்றும் பதிவு இலக்கங்கள் யாவையென்பதையும்,
(iv) மேற்படி நிறுவனத்திற்கு மாதாந்த வாடகை அடிப்படையில் பெற்றுக்கொள்ளப்பட்ட வாகனங்கள் யாவை என்பதையும்,
(v) மேற்படி வாகனங்களின் வகை, இலக்கம் மற்றும் மாதாந்த வாடகை ஆகிய விபரங்கள் வெவ்வேறாக யாவையென்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி வாகனங்களை பயன்படுத்துவது யாரென்பதையும்,

(ii) மேற்படி வாகனங்களுக்காக மாதாந்தம் பயன்படுத்தப்படும் எரிபொருளின் பெறுமதி யாதென்பதையும்,

(iii) வாடகை அடிப்படையில் பெற்றுக்கொள்ளப்பட்டுள்ள வாகனங்களின்உரிமையாளர்கள் யாரென்பதையும்,

(iv) மேற்படி வாகன உரிமையாளர்களுக்கும் அபிவிருத்தி லொத்தர் சபையின் தலைவருக்குமிடையேயுள்ள தொடர்பு எவ்வகையானதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning,:

(*a*) Will he submit to this House separately,—

(i) the number of vehicles that are used for propaganda activities of the Development Lotteries Board;

(ii) out of those vehicles, the vehicles that belong to the Development Lotteries Board;

(iii) the makes and the registration numbers of the aforesaid vehicles;

(iv) the vehicles that have been obtained for this institution on the basis of monthly rent; and

(v) the makes, registration numbers and the monthly rentals of the aforesaid vehicles?

(*b*) Will he state,—

(i) the names of the persons who use these vehicles;

(ii) the amount of money spent monthly on fuel for the aforesaid vehicles;

(iii) the names of the owners of the vehicles that have been obtained on the basis of rent; and

(iv) the relationship that exists between the owner of these vehicles and the Chairman of the Development Lotteries Board?

(*c*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) (i) වාහන 23යි.

(ii) සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අයත් වාහන නොමැත.

(iii) පැන නොනඟී.

(iv) වාහන 27යි.

(v)

| වාහන වර්ගය | වාහන අංකය | මාසික කුලිය |
|---|---|---|
| නිසාන් වෑනට් | GB - 5672 | 40,000/- |
This is the reason why we are looking at the war. What has been done by the yet heroic armed forces, they cannot carry on in a proper way. They take the Hon. Keheliya Rambukwella in to do that. The very people who helped the Government - we may have differences in our thinking with the JVP - the JVP played a pivotal role and even the President had the graciousness to say they had the support of the JVP. What has happened now? Where are the people like Wimal Weerawansa who then said, ලෝක වෙළෙඳ පොළේ මිල වැඩි වෙන කොට මේ රටේත් මිල වැඩි කරනවා නම්, මොකටද ආණ්ඩුවක් කිව්වා. දැන් ඒ ශබ්දය කොහේද? දැන් බොර තෙල් මිල US Dollars 136 සිට US Dollars 60 දක්වා අඩු වන විට අහිංසක ජනතාවට, ත්‍රීවිලරයක් දුවන කට්ටියට රුපියල් 85ට තෙල් විකුණන්න හැකියාවක් නැත්නම් මොනවාද මේ ආණ්ඩුව කරන්නේ? බද්දක් දානවා, ඒ තිබෙන තත්ත්වය නැති කරන්න. බටහිර ලෝකයට බැණ බැණ ඉන්න හෙළ උරුමයේ චම්පික රණවකලාගේ කට්ටිය එක්ක මේ රට හදන්නට පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. සුද්දන්ට බණිනවා. අපිත් බණිමු ඒකෙන් අපට ප්‍රතිලාභයක් ලැබෙනවා නම්. ඒක හරි. නමුත් සුද්දා එදා මේ රටේ හදපු දුම්රිය මාර්ගවලට වඩා එක කිලෝමීටරයක් අද හදලා තිබෙනවාද? පාරවල් හදා තිබෙනවාද? බැණලා අපට ප්‍රතිලාභයක් ලැබෙනවා නම් එහෙම කරමු. Labour GSP වාගේ දෙයක් අහිමි වීමෙන් ඒ මිලියන විසිඑක්දාහත් අපේ අහිංසක ජනතාවට ගෙවන්න වෙනවා නම්, මේ රටේ නිෂ්පාදනයක් හැටියට ඇඟලුම් කර්මාන්තයෙන් නිපද වන ඇඳුමක් පිට රට සුද්දෙක් පාවිච්චි කරන කොට ඒකටත් අපි ගෙවන්න ඕනෑ නම් දේශීයත්වය තිබෙන්නේ කොහේද ගරු කථානායකතුමනි? මේවායින් තමයි ඊයේ අය වැය තුළින් අපට ප්‍රතිඵලයක් ලැබුණාද නැද්ද කියන කාරණය ඉස්මතු වෙන්නේ.

Now yesterday's "Daily News" under the headline states, "Priority for Development, CoL" The Hon. Ranjith Siyambalapitiya, Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning states in the same newspaper, "People's welfare, long term development". If you take the headline, "Priority for Development, CoL", where on earth do you find this?

Then "The Nation" newspaper states, "Mahinda to deliver a realistic Budget". So, it means that up to now he has been delivering unrealistic Budgets. This is a newspaper that is under their own family and it states, "Mahinda to deliver a realistic Budget."

So, Hon. Speaker, all we have got to say is, ගිය අවුරුද්දේ අය වැයේ තිබුණු පොරොන්දු ක්‍රියාත්මක වුණා නම් ඒකෙන් අපට කියන්නට පුළුවන්, මේ අවුරුද්දේ අය වැයෙන් යම් විධියේ ප්‍රතිලාභයක් ලැබෙනවාද නැද්ද කියන එක. ගිය අවුරුද්දේ කිව්වා, "වැට්" එක සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරනවාය කියා. තෙල් මිල සම්බන්ධයෙන් එහෙම කිව්වා. නමුත් තෙල් මිල අඩු වුණාමත් අඩු කර තිබෙන්නේ සියයට 5ක් විතරයි. ගිය අවුරුද්දේ දුන් අය වැය පොරොන්දු ටිකවත් හරියට සාක්ෂාත් කරන්න බැරි ආණ්ඩුවක් මොනවාද මේ කථා කරන්නේ? ඊට පස්සේ, Environment Conservation Levy Act එකක් introduce කරනවාය කිව්වා. නමුත් කළේ නැහැ. ප්‍රතිලාභයක් ලබා දෙනවාය කියා ජනතාවට පෙන්නුවා. ඒක ලැබුණේ නැහැ. Milk and dairy products, VAT එකෙන් exempt කරනවාය කියා ගිය අවුරුද්දේ කිව්වා. දේශීය නිෂ්පාදනයක් වන කිරි නිෂ්පාදනය වැඩි කරන්නට අවශ්‍යයි, එම නිසා ඒක "වැට්" එකෙන් අහක් කරන්නට ඕනෑය කිව්වා. ඒ නිෂ්පාදනය වැඩි වුණාද? එදා ප්‍රතිලාභයක් ලැබුණා නම්, ඒක මේ අවුරුද්දටත් ගෙන යන්නට පුළුවන් නම් වටිනාකමක් තිබෙනවා. ඒක වුණේ නැහැ. එතකොට Social Responsibility Levy එක from 1 per cent to 1.5 per cent increase කරනවාය කියා කිව්වා, in support of further strengthening the National Action Plan for children. ඒ අහිංසක දරුවන්ට මොනවාද කළේ? සල්ලි මිලියන තුන්දාහක් විතර එකතු කර ගත්තා. නමුත් කිසි ප්‍රතිලාභයක් ඒ දරුවන්ට ගියේ නැහැ. අඩු ගණනේ පළමු වන ශ්‍රේණියට ළමයින් ටික ඇතුළත් කරන්න ක්‍රමයක් හදන්න බැරි ආණ්ඩුවක්. එදා එක්සත් ජාතික පක්ෂය දුන් කිරි වීදුරුවවත් දෙන්න බැරි ආණ්ඩුවක්. ගිය අවුරුද්දේ සහන දෙනවාය කිව්ව ආණ්ඩුවක්. ඒක වෙලා තිබෙනවාද?

පසු ගිය අය වැය ලේඛනයෙන් රජයේ සේවකයන් ගැන කිව්වේ මෙහෙමයි: "Public servants will get a cost-of-living allowance of Rs. 2,500 from January 2008 and to Rs. 2, 875 from July 2008 in addition to their monthly salary." මේකෙන් රුපියල් පන්දාහක් විතර ලැබෙනවාය කියා පෙන්නුවා. ගිය අවුරුද්දේ ඒ විධියට ලැබුණාද කථානායකතුමනි? 2007 වර්ෂයේ අය වැය ලේඛනයෙන් කියපු ඒවා මට කියන්න පුළුවන්. මට කියන්න පුළුවන් 2006 අය වැය ලේඛනය ගැන. මට කියන්න පුළුවන් තමුන්නාන්සේලාගේ පළමු වන අය වැය ලේඛනය ගැනත්. මට යන්නට පුළුවන්, හතර වැනි අය වැයට. අන්තිමට එදත් අදත් දීලා තිබෙන පොරොන්දු ක්‍රියාත්මක කරන්න බැරි වී තිබෙන මහින්ද චින්තන අය වැය තුළින්, ඉදිරියටත් යම් විධියක ප්‍රතිලාභයක් ලැබෙනවාද? ඒ නිසායි අපි මේ අවස්ථාවේදී කියන්නේ මේක ජනතාවට කොළය වහලා අමානුෂික අන්දමින් පීඩා කරන ආණ්ඩුවක්ය කියා.

තවත් කාරණයක් මම අහන්න කැමැතියි. ගරු කථානායකතුමනි, මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා කථා කළාට පස්සේ අය වැය ලේඛනයේ II වන කොටස තුළින් තමයි අය වැය යෝජනා සම්පිණ්ඩනය කරලා ඉදිරිපත් කළේ. අය වැය යෝජනා හතළිස්අටක් විතර මේ සැරේ ඉදිරිපත් කළා. ගිය සැරේ අය වැය යෝජනා පනස්නවයක් ඉදිරිපත් කළා. අඩු ගණනේ ඒ යෝජනාවලින් හතළිහක් අල්ලලාවත් නැහැ.

මේ අවස්ථාවේදී අපි වියදම් ලේඛනය දෙස බලමු. ඊයේ කිව්වා පොහොර සහනාධාරයක් දෙනවාය කියලා. අය වැයේ 44 වන යෝජනාව යටතේ වී වගාවට දෙන පොහොර සහනාධාරය පිළිබඳව කිව්වා. අමාරු තත්ත්වයක් තිබෙන තේ කර්මාන්තය සම්බන්ධයෙන් පොහොර සහනාධාරයක් දෙනවා කිව්වා. ඒකට තීන්දු කර තිබෙනවා, රුපියල් 2,500ට තියෙන පොහොර රුපියල් 1,000ට දෙන්න. නමුත් ඒ සහනාධාරය මේ වියදම් ලේඛනයේ අඩංගු වෙලා තිබෙනවාද? මේකේ තියෙනවා රුපියල් මිලියන 53,525ක වියදමක් දරන්න පුළුවන් කියන අදහසක්. නමුත් පොහොර සහනාධාරය සම්බන්ධ ඒ වියදම වියදම් යෝජනාවෙන් කිසි සේත්ම ඉදිරිපත් කර නැහැ.

ඒ වාගේම ඇඟලුම් කර්මාන්තය වැටෙන්න යනවාය කියනවා. යුරෝපා හවුල අපේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගහන්නේ නැහැ කියනවා. අපි ඒවා කිසි සේත්ම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. එක පැත්තකින් විදේශ ඇමති කියනවා, යුද්ධය නවත්වන්නය කියා හෝ මානව අයිතිවාසිකම් ප්‍රශ්නයක් කියා හෝ ඇඟලුම් කර්මාන්තයට කවුරුවත් ඇඟිලි ගහලා නැහැ කියලා. අනෙක් පැත්තෙන් ආණ්ඩුව කියනවා යුරෝපා හවුල ඇඟිලි ගහනවා කියලා. ඇඟලුම් කර්මාන්තයට පරිත්‍යාගයක් හැටියට ඒ ගොල්ලන් Labour GSP එකෙන් මිලියන 21,000ක් දෙන කොට, "අපේ රටට ඇඟිලි ගහන්න එපා. අපට ඕනෑ නැහැ. අපට ශක්තිමත් ආර්ථිකයක් තිබෙනවා" කියලා ලංකාවේ අය කථා කරනවා. මේ ඇඟලුම් කර්මාන්තයට එවැනි අලාභයක් වුණොත් ඒ සහනය ලබා දෙන්නම් කිව්වාට, අපි දන්නවා දෙසැම්බර් මාසයේ 31 වන දා වන විට ඒ සහනය නැවතෙන බව. මේ මිලියන 21,000 ලක්ෂ හතරක තරුණ තරුණියන්ගේ රක්ෂාවලට සෘජුව බලපානවා. මේක තමයි අනෙක් අභිරහස. නිදහස් වෙළෙඳ කලාප සංකල්පය ඔබතුමාත් හිටපු 1977 ආණ්ඩුවේ ඉඳන් ආපු දෙයක් නේද ගරු කථානායකතුමනි. අපි රක්ෂා ඇති කර දෙනවා. දකුණෙන් ළමයි ඇවිල්ලා ඒ රක්ෂා කළත්, එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව ඡන්දය දෙන්න ඒ ගොල්ලන්ට අයිතියක් තිබෙනවා. ඒත් ඒ ගොල්ලන්ගේ ඒ රැකීරක්ෂා ආරක්ෂා කිරීම විපක්ෂයේ හිටියත් අපේ වගකීමක් නොවෙයිද? ඒ රුපියල් මිලියන 21,000 මුදල් ප්‍රමාණය ලැබුණේ නැත්නම් ඒ අයගේ රැකියා නැති වෙනවා. ඒ රැකියා නැති වන අවස්ථාවේදී මොනවාද වෙන්නේ? ඊට පසුව ඒ සඳහා දෙන සහනාධාර වැඩි කරන්න පටන් ගන්නවා. ඉතින් ඒ රුපියල් මිලියන 21,000 අය වැයට ඇතුළත් කරලා තිබෙනවාද? නැහැ.

ඒ වාගේම අය වැයක් ඉදිරිපත් කරන කොට ඒකේ ප්‍රායෝගිකභාවය -practicality- ගැන යම් විධියකින් බලන්න අවශ්‍යයි. කිසි සේත්ම ප්‍රායෝගික මට්ටමෙන් නොවෙයි වියදම තිබෙන්නේ කියන එක මේකෙන් පෙන්වනවා. ගිය අවුරුද්දේ ප්‍රාග්ධන වියදම හැටියට රුපියල් බිලියන 434ක්, -රුපියල් කෝටි 43,400ක්- වියදම් කර තිබෙනවා වාගේම ඒක මේ අවුරුද්දේ රුපියල් බිලියන 2කින් -රුපියල් කෝටි 200කින්- තමයි වැඩි කර තිබෙන්නේ. මේ වියදම අඩු ගණනේ උද්ධමන තත්ත්වයට අනුවවත් වෙන් කර නැති එක අපට විශාල ප්‍රශ්නයක්.

ඒ වාගේම මේ රටේ ගිය අවුරුද්දේ ආදායම රුපියල් බිලියන 750ක් -රුපියල් කෝටි 75,000ක්- වශයෙන් ඇස්තමේන්තු කළාට දැනට ප්‍රායෝගික වශයෙන් ආදායම උත්පාදනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ රුපියල් කෝටි 67,500යි. ඉතින් ඉතිරි රුපියල් කෝටි 7,500 කොයි ආකාරයෙන්ද ලබා ගන්න පුළුවන් වන්නේ? ඒක සාක්ෂාත් කර ගන්න බැරි අවස්ථාවක, ඉදිරි අවුරුද්දේ ආදායම හැටියට රුපියල් කෝටි 87,500ක් -රුපියල් බිලියන 875ක්- උත්පාදනය කරන්න පුළුවන් කියලා හිතනවා. ඉතින් මෙවැනි අවස්ථාවක හිඟය පටන් ගන්නේ රුපියල් බිලියන 344න් -රුපියල් කෝටි 34,400න්- නම්, මෙවැනි ආදායමක් කිසි සේත්ම ප්‍රායෝගිකව ලබා ගන්න බැරි නම් තව රුපියල් කෝටි 10,000කින් නොවෙයිද හිඟය පටන් ගන්නේ? එතකොට පටන් ගන්නා හිඟය කෙළින්ම රුපියල් කෝටි 44,400ක් නොවෙයිද? නිකම් විජ්ජාවට මේ වාගේ ඉලක්කම්වලින් හිඟය අඩු කරලා, ආදායම වැඩි කරලා පෙන්වලා, වියදම හරියාකාරව ඉදිරිපත් කළේ නැති වුණාම අපි මේ කථා කරන්නේ මොනවා සම්බන්ධයෙන්ද? ඒ නිසා වෙන්න පුළුවන්, අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා උදේට පාර්ලිමේන්තුවේ ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැත්තේ? මොකද, උත්තර දුන්නොත් හිර වෙනවා. හිර වුණාට පසුව ඒකට උත්තර දෙන්න බැරි වෙනවා. ඒ ප්‍රශ්න අපි අහන්නේත් ඒ සම්බන්ධයෙන් ඇත්ත තත්ත්වය හෙළිදරවු කරන්නයි. ඉතින් එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපේ යුතුකමක් තිබෙනවා, මේකේ ඇත්ත

[ගරු රවි කරුණානායක මහතා]

තත්ත්වය ඇත්ත ආකාරයෙන් ප්‍රකාශ කරන්න. The capital expenditure for the year 2008 was Rs. 432 billion and with the 30 per cent inflation, there should be at least an allocation of Rs. 480 billion for the next year. But that has not been made. They have allocated only Rs. 434 billion. That is only a two billion rupees increase over the last year. So, that means either there is no capital expenditure or they only pay lip service and not expend that in the actual way. When you look at the Supreme Court judgment, the total Budget deficit is not Rs. 344 billion, it is Rs. 844 billion. If you add on Rs. 95 billion which is due to unrealistic revenue targets and also add on an expenditure of Rs. 100 billion for understating of expenditure to that, you are going to have a deficit of Rs.1,039 billion.

කෝටි 1,39,000ක අය වැය හිඟයක් තිබෙනවා. මේක පියවන්න තමයි අපි මෙච්චර දඟලන්නේ. එක පැත්තකින් අපේ අදහස් ඉදිරිපත් කරනවා. අනික් පැත්තෙන් ඒ අදහස් තුළින් එය පියවන්නේ කොහොමද කියා අප කථා කරනවා. මේ අතරතුරේදී තමයි අපි -එක්සත් ජාතික පක්ෂය- විකල්ප අය වැයක් ඉදිරිපත් කර තිබෙන්නේ. අපි මේක ඉදිරිපත් කර තිබෙන්නේ ආණ්ඩුව කිසි සේත්ම අපහසුතාවට පත් කරන්න නොවෙයි. ආණ්ඩුව ජනතාව පැත්තෙන් බලන්නේ නැතිව ඡන්ද කාලයට විතරක් ඒ අය ගැන කථා කරනවා. බලයට ආවාට පසුව යුද්ධය විකුණලා, මේ ඔක්කොම යුද්ධය නිසාය, යුද්ධයට විරුද්ධව කථා කරන්න එපා, විරුද්ධව කථා කළොත් ඒක ජාති ද්‍රෝහිකමක්ය කියමින් ජනමාධ්‍ය අතේ තියා ගෙන මේ වැඩ කටයුතු කරන්න තමයි අදහස් කරන්නේ. ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය වශයෙන් අප මේකේ හරි පැත්ත පෙන්වන්න අවශ්‍යයි කියන එක මා හිතන්නේ ඔබතුමාත්, මේ ගරු සභාවේ සියලු දෙනාත් පිළි ගන්නවා ඇති. ඒකට අද අප පුළුවන් තරම් ප්‍රයත්න දරනවා. කොහොමද මේක ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ කියා පැහැදිලි කර දෙන්න අපි උත්සාහ කරනවා.

Hon. Speaker, if you look at what I have just highlighted, the budget deficit, you would also see - මේ කියන අවස්ථාවේදීම, ගිය සුමානයේදීම ඩොලර් එක පාවෙන්න ඉඩ හැර තිබෙනවා. අවුරුද්දක් විතර ඒක රැක ගෙන, රු.107.75ට, 108ට යන ඒ මිල ප්‍රමාණය තුළ තියා ගෙන, එක පාරටම ගිය සුමානයේ ඒක පාවෙන්න ඉඩ දුන්නා. ඒ පාවෙන්න ඉඩ හැරීමෙන් පළමු වෙනි දවස තුළම රුපියල් 2.38ක අවප්‍රමාණයක් ඇති වුණා. මේ අවප්‍රමාණය ඇයි මා මේ අවස්ථාවේදී මතක් කරන්නේ? අය වැය ඇස්තමේන්තුවල මෙවැනි බලපෑමක් සඳහන් කර නැහැ. සියයට 2.25ක අවප්‍රමාණයක් කියන්නේ සම්පූර්ණ ණයබරතාව විදේශීය ණය මට්ටමෙන් බැලුවොත්, බිලියන 1,381යි. මා මේවා උපුටා ගෙන තිබෙන්නේ මහ බැංකුවේ වාර්තා තුළින්. බිලියන 1,381ක් - කෝටි 1,38,100ක් - වන අවස්ථාවක සියයට දෙකහමාරක අවප්‍රමාණයක් කියන්නේ, මේ රටේ ණයබරතාව බිලියන 34ක් - කෝටි 3,400ක් - මේ දවස් දෙක තුළ වැඩි වෙලා තිබෙන බවයි. ගරු කථානායකතුමනි, සමෘද්ධි වියදම සමඟ සංසන්දනය කළොත් එක දවසක් තුළ ඒකේ හතර ගුණයක් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඒ ප්‍රතිවිපාකය ඇති වෙලා තිබෙනවා. ඒක මේ අය වැය ඇස්තමේන්තුවලට එකතු කර තිබෙනවාද? නැහැ. දැන් ඊළඟට රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා කථා කරන විට කියයි, "ඔව්, ඔව් අද වැඩි වනවා, හෙට අඩු වනවා"ය කියා. ඒක නොවෙයි, අද තිබෙන තත්ත්වය අනුව අපට ඇත්ත තත්ත්වයක ශේෂ පත්‍රයක් ඉදිරිපත් කර තිබෙනවා නම් මේවායේ කරුණු අඩංගු කරන්න ඕනෑ. ඒක තුළින් එක දවසකින් කෝටි 3,400ක් නැති වුණා. මේ අවස්ථාවේදී මා ළඟ තිබෙනවා, IMF එකේ නිර්දේශ. එහි කියා තිබෙන්නේ සම්පූර්ණයෙන්ම මේ මුදල හරියාකාර මට්ටමේ නොවෙයි තිබෙන්නේ කියලායි; අඩු ගණනේ තව සියයට 18ක් Real Effective Exchange Rate යටතේ අඩු වෙන්න අවශ්‍යයි කියලායි. ඒක වුණොත් තවත් අවප්‍රමාණය වී මේ රටේ වියදම බිලියන 154ක් හෝ කෝටි 1,44,000කට වැඩි වේවි. මේක රජයට දරා ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද? මේක අපි පෙන්වූයේ නැති වුණොත් ඔබතුමන්ලා කියයි, විපක්ෂය වශයෙන් අපි මේවා කිව්වේ නැහැ කියා. ඒ වගකීම තිබෙන නිසා තමයි අපි මේක මේ අවස්ථාවේදී පෙන්වා දෙන්නේ. ගරු කථානායකතුමනි, වෙලාව ඉතිරි කර ගැනීම සඳහා මම මේ වාර්තාව හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

2006 මහ බැංකු වාර්තාවේ තිබෙනවා, "Sri Lanka - Outstanding Government Debt" කියලා. ඒකෙන් උපුටා ගෙන තිබෙන එකක් මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවසරය මත හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

පසුගිය මාස 4 තුළ විදේශ ණය ප්‍රමාණයක් මේ රජය අරගෙන තිබෙනවා. 2008 ජූනි 21 වන දා US Dollars 230 million අරගෙන තිබෙනවා. ඊට පස්සේ 23 වන දා US Dollars 150 million අරගෙන තිබෙනවා. ඊට පස්සේ සැප්තැම්බර් මාසයේ development bonds ඉදිරිපත් කර තිබෙනවා, US Dollars 60 millionවලට. ඊට පස්සේ ලංකා බැංකුව තුළින් නැවතත් සැප්තැම්බර් මාසයේ US Dollars මිලියන 30 කට development bonds විකුණා තිබෙනවා. නැවත ඔක්තෝබර් මාසයේ 8 වන දා development bonds, US Dollars මිලියන 300 ක් නිකුත් කර තිබෙනවා. එසේ නිකුත් කර හෙටට මාසයක් වෙනවා. අද වන තුරු ඩොලර් තඹ ශතයක් හොයා ගන්න බැරි වෙලා තිබෙනවා, මේ debenture bond එකට. ඒකෙන් පෙනෙන්නේ කොතරම් අවදානම් තත්ත්වයක අද ලංකාව තිබෙනවාද කියන එකයි. මේ ගැන ලංකාවට විතරක් නොවෙයි, අපි ලෝකයට බැණලා වැඩක් නැහැ. ලංකාවේ පරිපාලනය ගෙන යන්න තිබෙන්නේ අපේ ආණ්ඩුවටයි. ඒ ආණ්ඩුවට පරිපාලනය ගෙන යන්න තිබෙන හැකියාව ගැන තමයි අපේ විපක්ෂයෙන් මේ තර්ක විතර්ක කරන්නේ. මේ අවස්ථාවේදී රටේ අභ්‍යන්තර මට්ටමේ සුරැකුම් පත් සියයට 19ක පොලියට තිබෙන අවස්ථාවේදී ඒ අය ඒක පැත්තකට දමා පිට රට ණය ගන්න හදන්නේ සියයට 6ක, 7ක, 8ක පොලියට ගන්න පුළුවන් කියලා හිතා ගෙන. පසු ගිය වතාවේ HSBC ණය ගන්න විට අපි ඒක ගන්න එපා කිව්වා. ඇයි, අපි එහෙම කිව්වේ? අපි දැන ගත්තා, රටේ මුදල් ශක්තිය එතරම් ශක්තිමත් මට්ටමක නොවෙයි තිබෙන්නේ කියා. Capital market එක බැරි වෙලාවත් තාවකාලිකව අරින්න පටන් ගත්තොත් ඒකෙන් ඇති වන ප්‍රතිවිපාකය තමයි මම -ගිය සතියේ වුණු එක- කිව්වේ. දවසකින් අවප්‍රමාණය රුපියල් 2.38 නම්, ඒක සම්පූර්ණ ණයෙන් සියයට දෙකහමාරක අවප්‍රමාණයක් නම්, ආණ්ඩුවට ඒකෙන් බිලියන 34ක වියදමක් දරන්න වෙනවා නම් පිට රට ණය ගන්න ගන්න රුපියල ශක්තිමත් වුණේ නැත්නම් මොනවාද වෙන්නේ? අපේ වියදම වැඩි වෙනවා. ගරු කථානායකතුමනි, මෙතැන වගු දෙකක් තිබෙනවා. ගිය මාසයේ සිට ඩොලරය වෙනස් වීම නිසා ඇති වී තිබෙන භයානක සහ අමාරු තත්ත්වය ඒකෙන් පෙනෙනවා. එක වෙලාවක අපේ රටේ යූඑස් ඩොලර්ස් මිලියන 3,200ක සංචිතයක් තිබුණා. රුපියල ආරක්ෂා කරන්නට එදා බොහොම වුවමනාවක් තිබුණාට රුපියල් මිලියන 900කුත් දමලා රුපියල අවප්‍රමාණය වීම අඩු කරන්නට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ගිය සුමානයේ නැවතත් ඒක පාවෙන්නට ඉඩ හැරියේ. ගරු කථානායකතුමනි, එම වගු දෙක හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ වගේම IMF එක මේ රට සම්බන්ධයෙන් ඉදිරිපත් කරන දැක්මක් තිබෙනවා. එයින් එක ඡේදයක් මම උපුටා දක්වන්නම්.

"According to Sri Lanka's own real effective exchange rate(REER) index,"

---

*** *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

"Sri Lanka's own real effective exchange rate", ලංකාව අනුවම කියනවා.

"the rupee was overvalued by about 18 per cent in June, hurting the island's exporters but helping foreign hedge funds."

සාමාන්‍යයෙන් කියන්නේ මේ ආණ්ඩුව දේශීයත්වය ආරක්ෂා කරන ආණ්ඩුවක් කියලායි. රටේ අභ්‍යන්තර පරිපාලනය ගෙන යන මූල්‍ය ආයතන කියනවා, පිට රට මුදල් වංචාකරුවන් කියන්න පුළුවන් කට්ටියට, අපටත් ඇඟිල්ල දිගු කරන කට්ටියට උදවු කරන්න හදනවාලු. නමුත් දේශීයත්වය කියන එක නැති වෙලා තිබෙනවාලු. අපනයනකරුවන් සියයට 18ක් පාඩු ලබා තිබෙනවාය කියනවා. ඒ තුළින් කියන්නේ මොකක්ද? දංකොටුව පෝසිලේන් සමාගම ලංකාවට විශිෂ්ට සේවයක් කරනවා. ඒ නිෂ්පාදනවලින් සියයට 99ක් අපනයනය කිරීමයි කළේ. In "The Bottom Line" of Wednesday, 05th November, it states I quote:

"Unrealistic Exchange Unsettles Dankotuwa Porcelain."

ඒ නිසා අපට අවුරුදු 25ක් තිස්සේ ලැබූ ලාභය අද අලාභයක් බවට පත් වෙලා තිබෙනවා. ඒවාට දෙන උත්තරය මොකක්ද? එක්සත් ජාතික පක්ෂයේ අපි අහන්නේ මේ අය වැයෙන් දංකොටුව පෝසිලේන් ආයතනය වගේ දේශීයත්වයක් රකින්න පුළුවන් කොම්පැනියකට සහන ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙනවාද කියන එකයි. නැහැ, ගරු කථානායකතුමනි. මේ සම්බන්ධයෙන් කථා කළාම අපි දේශ ද්‍රෝහියෝ වෙනවා ද? නැහැ. එක්සත් ජාතික පක්ෂය එදා කිව්ව දේ අද සිද්ධ වෙලා තිබෙනවා. ඒකයි අපට තිබෙන දුක. එදා කියන කොට අඩු ගණනේ "කමක් නැහැ, විපක්ෂයෙන් කිව්වා" කියලා හිතලා, ඒ කියන එක අහලා ඒ වරප්‍රසාද ගත්තා නම් කමක් නැහැ. එහෙම නොවෙයි ඒ ගොල්ලන් හිතන්නේ. "නැහැ, කිව්ව නිසා අපි කරන්නේ නැහැ" කියලායි ඒ අය හිතන්නේ. ප්‍රශ්නයට වැටුණාට පස්සේ දැන් අපි මොකුත් කරන්න ඕනෑ නැහැ කියන මතයේ තමයි ඉන්නේ. ඊට පස්සේ ලෝකයට බණිනවා. දැන් ඇමෙරිකාවට බණිනවා. ඒ ගොල්ලන්ගේ ආර්ථිකය කඩා වැටිලා කියනවා. ඇමෙරිකාවේ ආර්ථිකය කඩා ගෙන වැටුණාය කියලා අපට තිබෙන ප්‍රශ්නය මොකක් ද? යුරෝපයේ ආර්ථිකය කඩා වැටුණාය කියලා අපට තිබෙන ප්‍රශ්නය මොකක් ද? ඉරානයේ ආර්ථිකය කඩා වැටුණාය කියනවා. ඉරානයෙන් ණය ගන්නවා කියලා මොකුත් කියනවාද? බනිජ තෙල් බැරල් එකක් ඇමෙරිකානු ඩොලර් 100ට අඩුවෙන් වික්කොත් ඒ රට භයානක ආර්ථික අර්බුදයකට යනවා කියලා ඉරානය කියනවා. ඒකට මෙහෙන් - අපේ විදේශ ඇමතිතුමා දන්නවා ඇති සිදු වන දේ- විදේශ ඇමැතිවරයකු යවන්න හදනවා ඉරානයටත් ණයක් ගැන කථා කරන්න. ගරු රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා දන්නවා ඇති, මම කියන්නේ කවුරු ගැන ද කියලා. ඔබතුමාට ඒක කරන්න පුළුවන් නේ. මොකද, තව කෙනෙක් යවන්න හදන්නේ? ඔබතුමාට පුළුවන් Labour GSP එක ගැන කථා කරන්න. මෙතුමා යන්නේත් නැහැ, වෙනත් කෙනෙකු යවනවා. විදේශ සම්බන්ධකමක්වත් නැති පුද්ගලයෙක්. ඉරානයට ගිහිල්ලා ඇඹිලි ගහන්න හදන්නේ මොකද? එතකොට ඒ තත්ත්වය එහෙමයි. එක පැත්තකින් ඇමෙරිකාවට බණිනවා. එක පැත්තකින් යුරෝපයට බණිනවා. එහෙනම් ඉරානයටත් බණින්න ඕනෑ නේ. මොකද, ඒ ගොල්ලන් දැන් ඩොලර් දෙකක් වැඩි මුදලට අපට බනිජ තෙල් විකුණනවා. මේ අවස්ථාවේ දී futures hedge කරලා තිබෙන නිසා තමයි, පෙට්‍රල් මිල රුපියල් 142කට මිල නියම වුණේ. එක්සත් ජාතික පක්ෂයෙන් අප ඉදිරිපත් කළ විකල්ප අය වැයෙන් රුපියල් 80කට මිල නියම කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ජනාධිපතිත් ඒකට ගරුත්වයක් දීලා තිබෙනවා. මා එය අගය කරනවා. මොකද, එක්සත් ජාතික පක්ෂය කිව්වා, "අද අපි ආණ්ඩුවේ සිටිනවා නම් භූමිතෙල් ලීටරය රුපියල් 59ට දෙනවා" කියලා. ඒ බව දැන ගෙන භූමිතෙල් ලීටරයක මිල රුපියල් 60 දක්වා අඩු කළා. අපි කිව්වා, "අපි ආණ්ඩුවේ සිටියා නම් ඩීසල් ලීටරයක මිල රුපියල් 80 දක්වා අඩු කරනවා" කියලා. දැන් ඩීසල් ලීටරය රුපියල් 85 දක්වා අඩු කර තිබෙනවා. ඉතින් මේ අප ඉදිරිපත් කර තිබෙන්නේ, ඔහේ අහසේ තිබෙන සංඛ්‍යා ලේඛන නොවෙයි ගරු කථානායකතුමනි. අපිටත් වග කීමක් තිබෙනවා. විපක්ෂයේ අවුරුදු 12ක් 13ක් ඉඳලා පළපුරුද්දක් තිබෙන පක්ෂයක් වශයෙන් අපි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කර තිබෙනවා. ඉතින් ඒකෙන් පෙනෙන්නේ ජනාධිපතිත් අපේ විකල්ප අය වැය ක්‍රියාත්මක කර තිබෙන බවයි. අපි එය අගය කරනවා. අනෙක් ඒවාත් ඒ විධියට ක්‍රියාත්මක කරන්න කෝ. බැරි නම් තමයි අපි කියන්නේ, "කරුණාකර ඉල්ලා අස් වෙන්න, අපි මෙය ආරක්ෂා කර දෙන්නම්" කියන එක.

මා මේ අවස්ථාවේදී නැවත කියන්න ඕනෑ, US Dollar එක සම්බන්ධයෙන්. අපි ඉක්මනට ක්‍රියාත්මක වුණේ නැත්නම් ඉතාමත් භයානකකාරී තත්ත්වයක් ඇති වෙනවා. එතකොට කියන්න එපා, අපි කිව්වේ නැහැයි කියලා. අය වැය පිළිබඳව විවාද කරන මේ අවස්ථාවලදී අපි පෙන්වා දීලා තිබෙනවා, මෙහි තිබෙන භයානකකාරී තත්ත්වය.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා නැවත ඉදිරිපත් කරන්නේ මේ වියදම් ලේඛනයයි. මේ වියදම් ලේඛනය තුළ අපි එක පැත්තක් ගනිමු. එක පැත්තක් තමයි රජයේ සේවකයන්. රජයේ සේවකයන් බලා ගෙන සිටියේ, අනේ, ජීවන අංකයට දීමනාවක් ලැබෙනවා කියලායි. මේ වැඩි වෙන ජීවන අංකයට දීමනාවක් ලබා දීම ක්‍රියාත්මක කරනවා නම්, රුපියල් 6,500ත්, 7,000ත් අතර දීමනා වැඩි වීමක් ලැබෙන්නට අවශ්‍යයි. ඒ නිසා රුපියල් 7,000ක දීමනාවක් ලැබිය යුතුයි කියන විශ්වාසයෙන් ඒ අය සිටියා. එක්සත් ජාතික පක්ෂයේ විකල්ප අය වැය ඉදිරිපත් කරන කොට අපි ගණනය කළේ එම ජීවන වියදම වැඩි වීමයි. ජීවන වියදම වැඩි වී තිබෙන ප්‍රමාණයට අපි ගණනය කරලා කිව්වා, රුපියල් 7,500ක් ලබා දෙන්නට ඕනෑයි කියලා. ඒ වාගේම අපේ ලාල්කාන්ත මන්ත්‍රීතුමා ඇතුළු ජනතා විමුක්ති පෙරමුණ, එම දීමනාව රුපියල් 5,000ක් ලෙස ඉලක්ක කළා. ඉතින් ඒකෙන් පෙනෙනවා, යම් විධියක ඉලක්කයකට වැඩ කරනවාය කියලා. නැත්නම් නිකම් හිතුමතේට රුපියල් 5,000යි, රුපියල් 7,500යි කියලා කිව්වා නොවෙයි. එහෙනම් අපට කියන්න තිබුණා නේ, රුපියල් 20,000ක් ලබා දෙනවාය කියලා. නැහැ. ඊට පසුව ආණ්ඩුවේ ප්‍රතිචාරය වුණේ මොකක්ද? ආණ්ඩුවේ ප්‍රතිචාරය වුණේ "අපි පසුගිය අය වැයෙන් රජයේ සේවකයන්ට රුපියල් 3,500ක් වැඩි කර තිබෙනවා, ඒ නිසා මෙවර අය වැයෙන් රුපියල් 1,000ක් වැඩි කරනවා" යි කියන එකයි. ඊයේ අය වැය කථාව ඉවර වෙන්නත් ඉස්සර, "දෙරණ" රූපවාහිනී නාලිකාවෙන් කිව්වා, රජයේ සේවකයන්ට රුපියල් 4,500කින් වැටුප් වැඩි කළාය කියලා. "දෙරණ" රූපවාහිනී නාලිකාවත් ඒකට රැවටුණා. අන්තිමට වැඩි වෙලා තිබෙන්නේ රුපියල් 1,000යි. මේ වියදම් ලේඛනයේ රජයේ සේවකයන් සඳහා රුපියල් මිලියන 12,000ක් අන්තර් ගත කර තිබෙනවා. අඩු ගණනේ උද්ධමනයටවත් සතුටුදායක උත්තරයක් දීලා තිබෙනවාද? ජනාධිපතිතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී කිව්වා, රජයේ සේවකයෙක් දැන් අවම වශයෙන් රුපියල් 11,900ක මාසික වැටුපක් ලබා ගන්නවාය කියා. අපි සියලු දෙනාම පිළිගන්නා දෙයක් තමයි, උද්ධමනය සියයට 30 සිට සියයට 24ට 25ට අඩු වෙලා තිබෙන බව. සමස්තයක් වශයෙන් සියයට 25ක්ය කියා අපි හිතමු කෝ. එතකොට ඒ අනුව අවුරුද්දකට රුපියල් 2880ක ක්‍රය ශක්තියේ අඩු වීමක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති මම පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇසුවා, 2004 අවුරුද්දේ සිට ඉන්න සමෘද්ධි ලාභීන්ගේ අද මූර්ත ආදායම කොච්චරද කියා. අවුරුදු දෙකකින් රුපියල් 1,000 ආදායම රුපියල් 605ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ ක්‍රය ශක්තිය ඒ තරම් ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා. මහන්සි වෙලා වැඩ කරන රජයේ සේවකයන් මේ අය වැයෙන් යම් කිසි ප්‍රතිලාභයක් බලාපොරොත්තු වුණා. අඩු ගණනේ උද්ධමනයවත් අඩු වෙයි කියා ඒ ගොල්ල බලාපොරොත්තු වුණා. නමුත් ලොකුවට සද්ද කරලා, ඉතිහාසය ගැන කතා කරලා, රුපියල් 3,500 ගැන කතා කරලා රුපියල් 1,000ක් දීලා ගියා. ඒක තමයි මම කියන්නේ මේ අය වැය එක පැත්තකින් රුපියල් 100ක් දීලා අනික් පැත්තෙන් රුපියල් 1,000ක් ඇදලා ගත්ත අය වැයක්ය කියා. ඊට පසුව කියනවා, රජයේ නිලධාරින්ට ලැබෙන උත්සව අත්තිකාරම් මුදල රුපියල්

[ගරු රවි කරුණානායක මහතා]

3,000 සිට 5,000 තෙක් වැඩි කරනවාය කියා. ඒක දෙන්නේ ආණ්ඩුවෙන්ය. ගරු කථානායකතුමනි, රජයේ සේවකයන් වශයෙන් ඒක ඒ අයට ගන්න පුළුවන්. ඒකෙන් වෙන්නේ ණය බර තවත් වැඩි වෙන එක විතරයි. හෙට ලබා ගන්න තිබෙන ආදායම අදට ලබා ගන්න හැකියාව ඇති කරලා දෙනවා. ඒ වාගේම පොත් පත් ගන්න අමාරු තත්ත්වයක් තිබෙනවාය කියා - ඒ කියන්නේ ආණ්ඩුව පිළිගන්නවා අමාරු තත්ත්වයක් තිබෙනවාය කියා- ඒ සඳහා දෙන අත්තිකාරම් මුදල රුපියල් 1,000 සිට රුපියල් 2,500 දක්වා වැඩි කරනවාය කියා තිබෙනවා. ඒක ආදායම් උපද්දන ක්‍රමයක්ය. ඒකත් හෙට තිබෙන පඩියෙන් අදට අවස්ථාව ලබා දීමක්. ඒ වාගේම තමයි රජයේ ණය. ඒ ණය දෙන්නේ සියයට 4 පොලියටද, සියයට 10 පොලියටද කියා නැහැ. අපි දන්නා විධියට සියයට 15, සියයට 20 පොලියට තමයි අද ණය දෙන්නේ. ආපදා ණය රුපියල් ලක්ෂ 4ක් තිබුණු එක රුපියල් දෙලක්ෂ පනස්දාහ දක්වා අඩු කරලා තිබෙනවා. අඩු කරන්නේ වැඩි පිරිසකට දෙන්න ඕනෑ නිසාලු. නමුත් ගිය අවුරුද්දේ දීලා තිබෙන ණය ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. මොකද, සියයට 4 පොලියට දෙන්න සල්ලි නැහැ. ඒ ගොල්ල සියයට 18, සියයට 19 පොලියට දෙනවා. ඒ විධියට තමයි රජයේ සේවකයන්ට උදවු කරලා තිබෙන්නේ.

ඒ වාගේම බලන්න, ත්‍රිවිධ හමුදාවේ අය ගැන. තමන්ගේ පැවැත්ම තිබෙන්නේ ආරක්ෂක භටයන් නිසාය කියන එක ආණ්ඩුවත් අපි සියලු දෙනාමත් දන්නා කාරණයක්. ආරක්ෂක භටයන්ට රුපියල් 2500ක පඩි වැඩි කිරීමක් කරලා තිබෙනවාය කියා මෙතැනදී කිව්වා. නමුත් මේ අය වැය ලේඛනයේ II කොටසේ වියදම් ලේඛනයේ කියා තිබෙන්නේ මේ විධියටයි: "Enhancement of the allowance for members of the Armed Forces in operational areas". ආරක්ෂක හේතූන් නිසා ඒ කරුණු මෙතැනදී ඉදිරිපත් කළේ නැතිවා වෙන්න පුළුවන්. යුද හමුදාවේ 1,54,000ක්, නාවික හමුදාවේ 30,000ක්, ගුවන් හමුදාවේ 32,000ක් ඉන්නවාය කියා අපේ විකල්ප අය වැය ඉදිරිපත් කරන කොට අපි ගණන් බලා තිබෙනවා. බැලු බැල්මට කතාව අහන අවස්ථාවේදී තේරුම් යන්නේ ආරක්ෂක භටයකුට තමන්ගේ පඩිය රුපියල් 2,500කින් වැඩි වෙනවාය කියලායි. ඊට පසුව කියවා බලන කොට තමයි තේරුම් යන්නේ ඒක ලබා ගන්න නම් ක්‍රියාන්විත ප්‍රදේශයේ ඉන්න ඕනෑය කියා. ඉතින් අඩු ගණනේ ඒක සියයට 3ක ප්‍රමාණයක්වත් නැහැ. අනික් අතට අපට හිතන්න පුළුවන්; උපකල්පනය කරන්න පුළුවන් දැන් තිබෙන විධියට කුරුම්බැට්ටිවලින් ඇවිල්ලා ගහලා යන කොට කොළඹත් ක්‍රියාන්විත ප්‍රදේශයක්ය කියා. එතකොට ඒ සියලු දෙනාටම ගෙවනවා නම් ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් ඇත්ත තත්ත්වය ඒක නොවෙයි ගරු කථානායකතුමනි. ඉතින් මේ වියදම් ලේඛනය තුළින්, අපි ඉදිරිපත් කර තිබෙන අදහස් තුළින් අඩු ගණනේ උද්ධමනයටවත් හරි උත්තරයක් ලබා දී තිබෙනවාද කියා මම අහනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාට ලැබෙන පඩිය කීයද කියා මම දන්නේ නැහැ. අපි හිතමු රුපියල් 60,000ක් ය කියා. උද්ධමනය සියයට 30ක් නම් රුපියල් 18,000කින් තමන්ගේ ක්‍රය ශක්තිය අඩු වෙනවා නේද? ඔබතුමාට ලැබෙන ඒ ගණන අපේ පාර්ලිමේන්තුවේ ඉන්න සේවකයන්ට ලැබෙනවාය කියමු කෝ. ඉතින් තමන්ගේ පඩියෙන් රුපියල් 18,000ක් අඩු වුණාම කවුද ඒක ලබා දෙන්නේ? මේ නිසා තමයි රටේ සොරකම් ඇති වෙන්නේ. මේ නිසා තමයි සක්විති වාගේ හොරුන් ඇති වන්නේ. ආණ්ඩුවෙන්ම හොරු ටික ඇති කරලා ආණ්ඩුවෙන්ම ඔවුන්ට බැණලා, එක්සත් ජාතික පක්ෂයේ ලේබල් එක ගහලා ගෙනි යන්න හදනවා. අපේ luck එකට සක්විති නම් අපේ account එකට වැටුණේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ කාර්යාලය තිබුණේ ඔබතුමාත්, මමත් ඉන්න කෝට්ටේ ආසනයේයි. පුදුමයි මේ වාගේ හොරෙක් රවි කරුණානායකගේ account එකට දැම්මේ නැති එක! මොකද, එතැනට ගියාම බිත්තියේ එල්ලා තිබෙන පින්තූරයේ සක්විතිට අතට අත දෙන්නේ ඊයේ කතා කරපු මුදල් ඇමතිතුමායි. බොහොම හොඳට සක්විති රණසිංහ බදා ගෙන ඉන්නවා. අනික් පැත්තෙන් ඉන්නවා ඇමතිවරුන් හතර පස් දෙනෙක්. ඒ ගොල්ලන්ගේ පින්තූරය බිත්තියේ තිබුණු නිසා මගේ බෙල්ල ඒකෙන් බේරුණාය කියන්න පුළුවන් ගරු කථානායකතුමනි.

මේ අය වැය තුළින් පෞද්ගලික අංශයේ සේවකයන්ට සත පහකවත් ආදායම් උපද්දන මාර්ගයක් පෙන්වා තිබෙනවාද කියා මම අහනවා. අය වැයෙන් තෙල් මිල අඩු වෙනවාය කිව්වා. අද උදේ මම පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමයේ සභාපති ගැමුණු විජේරත්නට කතා කරලා ඒ ගැන ඇහුවා. එතුමා කිව්වා, "මොන විහිළුවක් ද ඊයේ කළේ?" කියලා. "තෙල් මිල වැඩි වෙන කොට ගාස්තු වැඩි කරන්න අවස්ථාව දුන්නේ නැති ආණ්ඩුවක් මෙවර අය වැයෙන් රුපියල් 20කින් මිල අඩු කරලා ප්‍රවාහන ගාස්තු සියයට 30කින් අඩු කරන්න" කියලා කියනවා කිව්වා. ඉතින් ඒ ගොල්ලන් කියනවා, "මේක විහිළුවක්" කියලා. ප්‍රවාහන ගාස්තු සියයට 12කින් වැඩි කරන්න අවසර දීලා ඊට පස්සේ මේ අය වැයෙන්ම අමතර කොටස්වලට සියයට 30ක් වැඩි කර තිබෙනවා. "ඒ අමතර කොටස් හොරකම් කරන්නද, ඒවා මිල දී ගන්න ඕනෑ නේ" කියලා ඒ ගොල්ලන් කියනවා. ඉතින් ඒ ගණනය කරන සංඛ්‍යා ලේඛන තුළ අනිවාර්යයෙන්ම ඒ සූත්තරය දැම්මා නම් -මේ ගොල්ලන්ට හැම එකකටම සූත්තර තිබෙනවා නේ. ගෑස්වලට හාල්වලට වාගේ මේකටත් සූත්තරයක් දැම්මා නම්- සියයට අටහමාරකින් තමයි ප්‍රවාහන ගාස්තු අඩු කරන්න පුළුවන් වෙන්නේ. එහෙම අඩු කරන්න පුළුවන්ද කියලා තවම හිතනවා. ඊයේ "ප්‍රවාහන ගාස්තු සියයට 30කින් අඩු කරනවා"ය කිව්වාම අත්පුඩි ගැහුව්වා. ප්‍රවාහන ගාස්තු සියයට 30කින් අඩු කරයි කියලා ජනතාව බලා ගෙන ඉන්නවා. ඒක සියයට අට හමාරකින් අඩු කළාම මොන වාගේ විජ්ජාවක්ද මේ පාර්ලිමේන්තුව ඇතුළේ කරලා තිබෙන්නේ කියලා හිතනවා. ඒ නිසා තමයි අපි කියන්නේ කරනවා නම් හරියට කරන්න කියලා. කරන්න බැරි නම් අතපත ගගා කියන්න එපා, "අරක ලබා දෙනවා මේක ලබා දෙනවා" කියලා. එක්සත් ජාතික පක්ෂයේ අපේ විකල්ප අය වැය එක් කෙනකුගේ දෙන්නකුගේ එකක් නොවෙයි; පක්ෂයේ නායකතුමාත් අනුමත කරපු එකක්; සියලු දෙනාටම වෘත්තීය පදනමක් තිබෙන එකක්. දැන් මුදල් අමාත්‍යාංශයේ ඉන්න කට්ටියත් අනුමත කර තිබෙන විකල්ප අය වැයක් තමයි අපි ඉදිරිපත් කර තිබෙන්නේ. මේ අය වැයෙන් පෞද්ගලික අංශයට ශත පහක් වැඩි කරලා නැහැ. හැබැයි එහෙම දුන්නේ නැති වුණාට එක පවුලකට රුපියල් 2,000කින් වියදම වැඩි කරන මාර්ගයක් තමයි පෙන්වා තිබෙන්නේ. කොහොමද මේ වියදම් වැඩි වෙලා තිබෙන්නේ? එක පැත්තකින් කියනවා, "වැට් බද්ද සියයට 15 ඉඳලා සියයට 12 වෙනකම් අඩු කරනවා" කියලා. ඒක බොහොම ආඩම්බරයෙන් කියනවා. ඒකේ සාමාන්‍ය අර්ථ කථනය තමයි වැට් එක input tax එකක් කියන එක. එක පැත්තකින් ඉදිරිපත් කරන වියදම අනෙක් පැත්තෙන් අඩු කරන්න පුළුවන්, තමන්ගේ ආදායමෙන්. ඒකේ input tax එක සියයට 3ක් තිබෙනවා නම් ඒක අඩු කර එතැනින් නැවැත්තුවා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙතැන මොනවාද වෙන්නේ? වැට් එක සියයට 3කින් අඩු කරනවා. Regressive tax එකක් කියන්නේ ඉතාමත් භයානක tax එකක්. ගුවන් තොටු පොළෙන් හෝ වරායෙන් හෝ එන කොට උපයන බද්දක් දාලා තියෙනවා, PAL - Port and Airports Levy - කියලා. ඒක සියයට 2ක්. දැන් ඒකේ input tax එකක් නැහැ. ඒක සංසන්දනය කළොත් -සියයට 2 සියයට 3 එක්ක සංසන්දනය කළොත්- සියයට 2 බද්දට සියයට තුන හමාරක් විතර වියදම් වෙනවා. අඩු වෙන එකට සියයට දෙක හමාරකට විතර අඩු වෙනවා.

මෙතැන රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමා ඉන්නවා. ආර්ථිකය ගැන දන්න පුද්ගලයෙක් වශයෙන් එතුමා දන්නවා ඇති මම මේ කියන්න හදන්නේ මොකක්ද කියලා. මේක කැබිනට් මණ්ඩලයේ කථා කළේ නැද්ද? ඉතින් මේකට ද මේ හොඳ අය වැයක් කියලා කියන්නේ? අද Daily News පත්තරය බැලුවා නම් පේනවා. බැරැක් ඔබාමාගේ අය වැයක් ඉදිරිපත් කළා වාගෙයි මේ කථා කරන්නේ. මෙවර අය වැයෙන් වැටිලා තියෙන ආර්ථිකයට කිසිම සෙතක් සැලසිලා නැහැ; රජයේ සේවකයන්ට පෞද්ගලික අංශයට -මම දැන් පෙන්නලා දුන්නා.- කිසිම සෙතක් සැලසිලා

නැහැ. එහෙම සෙතක් සැලසිලා නැති අය වැයක් හොඳයි කියන එක ප්‍රෝඩාවක් නොවෙයිද? සුමානයකට ඉස්සෙල්ලා ඉඳලා මේ රටේ ආනයන ආදේශනය කරන ප්‍රතිපත්තියක් ගෙන යනවා. ඒක හංගන්න දෙයක් නැහැ. විදේශ විනිමය අනුපාතය අද භයානක විධියට අඩු වෙලා තිබෙනවා. විදේශ සම්පත් ආරක්ෂා කරන්න විදේශ විනිමය අනුපාතය පුළුවන් තරම් අඩු කරලා තිබෙනවා. ඒ අඩු කරන ගමන්ම LC margin එකක් සියයට 200කට දාලා තිබෙනවා. ඒ සියයට 200ක් දාලා තිබෙන්නේ කාර්, වෑන්, මෝටර් සයිකල් සඳහායි. සුඛෝපභෝගී නැති භාණ්ඩවලටත් දාලා තිබෙනවා. බලන්න, කිරි පිටි. මේ රටේ කිරි පිටි නිෂ්පාදනය කරන්න ඕනෑයි කියලා, කිලෝවකට රුපියල් 5 සිට 15 දක්වා බද්ද වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම තිරිඟු පිටි මිල බලන්න. මේ රටේ සහල් නිෂ්පාදනය කරන්න ඕනෑ, සහල්වලින් නිපද වන දේවල් වැඩිදියුණු කරන්න ඕනෑ කියලා තිරිඟු පිටිවලට සියයට 5 සිට සියයට 15 දක්වා බද්ද වැඩි කර තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, සම්ප්‍රදාය කැඩුණු නිසා මගේ වේලාවෙන් මිනිත්තු පහක් විතර අඩු වුණා. මට තව මිනිත්තු 15ක් ලබා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා. මම හිතනවා, ඔබතුමා ඒකට ඉඩ දෙයි කියා.

ගරු කථානායකතුමනි, තිරිඟු මත පනවා ඇති තීරු බද්ද සියයට 10 දක්වා වැඩි කරලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පෙ.ව. 10.55ට නැවැත්තුවාම හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට වෙන් කර තිබුණේ මිනිත්තු 50යි. මම කථාව පටන් ගත්තේ පෙ.ව. 10.10ට. එතකොට පෙ.ව. 11.00 වෙනකම් මට කථා කරන්න පුළුවන්. පෙ.ව. 11.10 වෙනකම් කථා කරන්න මම ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා.

ගරු කථානායකතුමනි, මේ බද්ද වැඩි කිරීම තුළින් තිරිඟු පිටි මිල සියයට 15කින් වැඩි වෙනවා. ඒ වෙනුවට වෙනත් ආදේශකයක් සාර්ථකව වගා කරන්න පුළුවන් නම්, ඒ සඳහා දිරි ගැන්වීමක් කරන්න පුළුවන් නම් හොඳයි. නමුත් අපි තිරිඟු වගා කරන්නේ නැහැ. ඒකට අඩු ගණනේ මාස හයක් හතක් යනවා. ඉතින් අපි ආදායමක් ලබා ගන්නවා. ජනතාව වියදමක් දරනවා. ආණ්ඩුව ඒ වියදම කරන්නේ මොකටද කියන එක අපි තවම දන්නේ නැහැ.

සීනි ගැන බලන්න. සීනි සඳහා ඇති විශේෂ භාණ්ඩ බද්ද රුපියල් දහහතරේ ඉඳලා රුපියල් දහසය දක්වා වැඩි වෙනවා. රබර් ආනයනය කිරීම සහ තේ ආනයනය කිරීම අර ගෙන බලන්න. අද තේ මිල වැටිලා තිබෙනවා. යම් විධියකින් අඩු පැත්තකින් අර ගෙන ඒකට පොඩි අගයක් එකතු කරලා විකුණන එකෙන් අඩු ගණනේ අඩු මිලකට විකුණන්න පුළුවන් හැකියාවත් නැති කරනවා. එසේ වැඩි කිරීමේ අදහස මොකක්ද කියා මා දන්නේ නැහැ. මා ඒ සම්බන්ධයෙන් අදහස් යොමු කිරීම ආණ්ඩුව පැත්තට භාර දෙන්නම්. නමුත් මේ වාගේ තේ මිල වැටිලා තිබෙන අවස්ථාවක අඩු තැනකින් තේ ගෙනැල්ලා එය blend කරලා විකුණන්න පුළුවන් නම්, -ඒකත් නැති කරන්න යනවා නම්- ආණ්ඩුව ඒ මඟින් අපනයනය කිරීමේ අදහස ඇති කරන්න යන්නේ කොහොමද කියා මා දන්නේ නැහැ.

සත්ත්ව ආහාර පිට රටින් ගෙන්වීමේදී සියයට 25ක සෙස් බද්දක් පැනවීම සම්බන්ධ කාරණය තව එකක්. ඒවා මේ රටේ නිෂ්පාදනය කරනවා නම්, සියයට 80ක, 90ක මට්ටමක තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඊයේ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා සමඟ කථා කරපු වෙලාවේදී ගෙනාපු අදහසක් මා කියන්නම්. හෙට උදේ ඉඳන් මේක වැඩි වෙනවා. ඒක ඇත්තයි. වැඩි වුණාට පස්සේ ඒ ආදායම එදා ඉඳලා එකතු වෙනවා. නමුත් එය හැදුවාය කියා කෙළින්ම ආදේශ කරන්න බැහැ. අඩු ගණනේ මාස හය හතක් යනවා. නමුත් ආණ්ඩුව ඒ ආදායම පාවිච්චි කරනවා. ඒ, ලැබෙන ආදායමෙන් සියයට විසිපහක්. හෙට උදේ ඉඳන්ම පාරිභෝගිකයා ඒ මිල ගෙවනවා. නමුත් එහි ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැ ගරු කථානායකතුමනි. මේ නිසා තමයි අපට පෙනෙන්නේ කිසිම ඉලක්කයක් නැහැ කියා.

තමා ආදායම් උත්පාදනය කරන ක්‍රම මේ ආදායම් ලේඛනය තුළින් පෙන්වා තිබෙනවා. අය වැය ලේඛනයේ දෙ වැනි කොටසේ සම්පිණ්ඩනය කර තිබෙන ආදායම් ලේඛනයේ රුපියල් මිලියන තිස්පන්දාහක් පෙන්වා තිබෙනවා. ඒක වැරැදියි. එය රුපියල් මිලියන පනස්පන්දාහක්ය කියා මා මේ අවස්ථාවේදී කියනවා. මොකද, වැට් එකේ සියයට තුනක් අඩු කළාම මිලියන හතළිස්පන්දහස් තුන්සිය පනස්එකක් අඩු වෙනවාලු. සියයට අසූවක් වැට් එකේ ආදායම් ලැබෙන්නේ සියයට විස්සේ කොටසින්. ඉතින් ඒක අඩු කරන්නේ නැතිව සියයට තුනක් අඩු කරලා රුපියල් මිලියන හතළිස්පන්දාහක් තිබෙනවා නම් අපට දී තිබෙන මේ වාර්තා අනුව සම්පූර්ණ වැට් සම්බන්ධයෙන් රුපියල් බිලියන දෙසිය හතළිස්දෙකයි, ඒ කියන්නේ රුපියල් කෝටි විසිහතරදහස් දෙසීයයි උපයා තිබෙන්නේ. ඉතින් ඒකෙන් සියයට තුනක් අඩු වෙනවා නම් මෙතැනදීත් කර තිබෙන්නේ ප්‍රෝඩාවක්.

ආදායම රුපියල් මිලියන පනස්පන්දහස් තුන්සියයකින් වැඩි වෙලා තිබෙනවා. ඒක පෙන්වන්නේ නැතිව පෙන්වන්න හදනවා අප ආදායම වැඩි කරලා තිබෙන්නේ රුපියල් මිලියන තිස්දාහයි, වියදම රුපියල් මිලියන පනස්දාහයි, ඉතින් ආණ්ඩුව ඒකත් දරනවාය කියා. මේ වගේ විහිළු කරන්න පුළුවන් nursery-montessori කට්ටියත් එක්ක. අපත් ආණ්ඩු කරලා තිබෙන්නේ, නිදහස ලබා තිබෙන්නේ. නමුත් විහිළු කරන්නේ ආර්ථිකය ගැන දන්නා අයත් එක්කයි. ඒ නිසා තමයි ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා දැන් හිනා වෙන්නේ; හරියට උත්තර නොදෙන්නේ. මා හිතන්නේ ඒ උපක්‍රමශීලී සූත්‍රය නම් හරියට ගෙන යනවාය කියායි.

ගරු කථානායකතුමනි, මේ තුළින් අප පෙන්වන්න හදන්නේ මොකක්ද? අපට අවශ්‍යයි මේ සම්බන්ධයෙන් යම් විධියකට ඉදිරි දැක්මක් සහිත වැඩ පිළිවෙළක්. අපේ පාරිසරික අමාත්‍යාංශය කිව්වා නේ අපට අය වැයෙන් ශත පහක්වත් ඕනෑ නැහැ කියා. කෝ ඒ වණ්ඩි ටෝක් එක? අපේ ගරුතර පාලිත රතන ස්වාමීන් වහන්සේ කෝට්ටේ ප්‍රදේශයෙන් ගිහිල්ලා අහිංසක පාරිභෝගිකයාට අහිතකර බදු දාන්න එපාය කියා සුමාන දෙකක් යන්න ඉස්සෙල්ලා සුප්‍රිම් උසාවියෙන් උත්තරයක් ලබා ගත්තා; අවසරයක් ලබා ගත්තා.

විදුලි බිල අර ගෙන බලන්න. ගරු කථානායකතුමනි, කැබිනට් අමාත්‍යවරුන්ට බැරි වුණා එය අඩු කරන්න. පාලිත ස්වාමීන් වහන්සේ උසාවියට ගිහිල්ලා උත්තරයක් ලබා ගෙන එළියට ආවා. දැන් මේ රටේ පරිපාලනය ගෙන යන්නේ සුප්‍රිම් උසාවියද? නැත්නම් ගරුතර මහා සංඝ රත්නයද? එහෙමත් නැත්නම් එක්සත් ජාතික පක්ෂයේ විකල්ප අය වැයද? එහෙම නම් මොකටද මේ ආණ්ඩුව ගෙන යන්නේ? එක පැත්තකින් ඉන්දියාවෙන් එන්න එපාය කියනවා. අනික් පැත්තෙන් පරිප්පු දාන්නේ නැහැ. ඇවිල්ලා කරුණාකර ටොන් අටසියයක් ගන්න කියනවා. ටොන් අටසියයක් ගන්න කියා ඒක පැත්තකින් ගේනවා. අනික් පැත්තෙන් කියනවා, නෑ ඒක ඔය ගොල්ලන්ගේ ආණ්ඩුව නොවෙයි කියා.

එදා විදේශ ඇමතිතුමා කිව්වා ඒවා මේ රටේ අපේ ආණ්ඩුව තුළින් බෙදා හරිනවාය කියා. ඊට පස්සේ දවසේත් පත්තරේ තිබෙනවා, ප්‍රභාත් සුබර්ජී කියා තිබෙනවා, "නැහැ අපි ඉන්දියාවෙන් දෙන ආධාර ලංකාවේ ඉන්දියන් තානාපති කාර්යාලය තුළින් ගෙන යනවා"ය කියා. පරිප්පු දැම්මාට වඩා අමාරු දෙයක් නේ මේ වෙලා තිබෙන්නේ. අඩු ගණනේ අපට ආත්ම ගෞරවයක් තිබුණා, "දාන්න එපා. දෙන්න එපා" කියා කියන්න. එතකොට ඇවිල්ලා පරිප්පු වැට්ටුවා. දැන් මොනවාද

[ගරු රවි කරුණානායක මහතා]

කියන්නේ? "නැහැ මේක ඉන්දියන් තානාපති කාර්යාලය තුළින් යවනවා"ය කියායි. අපට ප්‍රශ්නයක් නැහැ. අපේ නායකතුමාත්, එක්සත් ජාතික පක්ෂයත් ඉන්දියාවත් එක්ක බොහොම සුහදතාවක් තිබුණා. එය තවමත් තිබෙනවා. ඉදිරියටත් එහෙමයි. නමුත් මේ වාගේ දේවල් බලන්න. විදේශ ඇමති නොදන්නා කරුණක් ඇති වෙලා තිබෙනවා. එතුමා දන්නේ නැහැ. මොකද, එතුමා ඉන්දියාවේ ගියේ නැහැ.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී විශේෂ ප්‍රකාශයක් කර තිබෙනවා. මා හිතන්නේ එවැනි තත්ත්වයක් ඇති වෙලා නැහැ කියායි. ඉන්දියාවෙන් සහ සෙසු රටවලින් ලැබෙන සියලුම ආධාර බෙදා හැරීමේ කටයුතු සියල්ල සිදු වන්නේ රටේ සහයෝගයෙන් තමයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

හරි, ඒ ලස්සන වචනයක් විධියට නේ "සහයෝගය" කියා කියන්නේ. අත අල්ලා ගෙන බෙදනවා, නැත්නම් අත අල්ලා ගන්නේ නැතිව බෙදනවා, අත කපලා ඉඹිනවා. දෙකම එකයි. මේ දෙන ආධාර ගේනවා. කොළඹ වරායෙන් ගෙනෙන්නේ නැත්නම් කන්කසන්තුරේ වරායෙන් ගේන්න ඉඩ දේවි. එතකොටත් කියාවි "සුහදතාවේදී කමක් නැහැ. ඉන්දියාවෙන් කොළඹට ගෙනාවාට වඩා හොඳයි කන්කසන්තුරෙන් ගෙනල්ලා බාන එක" කියා. අනේ, මේ වාගේ ආණ්ඩුවක්; ප්‍රතිපත්ති නැති ආණ්ඩුවක්. මා හිතන්නේ එතුමාට උත්තර දෙන්න බැහැ කියායි. එතුමා ඉන්දියාවේ ගියේ නැහැ. පව්! විදේශ ඇමති, නමට. විශේෂ විදේශ ඇමති.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තවම වේලාව පෙරවරු 11.10යි, ගරු කථානායකතුමනි. හැම වේලාවේම මගේ වෙලාවෙන් අඩු කරන්න හදනවා නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කථා කරන්න තව අය ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ආනයන ගැනත් ඒ වාගේම තමයි. සාමාන්‍යයෙන් ෆෑන් එකක් ගැන බලන්න. මේ රජය උද්ධමනය වැඩි කරන කොට ෆෑන් එක දා ගත්තා. දැන් ඒකටත් සියයට 50ක බද්දක් දාලා. බලන්න, කොතරම් අමාරු දෙයක්ද කියලා.

මේ රටේ ජනාධිපතිතුමා ඉන්නේ හම්බන්තොට. ලුණු ලේවා තිබෙන්නේ හම්බන්තොට. ජාතික ලුණු සංස්ථාව පෞද්ගලීකරණය කරන්න ගත්තේ එතුමාගේ පරිපාලනය තුළිනුයි; එදා කම්කරු අමාත්‍යාංශය තිබුණු එතුමාගේ පරිපාලනය තුළිනුයි. පෞද්ගලීකරණය කරන අවස්ථාවේදී ලොකුවට ශබ්ද කර කර ගත්තේ එතැනිනුයි. එහෙම අරන්, ලුණු නිෂ්පාදනය කර ගන්න බැරි වුණු ජනාධිපතිවරයෙක්. දැන් කියනවා, මේ සම්බන්ධයෙන් ලජ්ජයි කියලා. එදා තිබුණු අමාත්‍යාංශය දැන් කොහේද තිබෙන්නේ? ආසනය කොහේද තිබෙන්නේ? හම්බන්තොට. දැන් ලුණු ආනයනය කරනවායි කියනවා. එහෙම නම් මේ දේශීයත්වය පිළිබඳ ප්‍රශ්නය කාගේද? කවුද, රටේ ජනාධිපති? කවුද, රටේ ආර්ථිකය අවුරුදු 14ක් හොබවලා තිබෙන්නේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. එහෙම නම් මොකක්ද මේ කථා කරන්නේ? මේ දේශීයත්වය ගැන කොහොමද කතා කරන්නේ?

ගරු කථානායකතුමනි, මම මෙතැනින් පෙන්වන්න හදන්නේ 1924න් පස්සේ, "The Greatest Depression" කියන ඒ ආර්ථිකය කඩා වැටුණාට පසුව දැනුත් මේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන අන්දම ගැනයි. මේ ගැන කතා කරලා කිසි වැඩක් නැහැ. මේ රටේ අය වැයෙන් ප්‍රමුඛත්වය දීලා තිබෙන්නේ මොකකටද? අධ්‍යාපනයට ප්‍රතිපාදන වැඩි කරලා තිබෙනවාද? සෞඛ්‍යයට රුපියල් බිලියන දෙකක්, ඒ කියන්නේ රුපියල් කෝටි 200ක ප්‍රතිපාදන වැඩි කරන කොට මිහින් ලංකා ආයතනය වාගේ ප්‍රෝඩා කරන ව්‍යාපාරවලටත් රුපියල් මිලියන හයදාහක් වෙන් කරනවා. කැබිනට් අමාත්‍යවරුන්ට කොන්දක් නැද්ද, අහන්න. මොකක්ද?

බස් රථ ප්‍රමාණය වැඩි කරන්නේ නැහැ. අහිංසක ත්‍රිරෝද රථ හිමියෝ, "අපේ ජීවිතය මල්- සන්ධානය තියෙන තාක් කල්" කියලා සන්ධානයට ඡන්දය දුන්නා. ඒ ගොල්ලන්ට තෙල් මිල අඩු කරන්නේ නැහැ. බංකොලොත් වෙලා තිබෙන මිහින් ලංකා ආයතනයට රුපියල් මිලියන හයදාහක් දෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පෙරවරු 11.10 වෙන තෙක් මට දෙන්න ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මිනිත්තු පහක් වැඩියෙන් අරන් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, ගරු කථානායකතුමනි, මම පටන් ගත්තේ පෙරවරු 10.10ට. මොකද පටන් ගත්තෙත් ඒ පැත්තෙන් නේ. ප්‍රශ්න ගියා, 10.00 වෙන තෙක්ම. මට තව මිනිත්තු පහක් දෙන්න. මම මගේ කථාව අවසන් කරන්නම්.

මිහින් ලංකා ආයතනයට රුපියල් මිලියන පන්දාහයි. PAL එකේ වියදම් එක පැත්තකින් දානවා. එතකොට Economic Service Charge කියලා වැඩි කරනවා. නමුත් හම්බන්තොට වරාය ඇති කරන්න චීනයෙන් ණය ලබා තිබෙනවා. අහිංසක පාරිභෝගිකයන්ගෙන් මේක උපයන්න අවශ්‍ය වන්නේ ඇයි? කොළඹ වරාය හදන්නේ ADB loan එකකින්. අවුරුදු තුනකට ඒක ගෙවන්න කිසි සේත්ම අවශ්‍යතාවක් නැහැ. නමුත් මේ අවුරුද්දේ ඉඳන් ඒක තුළින් ආදායමක් උපයන්න හදනවා.

මෙන්න රට සංවර්ධනය කරනවා කියලා එක පැත්තකින් පෙන්නනවා. ඒකට කිසි සේත් වියදමක් දරන්නේ නැහැ. නමුත් පාරිභෝගිකයාගෙන් අරන් ඒ මුදල් තමයි පාවිච්චි කරන්නේ ඇමතිවරුන්ට ගෙවන්න; රුපියල් ලක්ෂයක ගෙවල් කුලී ගෙවන්න; කාර් දෙක තුනක් දෙන්න. ඒක තමයි අපි විකල්ප අය වැයෙන් කියන්නේ, ඒ ඇමතිවරු එකසිය දහය, තිස්පහකට අඩු කරනවායි කියලා. එහෙම තිස්පහකට අඩු කරලා අඩු ගණනේ එයින් රුපියල් මිලියන 15,000ක් සංවර්ධනයට හා ගම් දියුණු කිරීමට පාවිච්චි කරනවා. ඒවා මේ ආණ්ඩුවෙන් කරලා තිබෙනවාද? මිහින් ලංකා ආයතනය වාගේ ආයතනවලට අපි

ඒවා වියදම් කරන්නේ නැතුව ඒවා අපි පාවිච්චි කරනවා, රටේ සංවර්ධනයට සහ ජීවන වියදම අඩු කරන්න; ආදායම් උත්පාදන ඇති කරන්න; රජයේ වැටුප රුපියල් 7,500කින් වැඩි කරන්න; ආරක්ෂක හටයන්ට අවම වශයෙන් රුපියල් 42,000ක වැටුපක් ලබා දෙන්න; පොලීසියේ අයට රුපියල් 32,000ක වැටුපක් ලබා දෙන්න. මේවා තමයි ඒ ගොල්ලන් බලාපොරොත්තුව හිටියේ. ඒ ගොල්ලන් කියනවා, විපක්ෂයට - එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහතාට - ඔහොම දෙන්න පුළුවන් නම් ඒ අයගේ ආණ්ඩුවක් ආවාම මොනවා කරයිද කියා. එහෙම තමයි කියලා තිබෙන්නේ. අපි කොහොමද මේවා සාක්ෂාත් කරන්නේ? මේ රටේ ණය තුළින් රුපියල් මිලියන 312ක් විතර වියදම් කරන බව අපි පෙන්වා දී තිබෙනවා. සම්පූර්ණයෙන්ම debt service එක රුපියල් මිලියන 874යි. මේකෙන් ඒ ණය කපා හැරීමට රුපියල් මිලියන 425ක් 450ක් විතර යොමු කරනවා. සියයට 8ක 9ක පොලියකට තමයි HSBC එකේ ණය දෙන්නේ. ඇයි, අපි කිව්වේ HSBC එකේ ණය රටට අහිතකරයි කියලා? අපි -එක්සත් ජාතික පක්ෂයෙන්- යටිතල පහසුකම් සඳහා සියයට 0.5ක පොලියකට ණය ගන්නවා.

මෙම අවස්ථාවේදී ගරු අගමැතිතුමා සභා ගර්භයට එනවා. බොහොම සතුටුයි. බොහොම වාම්, අඩු ගණනේ පිරිසිදුභාවයක් තිබෙන අගමැතිතුමෙක්. අපි මේ කිය කියා සිටියේ ඔබතුමා ඉන්න ආණ්ඩුවෙන් ඉදිරිපත් කළ අය වැය තුළින් HSBC එකෙන් සියයට 8.5ක පොලියකට ගත්ත ණයවලට පොලියටම රුපියල් මිලියන 4,500ක් ගෙවන බවයි. අපි සිටියා නම් පොලියට ගෙවන්නේ රුපියල් මිලියන 275යි. එතකොට ඉතුරු වෙනවා, රුපියල් මිලියන 4,225ක්. මේ රුපියල් මිලියන 4,225න් සමෘද්ධිය සියයට 50ක් වැඩි කරන්න පුළුවන්. ගරු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ලා අපට දුන්න ආණ්ඩුව තුළ උද්ධමනය තිබුණේ සියයට 24යි, ගරු කථානායකතුමනි. අපි එය සියයට 4ට අඩු කළා. එසේ අපි අඩු කළේ ආණ්ඩුව අරන් මාස හයකින් නොවෙයිද? අන්න ඒ වාගේ දෙයක් තමයි අපි මෙවර අපේ විකල්ප අය වැය තුළිනුත් කරන්න අදහස් කළේ. අපි යම් විධියක ඉලක්කයක් ඇතිව තමයි කටයුතු කරන්නේ. එතකොට දැන් බලන්න මේ යුද වියදම. මේ යුද වියදම තුළින්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් නම් වෙලාව ඉවරයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු පහක් තියෙනවා නේ ගරු කථානායකතුමනි. අපේ පක්ෂයෙන් මිනිත්තු පහක් අඩු කරලා ඒ වේලාව දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමාත්, ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමාත්,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා මිනිත්තු තිහක්ම ගන්නවා. නමුත් අනෙක්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද එක්සත් ජාතික පක්ෂයෙන් කථා කරන්න ඉන්නේ ගරු මන්ත්‍රීවරුන් දෙන්නායි. ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා එකහයි ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකෙන් මිනිත්තු පහක් අපි අඩු කරනවා. අපේ සමස්ත විපක්ෂයෙන්ම අඩු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙනම් විනාඩි පහළොවක් අඩු කරන්න වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි ඒ? මම 10.10ට කථා කරන්න ගත්තේ. මට මිනිත්තු පනහක් තියෙනවා. එතකොට 11.00 වන තෙක් තිබෙනවා. 11.00 ඉඳන් ඉදිරියට යන වේලාව තමයි මම වැඩිපුර ගන්නේ.

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්බන්ධයෙන් බලන්න. අපි කිව්වා වාගේ එක්සත් ජාතික පක්ෂය බලයේ හිටියා නම් මේ කළු කඩ ව්‍යාපාරය වාගේ මේවා කරන්නේ නැහැ. අද ලීටර් මිලියන හතළිහක් මාසයකට ඒ ගොල්ලන් නිෂ්පාදනය කරනවා. ගිය සුමානයේ පාර්ලිමේන්තුවේදී කිව්වා, රුපියල් 53ක් බදු වශයෙන් හා රුපියල් 17ක් ලාභයක් වශයෙන් ගන්නවාය කියා. එහෙනම් අපි රුපියල් 70ක් කියා ගත්තොත් මේ අවුරුද්දට බිලියන 40ක් හෝ කෝටි 4,000ක් උපයනවා මේක තුළින්. මේක මහා විහිළුවක්. මේක මහා ප්‍රෝඩාවක්. කළු කඩ ව්‍යාපාරය ගෙනෙන්නේ මේ ආණ්ඩුවයි. මේක බොර තෙල් සූත්‍රය නොවෙයි. බොරු තෙල් සූත්‍රය! මේක තමයි මේ අනුගමනය කරන්න හදන්නේ. අන්තිමට හිතුවා, මේක තුළින් බස් ගාස්තු අඩු වේවිය, ත්‍රිරෝද රථ හිමියන්ට උදවු වේවිය, ධීවරයින්ට උදවු වේවිය කියලා. කිසි සේත්ම උදවු වෙන්නේ නැහැ. මේ අවස්ථාවේදී මම කිව්වා, මිහින් එයාර් එක සම්බන්ධයෙන් කොච්චර වෙන් කර තියෙනවා ද කියලා. SriLankan Airlines ආයතනය ගිය අවුරුද්දේ මාර්තු මාසයේදී අපේ අයිතියට ගත්තා. එදා ඉඳන් අද වන තුරු US Dollars මිලියන 112ක අලාභයක් තිබෙනවා. ඒ කියන්නේ බිලියන 14ක අලාභයක්. ඒ අලාභය කවුද ගෙවන්නේ? අපේ ජනතාවයි.

ඒ වාගේම තමයි මේ අවශ්‍ය යුද වියදම. යුද්ධය ගැන එක පැත්තකින් ජනාධිපති කියනවා, “I do not believe in a military solution. I believe in a political solution; I believe in an undivided nation and we will take the peace process forward” කියලා.

ඉතින් ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳ කථාවක්. හොඳට සමාප්ත කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මිනිත්තු දෙකකින් මම ඒක කරන්නම්. මේ අවස්ථාවේදී ජනාධිපතිතුමා කියනවා, අපි නොබෙදුණු රටක් තුළින් සාම සාකච්ඡාවන් ඉදිරියට ගෙන යන්නමය කියලා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියටම ගෙන යනවාය කියනවා. එක්සත් ජාතික පක්ෂයේ අපි ඒ විධියට කිව්වොත්, "මුන් කොටින් එක්ක ඉන්නවා" කියලා තමයි කියන්නේ. ජනාධිපතිතුමා එහෙම කිව්වාම මොකක්ද වෙන්නේ? යුදමය මානසිකත්වයෙන්ද කියන්නේ? ගරු කථානායකතුමනි, ඒක තමයි කියන්නේ. අන්තිමට හිර වුණාම ඕනෑ දෙයක් හොඳයි. එක්සත් ජාතික පක්ෂයට බැණ බැණ හරි ප්‍රශ්නය විසඳන්න පුළුවන් නම් කමක් නැහැ. 2004 අප්‍රේල් මාසයේ ඉඳන් අද වන තුරු යුද

[ගරු රවි කරුණානායක මහතා]

වියදම් සම්බන්ධයෙන් බැලුවොත්, බිලියන 583ක් -කෝටි 58,300ක්- වියදම් කරලා තියෙනවා. යුද හමුදාපති කියනවා, ත්‍රස්තවාදීන් 12,000ක් මරලා තියෙනවාය කියලා. ඒක මේ ගණනින් බෙදුවොත් එක ත්‍රස්තවාදියකු නැති කරන්න මිලියන 42ක් ගිහිල්ලා තියෙනවා. රජයේ ප්‍රවෘත්ති මඟින් ප්‍රකාශ කළා ත්‍රස්තවාදීන් 24,000ක් මරලා තිබෙනවාය කියා. ඒ විසිහතරදාහ 583න් බෙදුවා නම් එක ත්‍රස්තවාදියකු නැති කරන්න මිලියන 21ක් ගිහිල්ලා තිබෙනවා. මාස තුනෙන් ගෞරවනීය සාමය ගෙනෙනවාය කිව්වා. ඊට පස්සේ මාවිල් ආරු ඇල්ලුවාය කිව්වා. ඊට පස්සේ තොප්පිගල, සාම්පූර් ඇල්ලුවාය කිව්වා. 2007 අය වැයේදී, මේ ඔක්කෝම කරලා එන අවුරුද්දට ඉස්සරින් යුද්ධය ඉවර කරනවාය කියපු අය ඇයි, එහෙනම් තවත් මිලියන 177ක් වෙන් කරන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මහජන බැංකුව බංකොළොත් වෙලා තිබෙන මෙවැනි අවස්ථාවක අපි අහනවා, මේ රටට කොහොමද සෙතක් ලැබිලා තිබෙන්නේ කියා. ඒ නිසා මා එකක් කියන්නම්. මේ අය වැය සම්පූර්ණයෙන් බොරුවක්; ප්‍රෝඩාවක්. ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී වේලාව නැති නිසා අපේ එක්සත් ජාතික පක්ෂයේ විකල්ප අය වැය හැන්සාඩ් ගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

අපි කියනවා, පුළුවන් නම් මේ රට බේරා ගන්නය කියා. එවැනි වැඩ පිළිවෙළක් තුළින් තමයි අපි කටයුතු කරන්නේ කියන එක කියමින්, ගරු කථානායකතුමනි, මිනිත්තු පහක් විතර වැඩියෙන් දුන්නු එකට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ බැරි ආණ්ඩුවට - දැන් පාලනය කරන්න බැහැයි කියලා ඔප්පු වෙලා තියෙන ආණ්ඩුවට - කරුණාකර ඉල්ලා අස් වෙන්නය මා කියනවා. The road is long; the hill is steep. We must take one step at a time at this particular moment. All we can say is, the blessed are the young and they shall not inherit the national debt. This Government like no other, has ruined the economy. Therefore, this Government must be held responsible. We must ensure that they do not ruin the economy any further.

Thank you, Hon. Speaker.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
*Documents tabled :*

Makeover Needed
01 Nov, 2008 07:05:29
Sri Lanka bad budgets, hot borrowings, dollar peg has endangered economy: IMF

Nov o1, 2008 (LBO) - Sri Lanka has to change its ways to protect it self from the negative effects of bad budgets, foreign borrowings, and a de facto dollar peg of the rupee, the International Monetary Fund has said.

The IMF's executive directors, in an annual assessment of the island, said the economy and the national currency were threatened by foreign hot money brought into finance the budget deficit, which could reverse at any time.

"Directors noted the risks of public debt distress arising from the increasing reliance on dollar - denominated, short-term commercial debt," the IMF said in a statement after its annual 'Article IV' consultations.

"Directors took note of the staff's assessment that the real effective exchange rate of the rupee is overvalued, and that the de facto peg risks contributing to external instability by attracting speculative inflows that could reverse quickly."

Hedge funds that financed Sri Lanka budget deficits in 2007 and early 2008 to the tune of 600 million dollars are already pulling out, and the country's reserves have fallen to 2.6 billion dollars from 3.4 billion dollars two months earlier.

According to Sri Lanka's own real effective exchange rate (REER) index, the rupee was overvalued by about 18 per cent in June, hurting the island's exporters but helping foreign hedge funds'

On Thursday Sri Lanka tried to float the rupee but the exercise failed and a new peg had been established at 110 rupees to the US dollar instead of the previous 108, and the central bank is still losing foreign reserves steadily.

IMF said the dollar peg had encouraged hot money to come in. The IMF urged Sri Lanka to break the peg saying "exchange rate flexibility" would help discourage the flows of de-stabilizing capital.

But Sri Lanka also needed "a comprehensive policy package that would underpin confidence in the currency."

"Directors expressed concern that the combined build-up of macroeconomic imbalances, balance sheet vulnerabilities, high inflation, and external financing pressures poses serious risks to economic stability," the IMF said.

"Amid increased international risk aversion, raising external finance will become increasingly challenging, and Sri Lanka's external accounts are vulnerable to a reduction in international investor risk appetite."

IMF said Sri Lanka's recent growth has been "impressive" and welcomed central bank attempts to tighten monetary policy and bring down inflation. The government was also cutting down energy subsidies and helping the national budget.

But Sri Lanka needed an economic policy makeover, starting with budgets.

"This would need to involve a front - loaded fiscal consolidation, complemented by monetary tightening, steps toward greater exchange rate flexibility, and a further strengthening of financial supervision and regulation," IMF said.

Most independent analysts had identified Sri Lanka's budgets as the single most de-stabilizing factor, which often overrides central bank monetary policy (fiscal dominance) and causes high inflation and balance of payments crises.

Sri Lanka's budgets improved after a balance of payments and economic crisis in 2000/2001, but fiscal and economic policy reversed in 2004 as the island jettisoned and IMF - backed reform package.

Four years later Sri Lanka's balance of payments is under pressure again. The IMF no longer has an office in Sri Lanka.

Meanwhile the IMF said a 100 percent margin on car import letters of credit should be removed.

But a day earlier, Sri Lanka had already doubled the margin to 200 percent, and revived a raft of additional trade restrictions that were imposed during the 2000/2001 economic crisis.

***** *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

***සභා මේසය මත තබන ලද ලේඛනය**
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
*Document tabled.*

SRI LANKA — OUTSTANDING GOVERNMENT DEBT
(1948 — 2008)

| *Year* | *Total Domestic debt (Rs. Million)* | *Total foreign debt (Rs. Million)* | *Total debt (Rs. Million)* | *Total Debt as a % of of GDP* | *Debt repayment (Rs. Million)* | *Interest payment (Rs. Million)* | *Per capita Debt (Rs. Cnt.)* |
|---|---|---|---|---|---|---|---|
| 1948 | 392 | 125 | 517 | | | | 72.96 |
| 1950 | 515 | 125 | 640 | | | | 84.84 |
| 1955 | 889 | 205 | 1094 | | | | 127.27 |
| 1960 | 1,937 | 294 | 2230 | 36.4 | | | 225.34 |
| 1965 | 3,697 | 439 | 4185 | 51.8 | | | 374.87 |
| 1970 | 6,295 | 1578 | 7873 | 57.6 | | | 629.14 |
| 1975 | 10,859 | 10,593 | 14,564 | 54.8 | | | 1,079.13 |
| 1976 | 12,691 | 14,583 | 17,659 | 58.5 | | | 1,287.38 |
| 1977 | 14,392 | 15,840 | 24,985 | 68.6 | | | 1,792.07 |
| 1978 | 16,368 | 14,583 | 30,951 | 72.5 | | | 2,181.18 |
| 1979 | 19,634 | 15.840 | 35,474 | 67.7 | | | 2,451.22 |
| 1980 | 29,070 | 22,276 | 51,346 | 77.2 | | | 3,481.79 |
| 1981 | 35,518 | 29,172 | 64,690 | 76.1 | | | 4,357.11 |
| 1982 | 45,267 | 35,267 | 80,534 | 81.2 | | | 5,299.68 |
| 1983 | 51,769 | 46,688 | 98,457 | 81.0 | | | 6,386.26 |
| 1984 | 51,652 | 53,681 | 105,333 | 68.5 | | | 6,750.82 |
| 1985 | 62,611 | 67,673 | 130,284 | 80.2 | | | 8,223.96 |
| 1986 | 69,499 | 86,208 | 155,707 | 86.8 | | | 9,655.05 |
| 1987 | 78,997 | 111,812 | 190,809 | 97.0 | | | 11,653.88 |
| 1988 | 98,596 | 125,657 | 224,253 | 101.0 | | | 13,510.03 |
| 1989 | 117,562 | 156,298 | 273,860 | 108.7 | | | 16,276.97 |
| 1990 | 133,896 | 176,883 | 310,779 | 96.6 | | | 19,104.87 |
| 1991 | 152,119 | 214,579 | 366.698 | 98.5 | 39,855 | 22,073 | 22,294.38 |
| 1992 | 170,020 | 235,539 | 405,559 | 95.4 | 52,018 | 25,940 | 24,385.73 |
| 1993 | 213,685 | 270,224 | 483,909 | 96.9 | 57,493 | 30,203 | 28,718.64 |
| 1994 | 249,119 | 301,812 | 550,931 | 95.1 | 6,213 | 43,542 | 32,238.93 |
| 1995 | 289,410 | 346,286 | 635,696 | 95.2 | 77,663 | 41,117 | 36,787.86 |
| 1996 | 356,703 | 359,685 | 716,388 | 93.3 | 81,263 | 48,023 | 40,959.86 |
| 1997 | 387,740 | 376,331 | 764,331 | 85.8 | 83,729 | 55,246 | 43,162.98 |
| 1998 | 463,426 | 461,273 | 924,699 | 90.8 | 114,866 | 54,898 | 51,558.35 |
| 1999 | 543,465 | 507,866 | 1,051,331 | 95.1 | 103,885 | 62,123 | 57,740.06 |
| 2000 | 676,660 | 542,040 | 1,216,700 | 96.9 | 175,726 | 71,200 | 65,993.39 |
| 2001 | 815,965 | 636,741 | 1,452,706 | 103.2 | 179,072 | 94,307 | 77,552.10 |
| 2002 | 943,386 | 721,956 | 1,670,342 | 105.4 | 284,338 | 116,515 | 87,880.36 |
| 2003 | 1,019,969 | 843,882 | 1,863,851 | 105.9 | 219,508 | 125,126 | 96,813.37 |
| 2004 | 1,143,389 | 996,138 | 1,139,526 | 105.5 | 180,781 | 119,782 | 1,09,933.72 |
| 2005 | 1,265,721 | 956,620 | 2,222,341 | 93.9 | 224,707 | 120,159 | 1,12,992.73 |
| 2006* | 1,475,520 | 1,131,074 | 2,606,594 | 91.5 | 293,525 | 150,278 | 1,31,076.84 |
| 2007* | | | 3,081,290 | | | | 1,53,280.59 |
| 2008* | | | 3,789,290 | | | | 1,89,464.50 |

*Provisional (+ estimate 708,000mn) (Source: Annual Report – 2006, Central Bank of Sri Lanka)


US$bn
4.0
3.5
3.0
2.5
2.0
1.5
1.0
Jan-06
Apr-06
Jul-06
Oct-06
Jan-07
Apr-07
Jul-07
Oct-07
Jan-08
Apr-08
Jul-08
Oct-08


116
114
112
110
108
106
Jan-07
Apr-07
Jul-07
Oct-07
Jan-08
Apr-08
Jul-08
Oct-08
$500m Eurobond Dea l
Foreign flow in T-Bonds

*සභා මේසය මත තබන ලද ලේඛනය :
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
*Document tabled :*

**මහින්ද චින්තනය හරහා පැමිණෙන ආර්ථික ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා වන එක්සත් ජාතික පක්ෂ විකල්ප අය - වැය යෝජනාවලිය**

**හැඳින්වීම**

මෙහි පහත සඳහන් යෝජනා වර්තමානයේ පවුල් ඥාති සංග්‍රහය සහ වැරදි පාලනය හමුවේ ජනතාව මුහුණ පා සිටින දැවෙන ප්‍රශ්න සඳහා එක්සත් ජාතික පක්ෂයේ නව දැක්ම සහ ප්‍රවේශය පැහැදිලි කරයි.

අපේ අභිලාෂය මුළු මහත් රටේම කුසලතා සහ ශක්තීන් ඒකරාශී කරමින් දැඩි උනන්දුවක් යොමු කොට ජාතික ආර්ථික සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමය. අපේ ජාතික ආර්ථික සංවර්ධනයේ පළ ප්‍රයෝජන ජනගහනයේ සියලු කොටස් අතරේ බෙදා ගැනීමට අවස්ථා සලසා දෙනු ඇති අතර ඒවා ඥාති මිත්‍රදීන්ගෙන් සැදි වරප්‍රසාද ලත් සුළුතරයේ භුක්තියට සීමා වීමට ඉඩ නොතබනු ඇත.

**1. සමෘද්ධි පවුලක ආදායම ඉහළට**

ඉහළ යන නැති - බැරිකම, මැඩලීමට සෑම සමෘද්ධි පවුලකටම වෙනසකින් තොරව මසකට රුපියල් 5000ක දීමනාවක්. ඒ අනුව සමෘද්ධි පවුලක වාර්ෂික ආදායම රුපියල් 60,000/-ක් දක්වා ඉහළ නැංවීම. පවුල් දස ලක්ෂ විස්සක් සඳහා (20)

**ප්‍රතිපත්තිය -** රටේ දැනට පවත්නා නාස්තිය හා දූෂණය පිටු දැකීමෙන් ඇති වන වාසිය නැති- බැරි පවුල් සඳහා ලබා දීම

**2. බදු බර පහළට**

ජනතාවගේ බඩු මිල ඉහළ දමන සියයට 20 වැට් බද්ද වෙනුවට, ඇති - හැකි අය ගෙවන, නැති - බැරි අය රකින සියයට 10 සියයට 11ත් අතර නව පරිභෝජන බද්දක්

**ප්‍රතිපත්තිය -** දැනට පවතින ආකර්යක්ෂම බදු කළමනාකරණය පිටු දැක පාරිභෝගිකයාට සෙත සලසන නව බදු ක්‍රමයක් හඳුන්වා දීම

**3. රණවිරුවන්ගේ ආදායම ඉහළට**

රට රකින ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් සඳහා අවම වැටුප රුපියල් 40,000/-ක්ද, පොලිස් නිලධාරීන් සඳහා රුපියල් 32,000/- ඉහළ නැංවීම

**ප්‍රතිපත්තිය -** බොරු දේශ ප්‍රේමය වෙනුවට, රණවිරුවන්ගේ කැපවීම අර්ථවත් කරන, ආර්ථිකමය ලෙස ශක්තිමත් කෙරෙන රුණවිරු ආර්ථික ප්‍රණාමයක්.

**4. රජයේ සේවක වැටුප් ඉහළට**

රජයේ සේවක ජීවන තත්ත්වය ඉහළ දැමීමත්, සේවයේ ගෞරවයට සරිලන වැටුප් ක්‍රමයක් ඇති කරනු වස් රාජ්‍ය සේවක වැටුප අවම වශයෙන් රුපියල් 7500/-කින් හා හෝ සියයට 20කින් වැඩි කිරීම

**ප්‍රතිපත්තිය -** වැඩි වන ජීවන වියදම සමග පොර බදන රජයේ සේවකයන්ගේ ආත්ම ගරුත්වය සුරකෙන ආර්ථික අත්වැලක්

**5. විශ්‍රාම වැටුප ඉහළට**

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අතමිට වැඩි කෙරෙන ලෙස පවතින විශ්‍රාම වැටුප රුපියල් 3500/-කින් ඉහළ දැමීම

**ප්‍රතිපත්තිය -** දැනට ක්‍රියාත්මක කොට ඇති ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් දැයට ලබා දුන් සේවය සඳහා කෘත ගුණ සැලකීම.

**6. ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් පහළට**

ලෝක වෙළෙඳ පොළෙහි, බොර තෙල් බැරලයක් ඩොලර් 70 කට ලබා ගැනීමේ පදනමින්, පෙට්‍රල් ලීටරයක් රුපියල් 85/- කටද, ඩීසල් ලීටරයක් රුපියල් 75/- කටද, භූමිතෙල් ලීටරයක් රුපියල් 59/- කටද ජනතාවට ලබා දීම. මෙය ගමනාගමන වියදම හා විදුලි බිල සීඝ්‍ර ලෙස අඩු කිරීමට හේතුවේ.

**ප්‍රතිපත්තිය -** ලෝක වෙළඳ පොළ තුළ ඇති වන මිල වාසිය දේශපාලනඥයන්ගේ නඩත්තුවට නොයොදවා, ඍජු ලෙසම එකී වාසිය පාරිභෝගිකයාට ලබා දීම.

**7. තේ, පොල්, රබර්, කුරුඳු, ගම්මිරිස්, මැණික් සඳහා ස්ථාවර වෙළෙඳ පොළක්**

වැවිලි කර්මාන්තය හා මැණික් කර්මාන්තය තුළ පහළ වැටෙන භාණ්ඩ මිල පාලනය කිරීම සඳහා විදේශ රටවල් සමග මිල ආරක්ෂණය පදනම් කර ගත් වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම. ඒ තුළින් තේ, පොල්, රබර්, කුරුඳු, ගම්මිරිස් නිෂ්පාදකයන්ට මෙන්ම මැණික් පතල්කරුවන්ට ස්ථාවර මිලක් ලබා දීම සහතික කිරීම.

**ප්‍රතිපත්තිය -** කඩා වැටෙන වැවිලි කර්මාන්තයට හා වැවිලිකරුවන්ට රාජ්‍ය හරහා ස්ථාවරත්වයක් ලබා දීම.

**8. ඇඟලුම් හා රෙදිපිළි කර්මාන්තයට නව පණක්**

රටේ ගෞරවය මෙන්ම, ඇඟලුම් කර්මාන්තය හා රෙදිපිළි කර්මාන්තය ආරක්ෂා වන අන්දමට විදේශ වෙළෙඳපොළ ජය ගැනීම සඳහා විදේශ ගිවිසුම්වලට ඇතුළුවීම තුළින් GSP + සහනය ලබා ගැනීම තහවුරු කිරීම.

**ප්‍රතිපත්තිය -** රජයේ අදූරදර්ශී ක්‍රියා පිළිවෙත් හේතු කොට ගෙන කොන්දේසි විරහිතව ලබා ගත් නමුත් කොන්දේසි නිසා නැතිවී යන GSP + සහන හේතු කොට ගෙන කඩාවැටෙමින් පවතින ඇඟලුම් හා රෙදිපිළි කර්මාන්තය ආරක්ෂා කිරීම.

**9. ධීවර කර්මාන්තයට අතහිත**

සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයට අත හිත දෙන අතර, රටේ ධීවර කර්මාන්තය නවීකරණය කිරීම.

**ප්‍රතිපත්තිය -** සුරා කෑමට නිරාවරණය කොට ඇති ධීවරයා හා අමතක කොට ඇති ධීවරයා නැවතත් රටේ නිෂ්පාදන ක්‍රියාවලියට කාර්යක්ෂම ලෙස බද්ධ කර ගැනීම හා පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට මත්ස්‍ය නිෂ්පාදන ලබා දීම.

**10. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට සෙත**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ශක්තිමත් කෙරෙන සේ සියයට 10 අඩු (තනි ඉලක්කමට ගෙන එන පොලී අනුපාතිකයක්) ණය පොලී අනුපාතිකයක් සහිත ප්‍රාග්ධන පහසුකම් ලබා දීම.

**ප්‍රතිපත්තිය -** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා ආවේගයන් ගෙන් මුළා නොකරන, ඔවුන්ගේ සැබෑ ප්‍රශ්න විසඳා ගැනීමට පිළියමක්.

**11. ග්‍රාමීය ජනතාවට රැකියා අවස්ථා**

සෑම මැතිවරණ කොට්ඨාසයක් තුළම රැකියා 1000ක් බිහි කෙරෙන සේ, එක් මැතිවරණ කොට්ඨාසයක් තුළ කර්මාන්ත ශාලා/සමාගම් තුනක් බිහි කිරීම.

**ප්‍රතිපත්තිය -** ඊනියා කොළඹ සංවර්ධනයට පමණක් සීමා නොවී රටම නිෂ්පාදනයට යොමු කිරීම තුළින් ග්‍රාමීය විරැකියාව මෙන්ම සමස්ත විරැකියාව පරාජය කිරීම.

**12. ග්‍රාමීය ආර්ථික සංවර්ධනය**

මිහින් ගුවන් සමාගමට රුපියල් බිලියන 3ක් ලබා දීම වෙනුවට එකී මුදල ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා යෙදවීම. ඒ අනුව රටේ දැනට පවතින ගම්දනව් 25,000ක් අතරින් ඇති දුෂ්කර ගම්මාන 1000ක් තෝරා ගෙන එක් ගමක් සඳහා ආර්ථික ආයෝජන සිදු කිරීම.

**ප්‍රතිපත්තිය -** රජයේ අදූරදර්ශී විදේශ ප්‍රතිපත්තිය නිසා අහිමි වන GSP+ සහනය හානි පූර්ණය කිරීම සඳහා රජය මහින් ලබා දීමට යෝජිත රුපියල් බිලියන 21ක මුදල භාවිතා කොට ඒ වෙනුවට අමතක කොට ඇති, අත-මිට නැති ගැමි ආර්ථිකයට නව පණක් ලබාදීමට ආයෝජනය කිරීම.

**13. ණය පොලී අනුපාතිකය පහළට**

රටේ ණය බර අවම කරන සියයට 1/2 - සියයට 1 අඩු පොලී අනුපාතයක් ලබා දෙන විදේශ ණය පමණක් ලබා ගැනීම.

අලුතින් ණය ලබා ගැනීම වෙනුවට, 2008 වසර සඳහා පොරොන්දු වී ආයෝජනය නොකරන ලද කොන්දේසි රහිත ඩොලර් මිලියන 5.5ක් වන විදේශ ආධාර මුදල් කාර්යක්ෂමව ආයෝජනය කිරීම.

දැනට අහස උසට ඉහළට ගොස් ඇති රාජ්‍ය විසින් ලබා ගන්නා දේශීය ණය සඳහා වන පොලිය තනි ඉලක්කමකට ගෙන ඒම තුළින් රාජ්‍ය මූල්‍ය තුළ දේශීය ණය ගැනීම් කාර්යක්ෂම කිරීම

**ප්‍රතිපත්තිය -** විදේශ ණය හරහා රටේ අනාගත පරම්පරාව ණය නොකරන, ගිනි පොලී හරහා දේශපාලන බලධාරීන්ගේ මල්ල තර නොකරන රටට හිතැති විදේශ ණය/ආධාර උත්පාදන ප්‍රතිපත්තියක්.

**14. නව අධ්‍යාපන ප්‍රතිපත්තියක්**

නිදහස් අධ්‍යාපනය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා දැනට ගරා වැටුණු අධ්‍යාපන ක්‍රමය විස්ථාපනය කොට රටේ ආර්ථිකයට පණ පොවන, දේශානුරාගී පුරවැසියන් බිහි කරන නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම හා සරසවිවලට බඳවා ගන්නා ප්‍රමාණය 30,000 දක්වා වැඩි කිරීම.

**ප්‍රතිපත්තිය** - නිදහස් අධ්‍යාපනය රැක ගැනීම පිළිබඳ බොරු සටන් පාඨවලින් ඔබ්බට යන යථාර්ථවාදී අධ්‍යාපන ප්‍රතිපත්තියක්.

**15. දරුවන්ට පෝෂණය**

පවුල් පෝෂණය මෙන්ම මන්ද පෝෂණය පිටු දකිමින් රටේ අනාගතය නියෝජනය කෙරෙන දරු සම්පත වෙනුවෙන් කෙරෙන ආයෝජනයක් ලෙස, මන්දපෝෂණය දුරලන කාර්යක්ෂම හා පැතිරුණු පෝෂණ වැඩ සටහනක් හඳුන්වා දීම.

**ප්‍රතිපත්තිය** - දේශපාලන ඥාති සංග්‍රහයට වෙන් වන මුදලින් රටේ දරුවන් සඳහා සැබෑ ආයෝජනයක්.

**16. ජනතාව නිරෝගී කරන සෞඛ්‍ය සේවයක්**

සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් රජය විසින් සිදු කෙරෙන ආයෝජනය ඉහළ දමමින් ජනතාවට කාර්යක්ෂම හා විශ්වාසදායක සෞඛ්‍ය වැඩ පිළිවෙළක් හඳුන්වා දීම.

**ප්‍රතිපත්තිය** - දේශපාලකයන්ගේ ගසා කෑම් හා අකාර්යක්ෂම පාලනය හේතු කොට ගෙන රෝගී වී ඇති සෞඛ්‍ය ක්ෂේත්‍රය නැවත නිරෝගී කරවමින්, රෝගීන් සඳහා දියුණු සෞඛ්‍ය සේවයක් ලබාදීම.

**17. වීවලට සාධාරණ වෙළෙඳපොළක්**

දේශපාලනඥයන්ගේ අනුග්‍රහය ලැබෙන වී මෝල් හිමියන්ගේ ඒකාධිකාරිය බිඳ දමා වැඩි වන වී මිලෙහි වාසිය වී ගොවියාට මෙන්ම පාරිභෝගිකයාට සෘජුව ලබා දීම.

**ප්‍රතිපත්තිය** - දේශපාලන ඥාතිත්වයට යටවී ඇති සහල් වෙළෙඳපොළ යථාර්ථවාදී ලෙස ඉල්ලුම හා සැපයුම මත රඳෙන වෙළෙඳ පොළක් බවට පත් කිරීම. ඒ තුළින් වී ගොවියා හා නිෂ්පාදකයා සුරැකීම.

**18. පොහොර සහනාධාරය ඉහළට**

වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය රුපියල් 350ද, අනෙක් කෘෂි ගොවීන් සඳහා රුපියල් 750 කටද ලබාදීම.

කෘෂි බෝග මිල, ගොවි සමිති සමඟ සාකච්ඡාවෙන් හා අන්‍යෝන්‍ය එකඟත්වයෙන් නියම කිරීම.

**ප්‍රතිපත්තිය** - ණය බරින් මිරිකෙන ගොවි පවුල් නඟා සිටු වීම, ග්‍රාමීය කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීම.

**19. රාත්‍රී බස් සේවයක් සමග කාර්යක්ෂම ප්‍රවාහන සේවයක්**

මගී ජනතාවට ගෞරවනීය මෙන්ම, ගෙවන මුදලට සරිලන කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ලබා දීම, රාත්‍රී 8.00න් පසු සිදු කෙරෙන මගී ප්‍රවාහනය සඳහා රාජ්‍ය අනුග්‍රහය හා මැදිහත් වීම මත රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ ප්‍රවාහන සේවයක් හඳුන්වා දීම.

විනින් විනාශ වන මිහින් වැනි ව්‍යාපෘති වළකා මගියා කම්බස් නොවන සේ බස් හා දුම්රිය ප්‍රධාන කර ගත් මගියා ආරක්ෂා කරන ප්‍රවාහන ප්‍රතිපත්තියක් සැකසීම හා අධිරාජ්‍යවාදී සමයෙන් පසු දීර්ඝ නොවූ දුම්රිය මාර්ග පද්ධතිය රට පුරා පුළුල් කිරීම.

**ප්‍රතිපත්තිය** - ප්‍රවාහන සේවයේ වර්ධනය පිළිබඳ බොරු අඬහැරය වෙනුවට මගීන්ගේ දැවෙන අවශ්‍යතා සඳහා පිළියමක් ලබාදීම.

**20. සංචාරක කර්මාන්තයට අත හිත**

විදේශ රටවල් විසින් ලංකාව තුළට සංචාරය කිරීමට එරෙහිව පනවා ඇති තහනම ඉවත් කොට ගෙන මාස 18ක් තුළ මිලියනයක විදේශ සංචාරකයන් රටට ආකර්ශනය කර ගැනීමේ වැඩ පිළිවෙළක් හරහා ඇද වැටී ඇති සංචාරක කර්මාන්තයට නව පණක් ලබා දීම.

**ප්‍රතිපත්තිය** - රාජ්‍ය අදායම, සංචාරක කර්මාන්තය තුළින් නංවන අතරේම, ඇද වැටී ඇති සංචාරක කර්මාන්තකරුවන්ට නව ආර්ථික ශක්තියක් ලබා දීම.

**21. මූල්‍ය යහ පාලනය**

17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන නැවත ක්‍රියාත්මක කිරීම තුළින්, රාජ්‍ය ආයතන දේශපාලනීයකරණය වීම වැළැක්වීම සඳහා ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම, පොලිස් කොමිසම, මූල්‍ය කොමිසම, මැතිවරණ කොමිසම, අල්ලස් කොමිසම හා ඒ තුළින් වර්තමාන රජය තුළ පවතින නාස්තිය, දූෂණය හා අක්‍රමිකතා පිටු දැකීම.

**ප්‍රතිපත්තිය** - 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම හා විනිවිද පාලනයක් තුළින් මූල්‍ය පාලනය.



**22. දූෂණය හා නාස්තිය ඉවතට**

රාජ්‍ය පාලනය තුළ දිනෙන් දින වර්ධනය වන ඥාති සංග්‍රහය පරාජය කරමින් සහ පවුල් ගස මරා දමමින් රාජ්‍ය මූල්‍ය ඉතිරි කර ගැනීම.

**ප්‍රතිපත්තිය** - දූෂණය හා අක්‍රමිකතාවලින් තොර යහ පාලනය

**23. අමාත්‍ය මණ්ඩලය පහළට**

ජාතික ආරක්ෂක වියදමට ආයෝජනයක් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලය 35කට අඩු කිරීම.

**ප්‍රතිපත්තිය** - රජයේ නාස්තිය පිටු දකිමින්, රට ණය නොකොට රාජ්‍ය ආරක්ෂාව වෙනුවෙන් ප්‍රාග්ධන ආයෝජනය

**24. කිරි ගොවියාට සහන මෙන්ම කිරි පාරිභෝගිකයාට සහන**

දේශීය කිරි ගොවියාට අත හිත දෙමින්, දේශීය දියර කිරි පරිභෝජනය ඉහළ නංවන අතරේදී, පිටි කිරි 400g පැකට්ටුවක් රුපියල් 190ට ලබා දීම.

**ප්‍රතිපත්තිය** - දේශීය කිරි පාරිභෝජනය ඉහළ දැමීම තුළින් ගැමි ආර්ථිකයට අත හිත දෙන අතරේම කිරි පාරිභෝජනය ඉහළ දමමින් පෝෂණ තත්ත්වය ඉහළ දැමීම

**25. පාරිභෝගික භාණ්ඩ සහන මිලට**

පාරිභෝගික භාණ්ඩ සහනදායි මිලට ලබා දීමට වැඩ පිළිවෙළක් හඳුන්වා දීම උදා.- පරිප්පු 1kg ක් රුපියල් 125ට ලබා දීම.

**ප්‍රතිපත්තිය** - ජනතාවගේ මිලට ගැනීමේ ශක්තියට සමානුපාතිකව පාරිභෝගික භාණ්ඩ මිල නියම කිරීම

**26. උපයන විට ගෙවන බදු සීමා කිරීම**

උපයන විට ගෙවන බදු සඳහා පනවා ඇති සීමාව ලක්ෂ හය (6) දක්වා ඉහළ දැමීම

**ප්‍රතිපත්තිය** - පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ආදායම් තත්ත්වය ස්ථාවරව පවත්වා ගැනීම

**27. මහජන ප්‍රවාහනයට සහන**

බස්, වෑන්, මෝටර් සයිකල්, ට්‍රැක්ටර්, ත්‍රී රෝද රථ සහ ලොරිවලට පනවා ඇති සියලුම බදු ඉවත් කිරීම.

**ප්‍රතිපත්තිය** - එදිනෙදා ප්‍රවාහන කටයුතුවල යෙදෙන සුඛෝපභෝගී නොවන වාහන මිලදී ගැනීම

**28. මාධ්‍ය නිදහස**

ජනමාධ්‍ය වෙත පවරා ඇති සියලු ආකාරයේ තහංචි ඉවත් කිරීම

**ප්‍රතිපත්තිය** - ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීම

**මූර්ත බලපෑම** Net Impact

| | | |
|---|---|---|
| 1. | සමස්ත වියදම - රුපියල් බිලියන (Total Expenditure) | 261 |
| 2. | සමස්ත ඉතිරි කිරීම් රුපියල් බිලියන (Total Savings) | 283 |
| 3. | වියදමට සාපේක්ෂව ඉතිරි කිරීම් - (අතිරික්තය) රුපියල් බිලියන (Savings over the Expenditure) (Surplus) | 22 |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා.

[පූ. භා. 11.07]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මට කොපමණ වේලාවක් තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට මිනිත්තු තිහක් තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
දැන් මගේ වේලාව හරියටම හරි නේද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලිනුත් වේලාවක් ගත්තා නේ. ඒක මේකට අඩංගු වන්නේ නැහැ නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
දැන් මගේ අවස්ථාව හරියටම හරි නේද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරියටම හරි. මිනිත්තු 25කින් ඉවර කළොත් වැඩිය හොඳයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, මා කථාව ආරම්භ කරන්නට පෙර මේ ටික කියන්න කැමැතියි. විශේෂයෙන්ම ආචාර්ය එන්.එම්.පෙරේරා මැතිතුමා 1973 අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් කරපු කථාවේදී එතුමා කියලා තිබුණා, අපි වාගේ දියුණු වෙමින් පවතින රටකට, රටක ආරක්ෂාව සහ සංවර්ධනය, සුබ සාධනය කියන අංශවලින් දෙකක් තෝරා ගන්න වෙනවාය කියලා. නමුත්, මම කියන්න කැමැතියි, අතිගරු ජනාධිපතිතුමා මේ කාරණා තුනම එක සැරේ අරගෙන, ජාතිය ඉදිරියට ගෙන යන්න තමන්ගේ 2009 අය වැය ලේඛනයත් පාදක කර ගෙන තිබෙනවාය කියලා. ඒ වාගේම මම එතුමාටත්, අපේ පක්ෂයටත් විශේෂයෙන් ස්තුතිවන්ත වුණා, මේ වගේ වැදගත් විවාදයක් ආරම්භ කිරීමට මා වාගේ කනිෂ්ඨ අමාත්‍යවරයකුට අවස්ථාව ලබා දීම ගැන.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියාම මට මතක් වෙන කාරණාවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මාත් ඔබතුමා වාගේ ගැමියෙක්. අපේ ගම්වල එකකට එකක් නොගැළපෙන දේවල් දකින කොට මිනිස්සු කියනවා, "අනේ කාලේ වනේ වාසේ" කියලා. ගැමියෙක් හැටියට ඒ කථාව කියලා තමයි මගේ කථාව ආරම්භ කරන්නට සිද්ධ වෙන්නේ.

ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් තීන්දුව ගැන ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සඳහන් කළා. ඒ තීන්දුවට අප එකඟයි. ඒ තීන්දුවට කිසි සේත් අප අභියෝග කරන්නේ නැහැ. ඒ කිව්ව ආකාරයට අප ඒක වෙනස් කරනවා. හැබැයි, මේ අවිනිශ්චිත ගිණුම කියන කාරණාව මේ රටේ අය වැය ලේඛනවල දිගින් දිගටම තිබුණා ගරු කථානායකතුමනි. මේක 2003 වර්ෂයේ දී විසර්ජන පනතට එකතු කළේ එක්සත් ජාතික පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂය මේක එකතු කර, ඔවුන් ඉතා පැහැදිලිව කිව්වේ, " 'ජාතික අයවැය දෙපාර්තමේන්තුව' ශිර්ෂයෙහි 'රාජ්‍ය සම්පත් කළමනාකරණය' වැඩසටහන යටතේ, පළමු උපලේඛනයෙහි දැක්වෙන පුනරාවර්තන හෝ මූලධන වියදම් සඳහා වෙන් කර ඇති මුදල් 2 වන උපවගන්තියෙහි විධිවිධානයන්ට යටත්ව, භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් ඕනෑම නිලධාරියකුගේ නියමය මත උපලේඛනයේ වෙනත් ඕනෑම ශීර්ෂයක් යටතේ ඕනෑම වැඩ සටහනකට මාරු කළ හැකිය. එසේ මාරු කළ මුදල් අදාළ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන පරිපූරක ඇස්තමේන්තුවකින් ආවරණය වූ අයුරින් සැලකිය යුතු ය. " කියලායි. මේ කියන්නේ, 2003 අංක 44 දරන විසර්ජන පනතෙනුයි. අප නොවෙයි. ඔබතුමන්ලා අමාත්‍යවරුන් වශයෙන් සිටි කාලයේ ඉදිරිපත් කළ විසර්ජන පනතේ මෙහෙම තිබෙන්නේ. [බාධා කිරීම්] පොඩ්ඩක් අහගෙන ඉන්න. ඔබතුමා වෙලාව වැඩිපුරත් අරගෙන කිවූ සියල්ලම මා ඉවසීමෙන් අහගෙන හිටියා. එම නිසා ඔබතුමාත් ගරු මන්ත්‍රීවරයෙක් විධියට මා කියන දෙය සැලකිල්ලෙන් අහ ගෙන ඉන්න.

ගරු කථානායකතුමනි, 2008 සැප්තැම්බර් මස 19 වන දින විසර්ජන පනතෙන් අප මේක තවත් විනිවිදභාවයට ගෙනැවිත් තිබෙනවා. අප මේකෙන් කියනවා, "භාණ්ඩාගාරයේ ලේකම්ගේ නියමය අනුව හෝ තත් කාර්ය සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් බලය දෙනු ලැබිය හැකි භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකුගේ නියමය නැතහොත් ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමය අනුව, මාරු කරනු ලැබිය හැකිය." කියා. අප මේකට නිශ්චිත නිලධාරියකුත් දක්වා තිබෙනවා. ඒ වාගේම, " (2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම මාරු කිරීමක්ම, එම මාරු කිරීම සඳහා වූ හේතු ද සහිතව 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීම සඳහා නියමිත ආණ්ඩුවේ මූල්‍ය කාර්ය සාධනයට අදාළ වාර්තාවන්හි, ඇතුළත් කරනු ලැබි යුතුය." කියාත් තිබෙනවා. අප ඇඟ බේරා ගන්නට උත්සාහ කර නැහැ. මේක පරිපූරක ඇස්තමේන්තුවකින් අනුමත වූ සේ සලකන්නටය කියා අප කියා නැහැ. අප මේ කාරණාව විනිවිද භාවයෙන්, පාර්ලිමේන්තුවට වඩාත් වග කියන තැනකට ගෙනැවිත් තිබෙනවා. ඒක අප මේ රටට පැහැදිලි කරන්නට අවශ්‍යයි. ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන් කාරණාත් එක්ක මේක වෙනස් කරන්න අප ලැහැස්තියි. විපක්ෂය මේක මහා විශාල කාරණාවක් හැටියට, රජය විසින් කළ මහා විශාල මූල්‍ය වරදක් හැටියට පෙන්වා දෙන්නට හදන නිසයි මා මේ පැහැදිලි කිරීම කළේ ගරු කථානායකතුමනි.

විශේෂයෙන් 2009 අය වැය වාර්තාව ඉදිරිපත් කරන්නේ, 2009 වර්ෂය සඳහා අප මේ පුරෝකථනයන් ඉදිරිපත් කරන්නේ ලෝකයම විශාල ආර්ථික අවපාතයකින් බැඳුණු යුගයකයි. 2009 වර්ෂයට මේ මේ සිද්ධීන් අනුව මෙපමණ ආදායමක් ලබා ගන්නට ලැබේවි, ඒ අනුව මෙපමණ වියදම් කරන්නට ලැබේවි කියන එකයි මෙම අය වැය ලේඛනයෙන් කියන්නේ. මේ සියල්ලම පුරෝකථනයන්. අපට ඒ අභියෝගය තිබුණා. මේ කොතෙක් කිව්වත්, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා "ඇමෙරිකාවේ ආර්ථිකය වැටුණාට අපට මොකද" කියා අහනවා. මට ඒ ප්‍රශ්නය ගැන පුදුමයි. ඒකයි මා අර ගැමි කියමන කිව්වේ. අපේ රුපියලේ අගය අඩු වීම ගැන කථා කරනවා. 2007 සිට ලෝකයේ පවතින ඉතාමත් ශක්තිමත් ව්‍යවහාරික මුදල් 2008 ඔක්තෝබර් 30 වන විට කොහොමද පල්ලෙහාට ගිහින් තිබෙන්නේ කියන එක පැහැදිලි වන වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්නට මා ඔබතුමාගෙන් අවසරය ඉල්ලනවා. මා ළඟ ව්‍යවහාරික මුදල් පිළිබඳව සඳහන් දිග ලැයිස්තුවක් තිබෙනවා. මම එයින් කිහිපයක් කියන්නම්. යූරෝ එක සියයට 11.84කින්, ඉන්දුනීසියාවේ රුපියල සියයට 11.85කින්, ස්වීඩනයේ ක්‍රෝන් එක සියයට 14.65කින්, පිලිපීනයේ පේසෝ එක සියයට 15.40කින්, කැනඩාවේ ඩොලර් එක සියයට 18.86කින්, ඉන්දියානු රුපියල සියයට 19.82කින්, බ්‍රිතාන්‍යයේ ස්ටර්ලිං පවුම සියයට 20.54කින් පහළ ගිය බව සඳහන් දිග ලැයිස්තුවක් තිබෙනවා. ඒ සම්බන්ධව කියන්නට මා වේලාව ගන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මේ ලැයිස්තුව හැන්සාඩ්ගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

අපිට විතරක් සිද්ධ වුණු කාරණාවක් හැටියට අපි මේ ආර්ථික අවපාතය ගැන කථා කරන්න යනවා නම් ඒක විනිවිදභාවයෙන් තොර ඉතාමත්ම පක්ෂග්‍රාහී කියමනක් හැටියට මම මේ සභාවට කරුණු දක්වනවා.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

ඒ වගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පසු ගිය දා අපේ මූල්‍ය ක්‍රමය පැසසුමට ලක් කළා. ගරු කථානායකතුමනි, ඒ ගැනත් සඳහන් කරන්න අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළා. ඔවුන් එම පුවත් පත් නිවේදනයේ ඉතා පැහැදිලිව මෙන්න මෙහෙම සඳහන් කර තිබුණා:

"2002 වසරේ සිට ශ්‍රී ලංකාව සියයට 6.5ක ශක්තිමත් සාමාන්‍ය ආර්ථික වර්ධනයක් ලබා ගනිමින් 2007 වසර වන විට ඒක පුද්ගල ආදායම එ.ජ. ඩොලර් 1,625ක් දක්වා වර්ධනය කර ගත් අතර, 2002 සිට 2007 දක්වා කාලය තුළ දරිද්‍රතාවය සියයට 22.7 සිට සියයට 15.2 දක්වා අඩු කර ගෙන ඇත. යටිතල පහසුකම්හි ආයෝජනය ශක්තිමත් කරමින් 2007 මුල් කාලයේ දී ආරම්භ කළ දස අවුරුදු සැලසුමෙන් (මහින්ද චින්තන) මෙම ක්‍රියාකාරිත්වය දිගුකාලීනව පවත්වා ගැනීම අරමුණු විය."

අප ඔවුන් කියන ඒවා අනුගමනය කරපු රජයක් නොවෙයි. මහින්ද චින්තනය කියන්නේ මේ රටට ගැළපෙන මේ රටේ ජනතාව අනුමත කළ වැඩ පිළිවෙළක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපව පැසසුමට ලක් කළා. ගරු කථානායකතුමනි, මා එම පුවත් පත් නිවේදනය **සභාගත*** කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර නිශ්ශබ්ද වන්න. මම ගෞරවයෙන් ආරාධනා කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට මූලාසනයට පැමිණෙන ලෙස.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு இரா. சந்திரசேகர்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. RAMALINGAM CHANDRASEKAR] *took the Chair.*

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මේ කාරණයට එන්න කැමැතියි. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, අවුරුදු ගණනාවක් විපක්ෂයේ හිටපු කණ්ඩායමක් හැටියට එතුමන්ලා වග කිව යුතු විකල්ප අය වැය යෝජනාවලියක් ඉදිරිපත් කළාය කියා. මම ප්‍රාර්ථනා කරනවා, එතුමන්ලාට තව බොහෝ කාලයක් විකල්ප අය වැය යෝජනාවලියත් එක්ක විපක්ෂයේ ඉන්න ලැබේවා කියා. එතුමා කිව්වා වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විකල්ප අය වැය යෝජනාවලිය ඉදිරිපත් කළේ මේ රට වැඩිම කාලයක් පාලනය කරපු පක්ෂය. මේ රටේ වැඩිම අය වැය ලේඛන ප්‍රමාණයක් ඉදිරිපත් කරපු පක්ෂය. මේ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට පෙර දිනය මහ භාණ්ඩාගාරයට කාර්ය බහුල දිනයක් වුණා. ඒ කාර්ය බහුලත්වය මත වුණත් විපක්ෂය වග කීමෙන් ඉදිරිපත් කරපු විකල්ප අය වැය යෝජනාවලිය සැලකිල්ලට භාජන කළ යුතුයි කියා මම කල්පනා කළා. ඒ විකල්ප අය වැය යෝජනාවලිය මම ගෙන්වා ගත්තා. ඒක එතුමා සභාගත කළ නිසා මම සභාගත කරන්න අවශ්‍ය නැහැ. නමුත් අපේ වැඩ පැත්තකින් තියලා විපක්ෂයේ මේ අය වැය යෝජනාවලියේ යෝජනා එකින් එක සැලකිල්ලට භාජනය කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තෙන්ම අපි මෙහි සඳහන් කාරණා කිහිපයක් ගැන කථා කළොත් ප්‍රථමයෙන්ම කියනවා, සමෘද්ධි ලාභී පවුලකට මාසයකට රුපියල් 5,000ක සහනාධාරයක් දෙනවාය කියා. මේක අර "Regaining Sri Lanka" කියන පොතේ නම් තිබුණේ නැහැ. ඒ පොතේ 121 වන පිටුවේ ඉතා පැහැදිලිව තිබුණේ මොකක්ද? තමුන්නාන්සේලා තවමත් ඒක කියවලා නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න. මම තමුන්නාන්සේ කියපු කාරණා සියල්ල අහ ගෙන හිටියා. මම කථා කරලා ඉවර වුණාට පස්සේ ගරු මන්ත්‍රීතුමා උත්තර දෙන්න. ඒ පොතේ 121 වන පිටුවේ ඉතා පැහැදිලිව තිබුණේ මේ රටේ සහනාධාර කප්පාදු කළ යුතුයි කියලායි. ඔබතුමන්ලා මෑත ඉතිහාසයේ 2002, 2003 සහ 2004 වර්ෂ සඳහා අය වැය ලේඛන තුනක් ඉදිරිපත් කළා. ඒ අය වැය ලේඛනවල මේක සඳහන් වී තිබුණේ නැහැ. හැබැයි, දැන් කියනවා, රුපියල් 5,000ක් දෙනවාය කියා. මේ කියමන් උඩු යටිකුරු වුණු කියමන්. ඒ කියන්නේ අංශක 360ක් ආපස්සට හැරිලා කථා කරන දේවල්. අනෙක් තර්කය, මේ එකක්වත් යථාර්ථවාදී නැහැ කියන එකයි. රුපියල් 5,000 ගණනේ මේ රටේ සමෘද්ධි ලාභී පවුල්වලට දෙන්න නම් -එතුමන්ලා මේ රටේ සමෘද්ධි පවුල් ගණන දන්නවාද කියා මම දන්නේ නැහැ. මේ රටේ සමෘද්ධි ලාභී පවුල් 20,000ක් සිටිනවා- රුපියල් බිලියන 110ක් අලුතෙන් සල්ලි හොයන්න ඕනෑ. කොහොමද මේ සල්ලි හොයන්නේ? කොහේවත් එහෙම සඳහනක් නැහැ. ඒ කියන්නේ රුපියල් බිලියන 110ක් -සියක් කෝටි 110ක්- අලුතෙන් සෙවිය යුතු යෝජනාවක් පළමු වන ආකර්ෂණීය යෝජනාව හැටියට ඉදිරිපත් කරනවා. ඊළඟට, "බදු බර පහළට" කියා සඳහන් වෙනවා. බදු බර පහළ දමපු හැටි මට මතකයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. වැට් බද්ද සරල කිරීමට 2003 වර්ෂයේ මොකද කළේ? ඔබතුමන්ලාට මතක නැත්නම් ආපහු තමන්ගේ අය වැය ලේඛන බලන්න. බදු අනුපාතය පහසු කරන්නය කියා අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය සඳහා තිබුණු සියයට 20ක් වුණු වැට් එක සියයට 15ට ගෙනාවා. අත්‍යවශ්‍ය භාණ්ඩවලට -කරවල කැල්ලට, පරිප්පු ටිකට, සීනි ටිකට- තිබුණු සියයට 10ක වැට් බදු අනුපාතය සියයට 15ට ගෙනාවා. මොකටද මේ? මොකටද මේ කැකිල්ලේ තීන්දුව ගත්තේ? පහසු කරන්න. සියල්ල පහළොවේ මට්ටමට ගෙනෙන්නයි. අද කථා කරනවා, වැට් බදු වෙනස් කරලා බදු බර පහළට ගෙනෙනවාය කියලා. බදු බර පහළට ගෙනාවා තමයි. තමන්ගේ යහළුවන්ට බදු නිදහසක් දෙන්න උත්සාහ කරලා, නියෝජිතයෙක් විධියට ආණ්ඩුවට ගෙවන්න තමන් එකතු කර ගත්ත -ලාච්චුවේ එකතු වෙච්ච- වක්‍ර බදු ප්‍රමාණයත් තමන්ට එපා කියලා, මේ දුප්පත් රටේ ජනතාවගේ මුදල් එපා කියන පනත් ගෙනැල්ලා තමයි, මා හිතන්නේ එවැනි බදු සහන ලබා දෙන්න කල්පනා කරනවා ඇත්තේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊළඟට තියෙන්නේ මොකක්ද? රණ විරුවන්ගේ ආදායම ඉහළට. මිලේනියම් සිටි සිද්ධියත් එක්ක මේ රටේ රණ විරුවාගේ හදවත විනාශ කරපු එක්සත් ජාතික පක්ෂය අද කථා කරනවා, රණ විරුවන්ගේ යහපත සඳහා අලුතින් තවත් රුපියල් බිලියන 40ක්, 50ක් වියදම් කරන්න.

ඒ වාගේම රාජ්‍ය සේවක වැටුප් ඉහළට දමන්න කථා කරනවා. ඔවුන්ගේ පාලන සමයේ රාජ්‍ය සේවකයාට තිබුණු තැන මොකක්ද? චක්‍රලේඛ අංක 16 ගෙනැවිත් රාජ්‍ය සේවයට කිසිවකු ගන්නේ නැහැයි කිව්වා. 2004 අය වැය ලේඛනයේ මොකක්ද තිබුණේ? රුපියල් බිලියන 8ක් වියදම් කරන්න යෝජනා කර තිබුණා, රාජ්‍ය සේවකයා ගෙදර යවන්න. කුමන වයස් සීමාවේ වුණත් විශ්‍රාම ගන්න පුළුවන්. ඔහුට විශ්‍රාම පඩිය ගෙවන්න සූදානම්. ඇයි, ඒ? මොකක්ද අරමුණ? එක වර්ෂයකට ලක්ෂ දෙක බැගින් රාජ්‍ය සේවකයන් අඩු කරන්නයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රුපියල් 7,500ක මාසික වැටුප් වැඩි වීමක් කරන්න නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවම වශයෙන් අලුතින් රුපියල් බිලියන 100ක් සොයා ගන්න අවශ්‍යයි. ඒ මුදල සොයා ගන්න ක්‍රමයක් තිබෙනවාද? සොයා ගන්නා ක්‍රම වශයෙන් කියන්නේ දූෂණය අවම කරමු, දේශපාලන හෙංචයියලාට, ඥාතීන්ට උදවු කිරීම අවම කරමු කියලායි. මෙහෙම පොදු කතාන්තර කීපයක් විතරයි තිබෙන්නේ.

ඒ වාගේම, "විශ්‍රාම වැටුප ඉහළට" කියා කථා කරනවා. [බාධා කිරීමක්] ඔබතුමන්ලාට අහගෙන ඉන්න අමාරුයි. මේ රටේ විශ්‍රාමිකයාට තිබුණු, මේ රටේ රාජ්‍ය සේවකයාට තිබුණු ප්‍රධාන අයිතිය උදුරා ගත්තා. විශ්‍රාම වැටුප අහිමි කළා. මහින්ද රාජපක්ෂ

* ***පුස්තකාලයේ තබා ඇත.***
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ජනාධිපතිතුමා පත් වුණු නිසා තමයි, මේ රටේ රාජ්‍ය සේවකයාගේ ඒ පරම අයිතිය නැවත වතාවක් ලැබුණේ. අද කථා කරනවා, රුපියල් 3,500කින් වැටුප වැඩි කරන්න. මේකට කීයක් අවශ්‍යද? අඩු ගණනේ රුපියල් බිලියන 19ක් -රුපියල් සියක් කෝටි 19ක්- අවශ්‍යයි මේ සුරංගනා කථාව ඉෂ්ට කරන්න.

පෙට්‍රල්, ඩීසල්, බූමිතෙල් ගැනත් මා මේ පාර්ලිමේන්තුවේදී පැහැදිලි කළා. බදු අනුපාතයන් අඩු කරන්න අද මේ කථා කරන අය 2003 වර්ෂයේදී ඉන්ධන සඳහා සියයට 41ක් බදු ගත්තා. මේ වර්ෂයේ ගත වුණු මාසවල අපි අරගෙන තිබෙන්නේ සියයට 9.8යි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මා මේ සියල්ලම ගැන කියන්නේ නැහැ. මේවා අය වැය යෝජනාවන් හැටියට නොව, බලයට ඒමේ වුවමනාව තිබෙන පක්ෂයක ඡන්ද පොරොන්දු ඇතුළත් මැතිවරණ ප්‍රකාශනයක් හැටියටයි මා දකින්නේ. මේ හැම එකක් ගැනම මොකක් හෝ කියා තිබෙනවා. තේ, පොල්, රබර් ගැනයි, ඇඟලුම් ගැනයි මොකක් හෝ වාක්‍යයක් යොදා තිබෙනවා.

ඊළඟට සඳහන් වෙලා තිබෙනවා, "ග්‍රාමීය ජනතාවට රැකියා අවස්ථා" කියලා. අපි දන්නවා, රැකියා අවස්ථා දුන්නු හැටි. අපිත් ගම්වල ඉන්න මිනිස්සු. එක පාරක් හැදුණේ නැහැ. එක ඒදණ්ඩක් වැටුණේ නැහැ. එක පාරක විදුලිය ගියේ නැහැ. දැන් අලුතින් මතක් වෙලා තිබෙනවා.

ණය පොලී අනුපාතය ගැනත් මෙහි සඳහන් වෙනවා. මේ ගැන අපි හැම දාම කථා කරනවා. මේ සම්බන්ධයෙන් හැම දාමත් අපි කියනවා. 2004 දී අපි බලයට පත් වන කොට දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 105ක් මේ රට ණයයි. අද ඒක සියයට 85කට ගෙනැවිත් තිබෙනවා. ඒක සියයට 85කට ගෙනැවිත් තිබෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ සියල්ල හකුළා ගෙන ඉඳලා නොවෙයි. උපාධිධාරීයාට රැකියාව දීලා, මේ රටේ ප්‍රධාන ප්‍රශ්නය හැටියට තිබෙන ත්‍රස්තවාදය පරාජය කිරීමට අවශ්‍ය ඒ සටන ඉදිරියට ගෙන ගිහින්, මේ රටේ නොදියුණු ගමට පාර හදා දීලා, විදුලිය දීලා, ඒ සියලු කාරණා එක වර ඉෂ්ට කරන ගමන් තමයි ණය බර සියයට 85 දක්වා පහතට ගෙනෙන්න අපි කටයුතු කර තිබෙන්නේ.

තවත් එකක් තිබෙනවා, "නව අධ්‍යාපන ප්‍රතිපත්තියක්" කියලා. විශ්වවිද්‍යාලවලට ඇතුළු කරන ශිෂ්‍ය ප්‍රමාණය දෙගුණයකින් වැඩි කරන්න කථා කරනවා. මා හිතන හැටියට වර්ෂයකට ඇතුළත් කර ගන්න ශිෂ්‍ය ප්‍රමාණය දැන ගෙන නොවෙයි මේක ලියා තිබෙන්නේ. වර්ෂයකට විශ්වවිද්‍යාල 15කට 15,000යි ඇතුළු කර ගන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ එක වර්ෂයකට තවත් 15,000ක් ඇතුළු කර ගන්නවාය කියනවා. මේ රටේ බුද්ධිමත් ශිෂ්‍ය ප්‍රජාව මේ කියන ලේඛනයෙන් රවටා ගන්න පුළුවන්ය කියා එක්සත් ජාතික පක්ෂය කල්පනා කරනවා නම්, මා හිතනවා ඒක ලොකු වැරැදීමක්ය කියලා.

ඊළඟට, "වීවලට සාධාරණ වෙළෙඳ පොළක්" කියා සඳහන් කරනවා. රුපියල් 12කට වී කිලෝ එකක් විකුණා ගන්න බැරිව ගොවියා අඬ අඬා හිටපු යුගයක තමයි අපි රට භාර ගත්තේ. අද මේ රටේ ගොවියා කිසි කරදරයක් නැතිව රුපියල් 30කට, රුපියල් 35කට වී කිලෝවක් විකුණා ගන්නවා. එහෙම නම් වෙනත් විකල්ප යෝජනා නැවත ඉදිරිපත් කරන්න අවශ්‍ය නැහැ. අද ගොවියා සන්තෝෂයෙන් ඉන්නවා. ඔබතුමන්ලාට අවශ්‍ය උත්තරය උතුරු මැද පළාතේ ගොවියා මාස දෙකකට කලින් ලබා දුන්නා.

ඊළඟට, පොහොර සහනාධාරය ගැන සඳහන් වෙනවා. අපට මතකයි, 2004 වර්ෂයේ අපි බලයට පත් වන්න පෙර කෘෂිකර්ම හා පශු සම්පත් ඇමතිතුමා වශයෙන් සිටියේ ගරු එස්.බී. දිසානායක මැතිතුමා බව. එතුමා විශාල අසීරුතාවකට පත් වුණා. එතුමා ලංකාව පුරා කාඩ් පතක් බෙදා ගෙන ගියා, පොහොර සහනාධාරය ලබා ගැනීමට කියලා. මන්ත්‍රීවරු ගිහින් විශාල උත්සව පවත්වලා ගොවීන් අව්වේ පැය ගණන් පෝලිමේ තියලා ඔවුන්ට කාඩ් පත් දුන්නා. මාසයක්, දෙකක්, තුනක් ගියා. පොහොර සහනාධාරය ගන්න ගොවියා බලා ගෙන හිටියා. අනේ මේ කාඩ් එකට මොකවත්ම නැහැ. නිකම්ම කාඩ් එක තියා ගෙන ඉන්න තමයි ගොවියාට සිදු වුණේ. විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට ඒ කාඩ් පත මා මේ සභාවේදී හැන්සාඩ් ගත කිරීම සඳහා සභාගත කළ බව මට මතකයි. නමුත් අද රුපියල් හයදහසට පොහොර මිටිය යද්දී අපි එම පොහොර මිටිය රුපියල් 350කට -එම සහනාධාරය- ගොවියාට දෙනවා. ඒ නිසා අලුතෙන් කථා කරන්න දෙයක් නැහැ. මම ඒකයි කිව්වේ මේක දේශපාලන ලියවිල්ලක් කියලා.

ඊළඟට සඳහන් වෙනවා, "රාත්‍රී බස් සේවයක් සමඟ කාර්යක්ෂම ප්‍රවාහන සේවයක්" කියලා. මොකෙන් ද මේ දෙන්න යන්නේ? ඒකත් අර සතොස ව්‍යාපාරය රාත්‍රියට ඇරලා තිබ්බා වාගේ ඇති කියලා මම කල්පනා කරනවා. මට මතකයි, අපේ දැරණියගල පැත්තේ එහෙම සතොස ඇර ගෙන ඉන්නවා, මොකෙක්වත් නැහැ. ඇයි? මේ තීන්දු ගන්න මිනිස්සු මේ රට ගැන, රටේ ප්‍රදේශ ගැන දන්නේ නැහැ. දැන් මේ බස් සේවයක් ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගැමියෙක් හැටියට මම දන්නවා, අදටත් අපේ පළාත්වල රාත්‍රියේ අවසානයට යන බස් එක ලංගමයේ බස් එකක් බව. මිනිස්සු බලා ඉන්නේ අවසාන ලංගම බස් එකේ රාත්‍රියට ගෙදර යන්න. එතකොට ලංගම බස් එක දං ගෙඩිය උඩ තියලා භාගයක් බෙල්ල කපලායි තිබුණේ. අපි තමයි ලංගම රැක ගෙන තිබෙන්නේ. දුම්රිය සේවය -රජයේ මහා ප්‍රවාහන සේවය- දුම්රිය අධිකාරියක් ගෙනැල්ලා විනාශ කරන්නයි සූදානම් වුණේ. දැන් කථා කරනවා, රාත්‍රී බස් සේවයක් සමඟ කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ගැන. ඒ වාගේම, "අමාත්‍ය මණ්ඩලය පහළට" කියලා කථා කරලා තිබෙනවා. අපි විපක්ෂයේ ඉන්න කාලයේදී හැම මන්ත්‍රීවරයකුටම ආරාධනා කළා, එකතු වෙලා ඕනෑම ඇමතිකමක් අර ගෙන ආණ්ඩුව ශක්තිමත් කරන්නය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඒකයි කිව්වේ දැන් තනිකර අංශක තුන්සිය හැටේ ඉඳලා තමයි මේ එක්සත් ජාතික පක්ෂය කථා කරන්නේ කියලා.

ඊළඟට, මෙම විකල්ප අය වැය ලේඛනයෙන් මාධ්‍ය නිදහස ගැනත් කථා කරනවා. මාධ්‍ය නිදහස කියන එක ඇත්තටම මේ අය වැය ලේඛනයකට අදාළ කාරණාවක් නොවෙයි. ඒක රටේ පොදු කාරණාවක්. හැබැයි මේ කථා කරන්නේ අර රිචර්ඩ් ද සොයිසා මරා දමපු කණ්ඩායමේ අය තමයි. මාධ්‍ය වාගේ නොවෙයි, රටක තිබෙන ප්‍රධානම අයිතිය අධිකරණයයි. අධිකරණයේ විනිශ්චයකාරයින්ට ගල් ගහපු කණ්ඩායම අද විකල්ප අය වැය ලේඛනයක් තුළින් මාධ්‍ය නිදහස ගැන කථා කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මම ගණන් හදලා බැලුවා. මේ කියන යෝජනා ඉෂ්ට කරන්න නම් ගණනය කළ හැකි වියදම් ගත්තොත් අවම වශයෙන් රුපියල් බිලියන 290ක් අලුතෙන් අවශ්‍යයි. මේ අවම පැත්තට අර ගෙන ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේකේ ගණනය කළ නොහැකි වියදම්වලට දළ වියදමක් එකතු කළ විට, බිලියන 400ක් තිබෙනවා. ඒක අලුත් වියදමක්. බිලියන 400ක් කියන්නේ අපේ මේ වර්ෂයේ වියදම. මේ වර්ෂයේ පුනරාවර්තන වියදම බිලියන 806යි. ඒකෙන් භාගයක් සඳහා මේ අලුත්, ආකර්ෂණීය යෝජනා මේ වග කිව යුතු විපක්ෂය ඉදිරිපත් කරනවා. මේ සල්ලි සොයා ගන්නේ කොහොමද? එතුමන්ලා කියන විධියට අඩු වන වියදමක් හැටියට තිබෙන එකම දේ මේ ඇමති මණ්ඩලය නම්, එතුමන්ලා කවදා හෝ සද්භාවයෙන් ඒක අඩු කළොත් උපරිම විධියට රුපියල් බිලියනයකට අඩු ගණනක් ඉතුරු කර ගන්න ලැබේවි. නමුත් රුපියල් බිලියන 400ක වියදමක් කරන්නයි කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කුඩා කාලයේදී පාසලේදී අපට රචනා ලියන්න දෙනවා. "ඇලඩින්ගේ පුදුම පහන අපිට ලැබුණොත් මොනවාද අපි කරන්නේ?" මෙන්න මෙහෙම ලේඛනයක් තමයි මේ වග කිව යුතු විපක්ෂය මේ රටේ ජනතාවට ඉදිරිපත් කළේ. මේක ජනතාව දන්නවා. මොකද මම මේ ගැන

සාකච්ඡා කරන්න මාධ්‍යවේදී සහෝදරයින් පිරිසක් ගෙන්වා ගත්තා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැදගත් විපක්ෂයක් ඉදිරිපත් කර තිබෙන බරපතළ දෙයක් නිසා මේ ගැන කථා කරන්න ඕනෑ කියලා, මේ අය ගෙන්වලා මෙන්න මේ සඳහායි ඔබතුමන්ලා කැඳෙව්වේ කියලා මම කියන කොටම ඒ මාධ්‍යවේදීන් නැඟිටලා "අනේ ඇමතිතුමා, ඔබතුමා අපිව කැඳෙව්වේ මේ කාරණාවටයි කියලා දන්නවා නම් අපි එන්නේ නෑ, මේ වාගේ කඩදාසි වෙනුවෙන් අපේ වෙලාව නාස්ති කරන්න අපි සූදානම් නැහැ"යි කිව්වා. ඒ මේ රටේ මතය. ඒ නිසා මම එක්සත් ජාතික පක්ෂයට කියනවා -මහ ලේකම්තුමාත් ඉන්නවා- ප්‍රවේශම් වෙන්න කියලා. අපි එක්සත් ජාතික පක්ෂයට ආදරේ නැහැ, හැබැයි ප්‍රජාතන්ත්‍රවාදයට ආදරෙයි. මේ රටේ තිබෙන ප්‍රධාන විපක්ෂය හැටියට මේ පක්ෂයේ ඉන්නේ කුමන්ත්‍රණකාරයෝ කියලා මට පෙනෙන්නේ දැනුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ කිසිම දවසක මෙහෙම විකල්ප අය වැය ඉදිරිපත් කරලා දේශපාලන පක්ෂ පහළට වැටෙනවා අපි දැකලා නැහැ.

ඒ නිසා මට ලැබී තිබෙන කාල වේලාව අනුව අපේ අය වැය ලේඛනයේ -මහින්ද චින්තනයත් එක්ක ඉදිරිපත් කරපු අය වැය ලේඛනයේ- කාරණා කිහිපයක් ගැන පමණක් මම කථා කරන්න කැමතියි. විශේෂයෙන්ම අපි කිව්වා, අද මුළු ලෝකයම ආර්ථික අර්බුදයකින් දැවෙනවා කියලා. එහෙම නම් අපි කොහොම ද මේකට මුහුණ දෙන්නේ? අපිට මේකෙන් ගැලවෙන්න බැහැ. ඒ නිසා අපි අදටත් මහින්ද චින්තනයේ තිබුණු යම් යම් කරුණු කාරණාත් එක්ක තමයි ශක්තිමත්ව ඉන්නේ. "අපි වවමු - රට නඟමු" වැඩසටහන දියත් කරලා අපේ නායකයා ගිහිල්ලා වෙලට බහින කොට "මේවා අවශ්‍ය ද, මේවා මෝස්තර නේද" කියලා සමහරු හිනා වුණා. හැබැයි ඒ වර්ෂය තුළ ඒ කන්නයේ ඊට පෙර කන්නයට වැඩි කුඹුරු අක්කර ප්‍රමාණයක් -කුඹුරු අක්කර 88,000ක්- මේ රටේ මිනිස්සු වැඩ කළා. පිට රටින් තිරිඟු පිටි ගෙන්වන එක සියයට 40කින් අඩු වුණා. අද අපි සහල් සම්බන්ධව යම් කිසි ස්වයංපෝෂිතභාවයකින් ඉන්නේ මෙන්න මේ කාරණාත් එක්කයි; පොහොර සහනාධාරය ලබා දීමත් එක්කයි. එහෙම නම් අපි ඒ කාරණාවෙන් ආදර්ශ ගත යුතුයි.

අපි සෙස් බදු ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම මේ කථා කරන්න බලාපොරොත්තු වන්නේ ඒ කාරණාව ගැනයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෙස් බදු ගණනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ මේ රටේ නිෂ්පාදකයා ආරක්ෂා කරන්නයි. සෙස් බද්දක් කියා කියන්නේ අපි ආදායමක් බලාපොරොත්තුවෙන් ඇති කරන බද්දක් නොවෙයි. ඒ සෙස් බද්ද පැහැදිලිවම යෙද වෙන්නේ ඒ අදාළ කර්මාන්තයේ යහපතටයි. තිරිඟු පිටි පිළිබඳව කියා තිබෙන දෙය ගැන අපි බලමු. තිරිඟු ඇට සඳහා සියයට හයට තිබුණු බද්ද සියයට දහය දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම ආනයනය කරන තිරිඟු පිටි සඳහා සියයට පහක සෙස් බද්දක් පනවා තිබෙනවා. එතුමා ඇහුවා අපි තිරිඟු වවලා කොච්චර කල්ද කියා. තිරිඟු වවන්න අවශ්‍ය නැහැ. මේ රටේ වවන්න පුළුවන් දේවල් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. තිරිඟු වෙනුවට ඇයි අපට බත් කන්න බැරි? තවත් ධාන්‍යයක් තිබෙනවා. අපට ඉරිඟු ප්‍රයෝජනයට ගන්න බැරි ඇයි? අපි හැම දාමත් ලෝකයේ තිබෙන පිටි ගුලියත් එක්ක රැඳිලා ඉන්න ජාතියක් වන්න අවශ්‍යද? අපි එයට වඩා අඩියක් ඉදිරියට තියන්නේ නැද්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ සියයට පහ වැඩි කළේත් දුර දිග සොයා නොබලා නොවෙයි. තිරිඟු පිටි මිල පසු ගිය මාසයත් එක්ක තිබුණු ඉහළ යාම අද පහළට එන්න පටන් අරන් තිබෙනවා. අපි මේ කාරණාවත් බලලා තමයි මේ වෙලාවේ යම් කිසි සෙස් බද්දක් දමලා මේ රටේ එවැනි නිෂ්පාදනවල යෙදෙන අයට සහනයක් ඇති කළේ. අපි ජාතියක් හැටියට මේ විධියට අඩියක් ඉස්සරහට තියන්න අවශ්‍යයි. මේ යැපුම් මානසිකත්වයෙන් එහාට අපි යන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවර අය වැය මඟින් උඳු, කුරක්කන්, කව්පි, තල වැනි දේශීය කෘෂි නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා ආනයනය කරන එවැනි නිෂ්පාදන සඳහා සියයට 15ක සෙස් බද්දක් පැනවීමට යෝජනා කර තිබෙනවා. අපට මේවා මෙහේ වවන්න පුළුවන්. අපේ මිනිසුන් වවනවා. අපේ මිනිස්සු කාලයකට මේවා වවලා විකුණා ගන්න බැරිව දුක් විඳිනවා. එහෙම නම් රජයක් හැටියට අපි මේ අඩිය ඉස්සරහට තියන්න ඕනෑ. මාසයක්, දෙකක්, තුනක් සමහර විට මෙහෙම මිල ඉහළ යන්න පුළුවන්. නමුත් අපි ඒ ගමන යා යුතුයි. ඒක අපේ වගකීම.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඇහුවා, මේ අය වැය ලේඛනයේ මොනවාද තිබෙන්නේ කියා. මේ අය වැය ලේඛනයේ සියල්ලම තිබෙනවා. මේ අය වැය ලේඛනය, ක්ෂණික විසඳුම්, මධ්‍යකාලීන විසඳුම් ඒ වාගේම දීර්ඝ කාලීන විසඳුම් -මේ ජාතිය අඩියෙන් අඩිය ඉස්සරහට ගෙන යන්න අවශ්‍ය සියල්ල- ගොනු කර තිබෙන අය වැය ලේඛනයක්ය කියා මා කිව්වේ ඒකයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඒ වාගේම කිරි පිටිවලට සෙස් බද්දක් පැනවීම ගැනත් කථා කළා. මේ පියවරත් අපි තියන්න අවශ්‍යයි. මේකටත් කටයුතු කළේ ලෝකයේ කිරි පිටි මිල අඩු වෙගෙන එන තත්ත්වය බලලා ඒ කාරණාවලටත් ගැළපෙන -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
විනාඩි දෙකයි නේ තිබෙන්නේ. මට කියන්න තවත් බොහෝ කරුණු තිබෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ කරුණු හැන්සාඩ්ගත කරන්න මා ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා. මා එම කරුණු ඇතුළත් ලියවිල්ල **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ එකින් එකට අපි ගියේ මේ රට ගැන බොහොම දුර දැක්මක් ඇති මහින්ද චින්තනයත් එක්කයි. එහෙම නැතිව අද මේ ලේඛනයක් ඉදිරිපත් කරලා අපි කල්පනා කරනවා නම් මේ ලේඛනය දැකලා මේ රටේ ඉන්න මිනිස්සු ඇවිත් අපේ පක්ෂයට එකතු වෙයි, නැත්නම් අපේ ජයග්‍රහණය, අප සිහින දකින ඇමතිකම් ටික අරන් දෙන්න එකතු වෙයි කියා, ඒක විහිළුවක්. මේ රටේ බුද්ධිමත් මිනිස්සු දැන් ඒ තත්ත්වයේ නැහැ. ඊට වඩා බොහොම ඉහළ බුද්ධියක් තිබෙන ජනතාවක් ඉන්න රටක් හැටියට අපි මේ ගැන කල්පනා කරන්න ඕනෑ.

සමහරු ඇහුවා, මැතිවරණ වර්ෂයක් සඳහා මැතිවරණ අය වැය ලේඛනයක් ඉදිරිපත් කරනවාද කියා. මැතිවරණ අය වැය ලේඛන ඉදිරිපත් කරන්න අවශ්‍ය නැහැ මහින්ද චින්තන යටතේ. පසු ගිය පළාත් සභා මැතිවරණ දෙක උදාහරණයකට ගත්තොත් විපක්ෂය කථා කළේම උදර පෝෂණය ගැනයි. නමුත් ජනතාව ඒ ගැන සැලකුවාද? කෑගලු දිස්ත්‍රික්කයේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව විපක්ෂයට හොඳ තීන්දුවක් ලබා දුන්නා. මහින්ද චින්තනය කියන දුර දක්නා දර්ශනයත් එක්ක යන්න මේ රටේ මිනිසුන් සූදානම්ය කියා හොඳ පණිවුඩයක් ලබා දුන්නා. ඒ නිසා අපට එහෙම අවශ්‍ය නැහැ. නමුත් ජාතිය ඉදිරියට යන ගමන් මඟට ප්‍රධානම කාරක බලවේගය හැටියට අය වැය ලේඛනය යොදා ගැනීමේ වගකීම තමයි මේ රටේ රාජ්‍ය නායකයාට තිබුණේ. එතුමා ඒක ඉෂ්ට කළා. ඒ නිසා මා කියන්නේ මෙය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම තුලනාත්මක අය වැය ලේඛනයක්ය කියන එකයි. රටේ සියලු පාර්ශ්වයන් දිහා බලලා පියෙක් තමන්ගේ පවුලේ සියලු දරුවන් දිහා බලලා -උස් මිටිකම්, බාල මහලුකම් බලන්නේ නැතිව ඔවුන්ගේ සියලු අවශ්‍යතා දිහා බලලා, දීර්ඝ කාලීනව, කෙටි කාලීනව ඔවුන්ගේ දියුණුව දිහා බලලා- ඉදිරිපත් කරපු තමන්ගේ වැඩ පිළිවෙළක් විධියට මට මේක හඳුන්වන්න පුළුවන්.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා ]

අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඊයේ මේ ගරු සභාවේදී, අවි බිම තියලා ප්‍රජාතන්ත්‍රවාදයට එන්නය කියා එල්ටීටීඊ සංවිධානයට ආරාධනා කළා. අපි සූදානම් ඔවුන් එක්කත් සාකච්ඡා කරන්න. මොකද, මා අර පවුලක උදාහරණය ගත්තා නේ, ඒ පවුලේ දඟකාර පුත්‍රයා බවට පත් වෙලා ඉන්න කෙනාටත් ආරාධනාවක් කරනවා මේ ගමන එන්න. ඔහුටත් මුදල් වෙන් වෙලා තිබෙනවා. ඔවුන්ගේ පුනරුත්ථාපනයට රුපියල් මිලියන 3,000ක් මේ අය වැය ලේඛනය තුළ තිබෙනවා. නැවත පදිංචි කිරීමට රුපියල් මිලියන 500ක් මේ අය වැය ලේඛනය තුළ තිබෙනවා. මා හිතන්නේ විපක්ෂය ලොකු අසීරුතාවකට පත් කළ අය වැය ලේඛනයක් මේක. මේකේ කථා කරන්න, දොස් කියන්න, වැරදි හොයන්න බැහැ. ඒ නිසා ඔවුන් විශාල අසීරුතාවකට පත් වනවා. ඒ නිසා තමන්ගේ අර විකල්ප යෝජනාත් එක්ක සංසන්දනය කරලා ජනතාවට කථා කරනවා හැරෙන්න අද විපක්ෂයට වෙනත් ක්‍රමයක් නැහැ. විපක්ෂයක් හැටියට අර සාම්ප්‍රදායික දෝෂාරෝපණය කරනවා හැරෙන්න වෙනත් යමක් ඔවුන්ට කරන්න පුළුවන්ය කියා මා හිතන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා මා දිහා බලනවා. මා දීර්ඝව කථා කරන්නේ නැහැ. මා වෙනත් අයගේ වෙලාව ගන්න සූදානම් නැහැ. මොකද, අපේ දක්ෂ කථිකයන් රාශියක් අද මේ ගැන කරුණු පෙන්වන්න, විවාද කරන්න සූදානමින් ඉන්නවා. මා අවසාන වශයෙන් කියන්නේ මේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය මහින්ද චින්තනයේ නියම කැඩපතක් බවයි. මේ රටේ ජාතිය දිහා එක වර බලන, අභියෝග සියල්ල ඉදිරියට ජය ගනිමින් යන වැඩ පිළිවෙළේ නියම කැඩපතක්. ඒ කැඩපත ඊයේ දවසේ මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න අපට නායකත්වය දීපු අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ සඳහා සුවිශේෂ වෙහෙසක් ගත්ත අපේ මුදල් අමාත්‍යාංශයේ නව ලේකම්තුමා, නියෝජ්‍ය ලේකම්වරු ඇතුළු අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ටත් සුවිශේෂී ස්තුතිය ජාතිය වෙනුවෙන් පළ කරමින් මට වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

***සභා මේසය මත තබන ලද ලේඛනය**
*சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :*
*Statement tabled.*

Table 1

**Appreciation / Depreciation of currencies against US dollar**

Per cent

| *Country* | *Exchange rate app/ (dep) from end 2007 to 30 Oct. 2008* |
|---|---|
| Japan — Yen | 13.69 |
| China — Yuan Renminbi | 6.83 |
| Hong Kong — Hong Kong Dollar | 0.62 |
| Bangladesh — Taka | -0.44 |
| Sri Lanka — Sri Lankan Rupee | -0.65 |
| Taiwan — New Taiwan Dollar | -1.57 |
| Singapore — Singapore Dollar | -1.97 |
| Thailand — Baht | -3.20 |
| Malaysia — Malayasian Ringgit | -7.11 |
| Denmark — Danish Krone | -10.47 |
| Euro — Euro | -11.84 |
| Indonesia — Rupiah | -11.85 |
| Sweden — Swedish Krona | -14.65 |
| Philippines — Philippine Peso | -15.40 |
| Canada — Canadian Dollar | -18.86 |
| India — Indian Rupee | -19.82 |
| United Kingdom — Pound Sterling | -20.54 |
| Kenya — Kenyan Shilling | -20.62 |
| Pakistan — Pakistan Rupee | -24.52 |
| Korea — Won | -28.08 |
| Australia — Australian Dollar | -28.29 |
| South Africa — Rand | -30.46 |
| New Zealand — New Zealand Dollar | -30.97 |

***සභා මේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස**
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி :*
*Rest of the speech tabled :*

නිදහස ලැබීමෙන් පසු වැඩිම කලක් රට පාලනය කළ හා වැඩිම අය වැය ලේඛන ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇති එක්සත් ජාතික පක්ෂය, ජාත්‍යන්තර ආර්ථික අභියෝගවලින් මුළු ලෝකයම වෙළාගත් මෙවන් වකවානුවක ජනතාව මුලා කිරීම අරමුනු කර ගත් විකල්ප අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීමට තරම් බොළඳවීම පිළිබඳව අවංකවම කනගාටු වෙමි.

විකල්ප අය වැය යෝජනාවලිය නමින් දැවැන්ත වියදම් ලේඛනයක් එජාපය ඉදිරිපත් කර ඇතත් ඊට ගැළපෙන අයුරින් ආදායම් ලබා ගන්නා ආකාරය එම ලේඛනයේ සඳහන් නොකිරීමෙන් මෙය ජනතාව රැවටීම සඳහා යොදා ගත් තවත් එක් ලාමක උත්සාහයක් බව පැහැදිලිය.

මෙම ලේඛනයේ ඇතුළත් කරුණු එකින් එක පිළිබඳව අවධානය යොමු කිරීම කාලෝචිතය.

1. **සමෘද්ධි පවුල්වල ආදායම**

සමෘද්ධිලාභී පවුලකට මසකට රුපියල් 5000ක් ලබා දීමට යෝජනා කරන ඔවුන් ඒ වෙනුවෙන් අලුතින් වැය වන වියදම වන රුපියල් බිලියන 110ක මුදල සොයා ගන්නා ආකාරය පිළිබඳව සඳහන් කර නොමැති අතළු, තම පාලන සමයේ සියල්ල තීරණය කළ "යළි පුබුදුමු ශ්‍රී ලංකා" මහා ග්‍රන්ථයේ 121 පිටුවේ සඳහන් වන සමෘද්ධි සහනාධාරය කපා හැරීමට කර ඇති යෝජනාව පිළිබඳව විකල්ප අය වැය යෝජනා සම්පාදකයන්ට අමතක වී ඇති බවක් පෙනේ.

1. **බදු බර පහළට**

බඩු මිල පහළ දැමීම සඳහා VAT ඉවත් කරන බව සඳහන් කරන එජාපයට VAT බද්ද හඳුන්වා දුන්නේ තමන්ගේ පාලන සමයේ බව අමතක වී ඇත. එමෙන්ම 2003 අය වැය ලේඛනයේදී කැකිල්ලේ තීන්දුවක් ප්‍රකාශයට පත් කරමින් VAT බදු ප්‍රමාණය සියයට 15% දක්වා අඩු කර සීනි, පරිප්පු, කරවල වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා පැවති 20%ක්වූ 00 බදු ප්‍රමාණය සියයට 15% දක්වා අඩු කර සිනි, පරිප්පු, කරවල වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා පැවති 10ක් වූ වැට් බද්ද සියයට 15 දක්වා ඉහළ දැමීමට කටයුතු කළ ආකාරය කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳව කථා කරන එජාපයට අමතක වුවද මෙරට ජනතාවට අමතක නැත. අප මෙම වර්ෂයේ මුල් මාස 9තුල පමණක් භාණ්ඩ සඳහා බදු සහන දිමෙන් රුපියල් බිලියන 7ක ආදායමක් අහිමි කර ගෙන ඇත.

3. **රණවිරුවන්ගේ ආදායම ඉහළට**

තම පාලන සමයේදී ඊනියා සාම ගිවිසුමක් මගින් ත්‍රස්තවාදය ශක්තිමත් කර, ව්‍යාජ දේශපාලන ආන්දෝලනයක් ඇති කරමින් මිලේනියම් සිටි මෙහෙයුම හරහා රණවිරුවන්ගේ දැවැන්ත බුද්ධි අංශය විනාශ කිරීම රටට ආදරය කරන ජනතාවට මෙන්ම සමස්ත රණවිරුවන්ට කිසිදා අමතක නොවනු ඇත. රණවිරුවන්ගේ ආදායම ඉහළට නමින් මෙම බොළඳ යෝජනාව ක්‍රියාත්මක කිරීමට නම් අවම වශයෙන් රුපියල් බිලියන 20ක් වත් අවශ්‍ය වනු ඇත. දැනට වෙන්කර ඇති ආරක්ෂක වියදම වැඩි බවට මොර දෙන එජාපය මෙයින් අදහස් කරන අර්ථය අපැහැදිලිය.

4. **රජයේ සේවක වැටුප් ඉහළට**

රාජ්‍ය සේවයට ඇතුළත් වීමට පෙර මෙරට ජනතාවට තිබූ අයිතිය කළමනාකරණ චක්‍රලේඛ අංක 16 මගින් අහුරා දැමූ ඒජාපය 2003 අය වැය මගින් රුපියල් කෝටි 800ක වියදමින් රජයේ සේවකයින් ගෙදර යැවීමට සැලසුම් ද ඉදිරිපත් කරනු ලැබීය. කෙසේ වුවද, 2004 වසරේ සිට අප රජය සෑම රජයේ සේවකයෙකුගේම වැටුප් අවම වශයෙන් 70%කින් ඉහළ දැමීමට කටයුතු කර ඇත. රජයේ සේවකයින් පිළිබඳ එජාපයේ කිඹුල් කඳුළු හෙළීම බුද්ධිමත් රජයේ සේවකයින්ට අමුතුවෙන් කියා පෑම අවශ්‍ය නොවේ. ඔවුන්ගේ මෙම යෝජනාව සඳහා රුපියල් බිලියන 100ක් වත් අවම වශයෙන් සොයා ගත යුතුව ඇත.

5. **විශ්‍රාම වැටුප ඉහළට**

රාජ්‍ය සේවකයින්ට උරුම තම වෘත්තිය දිවියේ අවසන් වරප්‍රසාදය වන විශ්‍රාම වැටුප සම්පූර්ණයෙන්ම අහිමි කිරීමට තම පාලන කාලය තුළ කටයුතු කළ එජාපය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වැඩි කිරීමට අද කථා කිරීම යුගයේ ලොකුම විහිළුව වනු ඇත. විශ්‍රාම වැටුප් අයිතිය මෙරට රාජ්‍ය සේවකයන්ට ලබා දෙනු ලැබුවේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයෙන් බව සමස්ත විශ්‍රාමිකයන්ට අමුතුවෙන් කිවයුතු නොවේ. ඔවුන්ගේ මෙම යෝජනාවටද අවම වශයෙන් රුපියල් බිලියන 19 ක් වැය වනු ඇත.

6. **ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් පහළට**

තම පාලන සමය තුළ මිල සූත්‍රය මගින් ලෝක වෙළෙඳ පොළේ වැඩි වන සෑම සතයක්ම භූමිතෙල් ලාම්පුවෙන් ජීවත් වන අහිංසක ජනතාවගේ සාක්කුවට බැර කළ එජාපය අද ජනතාවගේ දුක්ගන්නාරාල බවට පත් වී ඇති බව මවා පෙන්වීම අතීතය මතක ඇති ජනතාවට කරන අවමානයකි. පහත වගුවෙන් මෙම තත්ත්වය මනාව පැහැදිලි වේ.

| Year | Taxes USD | Annual Import Bill USD | Percentage |
|---|---|---|---|
| 2002 | 302.9 | 694 | 44% |
| 2003 | 300.2 | 731 | 41% |
| 2004 | 169.3 | 1,061 | 14% |
| 2005 | 150.3 | 1,400 | 11% |
| 2006 | 235.0 | 1,766 | 13% |
| 2007 | 293.52 | 2,000 | 14.6% |
| 2008 (up to June | 151.70 | 1,535 | 9.8% |

**7. තේ, පොල්, රබර්, කුරුඳු, ගම්මිරිස්, මැණික් සඳහා ස්ථාවර වෙළෙඳ පොළක්**

2004 අප රජය බලයට පත් වන විට මෙම සියලු නිෂ්පාදන සඳහා පැවතුනේ අද ලෝක ආර්ථික අවපාතයේ පීඩනයට ලක්ව තිබිය දී තිබෙන මිලට අඩකටත් වඩා අඩු මිලක් බව පැහැදිලිය. හැම විටකම තම නිෂ්පාදනවලට ඉහළ මිලක් ලැබුණේ අප ආණ්ඩු කාල තුළ වීම විශේෂත්වයකි. එම තත්ත්වයට හේතුව වූයේ අනෙක් රටවල් සමඟ මනා සහයෝගයකින් කටයුතු කිරීම බව ජනතාව අවබෝධ කර ගෙන ඇත.

**8. ඇඟලුම් හා රෙදිපිළි කර්මාන්තයට නව පණක්**

ජාතියේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගනිමින් ඇගලුම් කර්මාන්තය ආරක්ෂා කර ගැනීමට රජය ගෙන ඇති පියවර පිළිබඳව එජාපයට නොපෙනී යන්නේ දේශපාලන උපැසකින් එදෙස බැලීම නිසාවෙනි. GSP + බදු සහනය ලබා ගත්තේද අප රජය සමයේ බව අවධාරණය කරමි.

**9. ධීවර කර්මාන්තයට අතහිත**

සුනාමි ව්‍යසනය මගින් 60%ක් විනාශ වූ ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කළේ කවුරුන් දැයි යන්න ධීවර ජනතාවට වටහා දීමට විශේෂ විස්තරයක් අවශ්‍ය නොවනු ඇතැයි කල්පනා කරමි. මේ සඳහා එජාප යෝජනා සඳහා යන වියදම පෙන්වා දී නොමැත.

**10. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සෙත**

විවෘත ආර්ථිකය අනිසි ලෙස යොදා ගනිමින් දේශීය සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයින් විනාශ මුඛයට ලක් කළ එජාපයේ වැඩ පිළිවෙළ හා මේ සඳහා මහින්ද චින්තනය තුළ ඇති සුවිශේෂ ස්ථානය මෙවැනි ඊනියා පොරොන්දුවලින් වසා දැමිය නොහැකි වනු ඇත. මේ සඳහා යන වියදම ද ඔවුන් ප්‍රකාශ කොට නොමැත.

**11/12. ග්‍රාමීය ජනතාවට රැකියා අවස්ථා හා ග්‍රාමීය ආර්ථික සංවර්ධනය**

නාගරික සංවර්ධනය පමණක් තේමා කොට ගත් ගැමියා නගරයට ගෙන ඒම රටේ ප්‍රශ්නවලට විසඳුම බව තමන්ගේ යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩ සටහන තුළින් ලොවටම ප්‍රකාශ කළ එජාපය අද අංශක 360කින් ආපසු හැරී ඇත්තේ කුමක් සඳහා දැයි වටහා ගැනීම අපහසු වනු ඇත.

**13. ණය පොලී අනුපාතිකය පහළට**

මුළු ජාතියම තමන්ගේ යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන තුළ පාවා දීමෙන් ජාතික සම්පතක් වූ සිංහරාජ වනාන්තරය පවා විකිණීමට එකඟව ලෝකයේ එවකට පැවති වාණිජමය ණය ගැනීම් සඳහා සූදානම් වූ එජාපය අද මුළු ලෝකයේම පවතින ආර්ථික අවපාතයක් සමග ණය පොලී අනුපාතය ඉහළ ගොස් ඇති අවස්ථාවක මේ සුරංගනා කථා පැවසීමේ අරුතක් නොමැත. විදේශ ණය හරහා රටේ අනාගත පරපුරම ණයකාරයින් නොකරන බව පවසන ඔවුන් තමන්ගේ 2003 පාලන සමයේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 105%ක් වූ ණය ප්‍රමාණය මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ අද වන විට සිළු අභියෝග ජය ගනිමින් දළ දේශීය නිෂ්පාදිතය සාපේක්ෂව සියයට 85 දක්වා පහළට ගෙන ඒමට කටයුතු කිරීම අප විසින් අත් කර ගෙන ඇති ආර්ථික වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයකි. එමෙන්ම අද අපගේ ඒක පුද්ගල ආදායම ඩොලර් 1600 ඉක්ම වූ මධ්‍ය පරිමාණ ආදායම් ලබන ස්වාධීනව ණය උපයා ගත යුතු රටක් බවට පරිවර්තනය වී ඇති බව ඔවුනට අමතකව ඇත.

**14. නව අධ්‍යාපන ප්‍රතිපත්තියක්**

නිදහස් අධ්‍යාපනයේ වටිනාකම හෑල්ලු කිරීමට හැම විටම කටයුතු කළ අප රටේ අධ්‍යාපනයේ අග්‍ර ඵලය වන උපාධිධාරීන් හට පොලු මුගුරුවලින් පහර දී මර්දනය කළ අධ්‍යාපන ධවල පත්‍රිකාවේ නිර්මාතෘවරයා වන එජාපය වර්තමානයේ සරසවි වලට ඇතුළුකර ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය එකවර දෙගුණයකින් වැඩි කිරීමට යෝජනා කිරීම මෙරට බුද්ධිමත් ශිෂ්‍ය පරපුරට ද අවමන් කිරීමකි.

**15. දරුවන්ට පෝෂණය**

ඥාති සංග්‍රහයට යොදා ගන්නා මුදල් දරුවන්ගේ පෝෂණය සඳහා යොදා ගන්නා බව පවසන එජාපය මෙරට ඥාති සංග්‍රහය ආරම්භ වූයේ 1977 ඔවුන්ගේ පාලන සමයත් සමඟ බව අමතක කිරීමට උත්සාහ කළද 2008 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතා ප්‍රතිශතය පහත සඳහන් අයුරින් පහත බැස ඇති බව ඔවුන් විසින් හිතාමතාම අමතක කර ඇත.

1990/91 - 26.1%
1995/96 - 28.8%
2002/03 - 22.7%
2006/07 - 15.2%

**16. ජනතාවට නීරෝගී සෞඛ්‍ය සේවයක්**

සියලු අභියෝග හමුවේ වුවද මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා සෑම අය වැය ලේඛනයකින්ම විශාල ලෙස මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් දිනෙන් දින මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රය වර්ධනය කර ඇති බව විකල්ප අය වැය සම්පාදකයින්ට නොපෙනීම පුදුමයට කරුණකි.

**17. වීවලට සාධාරණ වෙළෙඳ පොළක්**

2004 වසරට පෙර එජාප පාලන සමයේ රුපියල් 12කටවත් විකුණා ගත නොහැකි වූ වී කිලෝව රුපියල් 35කටත් වඩා වැඩි මුදලකට වර්තමානයේ අලෙවි වන බව මේ ඊනියා ලේඛන සකසන, සීත කාමරවල සිටින, ටයි පටිය නොගලවන ජනතා නියෝජිතයින් නොදන්නවාට දේශීය ගොවීන් මේ පිළිබඳව හොඳින් දැනුවත් වී ඇත.

**18. පොහොර සහනාධාරය ඉහළට**

2004 වසරින් අවසන් වූ තමන්ගේ පාලන කාලය තුළ පොහොර සහනාධාරය දෙන බවට ගොවීන්ට දින ලබා දෙමින් රැස්වීම් පවත්වා කාඩ් පතක් පමණක් නිකුත් කර ගොවීන් රැවටූ එජාපය අද මහින්ද චින්තනය යටතේ රුපියල් 7500ක් වන පොහොර මිටිය රුපියල් 350කට ලබා දෙමින් රජය රුපියල් කෝටි 3000ක දැවැන්ත සහනාධාරයක් ලබා දීම මොවුන්ට නොපෙනීම හාස්‍යට කරුණකි.

ඔවුන් කියන ආකාරයට අනෙකුත් භෝග සඳහාද පොහොර සහනාධාරය ලබා දීමට නම් තවත් රුපියල් බිලියන 40ක් අවශ්‍ය වෙනු ඇත.

**19. රාත්‍රී බස් සේවයක් සමඟ කාර්යක්ෂම ප්‍රවාහන සේවයක්**

අදටත් ක්‍රමවත් රාත්‍රී බස් සේවයක් පවත්වා ගෙන යනු ලබන ලංගමය දංගෙඩිය කර දක්කා ගෙන ගිය හා දේශපාලන හෙංචයියන්ට අලෙවි කිරීමට සැලසුම් කර තිබූ ජාතික සම්පතක් වූ මෙරට දුම්රිය සේවය අධිකාරියක් කිරීමේ පළමු පියවර තමන්ගේ යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහනේ 26 පිටුවේ සටහන් කරමින් රාජ්‍ය දේපළ පෞද්ගලීකරණය කිරීම මෙරට සංවර්ධනයට එකම ගමන් මඟ යැයි කියූඅයම මේ කියන්නේ කුමක්දැයි තේරුම් ගැනීම අපහසුය.

**20. සංචාරක කර්මාන්තයට අතහිත**

සුනාමි ව්‍යසනයෙන් ප්‍රධාන වශයෙන් පහර කෑ තවත් කර්මාන්තයක් වන සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට රජය ක්‍රියාත්මක කළ හා ක්‍රියාත්මක කරමින් පවතින පියවර පිළිබඳව විකල්ප අය වැය සම්පාදකයින් නොදන්වාට මෙරට බහුතර ජනතාව හොඳින් දන්නවා ඇත.

**21/22. මූල්‍ය හා යහපාලනය, දූෂණය හා නාස්තිය**

තමන්ගේ පාලන කාලය තුළ දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දෙස සිහිනෙන් හෝ නොබැලූ එජාපය තම පක්ෂයේ විධායක සභියෙකු ද මුල් වී මෙරට මෙතෙක් සිදු වූ කෝටි 350කට අධික මහා වැට් බදු වංචාව සිදු වෙද්දී ඉවත බලා සිටි එජාපය මෙරට මූල්‍ය හා යහ පාලනය පිළිබඳව කථා කිරීම තවත් එක් විහිළුවකි.

**23. අමාත්‍ය මණ්ඩලය පහළට**

තම පාලන කාලය තුළ තමන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා විපක්ෂයෙන් පැමිණෙන සෑම මන්ත්‍රීවරයකුටම ඇමතිකම් ලබා දීමට ආරාධනා කළ බව විකල්ප අය වැයට මෙම වගන්තිය ඇතුළත් කිරීමට පෙර සිහියේ තබා ගැනීම වැදගත් වේ.

**24. කිරි ගොවියාට සහන මෙන්ම කිරි පාරිභෝගිකයාට සහන**

මෙම සුරංගනා කථාවම තමන්ගේ 2004 මැතිවරණ ප්‍රකාශනයේ ද සඳහන් කර ජනතාව ප්‍රතික්ෂේප කරන ලද අතර මුළු ලෝකයේම කිරි පිටි මිල සියයට 100කින් ඉහළ යද්දී මෙම බොළඳ ප්‍රකාශය හරවත් එකක් නොවන බව පැහැදිලිය.

**25. පාරිභෝගික භාණ්ඩ සහන මිලට**

මුළු ලෝකයේම ආහාර මිල ගණන් ඉහළ ගොස් ඇති යුගයක තම ප්‍රකාශනයේ අඩුව පිරිමසා ගැනීමට යොදන ලද වගන්තියක් පමණක් බව අවධාරණය කරමි.

**26. උපයන විට ගෙවන බදු සීමා කිරීම**

බදු සමා පනත ගෙනැවිත් මෙරට නීත්‍යානුකූල බදු ගෙවන්නන් හෑල්ලුවට ලක් කර රජයට අය විය යුතුව තිබූ වක්‍ර බදු පවා දේශපාලන හෙන්චයියන්ට ආපසු ලබා ගැනීමට අවස්ථාව සලසා මෙරට බදු ක්‍රමය විනාශ කළවුන් දැන් මේ කරනු ලබන ප්‍රකාශයේ අරුත කුමක්ද?

27. **මහජන ප්‍රවාහනයට සහන**

මෙයද මෙම ලේඛනයේ අඩුව සම්පූර්න කිරීමට යොදන ලද වගන්තියක් ලෙස මා දකින්නේ මෙම වාහන වෙනුවෙන් රජය උපරිම බදු සහන මේ වන විට ද ලබා දී ඇති බැවිනි.

28. **මාධ්‍ය නිදහස**

යකඩ දා ගිය හේනේ පුලුන් සොයන්න එපා යැයි කථාවක් තිබේ. සාධාරණ තීරණ ලබා දුන් විනිසුරුවන්ගේ නිවෙස්වලට පවා ගල් ගැසූ මොවුන් අය වැය ලේඛනයට අදාළ නොවන මාධ්‍ය නිදහසක් ගැන කථා කරන්නේ තමන්ගේ බොරුවට මෙරට ජනමාධ්‍යවේදින්ද ඇඳා ගනිමින් කිසිදු දිනෙක ප්‍රායෝගික යථාර්ථයක් කර ගත නොහැකි ලේඛනයකට ප්‍රසිද්ධියක්වත් ලබා ගැනීමට දැයි සැක සිතේ.

එජාපයේ විකල්ප අය වැය යෝජනාවලිය ඉටු කිරීම සඳහා ගණනය කළ හැකි අවම වියදම රුපියල් බිලියන 290ක් වනු ඇත. ගණනය කළ නොහැකි වියදම් ප්‍රමාණය එකතු වූ විට අවම වශයෙන් රුපියල් බිලියන 400 ඉක්මවනු ඇත. එම ප්‍රමාණය 2009 අය වැය ලේඛනයේ පුනරාවර්තන වියදමින් හරි අඩකට සමාන වේ. පුනරාවර්තන වියදමින් හරි අඩකට සමාන වියදම් ඉදිරිපත් කරනු ලබන ඔවුන් කිසිදු පැහැදිලි ආදායම් යෝජනාවක් ඉදිරිපත් කරනු නොලබයි. මෙම යෝජනාවලිය තුළින් අතිශයෝක්තියකින් පෙන්වනු ලබන ඇමැති මණ්ඩලය 35 දක්වා අඩු කිරීම තුළින් ඉතිරි කර ගත හැක උපරිම මුදල රුපියල් බිලියන 1ක් පමණ වේ. රුපියල් බිලියන 400ක වියදම් සඳහා ආදායම් යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත්තේ ඔවුන් ප්‍රතිපත්තියක් ලෙස කිසිදා එකඟ නොවුණ හා එකඟ නොවන මෙම කරුණ පමණි.

අවසාන වශයෙන් අදායමක්, වියදමක් හා අතිරික්තයක් ඔවුන් දක්වා ඇතත් එය ලබා ගන්නා ආකාරය සඳහන් නොවීමෙන් මෙම යෝජනා සියල්ලම ඔවුන් බලයට පත් වූ දිනෙක ඇලඩින්ගේ පුදුම පහන සොයා ගැනීමෙන් පසු ඉටු කිරීමට බලාපොරොත්තු වන මැතිවරණයකින් පසු සුපුරුදු ලෙසම කටුගෙට යවනු ලබන දේශපාලන පොරොන්දු පත්‍රයක් බව පැහැදිලිය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එක්සත් ජාතික පක්ෂයේ විකල්ප අය වැය ගැන වැඩි කාලයක් කථා කිරීම සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය එතුමාට පුද කරනවා.

[පූ.භා. 11.33]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ පාලනයේ හතර වන අය වැය පිළිබඳව කරුණු දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ හැටියට අප සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය ලේඛනය ආණ්ඩුව විසින් -මුදල් ඇමතිවරයා විසින්- ඊයේ හඳුන්වා දුන්නා, දේශීය කර්මාන්ත දියුණු කරන්න ගෙනාපු අය වැයක් හැටියට. මේ සෙස් බදු පනවා තිබෙන්නේ, අනිකුත් බදු පනවා තිබෙන්නේ ඒ වෙනුවෙන් කියලා තමයි ආණ්ඩුව විග්‍රහ කරන්නේ. අනික් පැත්තෙන් අපට පෙනෙන්න තිබෙන ඇත්ත කාරණය තමයි, ලෝක ආර්ථික අර්බුදයක් තිබෙන එක. ඒ ලෝක ආර්ථික අර්බුදය අපටත් බලපා තිබෙනවා, ඒක නිසා කාටවත් මේකෙන් ගැලවෙන්න බැහැ කියලාත් ආණ්ඩුව පැත්තෙන් කියනවා. ඇත්ත. ලෝක ආර්ථික අර්බුදයක් තිබෙන බව ඇත්ත. ඇමෙරිකාවේ ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. අපට, විශේෂයෙන්ම තමුන්නාන්සේලාට පරමාදර්ශ හැටියට පෙන්වූ ආර්ථිකයන්, ලංකාව සිංගප්පූරුවක් කරන්න පරමාදර්ශ හැටියට පෙන්වූ ආර්ථිකයන් තිබුණු ඇමෙරිකා එක්සත් ජනපදයේ, යුරෝපයේ ආර්ථිකය කඩා වැටී තිබෙන බව ඇත්ත. හැබැයි, ඇමෙරිකා එක්සත් ජනපදයේ, යුරෝපයේ ආර්ථිකය කඩා වැටී තිබෙන හේතුවයි, ලංකාවේ ආර්ථිකය කඩා වැටී තිබෙන හේතුවයි දෙකක්. ඒක එකට පටලවන්න බැහැ. අසීමිතව credit card දීලා, උකස් ණය දීලා, කොටස් වෙළෙඳ පොළ කඩා වැටිලා ඇති වෙච්ච මූල්‍ය අර්බුදයක් තමයි ඒ රටවල තිබෙන්නේ. එහෙම විශාල මූල්‍ය අර්බුද නිර්මාණය වන මට්ටමේ කොටස් වෙළෙඳ පොළක් අපේ රටේ නැහැ; credit card වෙළෙඳ පොළක් නැහැ; උකස් වෙළෙඳ පොළක් නැහැ. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පිළිගන්න ඕනෑ දෙයක් තමයි, අපේ ආර්ථිකයත්, විශේෂයෙන් මේ ආණ්ඩුවත්, ආණ්ඩුවේ භාණ්ඩාගාරයත් අද ඉතා දැවැන්ත විදේශ විනිමය අර්බුදයකට, මූල්‍ය අර්බුදයකට ලක් වෙලා ඉන්නවාය කියන එක. මේ අය වැය පෙන්වන්නේ ඒක. මේ අය වැය සාරාංශයක් කර ගත්තොත් -සම්පිණ්ඩනය කර ගත්තොත්- දකින්න තිබෙන ප්‍රධාන දේ තමයි මේ ආණ්ඩුව මේ අය වැයෙන් තමන්ගේ අර්බුදය ප්‍රකාශයට පත් කර තිබෙන බව. විශේෂයෙන් වෙන මොකක්වත් නොවෙයි, ආණ්ඩුවේ තිබෙන මූල්‍ය අර්බුදය. ඒක කොහොමද කියා මම කියන්නම්. බලන්න, එක පැත්තකින් මේ ආණ්ඩුව තමන්ගේම අමාත්‍යාංශවල ප්‍රතිපාදන අඩු කර තිබෙනවා. අද මෙතැන කථා කරන හුඟක් ඇමතිවරුන්ට අර්බුදයක් තිබෙනවා. හෘදය සාක්ෂියට අනුව තමන්ගේ අමාත්‍යාංශ ගැන කථා කළොත්, තමන්ගේ අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කර තිබෙන බව දන්නවා. තමන්ගේ අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් අඩු කර තිබෙන බව දන්නවා. අද එකසිය හතක ඇමති මණ්ඩලයක් ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එකසිය හතක ඇමති මණ්ඩලයට අයිති අමාත්‍යාංශ විසිහයක ප්‍රාග්ධන වියදම් අඩු කර තිබෙනවා. ප්‍රාග්ධන වියදම් අඩු කර තිබෙන ඒ අමාත්‍යාංශ විසිහයේ ලැයිස්තුව මට කියන්න පුළුවන්. ආගමික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය එයින් කිහිපයක්. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට 2008 වර්ෂයේදී රුපියල් මිලියන 2,027ක් තිබුණා. දැන් මිලියන 1,637යි. සංචාරක අමාත්‍යාංශය, තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වාගේම සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේත් වියදම් අඩු කර තිබෙනවා. සෞඛ්‍ය වැඩිදියුණු කරනවාය කියා අය වැය කථාවේදී කිව්වා. සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයට 2008 දී ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් මිලියන 16,368ක් තිබුණා. මේ අවුරුද්දේ රුපියල් මිලියන 14,659යි. ඊළඟට විදේශ කටයුතු අමාත්‍යාංශය. ඒකේ නම් සැහෙන්න කපා තිබෙනවා. විදේශ කටයුතු අමාත්‍යාංශයේ වියදම කැපිල්ලේ හැටියට රෝහිත බෝගොල්ලාගම ඇමතිතුමාට නිකවැරටියේ විදේශ කටයුතු ඇමති තමයි වෙන්න වන්නේ. ලංකාවේ විදේශ කටයුතු ඇමති වෙන්න නම් බැහැ. විදේශ කටයුතු අමාත්‍යාංශයට ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් මිලියන 1,849ක් තිබුණා. ඒක රුපියල් මිලියන 806 දක්වා බස්සවා තිබෙනවා. බයිලා ඇමතිතුමාටත් ඉතින් බයිලා ගහමින් ඉන්න පුළුවන්. වෙන මොකුත් ඉතුරු වෙන්නේ නැහැ. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් විතරක් නොවෙයි, පුනරාවර්තන වියදම්වලිනුත් කපා තිබෙනවා. දැන් සමහර විට ඇමතිතුමාගෙන් අර arrears ටික අය කර ගනීවි. වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම නම් වැඩි කර තිබෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශයේත් ප්‍රාග්ධන වියදම් අඩු කරලා. වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශයේත් ප්‍රාග්ධන වියදම් අඩු කර තිබෙනවා. රුපියල් මිලියන 1,153, රුපියල් මිලියන 770ට බස්සලා තිබෙනවා. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් ගිය අවුරුද්දේ රුපියල් මිලියන 540ක් දීලා තිබුණා. ඒක රුපියල් මිලියන 240 දක්වා අඩු කර තිබෙනවා. රුපියල් මිලියන 300ක්ම කපලා. ඒ ඇමතිතුමිය ඒ දවස්වල කිව්වා, "මගේ ගේ හදා ගන්න විධියක් නැහැ, විදුලිය නැහැ, අතැන කැඩිලා, මෙතැන කැඩිලා කියලා." එතුමියගේ අමාත්‍යාංශයට ලබා දුන් ප්‍රාග්ධන වියදමත් අඩු කරලා. සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදමත් අඩු කරලා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදමත් අඩු කරලා. රුපියල් මිලියන 5,259ක් තිබුණා. ඒක රුපියල් මිලියන 4,619ට අඩු කරලා. ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම අඩු කරලා. වෘත්තීය කාර්මික පුහුණු අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම අඩු කරලා. ඩිව් ගුණසේකර මැතිතුමා පක්ෂයක් නියෝජනය කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා හැටියට ආණ්ඩුවේ ඉන්නවා. එතුමාගේ අමාත්‍යාංශයේත් ප්‍රාග්ධන වියදම අඩු කරලා.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. ගාමිණී ලොකුගේ ඇමැතිතුමා ගරු සභාවේ සිටියාද මන්දා. එතුමාගේ අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදමත් අඩු කරලා. නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදමත් අඩු කරලා. දැන් මේ හදන්නේ නැඟෙනහිර මුදා ගෙන, උතුර මුදා ගෙන නැවත පදිංචි කිරීම් කරවන්නයි. නමුත් ඒකට අදාළ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. අපේ බයිලා ඇමතිතුමාගේ විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයට රුපියල් මිලියන 534ක ප්‍රාග්ධන වියදමක් තිබුණා. ඒක රුපියල් මිලියන 432ට අඩු කරලා. කවුරුවත් මේ ඇස්තමේන්තු පොත කියවන්නේ නැහැ නේ. අය වැය කථාවක් හදා ගෙන ඇවිල්ලා කියවනවා. නමුත් ඇස්තමේන්තුවෙන් වියදම් අඩු කරලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. ජනතා වතු කළමනාකරණ හා සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් අඩු කරලා. මේක තමයි ඇත්ත. ඒ අමාත්‍යාංශවල ප්‍රාග්ධන වියදම් අඩු කරලා. අමාත්‍යාංශ 107කින් විසි ගණනකම ප්‍රාග්ධන වියදම් අඩු කරලා; පුනරාවර්තන වියදම් අඩු කරලා. මේ ඇමතිවරුන් නිකම්ම නිකම් හිස් බවට පත් කරලා. මා ඒක බොහොම සාධාරණ විධියටයි ඒ කිව්වේ. ඇමතිවරු අත උස්සන්නන් බවට පත් කරලා තිබෙනවා. හැබැයි, ඒ ප්‍රතිපාදන කප්පාදු කරලා ඒවා කොහේටද එකතු කර ගෙන තිබෙන්නේ? ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට ඒ දේ මේ පාර්ලිමේන්තුවේදී කියන්න සාධාරණ වෙන්න තිබුණා. ඒ සියල්ල එකතු කර ගෙන තිබෙනවා, එක ධුරයකට; ජනාධිපති කාර්යාලයට; ජනාධිපතිතුමාට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2008 ජනාධිපති වැය ශීර්ෂයේ පුනරාවර්තන වියදම තිබුණේ රුපියල් මිලියන 2,521යි. ඒ මුදල මේ අවුරුද්දේ රුපියල් මිලියන 2,738ක් දක්වා වැඩි කර ගෙන තිබෙනවා. පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 217කින් වැඩි කර ගෙන තිබෙනවා. රුපියල් මිලියන 3,069ක් තිබුණු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 4,064ක් දක්වා රුපියල් මිලියන 995කින් වැඩි කර ගෙන තිබෙනවා. එතකොට රුපියල් මිලියන 1,212ක් -කෝටි 121ක්- ජනාධිපති වෙනුවෙන් වෙන් කර ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයේ සේවකයන්ට වැටුප් වැඩි කළේ නැහැ. ඒක අසත්‍යයක්. වැටුපක් නොවෙයි, රුපියල් දාහක දීමනාවක් දුන්නේ. එතකොට ඒ වෙනුවෙන් වෙන් කළේ රුපියල් මිලියන 12,000යි. රජයේ සේවකයන් වෙනුවෙන් ලබා දෙන දීමනාවට රුපියල් මිලියන 12,000ක් වෙන් කරලා, ජනාධිපතිතුමා තමන් සඳහා රුපියල් මිලියන 1,200ක් වෙන් කර ගෙන තිබෙනවා. රජයේ සේවකයන්ට වෙන් කළ ප්‍රමාණයෙන් 10න් පංගුවක් ජනාධිපති ධුරයට වෙන් කර ගෙන තිබෙනවා. මේ රටේ රජයේ සේවකයන් 12,00,000ක් ඉන්නවා. ඒ අයට රුපියල් 1,000 ගණනේ දීමනාවක් දෙන්න මුදල් වෙන් කර තිබෙනවා. රජයේ සේවකයන් 1,20,000කට දුන්නු දීමනාව සමානයි ජනාධිපතිතුමා තමන්ගේ ධුරය සඳහා, තමන් සඳහා වැඩි කර ගත් මුදල් ප්‍රමාණය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක සාධාරණද? අන්තිමට මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? අපි මාසයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ අය වැය කථා කරනවා. කථා කරන්නේ මොකක් ගැනද? භාණ්ඩාගාරය කියන ලොකු බේසම ගෙනැල්ලා පාර්ලිමේන්තුවට පෙන්වලා තමන්ගේ පිඟානට බෙදා ගත්තු ටික ගැනයි. රුපියල් මිලියන 1,200ක්. එතකොට රජයේ සේවකයන් 1,20,000කගේ දීමනාව සඳහා වෙන් කළ ප්‍රමාණය සමානයි, විධායක ජනාධිපතිවරයාට වෙන් කර ගත්ත ප්‍රමාණයට. වැඩි පංගුව ගැනයි මා මේ කියන්නේ. මා මේ කියන්නේ, මුළු අවුරුද්දටම රුපියල් මිලියන 1,200ක් කියලා නොවෙයි. ජනාධිපතිතුමාගේ ප්‍රාග්ධන ඇස්තමේන්තුව මෙවර රුපියල් මිලියන 4,064ක්. ඉතින් මේක සාධාරණ නැහැ. මොකක්ද ඒ අර්බුදය? තමන්ගේම ඇමතිවරුන්ගේ වියදම් කපලා. අත්‍යවශ්‍ය අමාත්‍යාංශවල වියදම් කප්පාදු කරලා. අමාත්‍යාංශ 107ක් තිබෙනවා. ඇමතිවරු එහෙයියන් බවට පත් වෙනවා. තමන්ට යමක් කරන්න බැරි වෙනවා. අපි දන්නවා, ඕනෑම ඇමතිවරයෙක් අමාත්‍යාංශයක් ගත්තාට පසුව ආත්ම ගෞරවයක් ඇතිව තමන්ගේ ප්‍රදේශයට ගිහිල්ලා තමන්ගේ ජනතාවට කෙළින් කථා කරලා, තමන්ගේ නිලධාරින්ට කථා කරලා, නියෝගයක් දීලා මෙන්න මේ දේ කරන්නය කියලා මුදල් වෙන් කරන්න කැමැතියි. දැන් මොකක්ද මේ වෙන්නේ? ඒ කැමැත්ත කප්පාදු කරනවා. මේ ආණ්ඩුවේ ඇමතිවරුන් මේ ගැන කථා කරන්නේ නැති බව අපි දන්නවා. ඇමතිවරුන්ට මේ ගැන කථා කරන්න බැහැ. හැබැයි ඇත්ත ඒකයි. ඒ ගමන තමයි මේ යන්නේ. ආණ්ඩුව බරපතළ මූල්‍ය අර්බුදයක ඉන්නවාය කියන එක ඉතාම පැහැදිලියි. ඒ මූල්‍ය අර්බුදයේදී එක පැත්තකින් තමන්ගේ අමාත්‍යාංශවල - තමන්ගේ අමාත්‍යවරුන්ගේ- ප්‍රතිපාදන කප්පාදු කරලා ඒවා තමන්ගේ ළඟට ගොඩ ගහ ගෙන තිබෙනවා. මේ අය වැය කථාවේදී ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට ඒක ඉතා හොඳින් පැහැදිලි කරනවා. එතුමා කතාව අවසාන කරන්නේත් ඒ කථාවෙන්ම තමයි. තව ගොඩක් දේවල් කියනවා. හැබැයි ඒ අතරේ එතුමා කියනවා, "මිනිසා ගොඩ නඟා පවුල රකින්නටත්, පවුල ගොඩ නඟා ගම රකින්නටත්....." තමන් සූදානම්ය කියා. ඒක තමයි මේ කරලා තිබෙන්නේ. ඒක තමයි අන්තිමට වන්නේ. මේ ගොඩ නඟන පවුල මොකක්ද? මේ ගොඩ නඟන්නේ මැදමුලන පවුල; රාජපක්ෂ පවුල. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, වැඩ කරන 1,20,000ක පිරිසකට රුපියල් 1000 ගණනේ ගෙවන දීමනාවට සමාන මුදල් ප්‍රමාණයක් ජනාධිපති ධුරය වෙනුවෙන් වෙන් කර ගෙන තිබෙනවා. ඒ කියන්නේ ජනාධිපති ධුරය සඳහා පසු ගිය අවුරුද්දේ ඇස්තමේන්තු කරපු ප්‍රමාණයට වඩා මිලියන 1,200ක් මේ අවුරුද්දේ වෙන් කර ගෙන තිබෙනවා. ඒක බරපතළයි. කඩා වැටුණු නිෂ්පාදන, දේශීය කර්මාන්ත ශක්තිමත් කරන්න තමයි මේ අය වැය ගෙනත් තිබෙන්නේ කියලා ඊළඟට කියනවා. අය වැය තුළින් ඒ සම්බන්ධ යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මොනවාද ඉදිරිපත් කරන ඒ යෝජනා? තිරිඟු සඳහා වන තීරු බද්ද සියයට 6 සිට සියයට 10 දක්වා වැඩි කර තිබෙනවා. ආනයනය කරන තිරිඟු සඳහා සියයට 5ක සෙස් බද්දක් ගහනවා. එතකොට, තිරිඟු සඳහා සියයට 15ක බදු පනවා තිබෙනවා. ආනයනය කරන කිරි පිටි කිලෝවක් සඳහා වන විශේෂ භාණ්ඩ බද්ද රුපියල් 5 සිට 15 දක්වා වැඩි කර තිබෙනවා. ආනයනය කරන සෑම කිලෝ එකේ කිරි පිටි පැකට් එකකම මිල රුපියල් දහයකින් වැඩි කර තිබෙනවා. බීමට ගන්නා කිරිවලට. දියර කිරි නිෂ්පාදනය වර්ධනය කරන්නයි එහෙම කරන්නේ කියනවා. ආනයනය කරන සීනි සඳහා වන විශේෂ භාණ්ඩ බද්ද රුපියල් 14 සිට 16 දක්වා වැඩි කර තිබෙනවා. රබර් සඳහා සියයට 25ක සෙස් බද්දක් පැනවීමට යෝජනා කරනවා. සත්ව ආහාරවලට සියයට 25ක සෙස් බද්දක් පැනවීමට යෝජනා කර තිබෙනවා. කඩදාසි සඳහා සියයට 5ක සෙස් බද්දක් පනවනවා. පිට රටින් ගෙන්වන ගෘහ හා කාර්යාල භාණ්ඩ සඳහා සියයට 15ක සෙස් බද්දක් පනවනවා. පාවහන්, අත් බෑග්, පටි හා වෙනත් සම්භාණ්ඩ ආනයනයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 200ක සෙස් බද්දක් පනවනවා. පොලිතීන් හා ප්ලාස්ටික් සඳහා අදාළ සෙස් බද්ද සියයට 1 සිට සියයට 5 දක්වා වැඩි කර තිබෙනවා. ආයුර්වේද ඖෂධ වර්ග සඳහා සෙස් බද්ද වැඩි කිරීමට යෝජනා කර තිබෙනවා. පිට රටින් ගෙන්වන එළවලු, පලතුරු සඳහා වන සෙස් බද්ද වැඩි කරනවා. පිට රටින් ගෙන්වන මසා නිම කළ ඇඳුම් හා රෙදිපිළි සඳහා දැනට ඇති සෙස් බද්ද සියයට 50කින් වැඩි කිරීමට යෝජනා කරනවා. පිට රටින් ගෙන්වන ශීතකරණ, විදුලි පංකා, පිඟන් වැනි භාණ්ඩ සඳහා දැනට පවත්නා සෙස් බදු සියයට 50කින් වැඩි කිරීමට යෝජනා කරනවා. පිට රටින් ගෙන්වන චොක්ලට්, බිස්කට් සහ රසකැවිලි සඳහා පවත්නා සෙස් බදු සියයට 50කින් වැඩි කිරීමට යෝජනා කරනවා. පිට රටින් ගෙන්වන ලබන හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා පවත්නා සෙස් බද්ද සියයට 100කින් වැඩි කිරීමට යෝජනා කරනවා. මේවා අපේ රටට ආනයන කරන භාණ්ඩ. ඒවා අත්‍යවශ්‍ය වෙන්න පුළුවන්, නොවෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවාට මෙහෙම සෙස් බද්දක් ගැහුවාම, අපේ රටේ තිබෙන දේශීය කර්මාන්ත, දේශීය නිෂ්පාදන ආනයන

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ආදේශන හැටියට දියුණු වෙනවාය කියා කෙනෙකුට තර්ක කරන්න පුළුවන්. ඒක නේ මේ කියන්නේ. ලෝක අර්බුදයකුත් තිබෙනවා. ඒ නිසා අපි මේ බදු ගහලා විශේෂයෙන් දේශීය කර්මාන්තකරුවන් නඟා සිටුවන්න, දියුණු කරන්න සැලැස්මක් හදනවාය කියන්න පුළුවන්. මේකේ එක පැත්තක ඇත්තක් තිබෙනවා; අර්ධ සත්‍යයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තිබෙන්නේ රේගු දෙපාර්තමේන්තුව 2007 අවුරුද්දට නිකුත් කළ වාර්තාව. "External Trade Statistic Sri Lanka - 2007". ඒ කියන්නේ අපේ වෙළෙඳ ගනුදෙනුවලට අදාළ ආනයන අපනයන දත්ත සඳහන් වාර්තාව. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 කාර්ය සාධන වාර්තාවත් මෙතැන තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාර්තා අනුව ගත්තත් අපේ රටේ බරපතළ වෙළඳ ශේෂ හිඟයක් තිබෙනවා. අපනයනවලට වඩා ආනයන වියදම වැඩියි. 2007 අවුරුද්දේ ආනයනය සඳහා රුපියල් බිලියන 1,260ක් අපට වැය වෙලා තිබෙනවා. ඒ ලැයිස්තුව මෙතැන තිබෙනවා. වැදගත් නිසා ආනයන වියදම් සම්බන්ධ ඒ පිටු කිහිපය පමණක් හැන්සාඩ් වාර්තාවට එකතු කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

ඒ ලැයිස්තුවට අනුව තිරිඟු පිටි ගෙන්වන්න අපි රුපියල් මිලියන 29,237ක් වියදම් කරලා තිබෙනවා. දැන් ඒ සඳහා සියයට 15ක තීරු බද්දක් පනවා තිබෙනවා. එහෙම නම් ආනයනය කරන තිරිඟු පිටිවලට ආදේශනයක් හැටියට අපේ රටේ තිබෙන කව්පි, මුං ඇට, කඩල, වී වැනි වගාවන් සඳහා සහනයක් දෙන්න එපා යැ. ඒ ගොවියා ඒවා තෝරා ගන්න එපා යැ. මීට අවුරුදු හතරකට පහකට කලින් මේ සැලැස්ම ගෙනැල්ලා, තිරිඟු පිටි පාවිච්චිය නතර කරන්න කියා ජනතාවගෙන් ඉල්ලීමක් කරලා, දැන් මේ බද්ද ගහන්න සූදානම් වුණා නම් ගැටලුව විසඳෙන්න තිබුණා. නමුත් ප්‍රශ්නය මේකයි. අද කාටද ඒ සහනය දීලා තිබෙන්නේ? මේක නිසා ඒ ගොවියා දිරිමත් වෙලා තිබෙන්නේ කොහොමද? මේ ක්‍රියා මාර්ගය නිසා වෙන්න පුළුවන් දේ තමයි පාන් පිටි මිල වැඩි වෙන එක. වතුකරයේ හයලක්ෂයක් වැඩ කරන කම්කරුවෝ, දොළොස්ලක්ෂයක් වතුකරයේ ජනතාව බොහෝ විට ජීවත් වන්නේ රොටියක් පුච්චා ගෙන කාලායි. ඒ මිනිස්සු කන ඒ රොටියේ මිල වැඩි වෙනවා. පාන් පිටි මිල වැඩි වෙනවා. ඒ මිනිස්සු කන බනිස් ගෙඩියේ මිල වැඩි වෙනවා. තිරිඟු පිටිවලට ආදේශක වන මුං ඇට, කව්පි වවලා වෙළඳ පොළට එනකම් පාන් පිටි මිල වැඩි නොකර ඉන්නේ නැහැ. මිල අද ඉඳලා වැඩි වෙනවා. ඒක තමයි ඇත්ත දේ. ඒ වාගේම තමයි, ආනයනය කරන කිරි පිටි. දියර කිරි නිෂ්පාදනය වර්ධනය කරන්න කාටද අවස්ථාව දීලා තිබෙන්නේ? දියර කිරි පරිභෝජනය සියයට 25යි කියලා මේ අය වැය කථාවෙන්ම කියනවා. ඉතිරි සියයට 75 වෙනුවෙන් මොන දේශීය කර්මාන්තකරුවාට ද අවස්ථාව දීලා තිබෙන්නේ? කාටද ගොවි පොළ දීලා තිබෙන්නේ? දැන් කියන විධියට මේ එළදෙන්නු ගෙන්නලා, ඒකටත් රාජ්‍ය සමාගමක් හදලා, ඒක පවුලට භාර අරගෙන, ඒක කාට හරි බෑණා කෙනෙකුට දීලා මේක පටන් ගන්න කොට පෙරහැර ගිහිල්ලා. පැටව් ගහලා කිරි එරෙන කොට ජනතාවට කිරි එරිලා! ඒක නේ ඇත්ත, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකද වෙන්නේ? දැන් මේ බද්ද ගහපු ගමන් හෙට උදේ ඉඳලා මෙහේ පිටි මිල වැඩි වෙන්න පටන් ගන්නවා. මේ වාර්තාවට අනුව -රේගු දෙපාර්තමේන්තුවෙන් කියන කොටස විතරක්- සීනි සඳහා පිට රටට රුපියල් මිලියන 17,057ක් ගිහිල්ලා තිබෙනවා. 2007 අවුරුද්දේ විතරක් රුපියල් මිලියන 17,057ක සීනි අපි ගෙන්වා තිබෙනවා. 2007 අවුරුද්දේ ගෙන්වූවාය කියන්නේ, 2007 වෙනකම් මේ රටේ නිෂ්පාදනය සමත් නැහැ, මේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න. අපි අද මේ අය වැයෙන් මේක ගෙනාවාට පස්සේ උක් වගා කරලා, උක් ටික කපලා, ඒවා ෆැක්ටරියට ගෙනැල්ලා හදා ගන්න තව අවුරුදු 5ක් 6ක් යනවා. එතකොට ඒ බද්ද ගේන්න ඕනෑ මේ අය-වැයෙන් නොවෙයි. ඒ බද්ද ගේන්න ඕනෑ තව අවුරුදු තුන හතරකට පස්සේ එන අය වැයකින්. හැබැයි, මෙය කලින් ගෙනැල්ලා තිබෙන්නේ උක් ගොවියා ශක්තිමත් කරන්න නොවෙයි, භාණ්ඩාගාරයට මුදල් ටික ගන්න; ජනාධිපතිතුමාට මිලියන 1,200 හදා ගන්න. ඒකයි ඇත්ත කථාව. බලන්න එහෙම නොවෙයිද කියලා. ජයන්ත විජේසේකර මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, දැන් කන්තලේ උක් ෆැක්ටරිය වහලා. එහි අක්කර 15,000ක් බහු ජාතික සමාගමකට දෙන්න යනවා. උක් වවන්න නොවෙයි, ඒ උක් ගොවියා ඉන්න ගම්මානවල කෙසෙල් වගාවට. ඒ ජනතාවට පුරුදු කර්මාන්තය, උක් කර්මාන්තය. ඒ වෙනුවට කෙසෙල් වගාවට, පිලිපීන සමාගමකුයි, CIC එකයි සම්බන්ධ කරලා අක්කර 15,000ක් දෙන්න යනවා. [බාධා කිරීමක්] ඔය කියන්නේ. උක් ෆැක්ටරියේ යකඩ කිලෝ එක රුපියල් 14ට විකුණනවා. ඒක තමයි ඇත්ත. ඉතින්, එහෙම කරද්දී කොහොමද සීනි නිෂ්පාදනය කරන්නේ? මොකක්ද, ඒ වෙනුවෙන් තිබෙන වැඩ පිළිවෙළ? මොන දේශීය කර්මාන්තකරුවාට ද ඒකට සහනය දීලා තිබෙන්නේ? මොන දේශීය කර්මාන්තකරුවාද ශක්තිමත් කරලා තිබෙන්නේ? කවුරුද තෝරා ගෙන තිබෙන්නේ? දැන් කියනවා, සියයට 25කින් සත්ව ආහාර බද්දක් ගහනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සත්ව ආහාර බද්ද ගහපු ගමන් බිත්තරයේ මිල වැඩි වෙනවා; කුකුළු කෑම මිල වැඩි වෙනවා. එතකොට මස් කිලෝ එකේ මිල -කුකුළු මස්වල මිල- වැඩි වෙනවා. ඒ මිල වැඩි වෙන්නේ, ඔබතුමන්ලා බලාපොරොත්තු වුණු විධියට හෙක්ටයාර් 70,000ක බඩ ඉරිඟු වවලා, -

මේ අය- වැය කථාවෙන් මම ඒ කොටස උපුටා දක්වන්නම්:

" සත්ව ආහාර නිෂ්පාදනයට BOI සමාගම්වලට තීරු බදු සහන ලැබෙන නිසා දේශීය නිෂ්පාදකයින්ට අසාධාරණයක් වෙනවා".

ඒක ඇත්ත.

"එබැවින්, බඩ ඉරිඟු සහ සත්ව ආහාර පිට රටින් ගෙන්වීමේ දී BOI ඇතුළු සියලු ආනයනකරුවන්ට තීරු බදු වෙනුවට 25%ක සෙස් බද්දක් පැනවීමට යෝජනා කරනවා. ලබන මාස් කන්නයේ හෙක්ටයාර 70,000ක පමණ බඩ ඉරිඟු වවන්න මේ දිනවල සූදානම් වන ගොවි ජනතාවට මෙය විශාල දිරි ගැන්වීමක් වෙනවා."

එතකොට ලබන මාස් කන්නයේ හෙක්ටයාර් 70,000ක බඩ ඉරිඟු වවන්න කවුද තෝරා ගෙන තිබෙන්නේ? කොයි දේශීය ගොවියා ද? කොහේද වවන්නේ? කාටද, ඒ වෙනුවෙන් ඉඩම් වෙන් කරලා දීලා තිබෙන්නේ? දැන් අපි හිතමු, කොහොම හරි හෙක්ටයාර් 70,000ක් සොයා ගෙන, ගොවීන් තෝරා ගෙන වැව්වා කියලා. හෙක්ටයාර් 70,000ක් කියන්නේ ලොකු ගණනක්. මේ මොකටද වවන්නේ? සත්ව ආහාර වෙනුවට ආදේශකයක් හැටියටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මෙය තෝරා ගෙන වවන්න පටන් ගත්තත් අස්වැන්න නෙළන්න වෙන්නේ මැයි මාසය වෙන කොටයි. අස්වැන්න නෙළලා එය වෙළෙඳ පොළට එන කොට, සත්ව ආහාර හදන අපේ අවිස්සාවේල්ලේ කුකුළු කෑම කඩේට එන කොට නොවැම්බර් මාසය ඉකුත් වෙනවා. එහෙම නම් මේ අය වැයට මේ යෝජනාව ගෙනෙන්න ඕනෑ නැහැ. මේ යෝජනාව ගෙනෙන්න තිබෙන්නේ ලබන අවුරුද්දේ ඉදිරිපත් කරන අය වැයෙනුයි.

**ගරු දි. මු. ජයරත්න මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**

(மாண்புமிகு டி. எம். ஜயரத்ன - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)

(The Hon. D. M. Jayaratne - Minister of Plantation Industries)

හෙක්ටෙයාර හැත්තෑදාහක් කියන්නේ සාමාන්‍යයෙන් අක්කර දෙලක්ෂයක් පමණ ප්‍රමාණයක්. කුඹුරු දහඅටලක්ෂ තිස්දාහක් තිබෙනවා. ඒවායෙන් අස්වැද්දුවේ නැති ප්‍රමාණයත් ලක්ෂ හයකට වැඩිය තිබෙනවා. ඒවායේ බඩ ඉරිඟු වවන්න පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)

(The Hon. Sunil Handunnetti)

ඔබතුමා එය තෝරා ගෙන තිබෙනවාද? දැන් අපට තිබෙන ප්‍රශ්නය එයයි.

---

* *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
එතකොට ඒවා වී වගාවෙන් ඉවත් කරනවා?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක වෙනම තර්කයක්.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
සමහර කන්නවල වතුර හිඟයක් තිබෙනවා. ඒ වතුර හිඟ වෙලාවට -බඩ ඉරිඟුවලට එච්චර වතුර ඕනෑ නැහැ.- [බාධා කිරීමක්] ඒවායේ කුඹුරු කරන්නේ නැහැ. ඒවායේ බඩ ඉරිඟු වගා කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපේ රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා ඒ දවස්වල කුඹුරු ගොඩ කරනවා කියලා- [බාධා කිරීමක්] දැන් තමුන්නාන්සේලා කියන්නේත් වී වගාව අයින් කරලා ඒ වෙනුවට බඩ ඉරිඟු වවන්න කියායි.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
දැනටම අනුරාධපුරයේ අක්කර පනස්දාහක්- [බාධා කිරීමක්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි අක්කර පනස්දාහයි කියා කියමු කෝ. ඊළඟට වෙන්නේ මොකක්ද? පිට රටින් හාල් ගෙන්වන්න සිදු වීමයි. ඇයි, වී වෙනුවට කන්න වෙන්නේ බඩ ඉරිඟු නේ? දි.මු. ජයරත්න ඇමතිතුමනි, මේ කියන්නේ සත්ව ආහාර ගැනයි. අපත් එක්තරා ජාතියක සත්තු තමයි. මිනිස් සත්වයෝ. හැබැයි අපි කන්නේ බත්.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
සතුන්ට දුන්නාට ඔය සතුන්ට දෙන ඒවා සතුන්ට වඩා මිනිසුන්ට හොඳයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක හොඳයි. ඒක හොඳටම තේරෙනවා.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
බඩ ඉරිඟු ඉතාම ගුණ දායක ආහාරයක්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරියට හරි. ඔබතුමා හරියට හරි. මා ඔබතුමාට ගරු කරනවා.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
වී කුඩු බත්වලට වඩා ගුණ දායකයි. ඒක සතුන්ටයි දෙන්නේ. සුදු පාන් තමයි මිනිස්සු කන්නේ. පරළු පාන් වගේ ඒවායි සතුන්ට දෙන්නේ. ඒවා ගුණ දායකයි. ගාල්ලේ දහනායක ඇමතිතුමා ඔය කෑම ගැන පාර්ලිමේන්තුවේ කරපු කථාවක් තිබෙනවා **හැන්සාඩ්** වාර්තාවේ. අර ගෙන බලන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැන් ඔබතුමා මගේ වෙලාව දෙන්න. ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා ඒ කාරණාව මතක් කළාට. ගරු ඇමතිතුමනි, තවත් සත්ව ආහාරයක් තිබෙනවා පුන්නක්කු කියා. ඒ පුන්නක්කුත් හරිම වටිනවා මොළය නැති අයට මොළය හැදෙන්න. ඒවා පාවිච්චි කළොත් මේ වගේ යෝජනා ගෙනෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියමින් හිටියේ මෙයයි. හෙක්ටෙයාර හැත්තෑදාහක බඩ ඉරිඟු වවනවා නම් ඒ සැලැස්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑකම තිබෙන්නේ මේ අය වැය යෝජනාව එන්න අවුරුදු තුනකට, හතරකට කලිනුයි. අවුරුදු තුන හතරකට කලින් දේශීය ගොවි ජනතාවක් තෝරා ගෙන, ඉඩම් ප්‍රමාණය තෝරා ගෙන, ඒ වෙනුවෙන් කර්මාන්ත සමූහයක් හදලා, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා අද අප ඇවිල්ලා ඉන්නේ බඩ ඉරිඟු පිට රටින් ගෙන්වන ප්‍රමාණය නතර කරන්න පුළුවන් මට්ටමකට නම් මේ යෝජනාව ප්‍රායෝගිකයි. නමුත් එහෙම නොවෙයි සිදු වෙලා තිබෙන්නේ. අප අද මේවා වවන්න පටන් ගත්තත් වවලා අස්වැන්න ගන්න පුළුවන් වන්නේ මැයි මාසය පමණ වෙන කොටයි.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
ඔබතුමන්ලාගේ ඇමතිතුමා ඉන්න කාලයේ ඇයි එහෙම නොකළේ?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප හිතන්නේ මේ යෝජනාව ප්‍රායෝගික වන්නේ නැහැ කියායි.

ඊළඟට තවත් කාරණයක් තිබෙනවා. කඩදාසි ගනිමු. කඩදාසි ගෙන්වන එකට සියයට පහක බද්දක් ගහනවා. රේගු දෙපාර්තමේන්තු වාර්තාවට අනුව අද වෙන කොටත් අප කඩදාසි ගෙන්වන්න රුපියල් මිලියන තිස්එක්දහස් අටසිය අසූහයක් පිට රටට යවනවා. ඒක නතර කරන්න ඕනෑ. අපි ඒක පිළිගන්නවා. එය අපේ රටේ ඉතිරි කර ගන්න ඕනෑ. හැබැයි දැන් දේශීය වශයෙන් ඇඹිලිපිටිය, වාලච්චේන factory දෙක විතරක් ප්‍රමාණවත්ද, ඒවා සූදානම් ද මේ දේශීය අවශ්‍යතාව සම්පූර්ණ කරන්න? මේ අය වැයෙන් පස්සේ, මේ යෝජනාවෙන් පස්සේ මේ මිලියන තිස්එක්දාහ වියදම් වෙන එක නතර කරන්න ඒවා ප්‍රමාණවත්ද? නැහැ. එහෙම නම් මෙයින් ඇත්තටම සිදු වන්නේ මොකක්ද? මේ අය වැය යෝජනාවත් එක්ක හෙට උදේ ඉඳලා එක්සසයිස් පොතේ මිල වැඩි වෙනවා. දෙසැම්බර් නිවාඩුව ඉවර වෙලා ජනවාරියේ ඉස්කෝලේ යන පොඩි එකාට පොත් ගෙන යන්න පොත් ලැයිස්තුව මිලදී ගන්න කොට අම්මාට, අප්පොච්චිට සිද්ධ වෙනවා වැඩි මිලට අභ්‍යාස පොත් ටික අරන් දෙන්න. මේක තමයි ඇත්ත. මොකද, අපි දන්නවා, අපේ රටේ අභ්‍යාස පොත්, පාසල් පොත් නිෂ්පාදනය කරන ආයතන කීපයයි තිබෙන්නේ. ඒ ආයතන කිහිපය හැරෙන්නට වෙනත් ඒවා නැහැ. මේක තමයි ඇත්ත. ඒ වාගේම පත්තර මිල -පුවත් පත් මිල- වැඩි වෙනවා. මේ ප්‍රායෝගිකව සිද්ධ වෙන දේයි.

ඊළඟට පාවහන්, අත් බෑග්, සම් භාණ්ඩ ආනයනයේදී කිලෝග්‍රෑම් එකකට රුපියල් 200ක බද්දක් අය කරනවා. කුඩා හා ග්‍රාමීය කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට මම එම අමාත්‍යාංශයේ ඉන්න කොට ප්‍රායෝගිකව දැක්කා, පන් මලු ලක්ෂයක් හදා ගන්න පුළුවන් තැනක් අපේ රටේ නැති බව. මේක තමයි ඇත්ත. පන් මලු ලක්ෂයක් හදා ගන්න බැහැ. අපි හිතමු, දේශීය අත් බෑග්, සම් භාණ්ඩ අපේ රටේ හදන්න පටන් ගත්තාය කියලා. ඉතින් මේක හොඳ යෝජනාවක් වන්නේ, මේක ප්‍රායෝගික වන්නේ, මේකට සූදානම් වුණ ආර්ථිකයක් තිබුණොත් පමණයි. ඒකයි මම කියන්නේ. මේ නිෂ්පාදනය දේශීය වශයෙන්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

සිද්ධ කරන්න නම්, ඒ කර්මාන්තකරුවාට -පාවහන් හදන කෙනාට, සම් භාණ්ඩ හදන කෙනාට- ඒ වෙනුවෙන් අත හිත දීලා පෙර සූදානම් කිරීමක් කරලා තිබෙන්න ඕනෑ. එහෙම කරලා නැහැ. එහෙම සූදානම් ආර්ථිකයක් නොවෙයි මේ තිබෙන්නේ. එහෙම නම් යථාර්ථයට මුහුණ දෙන්න අපට සිද්ධ වෙනවා. යථාර්ථයට මුහුණ දුන්නාම වෙන්නේ මොකක්ද? තිබෙන භාණ්ඩයේ මිල වැඩි වනවා. ඊළඟට වෙන්නේ ඒකයි. අනිවාර්යයෙන් වන්නේ පාන් පිටි මිල වැඩි වෙනවා; පාන් මිල වැඩි වෙනවා; බනිස් ගෙඩියේ මිල වැඩි වෙනවා; එක්සසයිස් පොතේ මිල වැඩි වෙනවා; සත්ව ආහාර මිල වැඩි වෙනවා; බිත්තරේ මිල වැඩි වෙනවා; මස් කිලෝ එකේ මිල වැඩි වෙනවා; කිරි පිටි පැකට් එකේ මිල වැඩි වෙනවා. පිට රටින් ගෙන්වන භාණ්ඩ හැම එකේම මිල වැඩි වෙනවා. අන්තිමේදී මෙහේ නිෂ්පාදනය වන භාණ්ඩයේ මිලත් වැඩි වෙනවා.

මසා නිම කළ ඇඳුම්වලට සියයට 50ක බද්දක් දමනවා. එළවලු, පලතුරුවලට සෙස් බද්දක් දමනවා. දැනටත් අපි දන්නවා, රුපියල් මිලියන 20,000ක් ලංකාවෙන් පිට රටට ඇදී යන බව. එතකොට මේක නතර කරන්න මොකක්ද කරන්නේ?

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
වැඩි වශයෙන් භාණ්ඩ ආනයනය කිරීම හොඳයි කියන එකද ඔබතුමන්ලාගේ අදහස?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ. අපි කියන්නේ ගරු ඇමතිතුමා,-

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
මම අහන්නේ, ජේවීපීය හැටියට මොකක්ද අදහස?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා කියන එක වඩා හොඳයි.

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
සියලු දේවල් ආනයනය කිරීම යෝග්‍යයද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, නැහැ. අපි කියන්නේ මේක කරන්න කලින් ඒකට අවශ්‍ය සූදානම් කිරීම කරන්න ඕනෑ කියලායි. ඒ අවස්ථාව කලින් සූදානම් කරලා තමයි මේ බද්ද ගෙනෙන්න ඕනෑ. එහෙම සූදානමක් නැතුව එක වරම මේ බද්ද ගෙනැත් තිබෙන්නේ-

**ගරු දි. මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன)
(The Hon. D. M. Jayaratne)
ඔය අවවාද දුන්නේ නැහැ නේ ආණ්ඩුවේ ඉන්න කාලයේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කිව්වත් අහන්නේ නැහැ නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේක මේ වෙන කථාවක්. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යන්නේ වෙන කථාවක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මගේ කථාව කරන්න අවසර දෙන්න, නැත්නම් ඒ අවශ්‍ය කාලය ලබා දෙන්න කියලා. [බාධා කිරීම්] දැන් මේ විධියට බදු ගහලා තිබෙනවා. විශාල බදු තොගයක්. මේ අය වැයෙන් සමස්තයක් හැටියට කරලා තිබෙන්නේ එක දෙයයි. මම එය කලින් පැහැදිලි කළා. ගරු අමාත්‍යතුමන්ලා කීප දෙනෙක් දැන් ගරු සභාවට ආවා. ඒ නිසා මම නැවත කියනවා. මේ අය වැයෙන් ප්‍රධාන වශයෙන්ම කරලා තිබෙන්නේ එක දෙයයි. මේවා කවදා හරි අපේ රටේ නිෂ්පාදනය කළ යුතු භාණ්ඩ තමයි. ඒක ඇත්ත. හැබැයි ඒ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීමක් නොවෙයි කරලා තිබෙන්නේ. ඒ දේශීය නිෂ්පාදන පෙන්වලා, තමන්ගේ භාණ්ඩාගාරයේ තිබෙන මූල්‍ය අර්බුදය පියවා ගන්න මුදල් තොගයක් ඇදලා තිබෙනවා. ඒ වෙනුවෙන් සෙස් බදු ගහලා තිබෙනවා, තීරු බදු ගහලා තිබෙනවා, විවිධ බදු ගහලා තිබෙනවා. අනෙක් පැත්තෙන් තමන්ගේම අමාත්‍යවරුන්ගේ ප්‍රතිපාදන කපලා. තමන්ගේ අමාත්‍යාංශ විසිහයක ප්‍රාග්ධන වියදම් කපලා; පුනරාවර්තන වියදම් කපලා. අමාත්‍යාංශවල වියදම් කප්පාදු කරලා, ජනාධිපතිවරයා කලින් අවුරුද්දට වඩා වැඩිපුර රුපියල් මිලියන 1,200ක් අමතර ප්‍රතිපාදන හැටියට එකතු කර ගෙන තිබෙනවා. මේක තමයි කරලා තිබෙන්නේ.

දැන් බලන්න, වැට් එක අඩු කළා කියලා ලොකු පම්පෝරියක් ගහනවා. අද "දිනමිණ" පත්තරයේ ලොකුවට කියනවා, වැට් බදු අඩු කරලා තිබෙනවා කියලා. මොකක්ද කරලා තිබෙන්නේ? වැට් බද්ද සියයට 15 සිට සියයට 12 දක්වා අඩු කරලා තිබෙනවා. එතකොට එතැන පරතරය සියයට 3යි. හැබැයි, ඒ වාගේම වරාය හා ගුවන් තොටු පොළ බද්ද සියයට 3 සිට සියයට 5 දක්වා වැඩි කරනවා. අය වැය කථාවේ අවසාන ඇමුණුමෙන් අපට කියනවා, ඒ බද්දෙන් ලබන ආදායම රුපියල් මිලියන 24,000ක් හැටියට අපේක්ෂා කරනවාය කියලා. වරාය හා ගුවන් තොටු පොළ බද්දෙන් රුපියල් මිලියන 24,000ක් අපේක්ෂා කරනවා. එතකොට මේක හරි පැහැදිලියි. වරායෙන් සහ ගුවන් තොටු පොළෙන් මෙහාට එන හැම භාණ්ඩයකටම මේ බද්ද වදිනවා. තිරිඟු පිටිවලට, ඒ අය කරන බද්දත් පසුව වදිනවා. මා කලින් පැහැදිලි කරපු බදු සියල්ලම වදින භාණ්ඩයකට මේ බදු වදිනවා. තිරිඟු පිටි ආනයනය කළොත් වැඩි වන සෙස් බද්දත් වදිනවා; වැඩි වන වරාය හා ගුවන් තොටු පොළ බද්දත් වදිනවා. මේ දෙකම වදින්නේ එක භාණ්ඩයකට. ඒ බදු වැදිලා වරායෙන් එන කොට මහදී අහු වෙනවා. ඒ මොකකටද? වැට් එකට. එතකොට රුපියල් 100කට භාණ්ඩයක් ආනයනය කළොත් සියයට 2ක බද්දක් වරායේදී වදිනවා. එතකොට ඒ භාණ්ඩයේ වටිනාකම රුපියල් 102යි. ඒ රුපියල් 102ට වැඩි වන සෙස් එක හෝ මොකක් හෝ බද්දක් ආපසු වදිනවා, තව සියයට 3ක විතර. එතකොට ඒ භාණ්ඩයේ වටිනාකම රුපියල් 105යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ රුපියල් 105 වටිනාකමට තමයි සියයට 12ක වැට් එක වදින්නේ. එතකොට ඇත්තටම සියයට 12ක බද්දක් නොවෙයි, සියයට 15ක බද්දක් වැදිලා. මේක තමයි ඉලක්කම්වලින් මිනී මැරීම. මේ අය වැය එහෙම එකක්. ඉලක්කම්වලින් මිනී මරනවා. වචනවලිනුත් එහෙම කරන්න පුළුවන් නේ. මිනිහකුට "උඹ හොරා, උඹ හොරා" කිව්වාම, හොරෙක් නොවන මිනිහෙක් වුණත් හිතනවා තමා හොරෙක්ද කියා. වචනවලිනුත් මිනී මරන්න පුළුවන්. ඒ වාගේම තමයි මේකත්. ඉලක්කම්වලින් වංචා කරනවා. මේ අය වැය ඉලක්කමෙන් වංචා කරපු අය වැයක්. වැට් බද්ද අඩු කළාය කියා පෙන්වා ඒකෙන් තමයි මාධ්‍ය වාසිය ගන්නේ. මේක ඉතින් ජනමාධ්‍යවල දිගට හරහට යනවා; SMSවලින් යනවා. ආණ්ඩුවේ පත්තරවලටත්, රූපවාහිනීවලටත් මොකක් හෝ තියෙන්න එපායැ? මෙතැනදී වැට් එක අඩු කළාය කියලා පෙනෙනවා. නමුත් ඇත්තටම වෙන්නේ මොකක්ද? භාණ්ඩයක් එන කොටම වරායේදී සහ ගුවන් තොටු පොළේදී වදිනවා, බද්ද. එතැන බද්ද සියයට දෙකයි. ඒක වැදිලා මහට එන කොට මෙහේ තියෙනවා,

ආයෙමත් ජාතිය ගොඩ නැඟීමේ බද්ද කියලා එකක්. ඒකත් තියෙනවා සියයට එකක්. මේ අය වැයේම සඳහන්ව තියෙනවා, ඒකෙන් බලාපොරොත්තු වෙනවාය කියලා රුපියල් මිලියන පහළොස්දහසක්. එතකොට අතැන රුපියල් මිලියන විසිහතරදහසයි, මෙතැන රුපියල් මිලියන පහළොස්දහසයි. බද්දෙන්ම බලාපොරොත්තු වෙනවා, රුපියල් මිලියන තිස්නවදහසක්. ඔය රුපියල් මිලියන තිස්නවදහස උඩට තමයි වැට් එකත් වදින්නේ. ගරු ඇමතිතුමන්ලා අවංකව කියන්න, හෘදය සාක්ෂියෙන් කථා කර කියන්න වැට් එක අඩු කරලා ද කියා. අඩු කරලා නැහැ. බලන කොට අවසානයේදී වැට් එක සම්බන්ධව කියන්න තිබෙන්නේ මොකක්ද? අපි දන්නවා, වැට් බදු වංචා සිදු වෙනවාය කියා. මේක ගෙව්වාට රජයේ භාණ්ඩාගාරයට යන්නේ නැහැ, මේකේ ප්‍රායෝගික ගැටලු ගොඩක් තිබෙනවාය කියා. ඒ නිසා මේක අඩු කළාය කියලා පෙන්නලා, හරියටම කර මුලින් අල්ලලා අනික් සෑම භාණ්ඩයකටම වරායේදී, ගුවන් තොටු පොළේදී ජාතිය ගොඩ නැඟීමේ බද්දත් එක්ක ඔය ඔක්කෝම බදු ගහනවා. අන්තිමට බැලුවාම මොකක්ද මේ? නංගි පෙන්නලා අක්කා දෙනවා වාගෙයි. අක්කා වැට් එක. අක්කාව හංගනවා, නංගි පෙන්නලා. නංගි පෙන්නනවා, බදු ගහනවා. ඇත්ත කථාව මේකයි. ඒක ඉතා පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනික් එක තමයි ඉන්ධන මිල. දැන් මේ රූපවාහිනී සංවාද හුඟක් ඒවායේ පෙන්නුම් කරන්නේ, මේ අය වැය කියන්නේ ඉන්ධන මිලේ සහනය දුන්න අය වැයක් කියලායි. ඇත්තටම ඉන්ධන මිල අඩු වුණේ අපේ හයියකින්ද, මේ රටේ හයියකින්ද? නැහැ. ඒක ලෝක වෙළෙඳ පොළේ ඇති වුණු මූල්‍ය අර්බුදය නිසා ඇති වුණු විකෘතියක්. මේ මිල විකෘතියක වාසි, අවාසි වෙන්න පුළුවන් ඕනෑම තැනක. ආණ්ඩු පක්ෂයේ ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා දැන් මෙම ගරු සභාවේ ඉන්නවා. එතුමා මේ දවස්වල ඉන්නේ නොඉන්නවා වාගේයි. මොකද, මේ වාගේ ආර්ථිකයක් ගැන එතුමා කථා කරන්නේ නැහැ, ඇත්ත හෘදය සාක්ෂියෙන් තේරෙන නිසා. මේ මිල විකෘතියක වාසිය අර ගෙන අය වැයක් හැදුවොත් මොකක්ද වෙන්නේ? ඒ අය වැයත් විකෘතියක් බවට පත් වෙනවා. දැන් මෙතැන සිද්ධ වෙලා තියෙන්නේ ඒකයි. ලෝක ආර්ථිකයේ තෙල් මිලේ ඇති වුණු විකෘති තත්ත්වය පාවිච්චි කරලා "අපි තෙල් මිලෙන් දැවැන්ත සහනයක් දුන්නා" කියලා කියනවා නම් ඒක ඇත්තටම විකෘතියක්. මොකද, මේක වුණේ කුමක් නිසාද කියා අපි හරියට තේරුම් කරන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාව ඉල්ලුවේ සැබෑ වැටුප් වැඩි වීමක්. හැබැයි වැටුප් වැඩි වීම රුපියල් පන් දහසකින් දුන්නොත් එහෙම ඒ පන්දහස ආයේ අඩු කරන්න බැහැ. මොකද වැටුප් වැඩි කිරීමක් කළාට පස්සේ අඩු කරන්න බැහැ නේ. හැබැයි, තෙල් මිල එහෙම නොවෙයි. දැන් තෙල් මිල අඩු කරලා අනිද්දාට විතර ආයේ වැඩි කරන්නත් පුළුවන්. මොකද මේ ලෝක වෙළෙඳ පොළේ ඇති වුණු විකෘතිය ආයේ නැවත ඒ ධනේශ්වර ක්‍රමයම මොනවා හෝ සෙල්ලමක් දාලා හදා ගත්තොත්, ආයේ තෙල් මිල වැඩි වෙනවා. ඒ තෙල් මිල වැඩි වුණු ගමන් ආණ්ඩුව මොකද කියන්නේ? ආණ්ඩුව කියන්නේ දැන් ඉතින් මේ සහනය දෙන්න බැහැ කියලායි. ජනාධිපතිතුමාගේ කථාවේදී මුදල් ඇමතිතුමා හැටියට එතුමා කියනවා, මේ තෙල් සහනය දෙන වෙලාවේ හරි අපූරු කතන්දරයක්. එතුමා සැහෙන්න දුර උපකල්පනය කරනවා. එහෙම උපකල්පනය කළා නම් මේ හැම එකටම මේ උපකල්පනය කරන්න පුළුවන්. ඒකෙදී ඉන්ධන මිල සම්බන්ධයෙන් එතුමා කියනවා, "මේ ඩීසල් මිල නිසා බස් ගාස්තු සියයට විසි පහකින් පමණ අඩු කළ හැකි වෙනවා"ය කියා. හැබැයි, අද උදේ පත්තරයේ තියෙන්නේ මොකක්ද? අපේ පෞද්ගලික බස් රථ සමාගම්වල අය කියනවා, "නැහැ, නැහැ, එහෙම සියයට විසිපහක් අඩු කරන්න බැහැ"ය කියා. එතකොට මේ පෞද්ගලික බස් රථ හිමියන් ඔක්කෝම එක්ක කථා කරලා එකඟතාවෙන් නම් ආවේ, මේක මෙහෙම වෙන්නේ නැහැ නේ. හැබැයි මේක සිතළුවක්; මේක සිතුවිල්ලක්. ඒ සිතුවිල්ලෙන් එතුමා කියනවා, තව දෙයක්. "දුර ගමන් සේවාවලින් මසකට රුපියල් 750ක රුපියල් 1,000ක පමණ ප්‍රමාණයක් ඉතිරි වෙන්න පුළුවන්" කියා කියනවා. ඒ වාගේම, "පෙට්‍රල් මිල අඩු කිරීම නිසා මෝටර් බයිසිකලයේ යන අය ලක්ෂ දහසයකට මාසයකට රුපියල් 500ක් ඉතිරි කරන්න පුළුවන්" කියා කියනවා. ඉතින් ඒක අදත් පුළුවන්. අදත් සමහරු එහෙම කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. වියදම වැඩි වුණාම බයිසිකලය තියලා බස් එකේ යනවා. මෝටර් බයිසිකලය ගෙදර තියෙන කොට එතැනත් ඉතිරියක් වෙනවා නේ. ගමන් බිමන් නොගිහින් ඉන්නවා. සමහර ගෙවල්වල ටෙලිෆෝන් තියෙනවා. ගාස්තු වැඩි නිසා කථා කරන්නේ නැහැ. මෝස්තරයට ගෙදර ටෙලිෆෝන් එකක් තියෙනවා. අය වැය හදද්දී ඕනෑ නම් කෙනකුට කියන්න පුළුවන්, "ටෙලිෆෝන් බිලක් යන්නේ නැහැ, ඉතිරියක් වනවා" කියලා. ඒක ඇත්ත, ඉතිරියක් වෙනවා. මොකද කථා කරන්නේ නැහැ නේ? මෝටර් බයිසිකලය ගෙදර තියෙනවා. නමුත් මෝටර් බයිසිකලයෙන් කොහෙවත් යන්නේ නැහැ. එහෙම ඉතිරි කරලා ආර්ථිකයක් පවත්වා ගෙන යන්න බැහැ. මේ වාගේ මනරම් සිතිවිලිවලින් ආර්ථිකය දුවන්න බැහැ. මෝටර් බයිසිකලය තියෙන එක් කෙනා මෝටර් බයිසිකලය පැද්දොත් තමයි ආර්ථිකයට වටිනාකමක් එකතු වෙන්නේ. මෝටර් බයිසිකලයත් ශ්‍රමය වගුරුවන උපකරණයක්. ඒවාට අප ආර්ථික විද්‍යාවේ කියනවා, "නිෂ්පාදන උපකරණ" කියා. ඒ උපකරණ යොදවා ගත්තොත් තමයි ආර්ථිකය ශක්තිමත් වෙන්නේ. ඒවා නතර වුණොත්තින් මොකද වෙන්නේ? ගෙදර තිබුණාට පස්සේ ඒවායින් මොකුත් වෙන්නේ නැහැ. මේ වෙලා තිබෙන්නේ එහෙම එකක්.

ඊළඟට, තෙල් සහනය ගැන කියන්නට ඕනෑ. ඇත්තටම මේ තෙල් සහනය මීට වඩා දෙන්න තිබුණා. දෙන්නට පුළුවන්කම තිබුණු දෙය වුණත් -විකෘතියේ ප්‍රතිඵලය පවා- දුන්නේ නැහැ. ඒක මීට කලිනුත් දෙන්න පුළුවන්කම තිබුණා. එතකොට ඒක මේ අය වැය ලේඛනයට අදාළ නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ මෙහෙමයි. අය වැයේදී මොකද කළේ? ඇත්ත මූල්‍ය අර්බුදයක ආණ්ඩුව ඉන්නවා. ඒ මූල්‍ය අර්බුදය නිසා සහන දෙන්න බැහැ. ණයවර ලිපි විවෘත කිරීමේදීම සහන දෙන්න බැරි බව කොච්චරද කියා ඔප්පු වෙනවා; ආණ්ඩුව කොච්චර මූල්‍ය අර්බුදයක ඉන්න වාද කියන එක ඔප්පු වෙනවා. ණයවර ලිපි විවෘත කිරීමේදී සියයට සියයක තැන්පතු බැංකුවේ තැන්පත් කරන්නටය කියා ආණ්ඩුව කියන්නේ ඇයි? ව්‍යාපාරිකයන්ය කියන්නේ අපේ ආර්ථිකයේ කොටසක්ය කියන එක අප දන්නවා. කර්මාන්තකරුවෝ ව්‍යාපාරිකයෝ හලා ආර්ථිකයක් පවතින්න බැහැ නෙ. අපට වඩා ඔබතුමන්ලා තමයි අපට මේක කියන්නේ. විවෘත ආර්ථිකය ඇතුළේ කර්මාන්තකරුවෝ, ව්‍යාපාරිකයෝ අනිවාර්යයෙන්ම ඉන්න ඕනෑය කියා කියන්නේ ඔබතුමන්ලාමයි. දැන් මොකද වෙලා තිබෙන්නේ? කර්මාන්තකරුවෙක්, ව්‍යාපාරිකයෙක් මේ ඔබතුමන්ලා පනවන සියලු බදු ආණ්ඩුවට ගෙවන්න ඕනෑ. නැත්නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් -ටැක්ස් එකෙන්- පැනලා පස්සෙන් පන්නනවා. පොත් අර ගෙන එනවා. එහෙම නෙ කියන්නේ. අප අද ව්‍යාපාරිකයකු හම්බ වෙන්න ගියාම ව්‍යාපාරිකයා කියන්නේ මොකක්ද? "මහත්මයෝ මේ දවස්වල ගන්න දෙයක් නැහැ. බිස්නස් ඔක්කොම පාඩුයි. අරහෙට මෙහෙට ගෙවන්න විතරයි තිබෙන්නේ " කියලායි කියන්නේ. ඒක තමයි ඇත්ත. ඒ ගෙවන ව්‍යාපාරිකයා, කර්මාන්තකරුවා නිකම් ඉන්නේත් නැහැ. තමන්ගේ සේවකයන් තිහක් හතළිහක් නඩත්තු කරනවා. ඒ සේවකයන් තිහකට, හතළිහකට පඩි ගෙවනවා. එත කොට ආණ්ඩුව දෙන්න ඕනෑ රක්ෂාව ව්‍යාපාරිකයා දීලායි තිබෙන්නේ. එතකොට ව්‍යාපාරිකයා තමන්ගේ පවුල, තමන්ගේ කර්මාන්තශාලාව විතරක් නොවෙයි රකින්නේ; තවත් පවුල් දහයක් පහළොවක් රකිනවා. ආණ්ඩුව කන්න දෙන්න ඕනෑ පවුල්වලට ව්‍යාපාරිකයා කන්න දෙනවා; දේශීය කර්මාන්තකරුවා කන්න දෙනවා. එහෙම නෙ ඒක වෙන්නේ. එහෙම කරන එක් කෙනාට ආණ්ඩුව මොකක්ද කරන්නේ? ඒ එක් කෙනාගෙන් තමයි මේ ඔක්කෙම සූරා ගෙන කන්නේ. අන්න ඒ එක් කෙනාට දැන් මේ විධියට කරන්න කියනවා.

භාණ්ඩ ආනයනය කිරීමේදී මීට කලින් තිබුණු ක්‍රමය මොකක්ද? ආනයනය කළ භාණ්ඩ වරායට ආවම තමයි LC එකට බැංකුවේ මුදල තැන්පත් කරන්න ඕනෑ. LC විවෘත කරද්දී වන්නේ ඒ විධියටයි. LC -ඒ ණයවර ලිපි. ඒකට කියන්නේම ණයවර ලිපිය කියලායි. ඒක ණය පහසුකමක්. - විවෘත කළාම,

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඒ ණය පහසුකම ව්‍යාපාරිකයාට දෙන්නේ කොහොමද? භාණ්ඩ ආනයනය කරන්න තීරණය කර, ඇණවුම් කර, ඇණවුම වරායට ආවාට පස්සෙයි බැංකුවේ මුදල් තැන්පත් කරන්න ඕනෑ. ණයවර ලිපිය විවෘත කරද්දීම, වරායට බඩු එන්න කලින්ම මුදල් බැංකුවේ තැන්පත් කරන්න ඕනෑය කියා දැන් ආණ්ඩුව කියනවා. එතකොට බඩු වරායට එන්න කලින් බඩු මඟ; බඩු මුහුදේ. ව්‍යාපාරිකයා බඩුවලට අදාළ මුදල් දෙගුණයකින් තැන්පත් කරන්න ඕනෑ. සියයට සියයක්ම බැංකුවේ මුදල් තැන්පත් කිරීම වැඩි කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාටද ව්‍යාපාර කර ගෙන යන්නට හිතෙන්නේ? මා කියන්නේ මේකයි. දැන් ආර්ථිකය ඇකිළිලා තිබෙන්නේ; මූල්‍ය අර්බුදයක තිබෙන්නේ. බැංකු පොලී අනුපාතය වැඩියි. අයිරා පොලී අනුපාතය සියයට තිහක තිස්පහක ප්‍රමාණයක්. ඊට පස්සේ පඩි ගෙවන්න බැහැ. අමු ද්‍රව්‍ය ගෙන්වා ගන්නට බැහැ. ගෙන්වන අමු ද්‍රව්‍යවලට, භාණ්ඩවලට වරායේදී ගහන බද්ද දැන් වැඩි වෙනවා. තීරු බද්ද වැඩි වෙනවා. රේගු බද්ද වැඩි වෙනවා. සෙස් බද්ද වැඩි වෙනවා. ඒ පිටටම කියනවා, ණයවර ලිපියත් විවෘත කරන කොටම සියයට සියයක් මුදල් බැංකුවේ තැන්පත් කරන්නටය කියා. මේ ඔක්කොම කියන්නේ කාටද? එක පුද්ගලයකුටයි.

අර ලෝක අර්ථික අර්බුදය ආවෙත් ඔන්න ඔහොම තමයි. ලෝක ආර්ථික අර්බුදය ආවේ කොහොමද? එක ගෙයයි තිබෙන්නේ. ඒ ගෙය උකස් සමාගමකින් පුද්ගලයකු ගන්නවා. ඒ ගෙය සඳහා ඒ පුද්ගලයා උකස් මුදල් ගෙවන්නේ ඔහුගේ credit card එකෙන්. ඒ credit card සමාගම credit දෙන්නේ එක ගෙයකටයි. ඒ credit card සමාගමට මූල්‍ය සංවර්ධන බැංකුවකිනුයි ණය දෙන්නේ. එතකොට එතැනත් තිබෙන්නේ ඒ ගෙයමයි. එකම ගෙයට credit card සමාගත් සම්බන්ධ වෙනවා. ඒ ගෙයටම උකස් සමාගමත් සම්බන්ධ වෙනවා. ඒ ගෙයටම නිවාස සංවර්ධන බැංකුවත් සම්බන්ධ වෙනවා. ඒ ගෙයටම කොටස් වෙළෙඳ පොළත් සම්බන්ධ වෙනවා. අන්තිමේදී එක ගෙයක් වෙනුවෙන් මුදල් මවා තිබෙනවා. එම නිසා අන්තිමේ එක තැනකින් බුබුල හිඳුණාම, සිදුරු වුණාම මුළු ආර්ථිකයම කඩා ගෙන වැටුණා. එක ගෙයක් වෙනුවෙන් වටිනාකම් මැව්වා; මූල්‍ය මැවීමක් කළා. ඇමෙරිකාවේ මූල්‍ය වෙළෙඳ පොළ බිඳ වැටුණා. අපේ මොකද වෙලා තිබෙන්නේ? අපි මොකද කරන්නේ? එක ව්‍යාපාරිකයාට වැට් බද්දත් ගෙනෙනවා; සෙස් බද්දත් ගෙනෙනවා; වරාය හා ගුවන් තොටු පොළ සංවර්ධන බද්දත් ගෙනෙනවා; ජාතිය ගොඩ නැඟීමේ බද්දත් ගෙනෙනවා. ණයවර ලිපිවලට ඒ වෙලේම මුදල් තැන්පත් කරන්න කියලා කියනවා. මේ සියලු බර එකට පැටෙව්වාම ආර්ථිකයක් පවතින්න පුළුවන්ද? ඒක නිසා තමයි අපි මේවා කියන්නේ. දැන් ඔබතුමන්ලා කල්පනා කරන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ආර්ථික උපාය මාර්ග වැරදිලා තිබෙන්නේ. දැන්වත් තීරණය කරන්න ඕනෑ, කොහොමද මෙතැනින් ගැලවෙන්නේ කියා. එහෙම තීරණය කරන පාටක් පෙනෙන්නේ නැහැ නේ. මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී ඔබතුමන්ලා කොහොමද සලකා තිබෙන්නේ? එහෙම සලකා නැහැ. ඒක නිසා තමයි අපි කියන්නේ අද අපි රටක් හැටියට බරපතළ මූල්‍ය අර්බුදයකයි ඉන්නේ කියා. අපේ බැංකු පද්ධතිය අර්බුදයක තිබෙනවා. ඒක නිසා තමයි ඔබතුමන්ලාට සිද්ධ වෙන්නේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු - රුහුණ සංවර්ධන බැංකුව, සබරගමු සංවර්ධන බැංකුව, කඳුරට සංවර්ධන බැංකුව, වයඹ සංවර්ධන බැංකුව හා ඌව සංවර්ධන බැංකුව- ඔක්කොම ටික එකතු කරලා මූල්‍ය ප්‍රාග්ධනය ඒක රාශි කර ගැනීම වෙනුවෙන් එක ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක් හදා ගන්න. මම කියන්නේ ඒකේ වැරැද්දක් නැහැ කියලායි. අර්බුදයකට ආවම ඒ වාගේ උත්තර හොයන්න ඕනෑ. හැබැයි, එහෙම උත්තර හොයන්න වෙලා තිබෙන්නේ ඇයි? LC open කරන කොටම තැන්පතු බැංකුවේ තියන්න කියලා කියන්නේ ඇයි? ලංකා බැංකුවට සියයට 22 පොලියට බැංකු ණයකර නිකුත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? මේ මූල්‍ය අර්බුදය නිසායි. මේ මූල්‍ය අර්බුදයට රටක් හැටියට අපි උත්තර හොයනවා නම් අනිවාර්යයෙන් අපේ පැත්තෙන් මොකක්ද කරන්න ඕනෑ? කැප කිරීම් කරන්න ඕනෑ. ජනතාවත් එක්ක ඇත්ත කථා කරන්න ඕනෑ. බොරු කයිවාරු ගහලා, බොරු වර්ණනා කරලා, පම්පෝරි ගහලා බැහැ. මේ ආර්ථිකය මෙහෙම යන්න බැහැ. අද මේ අය වැය ලේඛනය ඔප්පු කර තිබෙනවා, මේ ආණ්ඩුව ඔප්පු කර තිබෙනවා, තමන් මුහුණ දෙන්නේ බරපතළ මූල්‍ය අර්බුදයක කියා. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මෙය කියන්නේ. අපිට මේ ආණ්ඩු කඩා වැටෙන නොවැටෙන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ රටට ආදරෙයි. මේ රටට ආදරය කරන පක්ෂයක් හැටියට අපි කියන්නේ දැන්වත් ඇස් ඇරලා බලන්න කියලායි. අපි ඉන්නේ ගිනි කන්දක් උඩ. අපි ඉන්නේ බරපතළ මූල්‍ය අර්බුදයක් උඩ. අපේ රට තියෙන්නේ එතැන. අපි ඔබතුමන්ලාට මීට අවුරුදු ගණනකට කලින් ඉඳලා කිව්වා, "මෙතැන උපාය මාර්ගික වැරැද්දක් තිබෙනවා. මේ උපක්‍රම වැරදියි. වෙනස් වෙමු, වෙනස් වෙමු" කියා. අද කෙළවරටම ඇවිල්ලා හොම්බ බිම ඇන ගෙන දැන් මේ යෝජනා ගෙනෙන කොට මේ බර පැටවෙන්නෙත් ජනතාව පිටයි. ඒක තමයි ඇත්ත.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(Mr. Deputy Chairman of Committees)

මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)

(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විනාඩි දෙකෙන් මම අවසාන කරනවා.

ජනතාව පිටයි පටවන්නේ මේ බර. අපි කියන්නේ ලෝක ආර්ථික අර්බුදයක් තිබෙන බව ඇත්ත කියලායි. හැබැයි, ඒ ආර්ථික අර්බුදයට උත්තරය, අමාත්‍යාංශවල ප්‍රාග්ධන වියදම් කප්පාදු කරලා ජනාධිපතිතුමා රුපියල් මිලියන 1,200කින් -බිලියනයකින්- තමන්ගේ කොටස වැඩි කර ගන්න එක නොවෙයි; තමන්ගේ කුඩුව හදා ගන්න එක නොවෙයි. ඇත්තටම මේකෙන් ඒක තමයි කර තිබෙන්නේ. අවසානයේ අපට රට ඉදිරියට ගිහිල්ලා කථා කරන්න වෙන්නේ මොකක්ද? අපි දන්නවා, ගිය අවුරුද්දේ -ඒකත් මේ වෙලාවේ කියලා ඉවර කරන්න ඕනෑ.- අපි ලොකු විවාදයක් කළාය කියා. ඒ විවාදය කර ඉවර වෙලා අවුරුද්දක් පුරා අපි මේ පාර්ලිමේන්තුවේ ගත කළා. අපිට හිටපු ගෞරවනීය ඇමතිවරු කිහිප දෙනෙක් නැති වුණා.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ විජිත රණවීර මන්ත්‍රීතුමා හැම දාම පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇහුවා. එතකොට අර "රතු පොත, රතු පොත" කියලා මුදල් අමාත්‍යාංශයෙන් තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශවලට වෙන් කරපු ප්‍රතිපාදන ඇතුළත් පොත ගෙනාවා. නමුත් මොකද වෙලා තිබෙන්නේ? මේ පොතේ සඳහන් විධියට මුදල් වෙන් කරනවා. නමුත් ලැබෙන්නේ නැහැ. අන්තිමට ඇමතිවරුන්ට අමාත්‍යාංශවලට ලැබෙන්නේ නැහැ. මේ වතාවේ මොකද වෙලා තිබෙන්නේ? මේ වතාවේ රතු පොත වෙනුවට මේ ලොකු පොතෙන්ම කපලා; අමාත්‍යාංශවල ප්‍රාග්ධන වියදම් කපලා. ඒ නිසා අපි කියන්නේ මෙහෙම ගියොත් අන්තිමේදී ඇමතිවරු රූකඩ බවට පත් වෙනවා කියලායි; අමාත්‍යාංශ නිකම්ම නිකම් හිස් බවට පත් වෙනවා කියලායි. රටේ සංවර්ධන ක්‍රියා දාමයට දායක වෙන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා මෙන්න මේ වැරදි ආර්ථික උපක්‍රම නිසා රට අගාධයට වැටෙන මේ අය වැය ලේඛනයට ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි අපේ විරෝධය පළ කරනවා. දෙගිඩියාවකින් තොරව අපි අපේ විරෝධය පළ කරනවා. ජනතා විමුක්ති පෙරමුණ මේ අය වැය ලේඛනයට විරුද්ධයි. ඒ ගැන දෙගිඩියාවක් අපිට නැහැ. මොකද, මේ අය වැය ලේඛනය කිසිදු මොහොතක කිසිදු ආකාරයෙන් සම්මත කරන්න, අනුමත කරන්න සහය දෙන්න පුළුවන් අය වැය ලේඛනයක් නොවන බව අපි ඉතා දැඩිව අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

*සභා මේසය මත තබන ලද ලියවිල්ල :
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
*Document tabled:*

**XVI**

**SUMMERY OF TRADE STATISTICS**
**IMPORTS - 2007**

| CHAPTER | | CIF VALUE (Rs.) |
|---|---|---|
| 01. | Live Animals. | 198,805,463 |
| 02. | Meat and Edible Meat Offal. | 257,547,910 |
| 03. | Fish and Crustaceans, Molluscs and other Acquatic Invertebrates. | 8,205,758,828 |
| 04. | Dairy Produce; Birds Eggs; Natural Honey; Edible Products of Animal Orgin not elsewhere Specified or included. | 20,595,894,729 |
| 05. | Products of Animal Origin, not elsewhere Specified or included. | 214,677,903 |
| 06. | Live Tree & Other Plants; Bulbs, Roots & the Like; Cut Flowers & Ornamental foliage. | 68,295,025 |
| 07. | Edible Vegetables & Certain Roots & Tubers. | 18,699,832,117 |
| 08. | Edible Fruit & Nuts peel of Citrus fruit or Melons. | 1,555,878,816 |
| 09. | Coffee, Tea, Mate & Spices. | 8,185,424,643 |
| 10. | Cereals. | 29,237,804,626 |
| 11. | Products of the milling industry; Malt; Starches; Inulin; Wheat gluten. | 1,098,665,407 |
| 12. | Oil seeds & Oleaginous Fruits; Miscellaneous Grains, Seeds and Fruit; Industrial or Medicinal Plants; Straw and fodder. | 987,736,173 |
| 13. | Lac; Gums, Resins & Other Vegetable saps & Extracts. | 192,494,047 |
| 14. | Vegetable plaiting Materials; Vegetable products Not elsewhere specified or Included. | 661,778,351 |
| 15. | Animal or Vegetable fats & Oils & Their cleavage Products; Prepared edible fats; Animal or Vegetable waxes. | 20,957,585,971 |
| 16. | Preparations of Meat, of Fish or of Crustaceans, Molluscs or other Aquatic Invertebrates. | 3,890,034,205 |
| 17. | Sugars & Sugar confectionery. | 17,057,361,428 |
| 18. | Cocoa & Cocoa preparations. | 457,591,406 |
| 19. | Preparations of cereals, Flour, Starch or Milk; Pastrycooks' products. | 3,547,093,870 |
| 20. | Preaparations of Vegetables, Fruit, Nuts or Other Parts of Plants. | 1,051,117,828 |
| 21. | Miscellaneous edible preparations. | 2,032,145,204 |
| 22. | Beverages, Spirits & Vinegar. | 2,230,668,182 |
| 23. | Residues & Waste from the Food industries Prepared Animal fodder. | 6,777,982,529 |
| 24. | Tobacco & Manufactured Tobacco substitutes. | 4,841,877,211 |
| 25. | Salt; Sulphur; Earths & Stone; Plastering Materials, Lime & Cement. | 25,895,994,194 |
| 26. | Ores, Slag & Ash. | 213,462,293 |
| 27. | Mineral fuels, Mineral Oils & Products of Their Distillation; Bituminous substances; Mineral Waxes. | 296,804,187,741 |
| 28. | Inorganic chemicals; Organic or Inorganic Compounds of Precious metals, of Rare-Earth Metals, of Radioactive elements or of Isotopes. | 9,184,935,216 |
| 29. | Organic chemicals. | 8,921,240,766 |
| 30. | Pharmaceutical products. | 17,243,627,057 |
| 31. | Fertilisers. | 21,421,686,573 |
| 32. | Tanning or Dyeing extracts; Tannins & Their Derivatives; Dyes, Pigments & Other colouring Matter; Paints and Varnishes; Putty and other Mast. | 9,229,113,764 |
| 33. | Essential Oils Resinoids; Perfumery, Cosmetic or Toilet Preparations. | 3,598,028,223 |
| 34. | Soap, Organic supface active Agents, Washing Preparations, Lubricating preparations, Artificaial Waxes. Prepared waxes, Polishing or Scouring. | 2,730,329,610 |
| 35. | Albuminoidal substances; Modified starches; Glues; Enzymes. | 2,130,832,614 |
| 36. | Explosives; Pyrotechnic products; Matches; Pyrophoric alloys; Certain combustible Preparations. | 143,515,328 |

| CHAPTER | | CIF VALUE (Rs.) |
|---|---|---|
| 37. | Photogrphic or Cinematographic Goods. | 1,878,364,843 |
| 38. | Miscellaneous chemical products. | 10,503,424,233 |
| 39. | Plastics & Articles thereof. | 45,149,391,402 |
| 40. | Rubber & Articles thereof. | 16,096,546,665 |
| 41. | Raw hides & Skins (other than furskins) & Leather. | 1,611,396,174 |
| 42. | Articles of leather, Saddlery & Harness Travel Goods, Handbags & Similar containers; Articles of Animal gut (other than silk worm gut). | 655,622,283 |
| 43. | Furskins & Artifical fur; Manufactures thereof. | 14,021,131 |
| 44. | Wood & Articles of wood; Wood charcoal. | 5,795,916,791 |
| 45. | Cork & Articles of cork. | 4,709,930 |
| 46. | Manufactures of straw, of esparto or of other Plaiting materials; basketware & wicker work. | 28,202,283 |
| 47. | Pulp of wood or of other fibrous cellulosic material; Recovered (waste & SCRAP) Paper or Paper board | 118,694,078 |
| 48. | Paper & Paperboard; articles of paper pulp, of Paper or of paperboard | 31,886,123,291 |
| 49. | Printed Books,Newspapers, pictures & other Products of the printing industry; Manuscripts, Typescripts and plans. | 3,453,433,211 |
| 50. | Silk | 844,994,082 |
| 51. | Wool, Fine or coarse Animal hair; Horsehair, Yarn & woven fabric. | 1,556,366,259 |
| 52. | Cotton | 58,228,206.585 |
| 53. | Other vegetable Textile Fibries; Paper Yarn & Woven Fabrics of paper yarn | 2,207,032,380 |
| 54. | Man-Made Filaments. | 10,679,964,073 |
| 55. | Man-Made Staple Fibres. | 29,927,407,287 |
| 56. | Wadding, Felt & Nonwovens; special Yarns; Twine, Cordage, Ropes & Cables & Articles thereof. | 3,046,698,743 |
| 57. | Carpets & other textile floor coverings | 399,529,544 |
| 58. | Special woven Fabrics; Tufted Textile Fabrixs; Lace; Tapestries; Trimmings; Embroidery. | 15,720,112,899 |
| 59. | Impregnated, Coated, Covered or Laminated Textile Fabrics; Textile Articles of a kind Suitable for industrial use. | 7,855,051,299 |
| 60. | Knitted or crocheted fabrics. | 51,346,096.494 |
| 61. | Articles of apparel & Clothing Accessories, Knitted or crocheted. | 5.036,950,701 |
| 62. | Articles of Apparel & Clothing Accessories, Not knitted or crocheted. | 3,798,113,191 |
| 63. | Other made up textile articles; sets; warm Clothing & worn Textile Articles; Rags. | 668,851,536 |
| 64. | Footware, Gaiters & the Like; Parts of such Articles | 909,180,551 |
| 65. | Headgear & parts thereof. | 219,647,992 |
| 66. | Umbrellas, sun umbrellas, walking –sticks, seat Sticks, whips, riding-crops & parts thereof. | 207,941,197 |
| 67. | Prepared feathers & down & articles made of Fea thers or of down; artifical flowers; articles of Human hair. | 107,954,296 |
| 68. | Articles of stone, Plaster, cement, Asbestos, Mica Or similar materials | 1,686,295,941 |
| 69. | Ceramic products | 4,388,307,112 |
| 70. | Glass and Glassware | 3,570,272,658 |
| 71. | Natural or cultured pearls, precious or semi - Precious stones, precious metals, metal clad with Precious metal and articles thereof; Imitation | 31,394,409,129 |
| 72. | Iron & steel | 36,926,717,866 |
| 73. | Articles of Iron or Steel | 19,983,510.010 |
| 74. | Copper & Articles Thereof | 10,7,44,193,541 |
| 75. | Nickle & Articles Thereof | 27,283,902 |
| 76. | Aluminium & Articles Thereof | 5,796,848,728 |
| 78. | Lead & Articles Thereof | 1,620,229,910 |
| 79. | Zinc & Articles Thereof | 980,150,662 |
| 80. | Tin & Articles Thereof | 21,890,240 |
| 81. | Other Base metals; Cermets; Articles thereof | 40,895,214 |
| 82. | Tools, Implements, cutlery, spoons & forks of base Metal; parts thereof of base metal | 2,766,321,186 |
| 83. | Miscellaneous articles of base metal | 5,317,091,910 |
| 84. | nuclear reactors, boilers, machinery & Mechanical, Appliances; parts thereof | 91,555,821,527 |

| CHAPTER | | CIF VALUE (Rs.) |
|---|---|---|
| 85. | Electrical machinery & Equipment & Parts Thereof; sound recorders & reproducers, Television image and sound recorders and reproducers, and | 82,780,924,220 |
| 86. | Railway or Tramway locomotives, rolling Stock & parts thereof railway or tramway Track fixtures and fittings and parts thereof; Mechanical | 2,350,984,815 |
| 87. | Vehicles other than Railway or Tramway rolling Stock, & parts & accessories thereof | 71,380,374,006 |
| 88. | Aircraft, spacercraft & parts thereof | 2,270,888,330 |
| 89. | Ships, Boats and Floating Structures | 308,694,085 |
| 90. | Optical, Photographic, Cinamatographic, Measuring, Checking, precision, Medical or Surgical Instruments and Apparatus; parts and Accessories | 10,755,162,753 |
| 91. | Clocks & Watches & parts Therof | 343,627,761 |
| 92. | Musical instruments; Parts & accessories of such Articles | 217,917,981 |
| 93. | Arms & Ammuniton; Parts & Accessories Thereof | 11,437,549 |
| 94. | Furniture; Beddging matteresses, Mattress , Matteress supports, cushions & Similar Stuffed Furnishings; Lamps & Lighting fitings, not elsewhere specified | 3,781,309,632 |
| 95. | Toys, Games & Sports requisites; Parts & accessories thereof | 1,198,731,763 |
| 96. | Miscellaneous Manufactured Articels | 7,023,572,380 |
| 97. | Works of art, Collectors' pieces & antiques | 5,282,695 |
| 99. | Petroleum products | 880,921,192 |
| | Grand Total | 1,260,607,019,283 |

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ඊ ළඟට ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා.

[අ.භා. 12.16]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - வர்த்தகம், சந்தைப்படுத்தல் அபிவிருத்தி, கூட்டுறவுத்துறை, நுகர்வோர் சேவைகள் அமைச்சர்)
(The Hon. Bandula Gunawardane-Minister of Trade, Marketing Development, Co-operatives and Consumer Services)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් බොහොම වැදගත් අදහසක් කිව්වා, රජය ඉතා විශාල මූල්‍ය අර්බුදයක සිටිනවාය කියා. බොහොම කාලයකට පසුව බොහොම නිවැරැදි ප්‍රකාශයක් කළා. 1989 සිට අපි මේ පාර්ලිමේන්තුව තුළදීත්, මේ පාර්ලිමේන්තුවෙන් පිටතදීත් ඉතාම දැවැන්ත ලෙස මේ මූල්‍ය අර්බුදය ගැන කියා තිබෙනවා. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මුදල් පිළිබඳ සම්පූර්ණ බලය පැවරෙන්නේ පාර්ලිමේන්තුවටයි. පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ වඩාම වැදගත් විවාදය අය වැය විවාදයයි. පාර්ලිමේන්තුවේදී අය වැය විවාදය අවස්ථාවේදී අය සහ වැය, අය වැය හිඟය, එය පියවා ගන්න ආකාරය යනාදිය පිළිබඳව සාකච්ඡා වෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ඒ විවාද වන හැම අවස්ථාවකදීම අපි කිව්වා, ව්‍යුහගත දෝෂයක් තිබෙනවා, ව්‍යුහගත ගැටලුවක් තිබෙනවා, මේ රටේ ප්‍රධාන වියදම් හතරට විතරයි රජයේ ආදායම ප්‍රමාණවත් වන්නේ කියලා. මොකද, ආණ්ඩුවක ආදායම ලබා ගන්නේ මේ රටේ මහ ජනතාවගෙන්. නිදහසින් පසුව ලංකාවේ සංඛ්‍යා දත්ත පරීක්ෂා කරලා බැලුවොත් කාගේ ආණ්ඩුවක් තිබුණත්, ඕනෑම වර්ෂයක සියයට 85ත්, සියයට 90ත් අතර ප්‍රමාණයක් ආදායම ලබා ගෙන තිබෙන්නේ භාණ්ඩ හා සේවා මත පන වන බදුවලිනුයි. එතකොට ආදායම් මට්ටම්වල වෙනසක් නොමැතිව සමස්ත ලාංකීය ජනතාව බදු ගෙවන එකෙන් තමයි ආණ්ඩුවක ප්‍රධාන ආදායම සියයට 90ක් ලබා ගන්නේ. බදු නොවන ආදායම වශයෙන් ඉතිරි සියයට 10 ලබා ගන්නේ ලාභ, ලාභාංශ, පොලිය, බදු කුලිය යනාදියෙනුයි. එතකොට මේ ලබා ගන්නා ආදායම අයිති වන්නේ මහින්ද රාජපක්ෂ රජයටය, එහෙම නැත්නම් ඊට කලින් තිබුණු එක්සත් ජාතික පක්ෂ රජයටය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයටය කියා හිතනවා නම් වැරැදියි. ඒ නිසා තමයි මහ ජනයාගේ මුදල් පිළිබඳ වගකීම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ අපි සියලු දෙනාට -මේ උත්තරීතර සභාවට- භාර දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය වර්ෂ කිහිපය පුරාම ලංකාවේ අය වැයේ තිබෙන පොදු ලක්ෂණයක් තමයි, රාජ්‍ය අය වැයේ ජංගම ගිණුමේ -වර්තන ගිණුමේ- හිඟයක් තිබීම. වර්තන ගිණුමේ හිඟයක් ඇති වන්නේ ඇයි? ප්‍රධාන වියදම් වර්ග හතරක් තිබෙනවා. ඕනෑම ආණ්ඩුවක් විසින් ඒ ආණ්ඩුව එදිනෙදා පවත්වා ගෙන යෑමේ කටයුතුවලදී දරනු ලබන වියදමේ ප්‍රතිඵලය වියදම දරන කාලයට පමණක් සීමා වන, නැවත නැවතත් දැරිය යුතු ස්වරූපයේ පුනරාවර්තන වියදම් හතරක් තිබෙනවා. එකක් තමයි, අපි තමුන්නාන්සේලා වෙන් කරන මුදලින් වැඩිම පිරිවැයක් දරන රාජ්‍ය අංශයේ සේවකයන්ට ගෙවන වැටුප. රාජ්‍ය සේවක වැටුප් සඳහා ගිය වර්ෂයේ වැය කළ මුදල රුපියල් බිලියන 233යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 23,300 තමයි ලංකා ආණ්ඩුවේ තිබෙන ලොකුම බිල. පොඩි පොඩි සිද්ධි ගැන කථා කරනවා. රාජ්‍ය සේවකයෝ දොළොස්ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් බිල තමයි ප්‍රධානම බිල. දෙ වනුව මේ රටට වැඩ කරලා විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ ඉන්නවා. ඔවුන්ගේ විශ්‍රාම වැටුප සඳහා පසු ගිය වර්ෂයේ රුපියල් බිලියන 73ක් -රුපියල් කෝටි 7,300ක්- වැය කළා. මේ දෙකේ ඓක්‍යය -එකතුව- ගත්තොත් රුපියල් බිලියන 306යි. සෙස් බද්ද, වැට් එක හා අනික් සියලුම බදු වර්ගවලින් ආදායම ලබා ගෙන, බදු නොවන ආදායමත් ලබා ගෙන 2008 වර්ෂයේ සාමාන්‍යයෙන් රජයට ලබා ගන්න පුළුවන් වුණේ රුපියල් බිලියන 600යි. මේ පාර්ලිමේන්තුව මහ ජනතාවට බදු පනවා ලබා ගන්නා ආදායම රුපියල් කෝටි 60,000ක් විතර වෙනවා. බදු නොවන මාර්ගවලින් ලැබෙන ආදායමත් එකතු වුණාම රුපියල් බිලියන 600ක්, 700ක් අතර ප්‍රමාණයක් තමයි ආදායම වශයෙන් ලැබෙන්නේ. එයින් හරියට භාගයක් -රුපියල් බිලියන 306ක්- රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ විශ්‍රාම වැටුප් වෙනුවෙන් වැය වෙනවා. විශ්‍රාමිකයෝ ලක්ෂ හතරහමාරක් හා රාජ්‍ය සේවකයෝ ලක්ෂ දොළහක් ඉන්නවා. ජනගහනයෙන් ලක්ෂ 14කට, ලක්ෂ 15කට මේ ආදායම් කොටස දෙනවා. මේ බර දරන්නේ කවුද? දේශපාලන දෘෂ්ටියකින් බැලුවාම හිතෙනවා, මේ බර දරන්නේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවයි කියලා. ඒකයි තිබෙන ප්‍රශ්නය. මේ සියලුම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි වීමේ හැම ශතයක්ම ගෙවනු ලබන්නේ, මේ රටේ ජනතාව විසිනුයි. ජනතාවගේ මුදල් ටික නේ මේ හසුරු වන්නේ.

එතකොට දෙ වන එක තමයි, අපේ වියදමට සරිලන ආදායමක් නැති එක. නිදහසින් පසුව පැවැති සෑම ආණ්ඩුවකින්ම ඉදිරිපත් කළ සෑම අය වැයකම පරතරයක් තිබෙනවා. කාගේ ආණ්ඩුවක් තිබුණත්, කවදා හරි දවසක, මතු යම් දවසක, වසර 3000 දී හෝ ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක් ආවත් මේ අය වැය පරතරය පියවා ගන්න දේශීය වෙළෙඳ පොළෙන් හා විදේශීය මූලයන්ගෙන් ණය ගන්නම ඕනෑ. පරම ඇත්ත ඒක නේ. එතකොට ඒ ණය ගැනීම හැම දාම සිද්ධ වුණාම ඒ ණයවලට වර්තන වියදමක් ලෙස පොලී ගෙවන්න ඕනෑ. මම මේ ණය පිළිබඳව ඉතාම වග කීමෙන් කියන්න ඕනෑ. මේ රටට නිදහස ලැබෙන කොට, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයෙන් පස්සේ විශාල ණය බරක් අපේ රටට තිබුණේ නැහැ. ණය නැති රටක් විධියටයි තිබුණේ. ඊට පස්සේ ජේ.ආර්. ජයවර්ධන මුදල් ඇමතිතුමා, ලංකාවේ පළමු වැනි මුදල් අමාත්‍යවරයා ලෙස 1950 දී ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටෙව්වා. ඊට කලින් ලංකාවේ මුදල් මණ්ඩලය සමඟ තමයි මුදල් ක්‍රමය තීන්දු වුණේ. ණය තිබුණේ රුපියල් මිලියන 654යි. ඊට දශකයකට පස්සේ 1960 දී ඒ ණය ප්‍රමාණය රුපියල් බිලියන 2.2ක් වුණා. 1970 දී රුපියල් බිලියන 8.6ක් වුණා. ඒක පොඩි ගණනක්. රුපියල් බිලියන 8.6ක වගේ ණය

තිබුණා 1970 වන තෙක්. එතකොට 1970ට කලින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු ඇමතිතුමන්ලාට, මුදල් ඇමතිතුමාට බොහොම පොඩි ගනුදෙනුවක් තමයි හසුරු වන්න තිබුණේ. තවමත් 1960-70 මානසිකත්වයේ ඉඳලා 2000 වර්ෂයට මුහුණ දෙනවා නම් තමයි ප්‍රශ්නය ව්‍යාකූල වන්නේ. 1977න් පස්සේ විවෘත වෙළෙඳ පොළ ආර්ථිකය ක්‍රියාත්මක වුණා. 1980 දී විදේශ ණය ප්‍රමාණය සියයට 51.3ක් දක්වා වැඩි වුණා. ඊට දශකයකට පසුව 1990 දී රුපියල් බිලියන 310 දක්වා වැඩි වුණා. 1980 සිට 1990 දක්වා මේ ණය ප්‍රමාණය වැඩි වීම වාර්තාවක් තබා තිබෙනවා. සියයට 507කින් ලංකා ආණ්ඩුවේ රාජ්‍ය ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ වැඩිම උද්ධමන අනුපාතය සියයට 26 වාර්තා කර තිබෙන්නේ 1980 දීයි. ඊට පස්සේ වැඩිම වාර්ෂික උද්ධමනය සියයට 21 වාර්තා වී තිබෙන්නේ 1990 දීයි. 1980 සිට 1990 කියන කාල පරිච්ඡේදයේ සියයට 507කින් ණය වැඩි වෙලා තිබෙනවා. ඊට පස්සේ 1990 සිට 2000 වන විට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 1,218ක් දක්වා වැඩි වුණා. ඒ ණය වැඩි වීමේ වේගය සියයට 507 නොවෙයි, සියයට 292යි. අය වැය පරතරය පියවන්න හැම ආණ්ඩුවකින්ම ණය අර ගෙන තිබෙනවා. හැබැයි වැඩි වෙලා තිබෙන්නේ සියයට 292කිනුයි. 2000 සිට 2007 වන විට දේශීය සැපයුම්කරුවන්ට හා විදේශීය හිමිකරුවන්ට ගෙවිය යුතු මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 3,070යි. ඒ කියන්නේ 2000 සිට 2007 වන විට සියයට 152කින් වැඩි වෙලා තිබෙනවා. එතකොට නිදහසින් පසු සෑම අවුරුද්දකම මේ පාර්ලිමේන්තුවේ ක්‍රියාවලිය තුළ රට ණය වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ අපි මොනවා හරි දුන්නාම - වැටුප් වැඩි කළාම, විශ්‍රාම වැටුප් වැඩි කළාම, ශුභසාධන වියදම් වැඩි කළාම, සහනාධාර වැඩි කළාම, පොහොර සහනාධාරය දුන්නාම- රජයේ වියදම වැඩි වෙනවා. වියදම වැඩි වෙන කොට ආදායම් වැඩි වන්නේ නැත්නම් අය වැයේ පරතරය වැඩි වෙනවා. අපි උදාහරණයක් හැටියට ගෙදරක් ගත්තත් එහෙමයි. ඉතාම කුඩා සමාජ ඒකකය තමයි, පාරිභෝජන කටයුතු සඳහා සංවිධානය වුණු කුටුම්භය. කුටුම්භයක ආදායම රුපියල් 20,000ක් නම්, වියදම රුපියල් 30,000ක් නම් එතැන පරතරයක් ඇති වෙනවා. ඒක පියවන්න එක්කෝ ණය ගන්නවා. නැත්නම් දේපොළ විකුණනවා. වෙනත් විකල්පයක් නැහැ. ණය ආධාර, දේපොළ විකිණීම කියන දෙකෙන් තමයි කුටුම්භයක් නැත්නම් පවුලක් ඒකට මුහුණ දෙන්නේ. සමාගමක් ගත්තත් එහෙමයි. සමාගමක් ගත්තාම ඕනෑම සීමාසහිත සමාගමක්, සමාගම් පනත අනුව ගණන් හදලා ගිණුම් නිසි ලෙස ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ සමාගමේ ආදායමට වඩා වියදම වැඩි නම් ණය ගන්නවා. ණය ගත්තාම ඒ ණයට පොලිය ගෙවන්න ඕනෑ. පොලිය ගෙවන්න බැරි නම් ඒ සඳහා තව ණය ගන්න ඕනෑ. ඒක ගෙවන්න බැරි වුණොත් ඒ සමාගම බංකොලොත් -bankrupt- වෙනවා. ඒ අනුව අපට ණය පොලිය ඇති වෙලා තිබෙනවා. 2008 වර්ෂයේදී පොලී ගෙවන්න රුපියල් බිලියන 209ක් ගිහිල්ලා තිබෙනවා. සහනාධාර හා වර්තන පැවරුම් සඳහා රුපියල් බිලියන 121ක් ගිහිල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ අපි වග කීමට බැඳෙන මහජනතාවගේ ආදායම රුපියල් බිලියන 600යි. ඒ 600න් 233ක් වැටුප් ගෙවලා, 73ක් විශ්‍රාම වැටුප් ගෙවලා, 209ක් පොලිය ගෙවලා, සහනාධාර හා වර්තන පැවරුම්වලට 121ක් දුන්නාම, එකතුව 636යි. එතකොට ආදායම 600යි, වියදම 636යි කිව්වාම, වර්තන ගිණුමේ, පවත්වා ගෙන යන ගිණුමේ, ජංගම ගිණුමේ-current account එකේ- රුපියල් බිලියන 36ක හිඟයක් තිබෙනවා. රජයේ සතයක්වත් ඉතුරු නැහැ. මේකට කියන්නේ රාජ්‍ය අංශයේ නිර්ඉතුරුම් කියලායි. ඉතුරු නැති වුණාම ප්‍රාග්ධන වියදම් දරන්න ඕනෑ. නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදෙනවා. ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය හැදෙනවා. හම්බන්තොට වරාය ඉදි වනවා. සුපිරි අධිවේගී මාර්ගයක් ඉදි වනවා. ගුවන් පාලම් ඇති වනවා. "ගම නැඟුම" වැඩසටහන යටතේ ගම්වල පාරවල් කොන්ක්‍රීට් කරනවා. "මඟ නැඟුම" වැඩ පිළිවෙළ තිබෙනවා. මේවා ප්‍රාග්ධන වියදම්. මේ ප්‍රාග්ධන වියදම් ටික දරන්න සෑම ආණ්ඩුවක් විසින්ම දේශීය වෙළෙඳ පොළෙන් හෝ විදේශීය වෙළෙඳ පොළෙන් අනිවාර්යයෙන්ම විශාල ණය ප්‍රමාණයක් ගන්න ඕනෑ. කොටසක් තිබෙනවා අපට -රජයට- මේ පාර්ලිමේන්තුව විසින් අනුමත කර දී තිබෙන සීමාව තුළ උද්ධමනාත්මක නොවන මූලවලින් ගන්න පුළුවන්. ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ගත්තොත් -



**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමනි, මඳක් නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු මහින්ද විජේසේකර මහතා (විශේෂ ව්‍යාපෘති අමාත්‍යතුමා සහ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த விஜேசேகர - விசேட கருத்திட்டங்கள் அமைச்சரும் தபால், தொலைத்தொடர்புகள் அமைச்சரும்)
(The Hon. Mahinda Wijesekara - Minister of Special Projects and Minister of Posts and Telecommunication)

"ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේ දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේ මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வண.)உடவத்தே நந்த தேரர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, දැන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය ගත්තොත් උද්ධමනය නැහැ. සල්ලි තිබෙන තැනින් මාරු වෙනවා විතරයි. පරිපාලන ණය ගත්තොත් උද්ධමනය නැහැ. මහ බැංකුවෙන්, වාණිජ බැංකුවලින් ණය ගත්තාම, මහ බැංකුව අලුතෙන් ව්‍යවහාරයට මුදල් එකතු කරනවා. වාණිජ බැංකු මුදල් මවලා ණයට දෙනවා. එතකොට අලුත් මුදල් සැපයුමක් ඇති වුණාම බඩු මිල වැඩි වනවා. ඒ ණය බර පාලනය කිරීම සඳහා 2003 දී මේ පාර්ලිමේන්තුවට පනතක් ගෙනාවා. ඒ පනත තමයි මූල්‍ය කළමනාකරණ වගකීම් පනත. රටට ඔරොත්තු දෙන ප්‍රමාණයට ණය බර හැසිර වීමේ බලය මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුවට මෙන්ම විපක්ෂයටත් පැවරී තිබෙනවා. ලංකා ඉතිහාසයේ වැඩිම ණය බර තිබෙන්නේ 1989 දීයි. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය 108.7යි. ඒ කියන්නේ ජාතියේ නිෂ්පාදනය 100යි නම් 108ක් ණයයි. ඊට පසුව 2001 දී ණය බර 103.2යි. 2003 දී ණය බර 105.8යි. ඒ කියන්නේ නිෂ්පාදනය 100ක් නම් අප ලෝකයටයි, දේශීය වශයෙනුයි 105ක් ණයයි. මේ තත්ත්වය වෙනස් කරන්න තමයි 2003 දී මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ගෙනාවේ. ඒ පනතේ මූලික ඉලක්කය වුණේ 2013 දී මේ ණය ප්‍රමාණය සියයට 60ට ගෙන එන්න ලංකාවේ පාර්ලිමේන්තුවේ මූල්‍ය කළමනාකරණය කිරීමයි. ඒ ක්‍රියාවලිය වෙතට දැන් ගමන් කර තිබෙනවා. 2007 දී රාජ්‍ය ණය බර සියයට 85.8යි. ඒ කියන්නේ දේශීය නිෂ්පාදනය 100යි නම් ණය 85යි. මේක ප්‍රමාණවත් නැහැ. මේක සියයට 60ට ගෙන එන්න ඕනෑ. ඒක ගෙන එන්නට හැකි වන්නේ 2013 දීයි. ඒ සැලැස්මට අනුව තමයි කාගේ ආණ්ඩුව තිබුණත් ණය පරිපාලනය කෙරෙන්නේ. ඒ නිසා ණය චෝදනාව සාධාරණ චෝදනාවක් නොවෙයි. මූල්‍ය අර්බුදය ඇත්තක්.

නිදහසින් පසුව 2007-2008 වර්ෂවලදී ලංකා ඉතිහාසයේ කිසිම රජයක් මුහුණ නොදුන්න ප්‍රධාන අභියෝග හතරකට මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට මුහුණ දෙන්න සිද්ධ වුණා. එකක් තමයි,

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මනුෂ්‍යයා විසින් තෙල් පරිභෝජනය සොයා ගත් දවසේ සිට බැලුවොත් වැඩිම ඛනිජ තෙල් මිල වාර්තා වීම. 2003 දී තෙල් බැරල් එකක් ඇමෙරිකානු ඩොලර් මිලියන 29යි. ඒක මේ අවුරුද්දේ ජූලි මාසය වන විට 146ට වැඩි වුණා. ඇමෙරිකානු ඩොලර් 29 කියන්නේ 30යි කියා හිතුවොත්, 30ට තව 30ක් එකතු කළාම 60යි, 60ට තව 30ක් එකතු වුණාම 90යි, 90ට තව 30ක් එකතු වුණාම 120යි, ඒකට තව 30ක් එකතු වුණාම 150යි. මේ ප්‍රමාණයට දැවැන්ත ලෙස ඛනිජ තෙල් මිල ඉහළ ගිහින් ලංකාවේ වැටුප් බිලට සමාන බිලක් ගෙවන්න සිදු වුණා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, 2003 දී අපට තෙල් ගෙන්වන්න ගියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 838යි. 2007 දී ගියා ඇමෙරිකානු ඩොලර් මිලියන 2,497ක්. 2003 දී ගියා වාගේ තුන් ගුණයක් සල්ලි 2007 දී රටින් පිටට යන විට මේ ගරු සභාවට තිබුණා ජාතික වග කීමක් ලෙස සලකලා ජාතියක් විධියට පාර්ලිමේන්තුව තුළ මේ ගැන වෙනම විසඳුමක් හොයන්න. එදා -2003 දී- තේ, රබර්, පොල් අපනයන ආදායම ඩොලර් මිලියන 985යි. ඛනිජ තෙල් ආනයන වියදම ඩොලර් මිලියන 838යි. තේ, රබර්, පොල් පිට රට පැටෙව්වාට පසුව අපට ඉතිරි වුණා 147ක්. 2008 දී ලෝකයේ තේ, රබර්, පොල් මිල විශාල ලෙස වැඩි වුණා. ආදායම ඩොලර් මිලියන 1,275ට වැඩි වුණා. තෙල් බිල ඩොලර් මිලියන 2,497යි. තේ, රබර්, පොල්වලින් ආදායම ලැබුණාට පසුව අපට තව මදියි විදේශ විනිමය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,222ක්. ඩොලර් බිලියනයකට වඩා වැඩියෙන් අපට -ලංකාව වාගේ රටකට- ගෙවන්න වන විට ඒක ගැන මේ ගරු සභාවට උත්තරයක් හොයන්න තිබුණා. 1:3ක් විදේශ විනිමය රටින් යන කොට ඒ රටට ඒක ඔරොත්තු දෙන්නේ කොහොමද? ඒක ලංකාවේ ඉස්සෙල්ලා තිබුණු අර්බුදයක් නොවෙයි. 1973 දී තෙල් අර්බුදයක් තිබුණා. ඊට පස්සේ කිසිම ආණ්ඩුවක් තෙල් අර්බුදයට මුහුණ දුන්නේ නැහැ. මේ අර්බුදයට මුහුණ දුන්නේ 2007 දී 2008 දී විතරයි. ලෝකයේ තිරිඟු පිටි, සෝයා බෝංචි, පරිප්පු, මස්, මාළු, කිරි, බිත්තර මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගියා. එම නිසා ඉන්දියාව භාණ්ඩ අපනයනය -පිට රට පැටවීම- තහනම් කළා. චීනය භාණ්ඩ අපනයනය තහනම් කළා. මේ රටට ප්‍රමාණවත් නොවුණ දේ ලෝකයේ කොහෙන්වත් සොයා ගන්න නැති වුණා. එහෙම තත්ත්වයක් තිබුණේ.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ආණ්ඩුව කරද්දී - 1970-1977 කාලයේ දී - ආහාර ප්‍රශ්නයක් ඇති වුණා. එතකොට ආනයන සලාක තිබුණා; විනිමය සලාක තිබුණා. ආනයන බලපත්‍ර තිබුණා. හාල් පොලු, මිරිස් පොලු දමා ඒ අර්බුදයට මුහුණ දෙන්න උත්සාහ කළා. එදායින් පස්සේ ලෝකයේ ඇති වුණු වැඩිම ආහාර මිල පිළිබඳ අර්බුදයට මුහුණ දුන්නා.

තුන් වෙනුව, ත්‍රස්තවාදී ප්‍රශ්නය. අපට විතරයි මරා ගෙන මැරෙන බෝම්බකරුවෝ සිටියේ. පාකිස්තානයට වෙන්න පුළුවන් -බෙනාසීර් භූතෝට වෙන්න පුළුවන්-; එහෙම නැත්නම් ඉන්දියාවට වෙන්න පුළුවන්; එහෙම නැත්නම් ලෝකයේ බටහිර රටකට වෙන්න පුළුවන්; ඒ සෑම රටකම වාගේ අද ත්‍රස්තවාදය උච්චතම අවස්ථාවට පත් වෙලා තිබෙනවා.

හතර වෙනුව, සුනාමියෙන් පස්සේ ලෝකයේ ස්වාභාවික ව්‍යසනයන් අසාමාන්‍ය ලෙස වැඩි වුණා.

මම මේ ගරු සභාවට කියනවා, මේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව හැර මේ හතරට එක වර මුහුණ දුන්න ආණ්ඩුවක් අපේ රටේ ඉතිහාසයේ තිබෙනවා නම් පුළුවන් නම් හොයලා කියන්නය කියලා. ඛනිජ තෙල් අර්බුදය, ආහාර පිළිබඳ අර්බුදය, ස්වාභාවික ව්‍යසනයන් පිළිබඳ අර්බුදය, ත්‍රස්තවාදය උච්චතම අවස්ථාවට පත් වීම කියන අර්බුද හතරට එක වර මුහුණ දුන්නා. ඒ අර්බුදය ජූලි මාසයෙන් පස්සේ අනික් පැත්තට ගමන් කරලා තෙල් මිල පහත වැටෙන විට -ආහාර මිල පහත වැටෙන්න පටන් ගන්න විට- ලෝකයේ දැවැන්තම ආර්ථිකය තිබෙන ඇමෙරිකා එක්සත් ජනපදයත්, එක්සත් රාජධානියත්, ලෝකයේ අනික් රටවලුත් මේ මූල්‍ය අර්බුදය යටතේ කඩා ගෙන වැටෙන්න පටන් ගත්තා. එතකොට ඇමෙරිකා එක්සත් ජනපදයේ දැවැන්ත පරිමාණයේ -අපේ ලංකාවේ ආණ්ඩුව වාගේ කිහිප ගුණයක් තිබෙන- Lehman Brothers වාගේ ආයතන බංකොලොත් වුණා. ඊට පසු අවුරුදු 120ක් පරණ Washington Mutual වාගේ බැංකුවක් බේරා ගන්න රජයට මැදිහත් වන්න සිද්ධ වුණා. ලෝකයේ මූල්‍ය ආයතන, රක්ෂණ ආයතන, මුදල් තැරැව්කාර සමාගම් මේ සියල්ලම ඛනිජ තෙල් අර්බුදයෙන්, ආහාර අර්බුදයෙන් පසු මූල්‍ය අර්බුදයකට මුහුණ දුන්නා. Bretton Woods සම්මේලනයෙන් පස්සේ මේ වාගේම ලෝකය කඩා වැටී තිබෙනවා. එතකොට නිවුන් සහෝදරයෝ දෙදෙනෙක් ලෝකයට බිහි වුණා. එනම් ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. රටවල් අතර ගෙවීම් පියවා ගන්න ක්‍රමයක් නැති වුණා. සල්ලිවල වටිනාකම බින්දුවට බැස්සා. රටවල් අතර ගනු දෙනු පියවන්න අලුත් ද්‍රවශීලතා ජාත්‍යන්තර වත්කමක් බිහි කළා, විශේෂ හර ගැනුම් අයිතිවාසිකම් -SDRs - Special Drawing Rights- කියලා. එහෙම අලුත් මුදල් ක්‍රමයක් නිර්මාණය කරන්න පුළුවන් වුණා. අද ලෝක දැවැන්ත අර්බුදයක් තිබෙන විට කෙනෙක් අහනවා, මහ බැංකුව, LC විවෘත කරන විට සියයට 100ක මුදල තැන්පත් කරන්න නියම කළේ ඇයි කියලා. විදේශ විනිමය වෙළෙඳ පොළේ විනිමය ලැබීම් හා ගෙවීම් පිළිබඳව මහ බැංකුව මැදිහත් වෙලා එවැනි පාලනයක් කළේ නැත්නම් ලෝකයේ දැවැන්ත ව්‍යසනයක් සිද්ධ වන විට ලංකාව වාගේ පුංචි වෙළෙඳ පොළවල් තිබෙන රටවලට ඒකට ඔරොත්තු දෙන්න බැහැ, මූලාසනාරූඪ ගෞරවණීය ස්වාමීන් වහන්ස. ඒකයි, ප්‍රායෝගික යථාර්ථවාදී ඇත්ත. අපි කථාවක් අසා තිබෙනවා, අලි dance කරන විට තණ කොළ පොඩි වෙලා කුඩු පට්ටම් වෙලා යනවාය කියා. ඒ වාගේ ලොකු රටවල් අතර දැවැන්ත අර්බුදයක් ඇති වුණාම පුංචි අපිට ඒක ඔරොත්තු දෙන්නේ නැති ව්‍යසනයක් බවට පත් වෙනවා. ඒ වාගේ අර්බුදයක් යටතේ අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන විට ඒකට මේ ඇති වී තිබෙන ජාත්‍යන්තර අහිතකර තත්ත්වය බලපානවා.

බොර තෙල් බැරල් එකක මිල 2003 සිට 2008 දක්වා සියයට 368කින් වැඩි වෙලා තිබෙනවා. එල්පී ගෑස් මිල සියයට 159කින් වැඩි වෙලා තිබෙනවා. යූරියා පොහොර මිල සියයට 450කින් වැඩි වෙලා තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ කිරි පිටි මිල සියයට 128කින් වැඩි වෙලා තිබෙනවා. තිරිඟු පිටි මිල සියයට 278කින් වැඩි වෙලා තිබෙනවා. ලෝක වෙළඳ පොළේ සහල් මිල සියයට 462කින් වැඩි වෙලා තිබෙනවා. රතු පරිප්පු මිල සියයට 577කින් වැඩි වෙලා තිබෙනවා. මට ලැබී තිබෙන සීමිත කාල වේලාව නිසාත්, මේ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු වීම අත්‍යවශ්‍ය වන නිසාත් මම මේ පිළිබඳ ඇත්ත ප්‍රස්ථාර සටහන් කිහිපයක් සහ සංඛ්‍යා දත්ත කිහිපයක් හැන්සාඩ් වාර්තාවේ මුද්‍රණය කිරීම සඳහා **සභාගත*** කරනවා. මූලාසනයේ අනුමැතිය ඇතිව මීට පෙරත් එවැනි සටහන් මා හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා සභාගත කර තිබෙනවා.

ඊළඟට ඒ අතර දේශීය ආර්ථිකය තුළ විශාල වෙනසක් ඇති වුණා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේදී උද්ධමනය පාලනය කර ගැනීම සඳහා අනුගමනය කරපු ආර්ථික ක්‍රමවේදයක් තිබුණා. එම ආර්ථික ක්‍රමවේදය තමයි වියදම් හැකිතාක් දුරට කපා හැරීම තුළින් රජයේ වියදම අඩු කරලා, අය වැය පරතරය අඩු කරලා ඒ තුළින් මිල මට්ටම ඉහළ යාම වළක්වා ගැනීම. ඒක එක ආර්ථික ක්‍රමවේදයක්. ඒ සඳහා පළාත් පාලන ආයතන ඇතුළු රාජ්‍ය අංශයේ සියලුම බඳවා ගැනීම් සම්පූර්ණයෙන් නතර කළා. වර්ෂ දෙකටම වැටුප් වැඩි කළේ රුපියල් 1,250කින් පමණයි. ඒ, වැටුප් බිල අඩු කර ගැනීම සඳහායි. රාජ්‍ය ආරක්ෂක වියදම සටන් විරාම ගිවිසුම යටතේ අඩු කළා. සමෘද්ධිය ඇතුළු සහනාධාර වඩාත් විධිමත් කොට අඩු කිරීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනතක් පාර්ලිමේන්තුව සම්මත කළා. පොහොර සහනාධාරය සඳහා රුපියල් බිලියන 2යි වියදම් කළේ. පොහොර මිටියක් රුපියල් 850කට ලබා දුන්නා. ඒ වියදම් සීමා කිරීම සඳහායි.

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

ඒ අර්බුදයට මුහුණ දෙන්න, වියදම් කපන්න, සැලසුම් සකස් කර තිබුණු ආකාරය පිළිබඳව මා එක කරුණක් මේ ගරු සභාවට පැහැදිලි කරන්න කැමැතියි. රාජ්‍ය අංශයේ ශ්‍රමික සංඛ්‍යාව පිළිබඳව, 2001 වර්ෂයට සාපේක්ෂව 2003 වර්ෂය වන කොට රජයේ සේවක සංඛ්‍යාවෙන් 1,21,000ක් අඩු කරනු ලැබුවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම සඳහා මා ඉලක්කම්වලින්ම සඳහන් කරන්නම්. 2001 දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 11,64,990යි. 2003 දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය දසලක්ෂ 43,208යි. එතකොට 2003 වන විට රාජ්‍ය අංශයේ රක්ෂා ලබා දීම අඩු කළා; 1,21,782කින් අඩු කළා. එතකොට ලංකාවේ වැටුප් බිල රුපියල් බිලියන 91යි; රුපියල් කෝටි 9,100යි.

ඊට පසුව 2004 අය වැය ලේඛනයෙන් මේ විධියට බොහොම පැහැදිලිව ඉදිරිපත් කළා. 2004 අය වැය ලේඛනයේ 34 වෙනි පිටුව කෙරෙහි මා ඔබ වහන්සේගේ අවධානය යොමු කරවනවා, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. "අපගේ ඉලක්කය වන්නේ රාජ්‍ය අංශයේ මධ්‍යම හා පහළ ආදායම් ශ්‍රේණිවල සේවකයන් අතරින් ලක්ෂයක් 2004 වන විටද, තවත් දෙලක්ෂයක් 2006 වන විටද අඩු කිරීමය. මේ හේතු කොට ගෙන රජයට අනේක විධ වක්‍ර ඉතිරි කිරීම් අත් වනු ඇත." ඇත්ත නේ. රාජ්‍ය අංශයෙන් ලක්ෂ තුනක් අඩු කළාම, 2006 වන කොට 1,21,000ක් අඩු වුණාම, 2006 දී රාජ්‍ය අංශයේ සේවකයන් සිටින්නේ ලක්ෂ 6යි. එතකොට ඒකේ එක කළමනාකරණ ක්‍රමවේදයක් ලංකාවේ ආණ්ඩුවේ වැටුප් බිල රුපියල් බිලියන 100ට වඩා අඩුවෙන් තබා ගැනීම. ඒ සඳහා තමයි එම සැලැස්ම සකස් කර තිබුණේ. නමුත් වර්තමාන රජයේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඊට සම්පූර්ණයෙන් වෙනස් ප්‍රතිපත්තියක් තමයි අනුගමනය කර තිබෙන්නේ. සියලු පුරප්පාඩු පුරවන්නට ඕනෑ, රාජ්‍ය අංශය පුළුල් කරන්නට ඕනෑ, රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව වැඩි කරලා පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය, සමුපකාර අංශය කියලා අංශ 3ක් රටේ තිබෙන්නට ඕනෑය කියලා එම විකල්පයට මාරු වීමෙන් 2003 දී රුපියල් බිලියන 91ක්ව තිබුණු රාජ්‍ය අංශයේ සේවක වැටුප් බිල 2007 දී රුපියල් බිලියන 214ක් වෙලා තිබෙනවා. වැඩි වීම සියයට 138යි. 2003 දී විශ්‍රාම වැටුප් බිල රුපියල් බිලියන 32යි; 2007 දී 68යි. වැඩි වීම සියයට 112යි. රාජ්‍ය ආරක්ෂක වියදම 2003 දී තිබුණේ රුපියල් බිලියන 47යි. 2007 දී එය 117ට වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 148කින් වැඩි වෙලා තිබෙනවා. පොහොර සහනාධාරය සඳහා එදා වැය වෙලා තිබුණේ රුපියල් බිලියන 2යි. ඊට පසුව 2007 දී රුපියල් බිලියන 11යි. එය සියයට 450කින් වැඩි වෙලා තිබෙනවා. රාජ්‍ය ණය මත පොලී ගෙවීම් එදා තිබුණේ රුපියල් බිලියන 125යි; 2007 දී රුපියල් බිලියන 182යි. එය සියයට 45කින් වැඩි වෙලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම් 2003 දී රුපියල් බිලියන 75යි. එය බිලියන 206ක් වෙලා තිබෙනවා. ඒ අනුව සියයට 174කින් වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මා ඔබවහන්සේගේ කාරුණික අනුග්‍රහය යටතේ මේ පාර්ලිමේන්තුව විසින් දැන ගත යුතු, මේ පාර්ලිමේන්තුව විසින් අධ්‍යයනය කළ යුතු, මේ පාර්ලිමේන්තුව විසින් ගැඹුරින් විශ්ලේෂණය කළ යුතු රාජ්‍ය වියදම් වැඩි වීම පිළිබඳව වූ ප්‍රස්ථාර කිහිපයක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලමින් මා මේ අවස්ථාවේ දී **සභාගත*** කරනවා.

මේ අර්බුදය මෙලෙසින් හට ගැනීම නිසා විශාල උද්ධමන අනුපාතයක් ඇති වුණා. නමුත් පෙන්වන්න හදනවා, මේක මේ ලෝකයේ වෙන කොහේවත් සිදු වුණේ නැහැයි කියලා. ඒක වැරැදියි. මොකද හේතුව? 2007 සැප්තැම්බර් මාසයේ දී වෙනිසියුලාවේ උද්ධමන අනුපාතය සියයට 36.0යි. අපේ අසල්වැසි ආසියාතික රටක් වන පාකිස්තානයේ උද්ධමන අනුපාතය සියයට 23.9යි. ඊජිප්තුවේ උද්ධමන අනුපාතය සියයට 21.5යි. හැබැයි ඇමෙරිකා එක්සත් ජනපදයේ උද්ධමන අනුපාතය සියයට 4.8යි. ඒත් ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ ඒක 2.3යි. ජපානයේ මේ අවුරුද්දේ සියයට 2ත් 3ත් අතර උද්ධමන අනුපාතයක් තමයි තිබෙන්නේ. ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ සෘණ උද්ධමන අනුපාතයක් තමයි තිබුණේ. මුළු ලෝකයේම උද්ධමන අනුපාතය මේ ආකාරයෙන් වැඩි වන තත්ත්වයක් තුළ තමයි ලක්ෂ්‍යාමය පදනම යටතේ - point-to-point inflation - මාසික උද්ධමනය සියයට විස්සේ මට්ටමට පහළට ගෙනැල්ලා තිබෙන්නේ. අනිවාර්යයෙන්ම මේ අවුරුද්දේ බඩු මිල වැඩි වෙනවාය, අය වැය යෝජනාවලටය අඩු කළේ කියා තමුන්නාන්සේලා කියනවා. මේක සම්පූර්ණයෙන්ම ජනතාව නොමඟ යවනසුලු ප්‍රකාශයක්. මොකද, මේ අය වැය ලේඛනය සකස් කර තිබෙන්නේ බඩු මිල වැඩි වීම වෙනුවට බඩු මිල වැඩි වීමේ වේගය අඩු කරන දිසාවටයි.

* කථාව අවසානයේ පළ කර ඇත.
உரையினிறுதியில் தரப்பட்டுள்ளது.
*Produced at end of speech.*

අය වැය ලේඛනය ගැන කතා කරන්නට ප්‍රථමයෙන්, ප්‍රධාන වශයෙන්ම නිෂ්පාදන වියදමට බලපාන, ගෘහස්ථ පරිභෝජනය සඳහා යොදා ගන්නා ගෑස් ගැන - ගෑස් මිල ගැන - කථා කරන විට මම මේ ගරු සභාවට පැහැදිලි කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ගෑස් සඳහා මිල සූත්‍රයක් තිබුණා. එය තීරණය කර තිබුණේ ශ්‍රේෂ්ඨාධිකරණය විසිනුයි. අපේ පාලනයෙන් තොර හේතුවක් නිසා තෙල් මිල අඩු කරන එකේ වටිනාකමක් නැහැ කියා එහි කියා තිබෙනවා. ඒකම තමයි අපි කිව්වේ මේක රජයේ පාලනයෙන් තොරවයි වැඩි වන්නේ මේකට රජයට කරන්න දෙයක් නැහැ කියලා. තෙල් මිල එහෙම වැඩි වුණා වාගේම දැන් ලෝකයේ ගෑස් මිල අඩු වෙන්නට පටන් අර ගෙන තිබෙනවා. එහෙම අඩු වන කොට අඩු වීමේ වාසිය සම්පූර්ණයෙන් දෙනවා. වර්ෂයකට මාස දෙකෙන් දෙකට හය වතාවක් ගෑස් මිල ඉහළට හෝ පහළට යනවා; වෙනස් වනවා. මේ සූත්‍රය පුරුදු වන තෙක් ආණ්ඩුව ඕනෑ නැහැ. ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල අඩු වුණාම අපි ඒ වාසිය සම්පූර්ණයෙන් පාරිභෝගිකයාට දෙනවා. මේ වර අය වැය ලේඛනයට කලින් නොවැම්බර් මාසයේ 1 වැනි දා ලාෆ් ගෑස් සිලින්ඩරයක මිල ඉතිහාසයේ පළමු වන වතාවට රුපියල් 180කින් අඩු කළා. ෂෙල් ගෑස් සමාගම රුපියල් 56කින් මිල වැඩි කරන්න ඉල්ලද්දී අපි රුපියල් 78කින් ඒක අඩු කළා. මාසිකව ඒ වියදම අඩු වීම ගැන මේ ගරු සභාවේදී කිසිම සාකච්ඡාවක් වෙන්නේ නැහැ. ඒ වාගේම මම කියන්නට කැමැතියි මේ මාස දෙක තුළ ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල නැවත වතාවක් අඩු වනවා. සූත්‍රයට අනුව දෙසැම්බර් මාසයේ 31 වැනි දා නැවත වතාවක් ගෑස් මිල අඩු වනවා. එක්තරා පුවත් පතක් වාර්තා කරලා තිබුණා මම දැක්කා, ඒ ලබන මාසයේදීය කියා. එහෙම අපට ඕනෑ ඕනෑ වෙලාවට අඩු කරන්නට බැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගෑස් මිල සූත්‍රයක් හදලා ඒ සූත්‍රය ක්‍රියාත්මක කිරීමේ වගකීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පවරා තිබෙනවා. ඒක වෙන්නේ දෙසැම්බර් 31 වැනි දා යි. දෙසැම්බර් 31 වැනි දා ට නැවත ගෑස් මිල අඩු වෙනවා.

කිරි පිටි ගැනත් ප්‍රශ්නයක් මතු කළා. තමුන්නාන්සේලාට මම කියන්නට ඕනෑ, මේ රටේ දරුවෝ ඉන්න අම්මලාගේ වේදනාව ගැන අපිත් දන්නවාය කියලා. අපට වඩා හොඳට මහින්ද චින්තනයෙන් නිරන්තරයෙන් අතිගරු ජනාධිපතිතුමා ළමයි පිළිබඳව මෙම අය වැය ලේඛනයෙන් දක්වා තිබෙන අනුග්‍රහය, පිටුබලය ඉතිහාසයේ කිසිම වෙන කිසිදු අය වැය ලේඛනයකින් දක්වලා නැහැ. කිරි ප්‍රචලිත කිරීම සඳහා මේ වරත් අය වැය ලේඛනයෙන් සමෘද්ධි ලාභීන් සහ වතුකරයේ දරුවන්ට දියර කිරි පරිභෝජනය සඳහා රුපියල් 200ක මාසික දීමනාවක් ලබා දී තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ කිරි පිටි මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 4,500කට වැඩි වුණා. එසේ වැඩි වුණ අවස්ථාවේදී - පසු ගිය නොවැම්බර් මාසයේ දී- අපි උපරිම මිලක් නියම කළා ග්‍රෑම් 400ක කිරි පිටි පැකට්ටුවක් අලෙවි කළ හැකි වැඩිම මිල රුපියල් 275ක්ය කියා. අද වන තෙක් පුරා අවුරුද්දක් තුළ කිරි පිටි මිල රුපියල් 275ට වඩා සත 5ක් වත් වැඩි වෙලා නැහැ. අඩු වෙලා තිබෙනවා. අපේ සී.බී. රත්නායක ඇමතිතුමන්ලාගේ හයිලන්ඩ් කිරි පිටි රුපියල් 270ට තිබෙනවා. කැන්ඩි කිරි පිටි රුපියල් 245ට තිබෙනවා. ඩයමන්ඩ් කිරි පිටි - සතොස කිරි පිටි - රුපියල් 250ට තිබෙනවා. ලක්ස්ප්‍රේ කිරි පිටි රුපියල් 270ට තිබෙනවා. රුපියල් 275 මිලට තිබෙන්නේ ප්‍රධාන විජාතික -

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

බහුජාතික- සමාගම් දෙකක කිරි පිටි පමණයි. [බාධා කිරීමක්] ඔව්. හයිලන්ඩ් රුපියල් 230ට ගන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, කිරි පිටි ආනයනය කරන විට සාමාන්‍ය බද්දක් අය කරනු ලැබුවා නම් අපි අය කරන්න ඕනෑ රුපියල් 93යි. මේ පාර්ලිමේන්තුව විරුද්ධ වෙද්දී අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට පනතක් ඉදිරිපත් කළා. ඒ තමයි විශේෂ වෙළෙඳ භාණ්ඩ පනත. ජනතාව වෙනුවෙන් කතා කරන මේ දෙ ගොල්ලම ඒකට විරුද්ධව ඡන්දය දුන්නා. ජනතාවගේ බදු බර අඩු කරන විශේෂ වෙළෙඳ භාණ්ඩ පනතට විරුද්ධව තමුන්නාන්සේලා -ජනතාව වෙනුවෙන් කතා කරන අය- ඡන්දය දුන්නේ නැහැ කියා පුළුවන් නම් කියන්න.

අපි කිරි පිටි බද්ද රුපියල් පහට අඩු කළා. රජයට රුපියල් 93ක් අය වෙන්න ඕනෑ. නමුත් රුපියල් පහයි අය කළේ. සහනාධාර විධියට පාරිභෝගිකයාට රුපියල් 86ක් දුන්නා. ඒ බද්ද තමයි, මේ අය වැය ලේඛනයෙන් 5 ඉඳලා 15ට වැඩි කරලා තිබෙන්නේ. ඒකෙන් කිරි පිටි මිල ශත පහකින්වත් වැඩි වන්නේ නැහැ. දැන් සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, හෙට ඉඳලා කිරි පිටි මිල වැඩි වනවා කියලා. එතුමා දන්නේ නැහැ, ඒ නීතිය මොකක්ද කියලා. කිරි පිටි සමාගම් කිරි පිටි මිල වැඩි කරන්න නම් පාරිභෝගික කටයුතු අධිකාරියට ඇවිල්ලා අවසර ගන්න ඕනෑ. නැත්නම් අල්ලලා හිරේ දමනවා. සමාගම් වෙනුවෙන් කථා කරන මහත්වරු දැන ගන්න ඕනෑ, රටේ නීතියක් තිබෙනවාය කියලා. ඒ නිසා ශත පහකින්වත් කිරි පිටි මිල වැඩි වන්න ඉඩ දෙන්නේ නැතැයි කියන සහතිකය මම මේ ගරු සභාවට මේ අවස්ථාවේදී ලබා දෙනවා. ඒ සඳහා වන බද්ද වැඩි කළා. බද්ද වැඩි කළේ රජයේ ආදායම වැඩි වන්නයි. මොකද, ලෝක වෙළෙඳ පොළේ කිරි පිටි මිල අඩු වෙනවා. මිල අඩු වෙන කොට සමාගම් පොහොසත් කරන්න නොවෙයි ආණ්ඩුව ඉන්නේ. ඒ ලැබෙන ආදායමෙන් කොටසක් ලබා ගන්න තමයි ආණ්ඩුව ඉන්නේ.

ඊළඟට, ආරක්ෂක වියදම ගැන කථා කළා. අපේ රටේ විවිධ ආණ්ඩු විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කළා, මේ රට කඩන්නේ නැතිව බෙදන්නේ නැතිව සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් සියලු ජනයාට කැමැති තැනක ජීවත් වන්න හා ජීවනෝපාය සලසා ගන්න ඉඩ සලසන්න. ඒකට රටක් තියෙන්න ඕනෑ. උතුරේ හරි දකුණේ හරි ත්‍රස්තවාදය නැති වෙන්න ඕනෑ. ලෝකයේ ඕනෑම රටක් රාජ්‍ය ආරක්ෂාවට විශාල වියදමක් දරනවා. ගෞරවනීය ස්වාමීන් වහන්ස, මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් -රටේ නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන්- ඉන්දියාව රාජ්‍ය ආරක්ෂාවට සියයට 2.7ක් වැය කරනවා. පාකිස්තානය රාජ්‍ය ආරක්ෂාවට සියයට 3.8ක් වැය කරනවා. සිංගප්පූරුව රාජ්‍ය ආරක්ෂාව සඳහා සියයට 4.7ක් වැය කරනවා. රුසියාව රාජ්‍ය ආරක්ෂාව සඳහා සියයට 4.0ක් වැය කරනවා. Economic Indicators කියන ලෝකය පිළිගන්න දත්ත සටහනේ ඒ කරුණු බොහොම පැහැදිලිව තිබෙනවා. මම කියපු මේ රටවල් සියල්ලම රාජ්‍ය ආරක්ෂාවට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස දරන වියදම අපේ රට දරන වියදමට වඩා වැඩියි. ඉන්දියාව සියයට 2.7යි. පාකිස්තානය සියයට 3.8යි. සිංගප්පූරුව සියයට 4.7යි. රුසියාව සියයට 4.0යි. ශ්‍රී ලංකාව සියයට 2.4යි. ඒ වාගේම රජයේ ආදායමෙන් - ජනතාවගෙන් බදු වශයෙන් එකතු කරන රජයේ ආදායමෙන් - ආරක්ෂක කටයුතු වෙනුවෙන් කොච්චර වියදම් කරනවාද කියලා මේ කෘතියේ තිබෙනවා. ඉන්දියාව, ඒ රටේ ජනතාවගෙන් බදු වශයෙන් ගන්නා ආදායමෙන් ඉන්දියානු රාජ්‍ය ආරක්ෂා කරන්න සියයට 17.7ක් ගන්නවා. ඉන්දියානු ආණ්ඩුවට ලැබෙන ආදායමෙන් රාජ්‍ය ආරක්ෂාවට සියයට 17.7ක් ගන්නවා. පාකිස්තානය, පාකිස්තාන රට රැක ගැනීම සඳහා ඒ ආදායමෙන් සියයට 24.9ක් ගන්නවා. ඒ කියන්නේ පාකිස්තානය මහජනතාවගෙන් බදු වශයෙන් ලබන ආදායමෙන් හරියට හතරෙන් එකක් රටේ ආරක්ෂාව වෙනුවෙන් තමයි වැය කරන්නේ. සිංගප්පූරුවේ යුද්ධයක් නැහැ. ජනවාර්ගික ගැටලුවක් නැහැ. සිංගප්පූරුව දූපතක්. අපේ රටට වඩා 66 ගුණයකින් කුඩායි. ඒ රට රැක ගැනීම සඳහා සිංගප්පූරු ආණ්ඩුව මහජනයා ගෙවන බදු මුදල්වලින් සියයට 34.0ක් වැය කරනවා. රුසියාව, රුසියාව ආරක්ෂා කර ගැනීම සඳහා මහජනයාගේ බදු මුදලින් සියයට 20ක් වැය කරනවා. ශ්‍රී ලංකාව වැය කරන්නේ සියයට 20.3යි. මේ සංඛ්‍යා ලේඛන අනුව ලෝකයේ සෑම රටක්ම යුද්ධය තිබුණත් සාමය තිබුණත් ආරක්ෂාව සඳහා වැය කරනවා. සිංගප්පූරුව වගේ රටක්, කුඩා දූපතක්, අපේ රටට වඩා 66 ගුණයකින් කුඩා දූපතක් රාජ්‍ය ආරක්ෂාවට බදු ආදායමෙන් සියයට 34ක් වැය කරන කොට -මහජනයාගෙන් ලබන ආදායමෙන් වැය කරන කොට- අපි වැය කරන්නේ සියයට 20.3යි. [බාධා කිරීමක්] සිංගප්පූරුව කඩාකප්පල් වෙලාද?

**ගරු ආර්. සම්පන්දන් මහතා**
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
මම කියන්නේ මේ රටේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මෙහේ කඩාකප්පල් කරන්නේ නැහැ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ආරක්ෂා කරනවා. ත්‍රස්තවාදය විතරයි කඩාකප්පල් වෙන්නේ. [බාධා කිරීමක්] ත්‍රස්තවාදය විතරයි කඩාකප්පල් වෙන්නේ. අපි ඔබතුමාට කොච්චර සෙනෙහසක් දක්වනවාද? අපි ඔබතුමාට කොච්චර ආදරේද? අපි කිසිම වෙනසක් කරලා තිබෙනවාද? අපි එහෙම කරන්නේ නැහැ. මේ අපි ඔක්කෝගේම රට. කඩාකප්පල් කරන්න නොවෙයි, ත්‍රස්තවාදය විනාශ කරන්නයි ඕනෑ.

**ගරු ආර්. සම්පන්දන් මහතා**
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
යුද්ධ කරලා රටේ ආර්ථිකය කඩාකප්පල් කරන්න එපා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
රාජ්‍ය ආරක්ෂක වියදම අපේ අය වැය ලේඛනයේ තිබෙන බරපතළ වියදමක් බව ඇත්ත. නමුත් ලෝකයේ සාමය තිබෙන රටවලත් ඒ වියදම මීට වඩා වැඩිපුර දරනවා. එහෙම දරන්නේ ඇයි? ඒ රටවල ත්‍රස්තවාදය නැති වුණත්, ඉන්නේ නිරායුධ අවිහිංසක ජනයා වුණත් ඒ රටවලත් රාජ්‍ය අය වැයෙන් කොටසක් රාජ්‍ය ආරක්ෂාව සඳහා වෙන් කළ යුතු වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන වෙලාව නම් අවසානයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
තව විනාඩි පහක් දෙන්න.

ගෑස් මිල රුපියල් 178කින් සහ රුපියල් 78කින් අඩු වෙලා තිබෙනවා. ඛනිජ තෙල් ලීටරයක මිල - [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි පහක් දෙන්න විධියක් නැහැ ගරු ඇමතිතුමනි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
විනාඩි දෙකක් දෙන්න. තවත් විනාඩි දෙකකින් කථාව අවසන් කරන්නම් මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස.

තෙල් මිල අඩු වෙලා තිබෙනවා. ඩීසල් රුපියල් තිහකින්, භූමි තෙල් රුපියල් විස්සකින්, පෙට්‍රල් රුපියල් පහළොවකින් අඩු වෙලා තිබෙනවා. ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා කිව්වා, බස් ගාස්තු අඩු කරනවා කියලා. ඊයේ අය වැය යෝජනාව ගෙනැල්ලා අද බස් ගාස්තු අඩු කරන්න බැහැ. ඒ පිළිබඳව සාකච්ඡා කරලා ලබන සතිය තුළදී එතුමා බස් ගාස්තු අඩු කරනවා. විශාලම බද්ද - වැට්- සියයට 15 ඉඳන් 12 දක්වා අඩු වනවා. ලෝක වෙළෙඳ පොළේ මිල පහතට යෑම නිසා තිරිඟු පිටිවල හෝ පාන්වල හෝ මිල මේ කියන ලෙස ඉහළ යන්නේ නැහැ. කිරි පිටි මිල ඉහළ යන්නේ නැහැ. මේ තිබෙන තත්ත්වය ලෝකයේ හොඳින් පැවතුණොත් මේ තිබෙන අභියෝග හමුවේ වුණත් දෙන්න පුළුවන් සියලු සහනයන් ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, කෙනෙකුට හිතෙන්න පුළුවන් දස දහසකින් පඩි වැඩි කරන්න ඕනෑය, පන් දහසකින් විශ්‍රාම වැටුප් වැඩි කරන්න ඕනෑය කියා. ආණ්ඩුවට එහෙම කරන්න පුළුවන් නම් එහෙම කරනවා. ඕනෑම ආණ්ඩුවක් කටයුතු කරන්නේ ඒ ඒ සීමාව තුළ පමණයි. ඒ නිසා විකල්ප අය වැයක් නොවෙයි ඉදිරිපත් කරන්න ඕනෑ. තිබෙන අය වැයේ වියදම් වඩා කාර්යක්ෂමව බෙදන්නේ කෙසේද කියන එකයි අවබෝධ කරන්න ඕනෑ. සමහර අයට මේක තේරෙන්නේ නැහැ. ඒකයි සමහර අය විවිධ දේ කියන්නේ. ඒ වාගේ වෙලාවට අපේ හිත්වලට වේදනාව ඇති වුණාම අන්තිමට පිහිටට තිබෙන්නේ ධර්මය පමණක් බව ඔබ වහන්සේත් පිළිගන්නවා ඇති. මේ වේදනාජනක කථා හා විකල්ප කථා අහ ගෙන හිටපු මා ධම්ම පදය බලලා ගාථාවක් ලියා ගෙන ආවා. මට වැරැදුණොත් ඔබ වහන්සේ එය නිවැරදි කරන්න ඕනෑ.

> "අප්පස්සුතායං පුරිසෝ
> බලිවද්දෝව ජීරති
> මංසානි තස්ස වඩ්ඪන්ති
> පඤ්ඤා තස්ස න වඩ්ඪති"

"අල්පශ්‍රැත, ශාස්ත්‍රයක් පුහුණු නොකළ, මඳ කරුණු දත් පුද්ගලයා වැඩෙන්නේ ගොනකු මෙනි. ඔහුගේ මස් නම් ලියලයි. එහෙත් නුවණ නොවැඩේ" කියා ගෞතම බුදු රජාණන් වහන්සේ දේශනා කර තිබෙන බව සඳහන් කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද විස්තර :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விபரங்கள் :*
*Descriptions tabled* :

3. ලෝක වෙළඳපොළ තුළ ගෑස්, පෙහොර සහ රසායනික ද්‍රව්‍ය වැනි ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදිතයන්ගේද, තිරිඟු, බඩ ඉරිඟු, සෝයා බෝංචි, සහල්, මස් වර්ග, කිරි නිෂ්පාදන ඇතුළු ආහාර මිල ගණන් ලෝක ඉතිහාසයේ නොවූ විරූ පරිද්දෙන් ඉහළ යෑමෙන් කෘෂියෝත්ධමනයක් ඇතිවීම, ගෝලීය මිල ඉහළයෑම 2003-2007 (මෙයට අදාල සංඛ්‍යා දත්ත හා ප්‍රස්තාර අමුණා ඇත.)

[illegible] මිල ඉහළ යෑම [illegible] (මෙට්‍රික් ටොන් 1 ක)

| | 2003 | 2008 | වැඩි වීම % |
|---|---|---|---|
| බොර තෙල් (බැරල් 1 ) | 29 | 136 | 368 |
| එල්.පී.ගෑස්. | 339 | 877 | 159 |
| යූරියා පොහොර | 12,000 | 66,000 | 450 |
| කිරිපිටි | 1,975 | 4,500 | 128 |
| තිරිඟු පිටි | 132 | 500 | 278 |
| සහල් | 200 | 620 | 462 |
| රතු පරිප්පු | 325 | 2200 | 577 |


L P G ගෑස් ලෝක වෙළෙඳපොළ මිල
L P G Saudi Armco Price in U
1000
900
800
700
600
500
400
300
200
100
0
211.6
339.9
320
369.9
582
548
877.5
2002 ජනවාරි
2003 ජනවාරි
2004 ජනවාරි
2005ජනවාරි
2006 ජනවාරි
2007 ජනවාරි
2007 සැප්තැම්බර්
කාලය


Nearby Cash Prices at Export Location(s)
FOB PRICES
Weekly Values for Jan 1, 2008 - Mar 31, 2008
US$/Bushel
14.5
14.0
13.5
13.0
12.5
12.0
11.5
11.0
10.5
10.0
9.5
US$/Metric Ton
525
500
475
450
425
400
375
350
15-Jan
30-Jan
14-Feb
29-Feb
15-Mar
Gulf HRW Ordinary
W Coast HRW Ordinary


පොහොර මිල වෙනස්වීම
Price Movement of Fertilizer
මිල ඇ.ඩො.
1600
1400
1200
1000
800
600
400
200
0
2000
2001
2002
2003
2004
2005
2006
2007
2008 ජූලි
කාලය
යූරියා
ඇමෝනියා
ටී. එස්. පී
එම් ඕ පී


කිරිපිටි - ලෝක වෙළෙඳපොළ මිල හැසිරීම
Price Movement of Milk Powder in World Market
මෙ.ටො. එකක් ඇ. ඩො.
5000
4500
4000
3500
3000
2500
2000
1500
1000
500
0
14.93%
5.73%
1.04%
85.56%
2003
2004
2005
2006
2007
කාලය


ලෝක වෙළෙඳපල තායිලන්ත සහල් මිල වෙනස්වීම
Price Movement of Thailand Rice in the World Market
1200
1000
800
600
400
200
0
මිල ඇ.ඩො.
1037
963
196
201
247
244
285
291
300
311
332
335
2003
2004
2005
2006
2007
2008 මැයි
කාලය
තායි සුදු සහල්
තායි තම්බපු සහල්


ලෝක වෙළෙඳපල රතු පරිප්පු මිල වෙනස්වීම
Price Movement of Red Lentils in the World Market
2500
2000
1500
1000
500
0
මිල ඇ. ඩො.
325
510
450
725
2200
2003 ජූලි
2004 ජූලි
2006 ජූලි
2007 ජූලි
2008 ජූලි
කාලය


Export Prices for Rice
US$/tonne
1080
980
880
780
680
580
480
380
280
180
May-07
Jul-07
Sep-07
Nov-07
Jan-08
Mar-08
May-08
US 2/4%
Thai 100% B
Viet 5%
Pak Irri-25%
Thai A1 Super


INSIDE THIS WEEK: TECHNOLOGY QUARTERLY
The Economist
Why you should still be scared of Iran
The world's best and worst schools
Unzipping your genes
The beginning of the end for Chávez
Our books of the year
THE END OF CHEAP FOOD


The Economist
Afghanistan: time to get tough on Karzai
Global house prices compared
The people to the rescue in China
Indiana McCain and the Election of Doom
Drugs that will blow your mind
Inflation's back...
EXCEPT MY HOUSE PRICE
IT SEEMS THE PRICE OF EVERYTHING IS UP!!
OIL PRICES ARE UP!
FOOD PRICES ARE UP!
...but not where you think


INSIDE THIS WEEK: A 14-PAGE SPECIAL REPORT ON EU ENLARGEMENT
The Economist
America's surprising suburbs
High Noon for Ehud Olmert
Vodafone changes guard
Signs of reform in corporate Japan?
Girls, boys and mathematics
Recoil
$135


His Mother's Son: The Woman Who Shaped Barack Obama
Behind North Korea's Latest Temper Tantrum
R.E.M. Rises from The Dead
TIME
Asia's Rice Crisis
As skyrocketing prices and shortages take hold, what's next for Asia's most important food?


Joe Klein: How Al Gore Could Save The Democrats
Tsunami Watch: Aceh's Slow Rebirth
China's Drive to Become the World's Top Gold Producer
TIME
The Clean Energy Myth
BY MICHAEL GRUNWALD
Politicians and Big Business are pushing biofuels like corn-based ethanol as alternatives to oil. All they're really doing is driving up food prices and making global warming worse— and you're paying for it


INSIDE THIS WEEK: A 14-PAGE SPECIAL REPORT ON ISRAEL
The Economist
Mugabe on the edge
Why Berlusconi is still unfit
Turkey's ruling party in court
Native American business
Genetics and doping in sport
APRIL 5TH-11TH 2008
Fixing finance
...and the risks of getting it wrong


The Economist
Defeatism in Afghanistan
The reinvention of Gordon Brown
John McCain's last chance
Controlling drug addiction
Goodbye to Jörg Haider
OCTOBER 18TH–24TH 2008
www.economist.com
CAPITALISM AT BAY


1.ලෝක ඉතිහාසයේ මෙතෙක් නොවූ විරූ පරිද්දෙන්
ඛනිජ තෙල් මිල ඉහල යෑම
2003 තෙල් බැරලයක මිල ඇ.ඩො = 29
2008 ජූනි තෙල් බැරලයක මිල ඇ.ඩො = 136
2003-2008 තෙල් බැරලයක් මිල වැඩිවීම ඇ.ඩො = 107
2003 සාපේක්ෂව තෙල් බැරලයක මිල 369% කින් ඉහළගොස් ඇත.

**තේ, රබර්, පොල් අපනයන අදායම තෙල් බිල ගෙවීමට ප්‍රමාණවත් නොවේ.**

| | වසර | 2003 | 2008 |
|---|---|---|---|
| තේ, රබර්, පොල් අපනයන අදායම ඇ.ඩො. මිලියන | | 965 | 1275 |
| ඛනිජ තෙල් ආනයන වියදම | | 838 | 2497 |
| | | + 127 | (- 1222) |

**විදේශගත සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් මෙරටට එවන මුළු මුදල් ප්‍රමාණය ඛනිජ තෙල් බිල ගෙවීමට ප්‍රමාණවත් නොවන දීනය වැඩි ඈතක නොවේ.**

| | වසර | 2003 | 2007 |
|---|---|---|---|
| විදේශීය සේවා නියුක්තියන්ගේ ප්‍රේෂන ඇ.ඩො. මිලියන | | 1205 | 2502 |
| ඛනිජ තෙල් | | 838 | 2497 |
| | | +367 | +5 |

## 2. ඛනිජ තෙල් ආනයන පිරිවැය ඉහළ යෑමෙන්,රුපියලේ බාහිර අගය කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවීම

| | |
|---|---|
| 2003 ඛනිජ තෙල් ආනයන පිරිවැය ඇ.ඩො. මිලියන | - 838 |
| 2007 ඛනිජ තෙල් ආනයන පිරිවැය ඇ.ඩො. මිලියන | - 2497 |
| 2003-2007 ඛනිජ තෙල් ආනයන පිරිවැය වැඩිවීම ඇ.ඩො. මිලියන | - 1659 |

2003 ට සාපේක්ෂව ඛනිජ තෙල් ආනයන වියදම 198% කින් ඉහළ ගොස් ඇත.

2003 පැවති ඛනිජ තෙල් මිල නොවෙනස්ව පැවතියේ නම්. වර්ෂයකට ඇමරිකානු ඩොලර් බිලියන 16 කට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ලංකාවට ඉතිරිකර ගත හැකිව තිබුණි. එසේ වූයේ නම්, රුපියලද බෙහෙවින් ශක්තිමත් කර මිල පීඩනය අඩුකර ගත හැකිව තිබුණි.

* *සභාමේසය මත තබන ලද ලියවිලි :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:*
*Descriptions tabled* :

රාජ්‍ය ප්‍රධාන වියදම් වර්ග ඉහත දැක්වූ අන්දමින් 100% කටත් වඩා වැඩි අනුපාතිකයකින් ඉහළ නගින විටෙක, රාජ්‍ය ආදායම් එලෙසින් වර්ධනය නොවේ නම්: අය-වැය පරතරය පියවා ගැනීම බැංකු ක්‍රමය වෙතින් ණය ගැනීමෙන්, මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇතිවීමෙන් උද්ධමනාත්මක පීඩනයක් ඇතිවීම ස්වාභාවිකය.

4. රාජ්‍ය වියදම් සීඝ්‍රගාමී ලෙස වර්ධනය වූ නමුදු රජයේ ආදායම් මන්දගාමීව වර්ධන වීම නිසාවෙන් අය-වැය පරතරය පුළුල් වී, රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් උද්ධමනාත්මක බලපෑම තීව්‍රවීම.

උදා:-
2003-2007 රාජ්‍ය වියදම් වර්ධනය පිළිබඳ උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(මෙකී වියදම් ඉහළ යෑමට අදාල ප්‍රස්ථාර සටහන් අමුණා ඇත.)

| | 2003 රු. බිලියන | 2007 රු. බිලියන | වියදම වැඩිවීමේ % ප්‍රතිශතය |
|---|---|---|---|
| රාජ්‍ය අංශයෙහි සේවක වැටුප් හා වේතන | 91 | 214 | 135% |
| විශ්‍රාම වැටුප් | 32 | 68 | 112% |
| රාජ්‍ය ආරක්ෂක වියදම් | 47 | 117 | 148% |
| පොහොර සහනාධාර | 2 | 11 | 450% |
| රාජ්‍ය ණය පොලී ගෙවීම් | 125 | 182 | 45% |
| ප්‍රාග්ධන වියදම් | 75 | 206 | 174% |


ශ්‍රී ලංකාවේ වාර්ෂික උද්ධමන අනුපාතය
Inflation Rate in Sri Lanka
30
25
20
15
10
5
0
1.60
5.90
26.10
21.50
6.20
14.20
15.60
1960
1970
1980
1990
2000
2001
2007
කාලය


රාජ්‍ය සේවක වැටුප් හා වේතන
Government Servant's Salaries & Wages
250
200
150
100
50
0
76
88.6
91.7
106.1
138.6
175
214
2001
2002
2003
2004
2005
2006
2007
කාලය


රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් බිල
Government Servant's Pension Expenditure
80
70
60
50
40
30
20
10
0
26.4
31.1
31.1
36.4
46.7
58
68
2001
2002
2003
2004
2005
2006
2007
කාලය


රාජ්‍ය ආරක්ෂක වියදම්
State Defence Expenditure
140
120
100
80
60
40
20
0
54.2
48.6
47
56.3
61.4
81.2
117.2
2001
2002
2003
2004
2005
2006
2007
කාලය


රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම්
180
160
140
120
100
80
60
40
20
0
රුපියල් බිලියන
71.2
94.3
116.5
125.1
119.7
120.1
151.2
169.1
2000
2001
2002
2003
2004
2005
2006
2007
කාලය


පොහොර සහනාධාරය
Fertilizer Subsidy
16
14
12
10
8
6
4
2
0
3.6
2.4
2.1
3.5
6.8
11.8
15
2001
2002
2003
2004
2005
2006
2007
කාලය


සමෘද්ධි සහනාධාර
Samurdhi Subsidy
සහනාධාර රුපියල් බිලියන
14
12
10
8
6
4
2
0
12.5
9.9
8.7
8.4
9.1
10.7
10.9
2001
2002
2003
2004
2005
2006
2007
කාලය


අධ්‍යාපන වියදම
රුපියල් බිලියන
100
90
80
70
60
50
40
30
20
10
0
39.1
88.7
2003
2007
කාලය


ප්‍රාග්ධන වියදම
Capital Expenditure
250
200
150
100
50
0
78.20
93.7
103.1
151.7
179.5
234.0
2002
2003
2004
2005
2006
2007
වර්ෂය


මාර්ග සංවර්ධනය සඳහා දැරූ වියදම්
රුපියල් බිලියන
60
50
40
30
20
10
0
8.6
10.7
16.9
28.7
37.4
54.6
2002
2003
2004
2005
2006
2007
කාලය




**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි ගරු ඇමතිතුමනි. ඊළඟට, the Hon. Suresh Premachandran.

**[பி.ப. 12.55]**

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

சபைக்குத் தலைமைதாங்கும் வணக்கத்துக்குரிய தேரர் அவர்களே, இந்த வரவு-செலவுத் திட்டம் தொடர்பான எனது பேச்சை, முதலில் இலங்கை மத்திய வங்கியின் ஆளுநர் இவ்வரவு-செலவுத்திட்டம் தொடர்பாகக் கூறிய கருத்தைத் தெரிவித்துக்கொண்டு ஆரம்பிக்கலாமென நினைக்கின்றேன். Mr. Ajith Nivard Cabraal, Governor of the Central Bank of Sri Lanka said that he has backed an increase in defence spending because it is vital to end the nation's 25-year-old civil war. இலங்கை மத்திய வங்கியின் Governor இந்த 2009ஆம் ஆண்டு வரவு-செலவுத் திட்டம் தொடர்பாக ஒரு பத்திரிகைக்குக் கருத்துத் தெரிவிக்கையில், 25 வருட civil war ஐ முடிப்பதற்கு இந்த வருட Budget இலே மிகப் பெருமளவிலான நிதி ஒதுக்கப்பட வேண்டும் என்பதையே முதலாவது விடயமாகக் குறிப்பிட்டார். ஆகவே, இந்த நாட்டில் உள்ள மத்திய வங்கியின் ஆளுநர் உட்பட சகல புத்திஜீவிகளும், இந்த நாட்டில் உள்ள ஒரு சிலரால் 'பயங்கரவாத ஒழிப்பு' என்றும், வேறு சிலரால் civil war என்றும் கூறப்படுகின்ற, தமிழ் மக்களுக்கு எதிராக நடத்தப்படுகின்ற இனப்படுகொலையைத் தொடர்ந்து நடத்திச்செல்வதற்குப் பெருந்தொகையான நிதி ஒதுக்கப்பட வேண்டுமென்ற எண்ணத்தைக் கொண்டிருக்கிறார்கள் என்பது இதிலிருந்து தெளிவாக விளங்குகிறது.

இதேசமயம் நான் இன்னொரு விடயத்தையும் உங்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். இந்த மாத ஆரம்பத்தில் இந்திய நடிகர்கள் இலங்கைத் தமிழ் மக்களுக்கு ஆதரவாக, போர் நிறுத்தத்தை வலியுறுத்தி சென்னையில் உண்ணாவிரதமிருந்தபொழுது, நடிகர் ரஜனிகாந்த் அவர்கள், "கடந்த முப்பது வருட காலமாக விமானப்படை, தரைப்படை, கடற்படை மற்றும் சர்வதேச ஆதரவுடன் தமிழ் மக்களுக்கு எதிராகப் பாரிய யுத்தத்தை நடத்தியபொழுதிலும், இன்றுவரையில் உங்களால் தமிழ் மக்களையும் வெல்ல முடியவில்லை; அம்மக்களின் மனங்களையும் வெல்ல முடியவில்லை. எனவே, நீங்கள் இன்னும் ஏன் ego வில் இருக்கிறீர்கள்? இந்தப் பிரச்சினையைத் தீர்த்துவிடுங்கள்!" என அவர் தனது வார்த்தைகளில் கூறினார். ஆகவே, நீங்கள் கடந்த முப்பது வருட காலமாகத் தொடர்ந்து யுத்தம் நடத்திக்கொண்டிருக்கின்ற நிலையில், ஒவ்வொரு வருடமும் "இந்த வருடம் இந்த யுத்தம் முடிந்துவிடும். ஆகவே, அதற்குப் பெருமளவிலான நிதி ஒதுக்குகின்றோம்" என்று தொடர்ந்து கூறிக்கொண்டே வருகின்றீர்கள்.

1977ஆம் ஆண்டில் பாதுகாப்புச் செலவுக்காக Ministry of Defence க்கு 0.75 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது. அதன் பின்னர் 9 வருடங்கள் கழித்து 1986ஆம் ஆண்டில் பாதுகாப்புக்காக 6 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. மேலும் 9 வருடங்கள் கழித்து 1995ஆம் ஆண்டில் 25 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. 1996 இல் 38 பில்லியன் ரூபாயும் அதற்குப்பிறகு ஐந்து வருடங்கள் கழித்து 2001ஆம் ஆண்டில் 63 பில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டது. அதன்பின்னர் 2007ஆம் ஆண்டில் அத்தொகை 139 பில்லியன் ரூபாயாக அதிகரிக்கப்பட்டு ஒதுக்கப்பட்டது மட்டுமல்ல, அதே வருடத்தில் அந்த ஒதுக்கீடும் போதாதென்று குறைநிரப்புப் பிரேரணைமூலம் மேலும் அதிகரிக்கப்பட்டு, 156 பில்லியனாக்கப்பட்டது. இந்த வருடம் 2008ஆம் ஆண்டில் அது 166 பில்லியன் ரூபாயாக அதிகரிக்கப்பட்டது. இப்பொழுது நீங்கள்

[ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා]

மேலும் யுத்தத்தைத் தொடர்ந்து நடத்துவதற்காக 2009ஆம் ஆண்டுக்கென 177 பில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கின்றீர்கள். இந்த நாட்டில் யுத்தத்தைத் தொடர்ந்து நடத்துவதற்காக ஒதுக்கப்பட்ட இந்த 177 பில்லியன் ரூபாயில், நான் நினைக்கின்றேன், தமிழ் மக்களைக் கொன்று குவிப்பதற்காக, அவர்களை அவர்களுடைய சொந்த இடங்களிலிருந்து விரட்டுவதற்காக, நீங்கள் முப்படைகளுக்கும் ஒரு நாளைக்கு 456 மில்லியன் ரூபாயை, அதாவது ஏறத்தாழ நான்கு மில்லியன் யுஎஸ் டொலர்களைச் செலவு செய்கின்றீர்கள் என்று. என்ன காரணத்துக்காக இவ்வாறு செய்கிறீர்கள்? தமிழ் மக்கள் தமது உரிமைகளைக் கேட்டார்கள் என்பதற்காகவா இவ்வாறு செய்கின்றீர்கள்? என நான் கேட்கின்றேன். எவ்வாறு உரிமைகளைப் பகிர்ந்துகொள்வது, எவ்வாறு அதிகாரங்களைப் பகிர்ந்துகொள்வது என்ற விடயங்களைப் பற்றிச் சிந்திக்காமல், உரிமைகளைக் கேட்டவர்களைக் கொன்றொழிப்பதன்மூலம் நீங்கள் பிரச்சினைகளுக்குத் தீர்வு காணலாமென எண்ணுவது உண்மையாகவே எவ்வளவுதூரம் சாத்தியமாகுமென்பது எனக்குத் தெரியவில்லை.

That is why I say that the economic advancement lies in the greater democratization of the country. Where have we taken this democratization? We have taken this to areas in the Eastern Province where there was no democracy previously. Today for the first time in the history of Sri Lanka, the Eastern Provincial Council is administering the district and addressing the needs of all our people; the Tamils, the Sinhalese and the Muslims who are living in harmony. That is what was meant by President Rajapakse's vision to cater to the people. We are providing more and more investment to that region because that region was deprived of development for 25 years due to the scourge of terrorism that prevailed in those areas. It is from that angle that we are looking at greater opportunities to be given to the milk production sector, the paddy sector, and the small growers in the tea and rubber sectors. They are all part of the SME sector development in Sri Lanka. There is a special concentration on the Lankaputhra Bank which is an amalgamation of the SME Bank which I created during my period when I was in charge of that subject. Now, today why did we create the SME sector to be a vibrant sector? Because, we strongly believe in the entrepreneurship of the small person and the people of Sri Lanka. Today, we have been able to improve the growth against our exports. Our resilience over the world impact on our economy sliding down with the world prices can get further adjusted if we have greater security on our production bases. That is how we have looked at the macroeconomic picture so that we can take

[ගරු රෝහිත බෝගොල්ලාගම මහතා]

the micro effects of that for the benefit of all our people, 20 million in number. That is how we have to look at an action plan for the economy. We have not said that we have a war to fight in the North, we have to fight terrorism, therefore tighten your belt; no employment opportunities, no salary increases, no overtime like we said in 2002 in this very House in the United National Party Budget. No such thing has ever been said by President Mahinda Rajapaksa because he strongly believes that what is meant for the people should be given with greater enhancement. That is how we are looking at the economy whilst managing it. Some of the prophets of doom are silent today having analysed the benefits of this Budget. That is the silence that prevails because we have been able to present a Budget which is attractive and at the same time meaningful, a Budget that has provisions for development and at the same time countering terrorism, a Budget that brings liberty to the people and greater strength of democracy to all parts of Sri Lanka, soon to the North, because we have been able to look at the fundamental aspects in the last 36 months that we have been in office. So, this is a very far-reaching Budget in the opinion of everybody who strongly believes in the need to sustain greater development in our country.

We are also very conscious about how the Government's social responsibility is working today. When fuel prices were going up, the Government was cushioning under the element of high price of fuel. But today, when it is sliding down you have to recover, recoup the loss whilst you pass the benefits on to the consumer. That is how a consumer-oriented market is being catered to. As the Hon. Bandula Gunawardane said, merely because you impose a duty on the importation of milk powder in order to develop the local milk production, it does not mean that tomorrow they can raise the prices. There is a regulatory mechanism through which our Government is guiding the economy. It is a mechanism of a good democratic economy, to pass the benefits of economic development to the people and to cushion the people against various adverse effects that come from outside elements, outside world. This is how we balance it. We have to always look at the fundamentals of our economy to be sustained on a continuous basis. We cannot just refer to 2006 and say that we presented the Budget, these are the estimates and these are things that approval is needed, and forget it in 2007. We must have the effects of 2006 being taken over 2007 and 2008 on a continuous basis so that every cent that we put on capital investment and cushioning the people will be on a sustainable manner. So, no one is being taken unaware of what is happening, like how the major economies have collapsed today. They cannot find answers for the collapse. Some say it is due to overheated economy, some say it is due to greater exposure to credit and lack of recovery of debt. They say that today there is a sea of debt in the world. ඒ කියන්නේ විශාල ණය සාගරයක් විධියට තමයි ලෝකය පරිවර්තනය වෙලා තිබෙන්නේ. ලෝකයේ තිබෙන ගොඩ බිම් ප්‍රමාණයට වඩා සාගරයේ ප්‍රමාණය වැඩියි. ලෝකය ණය සාගරයක් වුණාම ගොඩ බිමේ තිබෙන ශක්තිය ප්‍රයෝජනයට ගන්න බැහැ, ඊට වඩා වැඩි ණය බරක් ලෝකය තුළ පතිත වෙලා තිබෙන නිසා. අපි හරි විධියට මූල්‍ය කළමනාකරණයත්, ආර්ථික ප්‍රතිපත්තියත් මෙහෙය වීම නිසා ඒ කියන තත්ත්වයෙන් ගැලවීමේ හැකියාවක් අද ශ්‍රී ලංකාවට ලබා ගන්නට පුළුවන් වෙලා තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේ පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විශේෂ පැතිකඩවල් කිහිපයක් තිබෙනවා. එක පැත්තකින් අපනයන ආර්ථිකයක් තිබෙනවා. අනෙක් පැත්තෙන් ආනයනය තුළින් ජනතාව ජීවත් වන මාර්ගයකුත් තිබෙනවා. නිසි ක්‍රමයක් තුළින් මේ පැතිකඩ දෙකම සමතුලනය කිරීමේ හැකියාව තිබෙනවා. අපි ඒකට කියනවා, guided approach in terms of an economy කියලා. මේ guided economy එකේ අවශ්‍යතාව අද ලෝකයට වැඩි වැඩියෙන්ම අවශ්‍ය වෙලා තිබෙනවා. ඉන්දියාව ඉතාමත්ම කල්පනාකාරීව ඔවුන්ගේ නිදහස් වෙළෙඳ ප්‍රතිපත්ති පාවිච්චි කළ නිසා, හුඟක් ආයතන පෞද්ගලීකරණය නොකළ නිසා ඔවුන්ට සිද්ධ වෙන්න ගිය විශාල විනාශයෙන් ගැලවීමේ ප්‍රවණතාවක් අද යම් තාක් දුරට ඇති වෙලා තිබෙනවා. එදා එක්සත් ජාතික පක්ෂය අනුගමනය කළ, සියලු දෙයම පෞද්ගලීකරණය කළ යුතුය කියන න්‍යාය වාගේ එකකට අපිත් ගියා නම්, මේ රටේ සම්පත් ප්‍රමාණය පෞද්ගලික පිරිසක් අතට පත් වෙනවා. බදු නිදහස ලබා ගත්තාම ඔවුන්ගෙන් රජයට ලැබෙන දායකත්වය මොකක්ද? ඔවුන්ගෙන් රජයට ලැබෙන දායකත්වය අවම වුණාම සමස්ත ජනතාවගේ අවශ්‍යතාව පිරිමැසීමේ වගකීම රජය කොයි විධියටද ඉෂ්ට කරන්නේ කියන ප්‍රශ්නයට අපට මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. නමුත් අප ගත් ඒ ඉතාමත් හොඳ, දූරදර්ශී ඥානයකින් යුත් වැඩ පිළිවෙළ මාස 36ක් තිස්සේ ගෙන ගිය නිසා, අපේ විදේශ ප්‍රතිපත්තියේ තිබෙන සරල පැවැත්ම නිසා, අද ශ්‍රී ලංකාව තුළ විශාල ආර්ථික ශක්තියක් ගොඩ නැඟීමේ හැකියාව අපට ඇති වෙලා තිබෙනවාය කියන එක මම ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ. මෙන්න මේකයි අපේ තිබෙන හැකියාව. ඒ හැකියාව ගැන අපි පුන පුනා කියන්න ඕනෑ නැහැ. මේ වාගේ අවස්ථාවක රජය කරන්නේ මොකක්ද කියන එක නොදැනුවත්ව නොවෙයි, නමුත් පිළිගැනීමේ අපහසුතාවකින් විපක්ෂය කටයුතු කරන අවස්ථාවක මගේ යුතුකමක් තිබෙනවා මෙන්න මෙවැනි අවස්ථාවකදී අප මේ රටේ කටයුතු මෙහෙය වන්නේ කොයි විධියටද කියන එක කියන්න. මෙන්න මේකයි අපට තිබෙන විශාලතම අවශ්‍යතාව. අද අප ඉදිරිපත් කර තිබෙන අය වැයේ විශේෂත්වය වන්නේ ඒකයි. මහජනතාවගේ අයිතීන් රැකෙන්නට, ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගන්නට, ත්‍රස්තවාදී වැඩ පිළිවෙළ යටතේ ලංකාව කැඩීම වළක්වන්නට අවශ්‍ය ආයෝජනය කරන්නට, සමස්ත ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවන් සහ ඔවුන්ගේ දරුවන්ගේ අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය සියලුම ආයෝජනයන් කරන්නට මහින්ද රාජපක්ෂ රජය යටතේ වාර්ෂිකව කරන උත්සාහය ගැන තමයි අද මේ සාකච්ඡා කරන්නේ. මෙන්න මේකයි අපේ අය වැයේ තිබෙන හොඳම ලක්ෂණය; සුවිශේෂත්වය.

අද ලෝකයේ හුඟක් රටවලට අය වැයක් ඉදිරිපත් කර ගැනීමට හැකියාවක් නැහැ. මොකද, එතරම්ම අවපාතයකට ගිහිල්ලා. බිමටත් ගිහිල්ලා, බිමත් කඩා ගෙන යන තත්ත්වයකට ඔවුන්ගේ ආර්ථිකය එන්න එන්නම ඇද වැටිලා තිබෙනවා. අද අපේ ආර්ථිකය සියයට 6.5ක හොඳ නැඟීමක් ඇතිව එන්න එන්නම ක්‍රියාන්විතව තිබීම අප ලබා ගත් සුවිශේෂ ජයග්‍රහණයක් විධියට සඳහන් කළ යුතුමයි. එහෙම නම් ඒ ජයග්‍රහණය අපි කොහොමද ඉදිරියට ගෙන යන්නේ? ඒක ඉදිරියට ගෙන යැමේදී සියලුම ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා කැප වෙනවා වාගේම ඔවුන්ගේ පිළිගැනීමත් ඒකට අවශ්‍යයි. ත්‍රස්තවාදය නැමති ඒ උවදුරෙන් ශ්‍රී ලංකාව නිදහස් කර ගන්නට ජාත්‍යන්තර සහයෝගය ලබා ගෙන, ඒ කර්තව්‍ය ඉෂ්ට කර ගන්න යන න්‍යාය පත්‍රය තුළ ශ්‍රී ලංකාව හොඳ ශක්තිමත් ජාතියක් විධියට ලෝකයට ඉදිරිපත් කරන්නට,-

Venerable Sir, special reference was made in the Budget Speech - in fact, the Hon. Ravi Karunanayake and the Hon. Suresh Premachandra also referred to it - about Sri Lanka vis-a-vis the European Union and the GSP concession that is now being discussed both in Sri Lanka and in Europe. I would like to quote what the President said yesterday in the Budget Speech. In Part I, on page 13, under para 29, he says:

> "Hon. Speaker, the European Union has adopted a new trend, wherein conditions are being attached to concessions granted by them such as GSP+. It is unfair to engage in international trade and investment within a framework through which political objectives are tried to be achieved."

Now, how could political objectives replace trade concessions? That is an issue in regard to which we have made our position very clear. The President further says, I quote:

> "We are a proud nation that is not second to any developed country which respects fundamental rights, human rights, rights of women, respect labour laws, laws preventing the use of child labour, environmental laws, gender equality, election and civil rights."

So, these are ingrained in our Constitution. There are statutory provisions that we have made in order to enhance the rights of all our people. In the context of what we posses today, why should we compromise our value judgment to the European Union? That is how we have positioned ourselves. But we are all the time engaged with the world at large including the European Union. That is why we have proposed that a dialogue is the mean through which we could address these issues and we are pursuing our efforts towards that. This is how we are looking at matters. But never will we compromise our national interest, sovereignty and territorial integrity of our country. That is something I would like to repeat.

In the context of these things, Venerable Sir, we are looking at the development agenda for Sri Lanka. The amber light comes on before the red appears. Similarly, we are taking very proactive action. We are not a Government that reacts merely because alarm bells are rung by some interested quarters in the world. We have got a very proactive approach when it comes to Sri Lanka's priorities, the interests of our people and that of our nation**.** We address them in the most productive, the most meaningful and the most capable manner. That is how we are positioning our Government.

I listened to the speech of the Hon. Suresh Premachandra. It is so unfortunate that he is not in the House now, even to interrupt or to intervene when I am referring to the LTTE and the type of lifeline the TNA Members are trying to throw towards Prabhakaran; the terrorist who wants people of all communities living in Sri Lanka to sacrifice for his fascist terrorist agenda which he imagines could be succeeded.

So, along with the challenges that we have both in terms of democracy and restoration of democracy to all parts of Sri Lanka, we also have the question of liberty. These are very core issues that we are all committed to. What did Senator Barack Obama say? He said that he stands for democracy and liberty. We, in Sri Lanka stand for democracy, liberty and security. Security in Sri Lanka is being threatened. Therefore, we need to restore it.

මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, මට තව කොයි තරම් වේලාවක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වේලාව ඉවරයි.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
එහෙම නම් මම තව විනාඩියකින් කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, ඉතාමත් හොඳ විවාදයක් යන අවස්ථාවක්. මේ අය වැයේ තිබෙන සුබ ලකුණු ගැන යම් සඳහන් කිරීමක් අපි හැම දෙනාගෙන්ම බලාපොරොත්තු වෙනවා. මොකද, මේක ශ්‍රී ලංකාවේ එක් පක්ෂයකට පමණක් අයිති අය වැයක් නොවෙයි. මේ අය වැය යෝජනාවලිය තුළින් ජීවත් වන්නේ, මේ අය වැය යෝජනාවල ප්‍රතිඵල බුක්ති විඳින්නේ සමස්ත ජනතාවයි. එහෙම නම් අද හතර වන වතාවටත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට මුදල් අමාත්‍යවරයා විධියට මෙවැනි ඉතාමත්ම දූරදර්ශී සහ ඉතාමත්ම ක්‍රමවත් අය වැය යෝජනා මේ සභාව වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන අපේ ප්‍රශංසාව මුසු කරමින් -

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ඔබතුමාගේ මුදල වැඩි කරන්නේ නැහැ.

**ගරු රේණුකා හේරත් මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரேணுகா ஹேரத்)
(The Hon. (Mrs.) Renuka Herath)
ඇමතිකමත් නැති වෙනවා.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
ආ, ඇත්තද? තව එකක් ලැබෙයි. මගේ ප්‍රතිපාදන වැඩි කරලා තිබෙනවා. තමුන්නාන්සේලා දැන ගන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර කථාව අවසන් කරන්න.

**ගරු රෝහිත බෝගොල්ලාගම මහතා**
(மாண்புமிகு ரோஹித போகொல்லாகம)
(The Hon. Rohitha Bogollagama)
මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, විශේෂයෙන් මම ඔබවහන්සේට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාව ලබා දීම ගැන. නමුත් මගේ මිත්‍රයෝ විපක්ෂයේ ඉන්නවා. එතුමන්ලා ගැන යමක් සඳහන් නොකරම බැහැ. එතුමන්ලා හැම දෙයක් ගැනම හොඳ අවබෝධයකින් දැන ගෙන ඒ ගැන කථා නොකර ඉන්න එක ගැනයි මගේ කනගාටුව. එසේ ප්‍රකාශ කරමින් මෙම අවස්ථාව ලබා දීම ගැන ඔබ වහන්සේට නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 2.17]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, වර්තමාන ආණ්ඩුවේ හතර වන අය වැය යෝජනාවලිය, එහෙමත් නැත්නම් 2009 වර්ෂය සඳහා වූ අය වැය යෝජනාවලිය පිළිබඳව අපේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම වැදගත් යැයි මා විශ්වාස කරනවා. මේ අය වැය විවාදයට අපි සම්බන්ධ වන අද දවස එක අතකින් ඉතාමත් වැදගත් දවසක්. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයන්ට විරුද්ධව සටන් කරපු වීර පුරන්අප්පු එහෙම නැත්නම් වීර හැන්නැදිගේ ප්‍රැන්සිස්කු ප්‍රනාන්දු කියන ඒ ශ්‍රේෂ්ඨ දේශ ප්‍රේමියා මේ රටේ මොරටු උයන කියන ගමේ ඉපදුණු දවස තමයි අප මේ විවාදය ආරම්භ කළ අද දවස.

මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, මේ අය වැය විවාදයට අපි ප්‍රවේශ වන්නේ ප්‍රධාන කාරණා කීපයක් පූර්ව වශයෙන් අවධාරණය කර ගෙනයි. මේ රටේ ජාතික ආර්ථික ප්‍රතිපත්තියක්, ජාතික ආර්ථික වැඩ පිළිවෙළක් අත්‍යවශ්‍යයි කියන මතය රට තුළ ප්‍රබලව ගොඩ නඟන්න, එය සනාථ කරන්න ඉතාමත්ම ප්‍රබල මැදිහත් වීමක් කරපු පුද්ගලයන් සමූහයකගෙන් නියෝජිතයන් පිරිසක් හැටියට තමයි අපි මේ අය වැය දිහා බලන්නේ. මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්සේ දන්නවා, මේ රටේ කලෙක ඉතාමත්ම ප්‍රබල ආර්ථික මත වාදය, ආර්ථික ප්‍රතිපත්තිය බවට පත් වෙලා තිබුණේ නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්තිය බව. ඒ කියන්නේ, රජය ආර්ථික භූමිකාවෙන් ක්‍රමානුකූලව ඉවත් වෙලා වෙළෙඳ පොළ බලවේගවලට පමණක් සියල්ල තීරණය කරන්න ඉඩ හරින ආර්ථික ප්‍රතිපත්තිය; දේශීය නිෂ්පාදකයාව එතරම් වැදගත් කොට නොසලකන ආර්ථික ප්‍රතිපත්තිය; රාජ්‍යය දුබල කොට, විදේශ සමාගම් තන්ත්‍රයකට ලංකාවේ ආර්ථිකය හසුරු වන්නට නිරන්තරයෙන් අවස්ථාව වැඩි කරන ආර්ථික ප්‍රතිපත්තිය. ඒ සඳහා තමයි රාජ්‍ය දේපොළ, රාජ්‍ය සම්පත් පෞද්ගලීකරණය කිරීම ආර්ථික ශික්ෂා පදයක් බවට පත් වුණේ.

1977න් පසුව ආපු බොහෝ මුදල් ඇමතිලාගේ ප්‍රධාන ආර්ථික ශික්ෂා පදය වුණේ, අය වැය පරතරය පියවා ගැනීම සඳහා, ඒ බර අවම කර ගැනීම සඳහා අහවල් අහවල් ආයතන පෞද්ගලීකරණය කිරීමෙන් මෙච්චර මුදලක් ලැබෙනවා, ඒ මුදලෙන් අපි මෙච්චර දෙයක් කර ගන්නවා කියන පාඨයයි. එය තමයි ඔවුන්ගේ කටින් නිරන්තරයෙන්ම පිට වුණේ. මෙන්න මේ නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයට එරෙහිව රාජ්‍යය දුබල කරන, ජාතිය දුබල කරන, ස්වදේශීය නිෂ්පාදන කඩා වට්ටන, විජාතික නිෂ්පාදන බලවේගවලට, ව්‍යවසායික බලවේගවලට රටේ ආර්ථිකය පාවලා දෙන මේ කොල්ලකාරී ආර්ථික ගමනට එරෙහිව මේ රටේ ජනතා මතයක් ගොඩ නඟන්න කැප වුණු මිනිස්සු හැටියට, ඊට විරුද්ධ ආර්ථික ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙනී සිටි මිනිස්සු හැටියට, ඒ ආර්ථික ප්‍රතිපත්තිය වැරදියි කියලා සමාජය තුළ ඒත්තු ගන්වන්න මැදිහත් වුණු මිනිස්සු හැටියට තමයි අපි මේ අය වැය යෝජනාවලිය දිහා බලන්නේ. එදා අපි මේක කියන විට අද මේ ආණ්ඩුවේ ඉන්න බොහෝ ඇමතිවරු වෙන්න පුළුවන්, ඇතැම් ඇමතිවරු වෙන්න පුළුවන්, ඒ ගොල්ලෝ පරමාදර්ශය කොට පිළි අර ගෙන තිබුණේ මේ නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්තිය. චන්ද්‍රිකා ජනාධිපතිතුමියගේ කාලයේ අවුරුදු 17ක් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ විකුණුවාට වඩා මේ රටේ ජාතික ආර්ථික සම්පත් විකුණපු බව අප කවුරුත් දන්නවා. එදා ඒ අය වැයවල් ගෙන එන කොට මේ ඇමතිතුමන්ලා ගොඩක් ඒ ආණ්ඩුවේ හිටියා. එදා ඒ අය වැය විවාදවලදී එතුමන්ලා බොහොම උද්දාමයෙන් කිව්වේ මොකක්ද? "ලෝකයේ අලුත් ගමන මේක, ලෝකයත් එක්ක, ලෝකයේ මේ පෞද්ගලීකරණයත් එක්ක අපි ඉස්සරහට යන්න ඕනෑ, මේ ළිං මැඩියන්ට මේක තේරෙන්නේ නැහැ, රජයට මේ හැම එකම කරන්න බැහැ, ඒ නිසා ඒවා ටික ටික වෙළෙඳ පොළ බලවේගවලට දීලා, අද අරහේ මෙහෙමයි, මෙහේ මෙහෙමයි, එහෙම ගමනක් තමයි අද අපට යන්න තිබෙන්නේ." කියන ප්‍රධාන බණ පදය තමයි - මේක තමයි - මෙතුමන්ලාගෙන් අපට අහන්න ලැබුණේ. නමුත් ඉතිහාසයේ දෛවයේ සරදමකට වගේ එදා ඒ අප ඉදිරිපත් කරපු අදහසට අද එක්තරා ආකාරයක වලංගු බලයක් ලැබිලා තිබෙනවා. අද මේ ගෙනැවිත් තිබෙන අය වැය ඇතුළේ ඒ පරණ කෙඳිරිය නැහැ; ඒ පැරණි යල් පැන ගිය කෙඳිරිය නැහැ. මේ තිබෙන අය වැය පරතරය පියවන්න, මේ රටේ මේ අහවල් සම්පත් ටික විකුණන්න ඕනෑයි කියන ඒ පදය මේ අය වැය ලේඛනය ඇතුළේ නැහැ. ඒක ඉතා වැදගත් කාරණයක් හැටියට අප සලකනවා. ඒක ගේන ආණ්ඩුව ඇතුළේ ඊට ප්‍රතිවිරුද්ධ මත දරපු අය හිටියා වුණාට ඒ අය අතින් හරි ඒ අපි කාලයක් තිස්සේ මතු කරපු ආර්ථික වැරදි ගමන් මඟ වෙනස් කිරීමේ දිශාවට පියවරක් තියනවා නම් ඒ පියවර අගය නොකර ඉඳීමේ කුහකවතක් ආරක්ෂා කරන්නට අපට අවශ්‍ය නැහැ, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. ඒ නිසා අපි මූලික වශයෙන් දකිනවා, මෙන්න මේ වැදගත් කාරණය. යුද්ධය සම්බන්ධ ප්‍රශ්නය ගත්තත්, බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජයට පත් කළ හැකියි, පරාජයට පත් කළ යුතුයි කියන මතය - මුල සිට දරපු ඒ මතය - සමාජගත කරන්න මැදිහත් වෙච්ච උදවිය අපි. ඒ කාලේ මේ ආණ්ඩුවේ අද ඉන්න බොහෝ ඇමතිවරු, "එහෙම කොහොමද කරන්නේ? යුද්දෙන් බැහැ මේක, සාකච්ඡාවෙන් කරන්න පුළුවන්, සාකච්ඡාවෙන් ඇරෙන්න කොහෙන් යුද්ධ කරන්නද?" කියලා අපට පෙරළා ප්‍රතිප්‍රහාර එල්ල කරපු අය. දැන් මේ මෙතැන ඉන්න ගරු ඇමතිතුමන්ලා අතරත් එහෙම කියපු අය ඉන්නවා. ඉතින් එහෙම කියපු අය වුණත් අද ඒ තමන් කලින් දරපු මතය පැත්තකට දාලා -පැත්තකට දාලා හෝ තියා ගෙන හෝ තමන් ගාව තියා ගෙන හෝ- බෙදුම්වාදී ත්‍රස්තවාදය පරද වන යුද ක්‍රියාදාමය ඉදිරියට ගෙන යනවා නම් ඒක ගැන සතුටු වන්න අපට අර අදහස බාධාවක් නොවෙයි. අර කලින් දරපු ස්ථාවරය හෝ තවමත් තිබෙන ඒ තනි ස්ථාවරය හෝ අපට බාධාවක් නොවෙයි. ඒ නිසා වැදගත් දේ වන්නේ, මූලික දිශානතිය මොකක්ද යන්නයි. ජාත්‍යන්තර තැරැව්කාර වෙළෙඳ පොළ බලවේගයන්ගේ න්‍යාය පත්‍රයට යට වූ ගමනක්ද යන්නේ, එහෙම නැත්නම් ඒකට ප්‍රතිවිරුද්ධ ගමනක්ද යන්නේ? වැදගත් වන්නේ මෙන්න මේ කාරණය. ඒ යට වූ ගමනක් නම් යන්නේ ඒ යන්නේ කවුද කියන එක අපට වැදගත් නැහැ. ඊට ප්‍රතිවිරුද්ධ ගමනක් නම් යන්නේ ඒ යන්නෙත් කවුද කියන එක අපට වැදගත් නැහැ. ඒ නිසා අපට හොයලා බලලා දැන ගන්න තිබෙන්නේ මේ අය වැය යෝජනාවලිය ඇතුළේ දිශානතිය කුමක්ද, ලෝක බලවතුන්ගේ නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්තියේ න්‍යාය පත්‍රයට යටත් වුණු ගමනක්ද, ඊට ප්‍රතිවිරුද්ධව ජාතියේ නිෂ්පාදකයාව, ජාතියේ නිෂ්පාදන හැකියාවට පණ දෙන රාජ්‍යය සතු සම්පත් වෙළෙඳ පොළ බලවේගයන්ට විකුණන් කන්න ඉඩ නොදෙන ගමනක්ද යන්නේ කියන එකයි. මෙච්චරයි මේක දිහා බලද්දී ප්‍රධාන වශයෙන්ම අපට සලකා බලන්න තිබෙන වැදගත් කරුණ ගරු ස්වමීන් වහන්ස. එහෙම බැලුවාම තමයි අපට පෙනෙන්නේ; එහෙම බැලුවාම තමයි අපට පැහැදිලිව පෙනෙන්නේ මූලික වශයෙන් මේ අය වැය ලේඛනයේ දිශානතිය. මේ අය වැය ලේඛනයේ එල්ල වෙලා තිබෙන දිශාව කවර ලෙසකින්වත් අර නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික න්‍යාය පත්‍රයට ඕනෑ කරන දිශාව නොවෙයි කියන එක අප ඉතාම පැහැදිලිව දකිනවා. ඒ දිශාවට, නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික න්‍යාය පත්‍රය දිශාවට නොවැටුණු අය වැයක් ගෙන එන ආණ්ඩුව ඇතුළේ ඊට වෙනස් මත දරන ඇමතිවරු ඉන්නවා වන්න පුළුවන්. ඒ පරස්පරය තියෙනවා වෙන්න පුළුවන්. ඒ පරස්පරය ගැටුමක් වෙන්න පුළුවන්, බාධාවක් වෙන්න පුළුවන්. ඒ මොනවා වුණත් අය වැය ලේඛනය තුළ ඒ පරස්පරය නැහැ. ඒ යෝජනාවලිය තුළ ඒ පරස්පරය නැහැ. අපි දන්නවා මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, පොළොව තමා වටා භ්‍රමණය වෙමින් ඉර වටා පරිභ්‍රමණය වනවාය කියපු, ඒ මහා සත්‍ය ප්‍රකාශයට පත් කරපු වරදට විද්‍යාඥ ගැලීලියෝ ගැලීලිට මරණීය දණ්ඩනය උරුම වුණා. එකම හේතුව, ක්‍රිස්තු දර්ශනයේ තිබුණු දෙවියන් වහන්සේ විසින් මේ සියල්ල මැව්වාය කියන සත්‍යය මේකෙන් බිඳ වැටේවිය කියන භය ඇති වූ නිසයි. එදා ඒ ආගමික සංස්ථාව කලබලයට පත් වෙලා, පොළොව තමා වටා භ්‍රමණය වෙමින් ඉර වටා පරිභ්‍රමණය වනවාය කියලා කිව්ව ගැලීලියෝ ගැලීලිව මරණයට පත් කළා. නමුත්, ඊට අවුරුදු 359කට පස්සේ, ඒ

කියන්නේ දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේගේ කාලයේ, 1992 ඔක්තෝබර් 31 දින දෙ වන ජුවාම් පාවුළු පාප් වහන්සේ ප්‍රකාශයට පත් කළා, එදා ගැලීලියෝ ගැලීලි කියපු එක හරිය කියලා. ඒ, ගැලීලියෝ ගැලීලි ජීවිතය පුදලා අවුරුදු 359කට පස්සේයි. දෙ වන ජුවාම් පාවුළු පාප් වහන්සේ 1992 එහෙම කියන කොට ගැලීලියෝ ගැලීලි මරණය ලබා වෙන කොහේ හරි ඉඳන් මේක අහ ගෙන හිටියා නම් සතුටක් ඇති වනවා. ගැලීලියෝ ගැලීලිගේ පැත්තෙන් බැලුවොත්, ඔහුට මරණය ගෙන එන ලද සංස්ථාවම තමයි නැවත ඔහු නිවැරදියි කියලා කිව්වේ. නමුත් ඒ කාරණය ගැන සතුටට පත් නොවී ඉන්න ගැලීලියෝ ගැලීලිට පුළුවන්කමක් නැහැ, ඔහු කොහේ හරි ඉඳ ගෙන ඒක අහගෙන හිටියා නම්. ඒ වගේ මේ රටේ ජාතික ආර්ථික ගමනකට යොමු වෙන්න ඕනෑය කියපු, මේ රටේ ජාතික නිෂ්පාදනයට පණ දෙන්න ඕනෑය කියපු, මේ රටේ රාජ්‍ය සම්පත් විකුණන එක නතර කළ යුතුයි කියලා කියපු, රජය ආර්ථිකයේ ප්‍රබල භූමිකාවකට අවතීර්ණ විය යුතුයි කියලා කියපු, ඒ වාගේම විදේශ පරිභෝජන මත යැපෙන තනිකර රඳා පවතින ජාතියක් වෙනුවට ආහාර සුරක්ෂිතභාවය, ආහාර නිෂ්පාදනමය ක්‍රියාවලිය පණ ගැන්විය යුතුයි කියලා කියපු, ජාතිය බලමුළු ගැන්විය යුතුයි කියලා කියපු අපට, ඒ දෘෂ්ටි කෝණය මත ඉඳලා මේ අය වැය දිහා බලා සලකා බලන්න වෙන්නේ, මේ අය වැය ඒ අපි දරන ලද මතයට සමගාමීව යන අය වැයක් හැටියටයි.

මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, ඒ නිසා අපි ඉතාම පැහැදිලි කාරණයක් කියන්න කැමැතියි. මේ අය වැය ලේඛනය තුළ පෞද්ගලීකරණය ඉදිරියට ගෙන යාමක් නැති කාරණය අපි ඉතා වැදගත් කොට සලකනවා. ඒ වාගේම රාජ්‍ය අංශය ආර්ථිකය භූමිකාවෙන් පිටමං කිරීමක් මේක ඇතුළේ නැහැ. අපට 2001 සිට 2004 දක්වා වූ කාලය ඇතුළත එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ අය වැය යෝජනාවන් ඇතුළේ තිබුණු ප්‍රධාන ගැටුම මේකයි. එනම් ක්‍රමානුකූලව රාජ්‍ය අංශය හකුළුවනවා. වෙළෙඳ පොළ බලවේගයන්ට සම්පූර්ණයෙන් සියල්ල භාර දෙනවා. මේ අය වැය ලේඛනය තුළ ඒ අවදානම නැහැ. රාජ්‍ය අංශය හැකිළ වීම හෝ වෙනත් විදේශීය වෙළෙඳ පොළ බලවේගයන්ට මේ රටේ ආර්ථිකය පාවා දීමේ සලකුණු මේක ඇතුළේ දකින්න නැහැ. අනික් අතට දේශීය නිෂ්පාදකයාට, මේ රටේ ව්‍යවසායකයාට ඔහුගේ නිෂ්පාදන ක්‍රියාදාමය ඉදිරියට ගෙන යාම සඳහා සැලකිය යුතු සහයෝගයක් මේ අය වැය යෝජනාවලියෙන් ලැබිලා තියෙනවා. මේවා ඉතාම දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ දේශපාලන ක්‍රියාවලිය තුළ හිඳිමින් අප ඉදිරිපත් කරපු චුවමනාවන්. අප පෙනී හිටිය සත්‍යයන්. මේ රටේ නිෂ්පාදන හැකියාව පණ ගන්වන්නේ නැතිව, මේ රටේ ස්වදේශික ව්‍යවසායකයාව බලසම්පන්න කරන්නේ නැතිව ලෝකයේ අද පවතින ගෝලීය අධිරාජ්‍යවාදී බලවේගවලින් එන මේ මහා ආර්ථික වියවුලට මුහුණ දෙන්න පුළුවන්කමක් කිසි ලෙසකින්වත් කිසිම රටකට ලැබෙන්නේ නැහැ.

අපි දන්නවා මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, මේ අපි කථා කරන වේලාව වන කොට ඇමෙරිකා එක්සත් ජනපදය විශාල මූල්‍ය කඩා වැටීමකට ලක් වුණු ආර්ථිකයකට හිමිකම් කියන රටක් බවට පත් වී තිබෙන බව. පසු ගිය දා ජයග්‍රහණය කරපු බැරක් ඔබාමාගේ ජයග්‍රහණයට පවා ඒ මූල්‍ය කඩා වැටීම විසින් ඇති කරන ලද විශේෂ තත්ත්වය පවා හේතු වුණු බව අප කවුරුත් දන්නවා. ඒ ආර්ථික අස්ථාවරභාවය විසින් තිගැස්සුණු ඇමෙරිකානු සමාජය ඉතිහාසයේ පළමු වන වතාවට කළු ජාතික සම්භවයක් තිබෙන පුද්ගලයකුව, ඇමෙරිකානුවකුව තමන්ගේ රටේ ජනාධිපති බවට පත් කර ගන්න තීරණය කළා. අවසානයේ ජෝර්ජ් බුෂ්ට - වෙළෙඳ පොළ බලවේගයන්ගේ ගමනින් තමයි ලෝකයේ ආර්ථිකය ප්‍රසාරණය වෙන්නේ, ඉදිරියට යන්නේ කියන මන්තරය ජප කරපු ඒ මහ දෙවොලේ වැඩ සිටින ප්‍රධානතම දෙවියන්ට- සිද්ධ වුණා, වහාම රජයේ මුදල් බිලියන ගණනක් යොදවා ඒ මූල්‍ය සමාගම්වල රජයේ පංගුව, පාලනය වැඩි කර ගන්න; තර කර ගන්න. එතැනදී තමයි වෙනිසියුලාවේ ජනාධිපති චාවේස් ප්‍රසිද්ධියේ කිව්වේ, -අපහාසයකට මෙන් අවමානයකට මෙන් කිව්වේ- "දැන් ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් මහත්මයාත් මා වාගේ සමාජවාදියකු වෙලා" කියලා. ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇති වෙච්ච ආර්ථික වියවුලෙන්, කඩා වැටීමෙන්, අර්බුදයෙන් අපට පේනවා, ඒ නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථිකයේ රන් දෙවොල, ඒ මුදුන් මල් කඩ බඳු වෙච්ච එක්සත් ජනපදයටත් ඒ ආර්ථික ක්‍රමයේ රැකවරණය ලැබී නැති බව; ආරක්ෂාව ලැබී නැති බව; සුරක්ෂිතභාවය නිර්මාණය වෙලා නැති බව. එම නිසා රන් දෙවොල අද බිඳ වැටෙනවා. ඒ ආර්ථිකයේ සිහින බුබුළ අද ඇස් පනා පිට බිඳ වැටෙන්නට පටන් ගෙන තිබෙනවා. එම නිසාමයි මේ ලෝක තත්ත්වය යටතේ අපේ රට වාගේ රටවල ස්වදේශික නිෂ්පාදන හැකියාව වැඩිවැඩියෙන් පණ ගැන් වීමත්, ජාතික ආර්ථිකය තුළ රාජ්‍ය භූමිකාව වැඩිවැඩියෙන් සවි බල ගැන්වීමත් අත්‍යවශ්‍ය වන්නේ; වැදගත් වන්නේ. එහෙම නැත්නම් මේ ඇති වෙන අවපාතයට මුහුණ දීමේ හැකියාවක් අපේ රට වාගේ රටවලට ලැබෙන්නේ නැහැ.

දැනට ඒ ලෝක පරිමාව වර්ධනය වන අර්බුදයට වුණත් මේ සා ප්‍රමාණයකින් හෝ මුහුණ දීමේ හැකියාවක් අපට ලැබී තිබෙනවා නම් ලැබී තිබෙන්නේත් මේ ශක්තිය එක්තරා ප්‍රමාණයකට හෝ රැක ගෙන සිටින නිසා මිස වෙන හේතුවක් නිසා නොවෙයි. අර "Regaining Sri Lanka" සැලැස්මේ තිබුණු විධියට සියලු රාජ්‍ය අංශය දවසින් දවස කුඩා කළා නම්, මූල්‍ය වෙළෙඳ පොළ, බැංකු ටික ඔක්කොම පුද්ගලීකරණය වුණා නම් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardene - Minister of Cultural Affairs)
ගරු කථානායකතුමනි, " මේ අවස්ථාවේදී ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි මූලාසනයෙන් ඉවත් වුයෙන් ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு (வண.)உடவத்தே நந்த தேரர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *left the Chair, and* THE HON. GAYANTHA KARUNATILEKA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අනුකම්පාව අනුව ඊට වඩා වැඩි වේලාවක් ලබා දේවිය කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ කාරණය ඉතාම පැහැදිලියි. මේ අය වැය යෝජනාවලියෙන් අද මේ රට මුහුණ පා තිබෙන සකල ආර්ථික අර්බුදවලට උත්තර හම්බ වෙලාය කියා අප කියන්නේ නැහැ. එහෙම උත්තර හම්බ වෙලා නැහැ. මේ අය

වැය යෝජනාවලිය ඇතුළේ නොසලකා හැරීමට ලක් වෙච්ච ඕනෑ තරම් ක්ෂේත්‍ර තිබෙනවා. මේ අය වැය ලේඛනය ඇතුළේ අවධානයට ලක් නොවුණු ඕනෑ තරම් ක්ෂේත්‍ර තිබෙනවා. මේ රටේ විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව වෙනස් කිරීම සම්බන්ධ බලාපොරොත්තුව මේ අය වැය ලේඛනයෙන් ආවරණය වෙලා නැහැ. ආරක්ෂක හමුදාවල ඉන්න ස්වේච්ඡා සෙබළුන්ගේ දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන දුක් ගැනවිලි මේ අය වැයෙන් ආවරණය වෙලා නැහැ. ඒ වාගේම මිහින් ලංකා වැනි ආයතනවලට විශාල මුදලක් යොද වනවාට වඩා ජාතියේ ප්‍රමුඛත්වය යොමු විය යුතු ආයතන කෙරෙහි මේ අය වැයෙන් අවධානය යොමු විය යුතුයි. නමුත් එය සිද්ධ වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි. අද රට මුහුණ දී තිබෙන අභියෝගයට සාපේක්ෂව තිබෙන ඒ අභියෝගය සම්පූර්ණයෙන්ම දරා ගන්න සූදානමක් මේ අය වැය තුළ තිබෙනවාය කියා අප කියන්නේත් නැහැ. නමුත් අප දකින එක දෙයක් තිබෙනවා. මූලික දිසානතියේ වැරැද්දක් නැහැ. ඒක කියන්න බැරි වන්නට අපට බැහැ. මූලික දිසානතියේ වැරැද්දක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ලොකුම පරස්පරයයි මේක. ඇත්ත ගැටුම තිබෙන්නේ අය වැය ලේඛනය ඇතුළේ නොවෙයි. අය වැය ලේඛනයයි, ව්‍යවහාරයයි අතර ගැටුමක් එන්නට පුළුවන්. ආණ්ඩුව සමන්විත වෙලා තිබෙන්නේ පරස්පර විරෝධයන්ගේ එකතුවකින්ය කියන එක අප දන්නවා. මේ අය වැය ලේඛනය තුළින් ඉදිරිපත් කරන දර්ශනයට පටහැනි දර්ශනයක් දරන ඕනෑ තරම් පිරිස් ඔය ආණ්ඩුව ඇතුළේ ඉන්නවා. මේ අය වැය යෝජනාවලියෙන් පෙන්නුම් කරන දැක්ම, එය ඉදිරිපත් කර තිබෙන දිසානතිය සාක්ෂාත් කර ගන්න නම්, ඒ ඉලක්ක කරා යන්න නම් ඉතාමත් බල සම්පන්න මෙහෙයුමක් තිබිය යුතු වෙනවා. එසේ නැතිව ගෙවුණු අවුරුදුවල වාගේ රජයේ යන්ත්‍රණයයි, දේශපාලන තන්ත්‍රයයි, නිලධාරි යන්ත්‍රණයයි, මේ අය වැයෙන් කියන කතාවයි අතර පරස්පර විරෝධය මතු වන්නට ආවොත්, මේ කථාවයි ප්‍රායෝගිකභාවයයි අතර සම්පාත වීමක් නොවන්නට පුළුවන්. පරස්පර විරෝධයේ ගැටුම ඒ ආකාරයකට මතු වන්නට පුළුවන්. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඉතා වැදගත් කොට සලකන්නේ අය වැය ලේඛනය තුළ තිබෙන සාරය ප්‍රායෝගිකව එළ දරන තත්ත්වයකට ගෙන ඒමයි. එයයි ඉතාම වැදගත් වෙන්නේ. එහෙම නැතිව මේවා අවුරුද්දකට වතාවක් කරන අලංකාර කථා බවට පමණක් පත් වෙනවා. මේ රටේ අය වැය ලේඛන අපේ සමාජ ජීවිතයත් එක්ක, නිෂ්පාදන ජීවිතයත් එක්ක තදින් බැඳුණේ නැති යුගයක් පසු කරලායි අද මේ රට මෙතැනට ඇවිත් තිබෙන්නේ. හැම අය වැයකින්ම පස්සේ රටේ නිෂ්පාදන ක්‍රියාවලියේ වෙනසක් වුණාද නැද්ද? හැම අය වැය ලේඛනයකින් පස්සේ සමාජ ජීවිතයේ වෙනසක් වුණාද නැද්ද? හැම අය වැයකින්ම පස්සේ මිනිසුන්ගේ ජීවන රටාවේ වෙනසක් වුණාද නැද්ද? එහෙම වෙනසක් කරන්න බැරි අය වැය ලේඛනයකින් මොකක්ද තිබෙන තේරුම කියන ප්‍රශ්නය අපේ රටේ මිනිසුන් අපෙන් අහනවා. එම නිසා වැදගත් වෙන්නේ මෙයයි. ඒ නිසා මේ අය වැය ලේඛනයෙන් පෙන්නුම් කරන දිශාව නිවැරදියි වාගේම ඒ නිවැරදි දිශාවට සමාජය මෙහෙයවන්න තිබෙන වැඩ පිළිවෙළයි අත්‍යවශ්‍ය වෙන්නේ. ඒ වැඩ පිළිවෙළ සමඟ බැඳිලා මොකක්ද යන ගමන කියන එකයි වැදගත් වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න එතැනදී තමයි අපි විශ්වාස කරන්නේ සැබෑ ප්‍රතිවිරෝධය, සැබෑ ගැටුම මතු වන්න පුළුවන් තැන කියලා. අපි දන්නවා, රුසියාවේ පුටින් බලයට පත් වන විට පුටින්ට ප්‍රධාන අභියෝග දෙකක් තිබුණ බව. එකක් තමයි චෙච්නියානු බෙදුම්වාදී ත්‍රස්ත ව්‍යාපාරය මර්දනය කිරීමේ අභියෝගය. චෙච්නියානු බෙදුම්වාදී ව්‍යාපාරයට බටහිර හා යුරෝපා බලවේග සැහෙන සහයෝගයක් දුන්නා. ඒ මඟින් රුසියාව තවදුරටත් අස්ථාවර කරන්න ඒ අය බැලුවා. පුටින්ට ප්‍රධාන අභියෝගයක් තිබුණා, චෙච්නියානු බෙදුම්වාදී ව්‍යාපාරය සහමුලින්ම අවසන් කිරීමට. ඒ වාගේම පුටින්ට තිබුණු, සමානව තිබුණු අනික් අභියෝගය තමයි යෙල්ට්සිංගේ පාලන කාලය ඇතුළත සම්පූර්ණයෙන් නැති භංග වෙලා තිබුණු, නාස්ති කර තිබුණු රුසියානු ආර්ථිකය නැවත සවිබල ගැන්වීම. වෙන අර්ථයකින් කිව්වොත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඉදිරිපිටත් තිබුණේ සමාන්තරව මේ අභියෝග දෙක. එතැන චෙච්නියානු බෙදුම්වාදය පරද වනවා වාගේ මෙතැන බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය පැරද වීමේ අභියෝගය තිබෙනවා. අනික් අතට මෙතැන මේ රටේ හතර ගාතින් ඇද වැටිලා තිබෙන ආර්ථිකය ගොඩ නැංවීමේ අභියෝගය තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපට පෙනෙන්නේ නැහැ, අය වැය තුළින් මේ පෙන්වන දර්ශනය ප්‍රායෝගික භාවිතාවේදී ඒ ලෙසම ගැළපිලා ක්‍රියාවට නැංවෙනවාය කියා. ඒ නිසා තමයි අපි කියන්නේ කොටි ත්‍රස්තවාදය පැරද වීමේ අභියෝගය පමණක් නොවෙයි, ඒ අභියෝගය සමඟම රටේ ආර්ථිකය නියමානුකූලව ගොඩ නැංවීමේ අභියෝගයත් තිබෙනවා කියා. ඒ ආර්ථිකය නියමානුකූලව ගොඩ නැංවීමේ අභියෝගය සාර්ථකව ජය ගන්න බවක් මේ ආණ්ඩුව මෙතෙක් පෙන්නුම් කර නැහැ. මේ අය වැයෙන් පෙන්වන දර්ශනයයි ප්‍රායෝගික භාවිතාවයි අතර මෙතෙක් ගැටුමක් තිබෙනවා. ඒ ගැටුම සමනය කර ගන්න බැරි නම්, ඒ ගැටුම නිමා කර ගන්න බැරි නම්, ඒ පරස්පර විරෝධය අවසන් කර ගන්න බැරි නම්, අය වැයෙන් පෙන්නුම් කරන දර්ශනයත් භාවිතාවත් අතර ගැටුම ඉතුරු වෙනවා නම්, මේ රටේ සමාජ නිෂ්පාදන ජීවිතයත් එක්ක බැඳුණු අය වැයක් බවට මෙය පත් වන්නේ නැහැ. ඒ නිසා තමයි අපි විශ්වාස කරන්නේ, අත්‍යවශ්‍යයි කියා අපි සලකන්නේ, ඉතාමත්ම වැදගත් යැයි අපි සලකන්නේ මෙන්න මේ පරස්පර විරෝධය සමනය වෙන්න ඕනෑය කියන එක. ඒ කාරණය අවධාරණය කරමින්, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. අද රටේ පවතින තත්ත්වය -බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය පරාජයට පත් කිරීමේ අභියෝගය- හමුවේ මේ රටේ තීරණාත්මක සටනට මුහුණ දෙමින් සිටින කාල පරිච්ඡේදයක් ඇතුළේ රටේ ආර්ථික සම්පත් විකුණා ගෙන කන දිශාවට රටේ ආර්ථිකය ගෙන නොයන අය වැයක් ගෙන ඒම සම්බන්ධයෙන් අපේ ප්‍රසාදය පළ කරනවා. ජාතික නිදහස් පෙරමුණ මේ රටත්, ජනතාවත් වෙනුවෙන් මේ ඉදිරිපත් කර තිබෙන අය වැය කෙරෙහි සහයෝගය පළ කරමින් අය වැයත් ආණ්ඩුවේ ප්‍රායෝගික භාවිතාවත් පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නය කියා ඉල්ලා සිටිමින් මම මගේ කරුණු ස්වල්පය අවසන් කරනවා. ඔබතුමාට ස්තුතියි.

[අ.භා. 2.39]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ හතර වන අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන වෙලාවේ ඒ අය වැය ලේඛනය දිහා බැලුවොත් ඉතාමත්ම පැහැදිලිව පෙනෙන කාරණයක් තමයි දේශීයත්වයේ ලේබල් එකට යට කර මේ රටේ ජනතාවගේ සාක්කුවට තට්ටු කළ අය වැය ලේඛනයක් බව. මේ අය වැය ලේඛනය ගෙනෙන්න ඉස්සෙල්ලා විශාල ශබ්දයක් කළා. ඒ ශබ්දයේ තරමට මේ අය වැය ලේඛනයෙන් ජනතාවට වැඩක් වෙලා නැහැ කියන කාරණය අපි පැහැදිලිව සඳහන් කරනවා. ඒ මොකද, අය වැය ලේඛනයක මූලික බලාපොරොත්තු සියල්ලම අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මේ අය වැය ලේඛනයෙන් එහෙම පිටින්ම බිඳ දමා තිබෙනවා. මොකක්ද මේ අය වැය ලේඛනයකින් බලාපොරොත්තු වන්නේ? අය වැය ලේඛනයක මූලික බලාපොරොත්තුව තමයි රටේ ජනතාවගේ ජීවන බර සැහැල්ලු කිරීම; රටේ උද්ධමනය පාලනය කිරීම; විරැකියාව තුරන් කිරීම; රැකියා අවස්ථාවන් සුලභ කිරීම; නිෂ්පාදනය වැඩි කිරීම; ඒ සඳහා අවශ්‍ය ආයෝජනය වැඩි කිරීම හා ශක්තිමත් කිරීම. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනයෙන් එවැනි කිසියම් හෝ වැඩ පිළිවෙළක් යෝජනා වුණා ද කියා බැලුවාම පැහැදිලිව පෙනෙනවා, එහෙම වෙලා නැහැ කියා. එහෙම නම් මේ අය වැය ලේඛනයේ සමස්තය ගත්තොත් ඉතාමත් කනගාටු දායකයි. විශේෂයෙන්ම මම කියනවා, මේ අය වැය ලේඛනය මඟින් සුපුරුදු පරිදි නැවත වතාවක් මහජන බලාපොරොත්තු බිඳ දමා, ඒ වාගේම මහජන අපේක්ෂාවන් බිඳ දමා මේ රටේ සීමිත කණ්ඩායමක් ජීවත් කර වන්න, සීමිත කණ්ඩායමක් ආරක්ෂා කර වන්න මේ සමස්ත අය වැය යෝජනා හදා තිබෙනවාය කියා.

බලන්න, අද මේ අය වැයේ සමස්ත වියදම රුපියල් බිලියන 1,192යි. සමස්ත ආදායම රුපියල් බිලියන 855යි. අය වැය හිඟය රුපියල් බිලියන 337යි. කොහොමද මේ ඇස්තමේන්තු පිළිබඳව අප විශ්වාස කරන්නේ? පසු ගිය අය වැය ලේඛනය දිහා බැලුවාම ගිය අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කර ඊට පස්සේ අවුරුද්ද පුරාම මේ වාගේ අය වැය ලේඛනයෙන් පිට පරිපූරක ඇස්තමේන්තු 14ක් ඉදිරිපත් කර තිබෙනවා. මේ අය වැය ලේඛනයේ මූලික වියදම රුපියල් බිලියන 1,192යි. ඊට පස්සේ මේ අවුරුද්දේ 2009 එවැනි යෝජනා ඉදිරිපත් කරන්නේ නැහැ කියා මේ සභාවට සහතික වන්න පුළුවන්ද? පසු ගිය 2008 අය වැය ලේඛනය ඉදිරිපත් කර රුපියල් බිලියන 14.9ක පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙනවා. මේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කළාම මොකද වෙන්නේ? මේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන විට රජය ඕනෑම විධියකට මේ පරිපූරක ඇස්තමේන්තු සඳහා මුදල් ලබා ගැනීමේ උපක්‍රම යොදනවා. මේකේ ප්‍රතිඵලය වෙන්නේ මේ රටේ ජනතාවට අය වැය ලේඛනයෙන් පිට විශාල බදු බරක් පටවමින් තවත් මේ රටේ ජනතාව අමාරුවට අපහසුවට දමන යෝජනා ආණ්ඩුව ඉදිරිපත් කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනය මුදල් මුද්‍රණය කර අය වැය හිඟය පියවන අය වැය ලේඛනයක්. එතැනින් එහාට මොකුත් නැහැ. බලන්න, මේ අය වැය ලේඛනය මහ ලොකුවට ජනතාවාදී, දේශ ප්‍රේමී අය වැය ලේඛනයක් කියා කියන්න ආණ්ඩුව උත්සාහ දරනවා. මොකක්ද වෙලා තිබෙන්නේ? මේ අය වැය ලේඛනයේ ඉතාමත් පැහැදිලිව තිබෙන කරුණක් තමයි ආණ්ඩුව හංගලා සියලු දේවල් කර තිබෙන එක. දේශීයත්වයේ ලේබල් එක අලවලා අනික් පැත්තට මහජනයාගේ සාක්කුවෙන් ඇදලා අර ගෙන තිබෙනවා, මහජනයාත් දන්නේ නැතිව. මේකේ එක පැත්තකින් කියනවා, තිරිඟු පිටි මත අය කරන තීරු බද්ද සියයට 6 සිට සියයට 10 දක්වා වැඩි කරනවාය කියා. තිරිඟු පිටිවලට ද්විත්ව බද්දක් තිබෙනවා. එක පැත්තකින් කියනවා, දේශීය නිෂ්පාදන ආරක්ෂා කරන්න සෙස් බද්දක් අය කරනවාය කියා. මේ නිසා දැන් තිරිඟු පිටිවලට ද්විත්ව බද්දක් එකතු වෙනවා. මොකක්ද මේකේ ප්‍රතිඵලය වෙන්නේ? දේශීය නිෂ්පාදනය වැඩි කරන්න නම් දේශීය නිෂ්පාදනවලට අත දෙන්න නම් කුරක්කන්වලට, කව්පිවලට, තලවලට මේ වගේ විශාල බදු එක වර පනවා හරි යන්නේ නැහැ. ඒ වෙනුවට රටේ ආදේශක නිෂ්පාදන වැඩි කරන්න පුළුවන් මාර්ගයක් ආණ්ඩුව හදලා දෙන්න ඕනෑ. එහෙම කරන්නේ නැතිව තිරිඟු පිටි බද්ද වහාම මේ විධියට පැන වුයේ ඇයි? ඒක ලෙහෙසියෙන්ම ආණ්ඩුවට බදු ලබා ගන්න පුළුවන්, ආදායම ලබා ගන්න පුළුවන් මාර්ගයක් බව ආණ්ඩුව දන්නවා. එම නිසා පාරිභෝගිකයාට මේ පරිභෝජනයෙන් ඉවත් වෙන්න පනවන බද්දක් නොවෙයි මේක. මේ විශාල නාස්තිකාර වියදම් සොයන්න, පහසුවෙන් බදු එකතු කර ගන්න පුළුවන් මාර්ගයක් හැටියට තමයි මේ තිරිඟු පිටි මත බද්ද අය කර තිබෙන්නේ. මේ නිසා පාන් රාත්තලේ මිල වැඩි වෙනවා; බනිස් ගෙඩියේ මිල වැඩි වෙනවා; පිටිවලින් නිෂ්පාදනය කරන හැම ආහාර වර්ගයකම මිල වැඩි වෙලා මහජනතාව විශාල අපහසුතාවකට පත් වෙනවා. බලන්න, කිරි පිටි බද්ද ගැන අය වැය ලේඛනයේ කියන කථාව. "දේශීය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කිරි පිටි කිලෝ එකකට රුපියල් 5 සිට 15 දක්වා බද්දක් අය කරනවා"ය කියලා කිව්වා. මොකක්ද සිදු වෙන්නේ? ජනාධිපතිතුමාම ඊයේ කිව්වා, මේ රටේ දේශීය වශයෙන් කිරි නිෂ්පාදනය තිබෙන්නේ සියයට 25යි කියලා. හැබැයි සියයට 25ක නිෂ්පාදනයක් පවතිද්දී සියයට 75ක් නිෂ්පාදනය කරන්න අපට නොහැකියාව තිබෙද්දීත් නිෂ්පාදනය වැඩි කරන්න ගන්න ක්‍රියා මාර්ගය එක වසරකින් වැඩි කරන්න පුළුවන්ද? මේ අවුරුද්ද වෙන කොට සියයට 75ක් පිට රටින් ආනයනය කරනවා නම්, ඒ ආනයනයේ හිඟය පියවා ගන්න ක්‍රමයක් එක පාරම සකස් කරන්න අමාරු බව ඕනෑම කෙනකුට පෙනෙනවා. එසේ තිබියදීත් මොකක්ද මේ කර තිබෙන්නේ? කිරි පිටි කිලෝ එකකට රුපියල් 5 සිට 15 දක්වා බද්දක් අය කර තිබෙනවා. මා අහන්නේ එහෙම නම් ළදරු කිරි පිටිවලට සහනයක් තිබෙනවාද කියලායි. ළදරු කිරි පිටිවලට මෙහෙම සහනයක් නැහැ. සෑම කිරි පිටි වර්ගයකටම බද්දක් අය කර තිබෙනවා. සත්ව ආහාරවලට සෙස් බද්දක් අය කර තිබෙනවා. දැන් මෙහෙම කරන්නේ ඇයි?

දැන් බලන්න, සීනි මත අය කරන බද්ද රුපියල් 14 සිට 16 දක්වා වැඩි කර තිබෙනවා. අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට කිව්වා, තල් හකුරු, කිතුල් හකුරු නිෂ්පාදනය වැඩි කරන්න, ඒ සඳහා ධෛර්ය දෙන්න තමයි මේ වාගේ බද්දක් අය කරන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අහනවා, කිතුල් ගස් හදලා, තල් ගස් හදලා, ලබන අවුරුද්දේ මේ නිෂ්පාදනය වැඩි කරලා, එයට මහජනයා හුරු කරන්න පුළුවන්ද කියලා. දැන් මේකෙන් සිදු වන්නේ මොකක්ද? පහසුවෙන් පරිභෝජනය කරන ද්‍රව්‍යවලට මේ විධියට බදු අය කරපුවාම, ආණ්ඩුවට ආදායමක් ඇති කර ගන්න පහසුයි. ආණ්ඩුව පරිභෝජන ද්‍රව්‍ය මත බදු පැනෙව්වාම මහජනයා අනිවාර්යයෙන්ම වක්‍ර බදු වශයෙන් ඒවා ගෙවනවා. එතකොට සෘජු බදු අය කර ගන්න ක්‍රමයක් නැති වුණාම මේ විධියට වක්‍ර බදු වශයෙන් පරිභෝජන ද්‍රව්‍ය මත බදු පනවා ආණ්ඩුවේ අය වැය හිඟය පියවා ගන්න පහසුම ක්‍රියා මාර්ගය තමයි මේ ඇති කර තිබෙන්නේ. මේ සඳහා වන්දි ගෙවන්නේ කවුද? මේ සඳහා වන්දි ගෙවන්නේ මේ රටේ සෑම පුරවැසියකුමයි. මේ රටේ සෑම පුරවැසියකුම මේ සඳහා බදු ගෙවන මට්ටමකට පත් වෙලා තිබෙනවා.

දැන් පිට රටින් ගෙන්වන කඩදාසි සඳහා සෙස් බද්දක් අය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය කිරීම නිසා සිදු වන්නේ මොකක්ද? පාසල් දරුවාගේ කොපි පොතේ සිට පත්තර පිටුව දක්වා සියලුම දේවල මිල ගණන් ඉහළ යාමයි. ඇඹිලිපිටිය, වාලච්චේන කර්මාන්තශාලා නඟා සිටු වන්නට ඕනෑ නම් ආණ්ඩුව වෙන විධියකට ඒ සඳහා මුදල් ආයෝජනය කරන්නට වුවමනායි. හැබැයි ඒක කරන්නේ නැතිව ආණ්ඩුව කොපි පොත් සඳහා මේ බද්ද වැඩි කිරීමෙන් සිදු වන්නේ මේ රටේ විශාල වියදමක් ජීවන බරට එකතු වෙන එක විතරයි කියලා මා හිතනවා.

දැන් මේවාට සහන දෙන්න බැහැයි කියන ආණ්ඩුව, "මිහින් එයාර්" ආයතනයට රුපියල් දසලක්ෂ හයදාහක් වෙන් කර තිබෙනවා. මා අහන්නේ මේ රටේ මිනිසුන්ට ජීවත් වෙන්නට අමාරු යයි කියන වෙලාවක, ජීවත් වෙන්න බැරි ප්‍රශ්න දහසකුත් එකක් තිබෙන වෙලාවක මේවාට සහනය දෙන්න බැරිද කියලායි. සීනි ටිකට සහන දෙන්න බැරි, කිරි පිටි ටිකට සහන දෙන්න බැරි, තිරිඟු පිටි ටිකට සහන දෙන්න බැරි, කඩදාසි ටිකට සහන දෙන්න බැරි ආණ්ඩුව, "මිහින් එයාර්" ආයතනයට රුපියල් දසලක්ෂ හයදාහක් වෙන් කරනවා. මේක විශාල අර්බුදයක්. ආණ්ඩුවට ගුවන් සේවාවක් සකස් කරන්න වුවමනා නම් ඒ සඳහා "ශ්‍රී ලන්කන්" ගුවන් සේවය වැඩි දියුණු කරන්න පුළුවන්. හැබැයි ඒක පැත්තකින් තබලා පසු ගිය අවුරුදු 2, 3 තුළ රුපියල් කෝටි තුන්දාහක් කාබාසිනියා කර දමපු මිහින් එයාර් ආයතනය නැවත ගොඩ ගන්න රුපියල් මිලියන හයදාහක් මේ අය වැය ලේඛනයෙන් වෙන් කිරීම සාධාරණද කියලා අපි ආණ්ඩුවෙන් අහන්න වුවමනායි.

ඒ විතරක් නොවෙයි. ආණ්ඩුව ඉතාමත් පහසු කාරණා හැටියට යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව එක පැත්තකින් ඉතාමත් ලස්සනට කියනවා, වැට් බද්ද සියයට 15 සිට 12 දක්වා අඩු කළාය කියලා. මම අහන්නේ මේකෙන් සහන ලැබෙන්නේ කාටද කියලායි. ආණ්ඩුව එක පැත්තකින් සියයට 15 සිට සියයට 12 දක්වා වැට් බද්ද අඩු කළාය කිව්වාම මහජනයා කථා බහ කරන්නේ වැට් බද්ද අඩු වුණාය කියලායි. හැබැයි වැට් බද්ද එක පැත්තකින් අඩු කරලා අනෙක් පැත්තෙන් මොකක්ද කරන්නේ? වරාය හා ගුවන් සේවා බද්දක් අය කර තිබෙනවා. සෙස් බදු වැඩි කර තිබෙනවා. තීරු බදු අමතරව අය කර තිබෙනවා. ජාතිය ගොඩ නැඟීමේ බද්දක් වෙනම ගෙනෙන්න යෝජනා කරනවා. ආර්ථික සේවා බදු ගහනවා. මේ බදු සියල්ලෙන්ම මොකක්ද සිදු වෙන්නේ? සෑම භාණ්ඩයකටම මේ බදු එකතු වෙලා නැවත වතාවක් මිල ගණන් ඉහළ යනවා. මා කියන්නේ මේ වැට් බද්ද අඩු කිරීම සඳහා කරන යෝජනාවෙන් සහනය ලැබෙන්නේ අංශ කිහිපයකට විතරයි කියායි. ඉතා පැහැදිලිව ඊයේ ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ දී කිව්වා, සංචාරක, රක්ෂණ, දූරකථන, ඉදි කිරීම් සහ ලීසිං සේවාවන්ට විතරයි මේ සහනය ලබා දෙන්නට

[ගරු තිස්ස අත්තනායක මහතා]

ක්‍රියා කරන්නේ කියලා. එහෙනම් මෙය සාධාරණ අය වැයක් කියලා පෙන්වන්නට හැදුවාට, මේකත් නිකම් මහජනතාවගේ ඇස් වහලා මහජනයාගේ සාක්කුවේ මුදල් මහ දවල් මං කොල්ල කන අය වැය ලේඛනයක්ය කියලා මා පැහැදිලිව කියන්නට ඕනෑ.

ඊටත් වඩා ඉතාමත් හාස්‍යජනකම කාරණය වන්නේ රජයේ සේවකයන්ගේ පඩි වැඩි කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයෙන් රජයේ සේවකයන්ට කිසිම පඩි වැඩි කිරීමක් කරලා නැහැ. ජීවන වියදම් දීමනාව රුපියල් 1000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒකෙත් ඇත්ත තත්ත්වය මොකක්ද? ගිය අවුරුද්දේ කරපු යෝජනාව අනුව මේ අවුරුද්දේ ස්වයංක්‍රීයව ජීවන වියදම් දීමනාව රුපියල් 375ක් වැඩි වෙන්න ඕනෑ. මේ අය වැයෙන් කිව්වත් නැතත් රුපියල් 375ක් ස්වයංක්‍රීයව වැඩි විය යුතුව තිබෙනවා. ඇත්ත වශයෙන්ම මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ස්වයංක්‍රීයව වැඩි වන රුපියල් 375ක ජීවන වියදම් දීමනාව අඩු කළාම රුපියල් 625ක ජීවන වියදම් දීමනාවක් වැටුපට එකතු වෙලා තිබෙනවා. ඒක කිරි පිටි පැකට් දෙකක් මිල දී ගන්නවත් ප්‍රමාණවත් මුදලක්ද කියා අපි ආණ්ඩුවෙන් අහනවා. මොකද, ඒක විශ්‍රාමිකයන්ට නැහැ. විශ්‍රාමිකයන්ට රුපියල් 560ක වාගේ සොච්චමක් වැඩි කරලා තිබෙනවා. ආණ්ඩුවේ සේවකයන්ට දීමනාව වශයෙන් වැටුපටවත්, විශ්‍රාම වැටුපටවත් අදාළ නොවන රුපියල් 625ක ජීවන වියදම් දීමනාවක් එකතු කරලා තිබෙනවා. මේකෙන් රජයේ සේවකයන් විශාල ප්‍රමාණයක් රවටා තිබෙනවා. කාටද සහතික කරන්න පුළුවන් වන්නේ 2009 අවුරුද්දේ උද්ධමනය වැඩි වන්නේ නැහැ කියලා. මේ වන කොට උද්ධමනය සියයට 30කින් ඉහළ ගිහින් තිබෙනවා. කාටද සහතික කරන්න පුළුවන් ලබන වර්ෂයේදී මේ රටේ ජීවන වියදම වැඩි වෙන්නේ නැහැ, ඒක පාලනය කරනවාය කියා. ආණ්ඩුවට එහෙම සහතික වෙන්න බැහැ. මොකද, එහෙම සහතික වෙන්න බැහැ කියන්නේ? ආණ්ඩුවේ නාස්තිකාර වියදම් ක්‍රමානුකූලව වැඩි කරමින්, ඒ වාගේම ආර්ථිකයේ පාලනය බිඳ වැටෙමින් තිබෙනවා.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ මුදල් වෙන් කිරීමේදීත් ඉතාමත් විහිළු සහගත මුදල් වෙන් කිරීමක් කර තිබෙන බව. ඒකක 90ට වඩා අඩුවෙන් පාවිච්චි කළාම විදුලි බිල් පතට රුපියල් 30ක වට්ටමක් දෙනවාය කියා තිබෙනවා. මම අහන්නේ ඒ මුදලින් පාන් රාත්තලක් ගන්න පුළුවන්ද? ඒකක 15ට වඩා අඩුවෙන් පාවිච්චි කළාම ජල බිල්පතට රුපියල් 20ක වට්ටමක් දෙනවාය කියා තිබෙනවා. පාන් බාගයක් ගන්න බැහැ ඒ දීලා තිබෙන සහනයෙන්. එතකොට මොකක්ද මේ දීලා තිබෙන සහනය? ඉතාම ලස්සන යෝජනා තිබෙනවාය කියා රටේ ජනතාව රවටන්න highlight කරලා ලොකුවට පෙන්වන කාරණා විතරයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අනෙක් කාරණය, අපි පැහැදිලිවම කියන්න ඕනෑ මේ තෙල් මිල මත මේ ආණ්ඩුව සූදු කෙළිනවාය කියන එක. අද වන කොට තෙල් මිල කීයද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේ වන කොට OPEC සංවිධානය නිකුත් කරපු වාර්තා අනුව තෙල් මිල ඉතාම ශීඝ්‍රයෙන් පහළ බසිමින් තිබෙනවා. මේ දිනවල තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 57 සිට 60 දක්වා මට්ටමක තමයි පවතින්නේ. ආණ්ඩුව මෙච්චර කල් -දැන් මාස 4ක් තිස්සේ- ඛනිජ තෙල් මිල නියම කළේ තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 147ක්ය කියන එක පදනම් කර ගෙනයි. දැන් ඒක ඇමෙරිකානු ඩොලර් 57 දක්වා අඩු වුණාම ඩීසල් ලීටරයක් රුපියල් 62ට දෙන්න ආණ්ඩුවට පුළුවන්කම තිබෙද්දී, පෙට්‍රල් ලීටරයක් රුපියල් 80ට දෙන්න පුළුවන්කම තිබෙද්දී, දැව් තෙල් ලීටරයක් රුපියල් 37.50ට දෙන්න පුළුවන්කම තිබෙද්දී ආණ්ඩුව මොකක්ද කළේ? මාස 4ක් තිස්සේ එක දිගට ඒ සහනය මේ රටේ ජනතාවට දෙන්නේ නැතිව, දැන් කියනවා ඩීසල් ලීටරයක් රුපියල් 80යි, පෙට්‍රල් ලීටරයක් රුපියල් 142යි, දැව් තෙල් ලීටරයක් රුපියල් 45යි කියා. ඉන්ධන පාවිච්චි කරන දේශීය පාරිභෝගිකයන්ට ඩීසල් ලීටරයක් රුපියල් 62කට දෙන්න බැහැ කියන ආණ්ඩුව විදේශ නැව්වලට ඩීසල් ලීටරයක් රුපියල් 62.50 ගණනේ අලෙවි කරනවා. දේශීය පාරිභෝගිකයන්ට දෙන්න බැහැ, විදේශ සමාගම්වලට ඒ සහනය දෙනවා. මෙතැනදී මා විශේෂයෙන් මතු කරන කාරණය තමයි, -අනෙක් පැත්තට තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි- අධික ලාබ ලබා ගන්න ආණ්ඩුව කරන මේ උපක්‍රමය නිසා මේ රටේ ජනතාවට විශාල බරක් දරන්න සිදු වෙලා තිබෙනවාය කියන එක. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මේ රටේ ඛනිජ තෙල් අලෙවියෙන් සියයට 70යි අලෙවියේ ප්‍රමාණය දරන්නේ. මේ රටේ ඛනිජ තෙල් වෙළෙඳ පොළේ ප්‍රමාණයෙන් සියයට 30ක් දරන්නේ IOC සමාගමයි. ආණ්ඩුවේ මේ හිතුවක්කාර තීරණය නිසා වෙළෙඳ පොළෙන් සියයට 30ක් දරන IOC සමාගම අධික ලාභයක් ලබනවා. අපි අහන්නේ ආණ්ඩුවට සල්ලි ගන්න ඕනෑ නිසා IOC සමාගමට අධික ලාබ ලබන්න ආණ්ඩුව ඉඩ දීලා තිබෙන්නේ ඇයි කියලායි. ජනතාවගේ මුදල් ප්‍රසිද්ධියේ මං කොල්ල කන්න ආණ්ඩුව ඉඩ කඩ දීලා තිබෙන්නේ මේ ආණ්ඩුවට සල්ලි හොයන්න තිබෙන වුවමනාව නිසායි.

ඒ විතරක් නොවෙයි. ඉතාමත් කනගාටු දායක තත්ත්වය තමයි ආරක්ෂක වියදම නැවත වතාවක් බිලියන 177.4ක් දක්වා වැඩි කර තිබීම. මේ අය වැය ලේඛනය දිහා බලපුවාම, මා හිතන හැටියට පසු ගිය අවුරුද්දට වඩා අමාත්‍යාංශ විසි ගණනක මුදල් ප්‍රතිපාදන අඩු කර තිබෙනවා. ජනාධිපතිපතිවරයාගේ වැය ශීර්ෂය, ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වාගේ වැය ශීර්ෂ කිහිපයකට මුදල් ප්‍රතිපාදන වැඩි කර තිබෙනවා. මම කියන්නේ මේකයි. රටේ ජාතික ආරක්ෂාව තහවුරු කර ගන්න ඒ අවශ්‍ය කාරණා සිදු කරන්න වුවමනායි. දැන් යුද්ධය අවසන් කරනවාය කියලා කියනවා. යුද්ධය අවසන් කරනවා නම් මේ පණිවුඩය දෙන්නේ මොකටද? ලබන අවුරුද්දේත් මේ යුද්ධය තවදුරටත් පවත්වා ගෙන යනවාය කියන්නයි. ආරක්ෂක වියදම්වලට නැවත වතාවක් රුපියල් බිලියන 177ක් වෙන් කරලා ආණ්ඩුව දෙන පණිවුඩය ඒකයි. මේ විධියට ආණ්ඩුව එක දිගට මහ ජනතාවට විශාල පීඩනයක් ඇති කර තිබෙනවා. දැන් බලන්න. මේ අය වැය ලේඛනය ඊයේ ඉදිරිපත් කරපු වෙලාවේදී හුඟක් අය සිතුවා, සහන රැසක් තිබෙන අය වැය ලේඛනයක් වෙයි කියලා. මොකක්ද වෙලා තිබෙන්නේ? පසු ගිය අවුරුදු දෙකේ අය වැය ලේඛන අරගෙන බලන්න. 2007 අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරපු යෝජනා මා ළඟ තිබෙනවා. මොනවාද ඒ යෝජනා? 2007 අය වැය ලේඛනයෙන් යෝජනා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබුණා. එදාත් මේ වගේම දස වසරක ගමනක් පිළිබඳව විශ්වාසය පළ කරලා යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. 2008 අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට කිව්වේ, දේශ ප්‍රේමී අය වැය ලේඛනයක් ඉදිරිපත් කරනවා කියලායි. ඒ අය වැය ලේඛනයෙන් මේ රටේ ජනතාවට සහතිකයක් දුන්නා. 2008 අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා කිව්වා, ඉන්ධන මිල නොවෙනස්ව තියා ගන්නවාය කියලා. ඉන්ධන මිල නොවෙනස්ව තියා ගන්නවාය කියලා පසු ගිය අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කරපු වෙලාවේ කිව්වා. ඒ සහතිකය මේ සභාවට දුන්නා. හැබැයි ඒක ස්ථිර කරන්නට ආණ්ඩුවට පුළුවන්කමක් තිබුණේ නැහැ. මහජනතාවට දරන්න බැරි තරමට ඉන්ධන මිල කිහිප වතාවක් වැඩි කළා.

ඊළඟට බලන්න. සමෘද්ධි ලාභීන්ට, අඩු ආදායම් ලාභීන්ට භූමි තෙල් සහනාධාරයක් දෙනවාය කියලා ආණ්ඩුව කිව්වා. ඒ සහනාධාරය දුන්නාද කියලා අපි අහනවා. ඒ සහනාධාරය දෙන්න ආණ්ඩුව ක්‍රියා කළේ නැහැ. ඒ වගේම ත්‍රී රෝද රථවලට සහන මිලට පෙට්‍රල් දෙනවාය කිව්වා. සමස්ත ත්‍රී රෝද රථ හිමියන්ට ඒ සහනය ලැබුණේ නැහැ. මා මේ කියන්නේ පසු ගිය අවුරුද්දේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරපු යෝජනාවලින් මොකක්ද සිද්ධ වුණේ කියන එකයි. තවත් යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබුණා. බදු ක්‍රමය සරල කිරීම, ඒ වගේම වතුකරයේ ජනතාවට සහල් සහනාධාරය ලබා දීම, රාජ්‍ය සේවකයන්ට සහන ලබා දීම වගේ යෝජනා ගණනාවක් ඒ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කළා. මම කියන්නේ මේකයි. වර්ෂයෙන් වර්ෂයට මේ වගේ අය වැය යෝජනා ඉදිරිපත් කරලා මාස ගණනක් ඒවායේ හොඳ නරක කථා කරනවා. අය වැය ලේඛනයක තිබෙන ප්‍රධානම කාරණය මේකයි. ඒ ඉදිරිපත් කරන අය වැය ලේඛනයෙන් රටේ ජනතාවට යහපතක් සිදු වන්න ඕනෑ. ජනතාවට යහපතක් සිදු වන්නේ නැත්නම් ඒකෙන් ජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැත්නම් අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීමේ තේරුමක් නැහැ.

අය වැය ලේඛනයක ඉලක්ක කරන ඒ වැඩ පිළිවෙළ ඉදිරියට යන්නේ නැත්නම් මොකක්ද සිදු වෙන්නේ? රටේ විශාල කඩා වැටීමක් සිදු වෙනවා. මේ රටේ ප්‍රමුඛත්වයක් දෙන ආයෝජන අවස්ථා මොනවාද කියලා තෝරා බේරා ගන්න ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. ආණ්ඩුව දේශපාලන න්‍යාය පත්‍රයකට අනුව කටයුතු කරමින් ඒ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න ජනතා යහපත පැත්තකින් තියලා සමහර කාරණා තෝරා ගෙන මේ ආයෝජන සඳහා මුදල් යොද වනවා. මේ යොද වන්නේ කාගේවත් මුදල් නොවෙයි, මේ රටේ ජනතාවගෙන් බදු වශයෙන් ලබා ගන්නා මුදල්. ඒ බදු මුදල් ජනතාවගේ යහපතට වියදම් කරන්න ක්‍රියා කරන්නේ නැතිව ආණ්ඩුව පෞද්ගලික අභිමතාර්ථයන් වෙනුවෙන් මේ වගේ යෝජනා, ව්‍යාපෘති සඳහා වෙන් කරනවා නම් ඒක බරපතළ කාරණයක් හැටියට අපි දකිනවා. ඒකයි අප කිව්වේ මිහින් එයාර් වගේ ආයෝජනයක් කළ යුතු නැහැ කියා. මොකද මහා භාණ්ඩාගාරයට දිගින් දිගටම ප්‍රශ්නයක් ඇති වුණු, දිගින් දිගටම බරක් වුණු මිහින් එයාර් ආයතනය ලබන අවුරුද්දටත් ගෙන යනවාය කියන්නේ නැවත වතාවක් එය නඩත්තු කරන්න මේ රටේ සමස්ත මහ ජනතාවගේ බදු මුදල් වැය කරන්න ආණ්ඩුව ක්‍රියා කරනවාය කියන එකයි. මේ වගේ යෝජනාවක් ක්‍රියාත්මක කරන්න වුවමනාවක් නැහැ. මට මතකයි මේ යෝජනාව ගෙනාපු අවස්ථාවේදී ආණ්ඩුවේ බොහෝ අය කිව්වේ මේ රටේ දුප්පත් මහ ජනතාවට පිට රට යන්න සහනශීලී ගුවන් සේවයක් ඇති කරනවාය කියායි. ගෘහ සේවිකාවන් වශයෙන් විදේශවලට යන අයට සහන දෙන්න ආණ්ඩුවට වුවමනාවක් තිබෙනවා නම් ඒ අයට නොමිලේ ගුවන් ටිකට් පතක් ලබා දුන්නා නම් මීට වඩා සහනයක් ඒ විදේශගත වන පිරිසට ලැබෙනවා. නමුත් එහෙම කරන්නේ නැතිව මෙවැනි ආයෝජන කරන්නේ කීප දෙනකුගේ මුදල් සොයා ගැනීමේ ව්‍යාපාරයක් වශයෙන්ය කියා අප කියන්න කැමැතියි.

අනික් කාරණය මේකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම මැතිතුමා කථා කරමින් කිව්වා මේ රටේ සියයට හයක ආර්ථික වර්ධනයක් සිදු වෙලා තිබෙනවාය කියා. මහ බැංකුව අද දේශපාලනීකරණය වෙලා. සියයට හයක ආර්ථික වර්ධනය ගණනය කරන්න පුළුවන්. අපට තිබෙන්නේ මෙයින් සතුටු වෙන්න පුළුවන්ද කියන ප්‍රශ්නයයි. මොකක්ද හේතුව? ආර්ථික වර්ධනයක් රටක සිදු වෙනවා නම් ඒ ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ මහ ජනතාවට ලැබෙන්න ඕනෑ. එය මහ ජනතාවට දැනෙන්න ඕනෑ. අද මේ රටේ ජීවත් වන මහ ජනතාව විශාල දරිද්‍රතාවකින් පෙළෙනවා. ඒ වගේම ඔවුන්ගේ දුප්පත්කම වැඩි වෙනවා. ඒ වගේම ජීවන බර වැඩි වෙනවා. මෙහෙම වෙන කොට ආර්ථික සංවර්ධනය මෙතරම් වේගයෙන් යනවාය, මහ ජනතාව එයින් ප්‍රතිලාභ ලබනවාය කියන්නේ කොහොමද? ඉතින් ඒ නිසා මේ ගණන් හිලවු ඉදිරිපත් කරලා ප්‍රමාණවත් වන්නේ නැහැ. ආණ්ඩුව ප්‍රායෝගිකව ඒ ලබා දෙන සහනය මේ රටේ ජනතාවට ලබා දෙන්න ක්‍රියා කරන්න වුවමනාය කියා මා කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. අද උදේ විවාදයට එකතු වුණු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා මොකක්ද කිව්වේ? එතුමා තමන්ගේ අය වැය ලේඛනය ගැන නොවෙයි කථා කළේ. එතුමා විකල්ප අය වැය ලේඛනයක් ගැන කථා කළා. ආණ්ඩුව ඉදිරිපත් කළ අය වැය ලේඛනය ගැන කථා කරන්න කරුණු නැතිව එහෙම කළාද කියා මා දන්නේ නැහැ. හැබැයි, එක අතකට අප සතුටු වෙනවා. එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කළේ අය වැය සඳහා ගන්නට සුදුසු යෝජනායි. මොකද, අය වැයක මූලික අභිප්‍රාය මේ රටේ ජනතාව ජීවත් කරවීමයි; ශක්තිමත් කරවීමයි; ඔවුන්ගේ ආදායම් මාර්ග නිසි ලෙස සකස් කිරීමයි. ඒ වෙනුවෙන් ආණ්ඩුවට අදහසක් ගන්න අප විකල්ප යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මුදල් නාස්ති කරන්නේ නැතිව අනවශ්‍ය වියදම් කපා හැරලා, අනවශ්‍ය ප්‍රමාණයට තිබෙන කැබිනට් මණ්ඩලය අඩු කරලා, අනවශ්‍ය උපදේශකවරුන් අඩු කරලා මේ රටේ ජනතාවට ඒ මුදල් ටික දෙන්නය කියායි අප අපේ විකල්ප යෝජනාවලින් කිව්වේ. ඉතින් ඒ විකල්ප යෝජනා පිළිබඳව අදහස් ඉදිරිපත් කළාට කමක් නැහැ. හැබැයි, අප කියන්නේ මේවා නිවැරදි කර ගන්න ආණ්ඩුවට තවමත් අවස්ථාව තිබෙනවාය කියායි. මේ නිවැරදි කිරීම කරන්නේ නැත්නම් මේ රටේ ජනතාව 2009 අවුරුද්දේත් විශාල පීඩනයකට පත් වෙන එක වළක්වන්න ආණ්ඩුවට පුළුවන් කමක් නැහැ.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ තවත් කරුණක් තිබෙනවා. උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණයේදී ජනතාව දුන්නු තීන්දුව මොකක්ද? උතුරු මැද සහ සබරගමුව ඒ තීන්දුව දුන්නේ ආණ්ඩුවේ ක්‍රියා මාර්ගය නිවැරදිය කියා නොවෙයි. රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා කිව්වා උතුරු මැද සහ සබරගමුව පළාත්වල ජනතාව ආණ්ඩුවේ තීරණය නිවැරදිය කියා ආණ්ඩුව බලයට පත් කළාය කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය වැරදිලා ආණ්ඩුව හිතා ගත්තු තීරණයක් බව මා කියන්න ඕනෑ. ආණ්ඩුවේ මුළු රාජ්‍ය බලයම යොදවලාත් ආණ්ඩුවට මොකක්ද වුණේ? පසු ගිය පළාත් සභා දෙකේ සිටියාට වඩා මන්ත්‍රී ධුර හතරක් උතුරු මැද සහ සබරගමුව කියන පළාත් සභා දෙකෙන්ම අඩු කර ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. [බාධා කිරීම්] උතුරු මැද සහ සබරගමුව කියන පළාත් දෙකෙන්ම පිළිවෙළින් ඡන්ද 75,000කුත්, 1,23,000කුත් අඩු කර ගෙන තිබෙනවා. එහෙම නම් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? අද ආණ්ඩුවේ සියලු මර්දනයන්ට මුහුණ දෙමින් ජනතාව ආණ්ඩුව ප්‍රතික්ෂේප කරමින් ඉන්නා බව ආණ්ඩුව හොඳට මතක තබා ගෙන මේ කථා කියන්න ඕනෑය කියා මා ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු ජයතිස්ස රණවීර මහතා (වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயதிஸ்ஸ ரணவீர - நீர்ப்பாசனத்துறை அமைச்சர்)
(The Hon. Jayatissa Ranaweera - Minister of Irrigation )

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රේණුකා හේරත් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரேணுகா ஹேரத்)
(The Hon. (Mrs.) Renuka Herath)
හරි, හරි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ඊත් එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තවත් කාරණයක් කියන්න කැමැතියි. මේ කාරණය සඳහන් කරන්නේ වෙනත් අරමුණකින් නොවෙයි. ආණ්ඩුව ජනතාව රවටමින් ඉන්නවා. බලන්න යුද්ධය දිහා. ආණ්ඩුව දින වකවානු දීලා මේ යුද්ධය ගැන සඳහන් කළා. මා අහන්නේ - [බාධා කිරීමක්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තමුන්නාන්සේටත් වැඩි මනාපයක් තිබෙනවාද?

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ඔබතුමා මගෙන් පස්සේ කථා කරන්න. යුද්ධය ගැන දින වකවානු කිව්වා. හමුදාපතිතුමා, ජනාධිපතිතුමා, ආණ්ඩුවේ මැති ඇමතිවරු වරින් වර කිව්වා, අහවල් කාලය වන විට මේ යුද්ධය අවසන් කරනවාය කියා. දැන් ලබන අවුරුද්දට ජාතික ආරක්ෂාව සඳහා රුපියල් බිලියන 177ක් ඉල්ලනවා. මම අහන්නේ පසු ගිය කාලයේ වියදම් කරපු මුදල් ප්‍රමාණයෙන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලායි. දැන් දවස් කීපයකට ඉස්සර වෙලා ආරක්ෂක ලේකම්වරයා කිව්වා මට මතකයි, ගුවන් ප්‍රහාර 6,000ක් එල්ල කර තිබෙනවාය කියලා. මේ ගුවන් ප්‍රහාර 6,000ට කී දාහක් වියදම් කරන්න ඇතිද? මේ ගුවන් ප්‍රහාර 6,000න් හැම ප්‍රහාරයක්ම සාර්ථකව එල්ල කළා කියලා ගුවන් නියමුවෝ සනාථ

[ගරු තිස්ස අත්තනායක මහතා]

කරනවාය කියලා ආණ්ඩුව කිව්වා. ඒ වාගේම ආණ්ඩුව කිව්වා, ඒ ගුවන් ප්‍රහාරවලින් එල්ටීටීඊ සංවිධානයේ කඳවුරු විනාශ වුණා කියලා. එහෙම නම් එල්ල කරපු ගුවන් ප්‍රහාර 6,000න් අවම වශයෙන් කඳවුරු 6,000ක්වත් විනාශ වෙන්න ඕනෑ; එක කඳවුරක දෙදෙනකු සිටියා නම් 12,000ක්වත් මිය යන්න ඕනෑ. එහෙම නම් මේ කරලා තිබෙන්නේ මේ වාගේ පාර්ලිමේන්තුවෙන් මුදල් අරගෙන ආණ්ඩුවේ ප්‍රචාරක යන්ත්‍රණයකට මුදල් සොයන එක විතරයි කියලා අපි කියන්න වුවමනායි. විශේෂයෙන්ම මම මේක කිව්වේ ආණ්ඩුව මේ යුද්ධය අවසන් කරනවා කියලා ඒක තවදුරටත් -ලබන අවුරුද්දටත්- දීර්ඝ කරන්න ලොකු උත්සාහයක ඉන්න බව පෙනෙන නිසායි. ඒ නිසා ඒකට වියදම් කරන මුදලත් මේ රටේ ජනතාවට ගෙවන්න සිද්ධ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, මේ අය වැය ලේඛනයෙන් මේ රටේ ජනතාවට කිසිම සහනයක් ලැබී නැහැ කියලා. මේ රටේ මූලික ප්‍රශ්න එකකටවත් උත්තරයක් අය වැය ලේඛනයෙන් හොයලා නැහැ; මහජනතාව දරිද්‍රතාවෙන් මුදා ගන්නවත්, ජීවන වියදම අඩු කරන්නවත්, ඒක සැහැල්ලු කරන්නවත් හරි ආයෝජනයක් කරලා නැහැ. ඒ වාගේම විරැකියාව තුරන් කරන්න උත්තරයක් නැහැ. නැවත වතාවක් ආණ්ඩුව කරලා තිබෙන්නේ මේ දේශ ප්‍රේමිත්වය පෙන්වලා, දේශ ප්‍රේමිත්වයේ ලේබල් එක අලවලා මේ රටේ මහජනයාගේ සාක්කුවේ තිබෙන මුදල් ටික මං කොල්ල කෑමක් විතරයි කියන එක පැහැදිලිව ප්‍රකාශ කරමින් මාගේ වචන ස්වල්පය මා අවසන් කරනවා.

[අ.භා. 3.04]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා)**

(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - கடற்றொழில், நீரக வளமூலங்கள் அமைச்சர்)

(The Hon. Felix Perera - Minister of Fisheries and Aquatic Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පක්ෂයේ මහ ලේකම්තුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මොකද, එතුමා පසු ගිය අවුරුද්දේත් කිව්වා මේ ආණ්ඩුව කඩා වැටෙයි කියලා. අදත් ඒකම කියනවා. නමුත් වෙච්ච දෙයක් නැහැ. අර එළුවාගේ මොකක්ද එකක් දැන් කඩා වැටෙයි, දැන් කඩා වැටෙයි කියලා හිතා ගෙන හැම දාම එළුවා පිටු පස්සේ යනවා වාගේ, හැම දාම කඩා වැටෙයි කියලා කිව්වාට එහෙම කඩා වැටෙන්නේ නැහැ. උතුරු මැද පළාතේත්, සබරගමුවේත් ජනතාවගේ මනාප වැඩියෙන් ලැබුණේ අපටයි. හැබැයි, මෙතුමාට නම් උතුරු මැද පළාතේ එක් මනාපයක් විශේෂ වශයෙන් ලැබී තිබෙන බව සඳහන් කරන්න ඕනෑ.

කඩා වැටීම කෙසේ වෙතත් මම කියන්න ඕනෑ, අද ලෝක ආර්ථික අර්බුදය හමුවේ අපේ රටට දැඩි බලපෑමක් නොතිබුණු බව. සුළු වශයෙන් තමයි ඒක අපට දැනුණේ. දැඩි බලපෑමක් දැනුණේ නැහැ. ශ්‍රී ලංකා රජය, මහ බැංකුව සමඟ එක් වී අනුගමනය කළ නිසි ආර්ථික කළමනාකරණය නිසා අපට පුළුවන් වෙලා තිබෙනවා කවුරු මොනවා කිව්වත් අපේ රටේ ආර්ථිකය හොඳ තත්ත්වයෙන් තියා ගන්න. ලෝක ආර්ථිකය කඩා වැටී තිබෙන හැටි දැක්කාම අපට පුදුම හිතෙනවා, අපි මෙහෙම ඉන්නේ කොහොමද කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය.

දැන් බලන්න, ඇමෙරිකාවේ "ලේමන් බ්‍රදර්ස්" සමාගම බංකොලොත් වුණා. ඒ වාගේම "මෙරිල් ලින්ච්" සමාගම හදිසි ඒකාබද්ධ වීමක් සඳහා පොලඹවන්න ආණ්ඩුවට සිද්ධ වුණා. සුවිශාල "වොෂින්ටන් මියුචුවල්" සමාගම, රාජ්‍ය තැන්පතු රක්ෂණ ආයතනය -FDIC- මැදිහත් වීමෙන් "ජේපී මෝගන්" බැංකුව වෙත බලාත්මකව විකුණුණා. ඔන්න තත්ත්වය. ඊළඟට සුවිශාල "වැකෝවියා" බැංකුව, රාජ්‍ය තැන්පත් රක්ෂණ ආයතනය මැදිහත් වීමෙන් බලාත්මකව "වෙල්ස් ෆාගෝ" බැංකුවට විකුණුණා. මුල්‍ය සමාගම් රාශියක් විනාශ වුණා. ඒ විතරක් නොවෙයි. එක්සත් රාජධානියේ "නොදර්න් රොක්" කියන ආයතනය එංගලන්ත මහ බැංකුව විසින් බ්‍රිතාන්‍ය පවුම් බිලියන 27ක් යොදා තමයි බේරා ගත්තේ.

රටේ විශාලතම නිවාස ණය පහසුකම් සපයන්නා වූ HBOS කියන බැංකුව, "ලොයිඩ්" සමාගම මඟින් පවරා ගත්තා. ඉඩම් හිමියන්ට අරමුදල් සපයන්නන් අතර බ්‍රිතාන්‍යයේ විශාලතම බැංකුව වූ "බ්‍රැඩ්ෆෝර්ඩ්" සහ "බ්‍රින්ග්ලි" සමාගම මහජන තැන්පතු ආරක්ෂා කර ගැනීම සඳහා රජයට පවරා ගැනීමෙන් විශාල ආර්ථික ප්‍රතිලාභයක් ලබන්න පුළුවන් වුණා. RBS, HBOS හා "ලොයිඩ්ස්" යන සුවිශාල බැංකු සිය කොටස් රජය සතු කරමින් පවුම් බිලියන 37ක් ලබා ගත්තා. ඒ පොඩි ගණනක් නොවෙයි. ඔන්න, ආර්ථිකය කඩා වැටීම.

යුරෝපයෙත් ඒ වාගෙයි. බෙල්ජියම, නෙදර්ලන්තය, ලක්සම්බර්ග් මහ බැංකු මඟින් විශාල ප්‍රමාණයේ ද්‍රවශීල අරමුදල් යොදවලා -එයට රාජ්‍ය මැදිහත් වෙලා- තමයි සුවිශාල බැංකු බේරා ගත්තේ. රේගන්ගෙන් පටන් ගත්තු ඒ විවෘත ආර්ථිකය -රාජ්‍ය මැදිහත් වීමක් නැතිව තිබුණු ඒ විවෘත ආර්ථිකය- අද වෙනස් වෙලා සමාජවාදී ආවරණයට යටත් වෙන්න සිද්ධ වෙලා තියෙනවා. පෞද්ගලික අංශය පිළිබඳ තදබල විශ්වාසයක් තියන්නේ නැතිව, රාජ්‍ය අංශයේ මැදිහත් වීම අවශ්‍යයි කියන තැනට, නිගමනයට එන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අතින් මා ප්‍රශංසා කරනවා, අපේ මහ බැංකුවට - Central Bank එකට -, ඒ වාගේම Treasury එකට. මෙවැනි ආකාරයෙන් දුර දිග බලලා අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය අනුව ක්‍රියා කරමින්, එයට අත් වැල දෙමින් මේ ගත්තු මූල්‍යමය ප්‍රතිපත්ති නිසා තමයි අද රට ආරක්ෂා වෙලා තිබෙන්නේ. නැත්නම් අපිට යන එන මං නැතිව ඉන්නයි සිදු වන්නේ.

ආණ්ඩුව කඩා වැටෙන්නේ නැහැ. මේ අර්බුදත් එක්ක අපිට කෙළින් හිට ගන්න පුළුවන් තත්ත්වයක් උදා කර දීම ගැන අපි විශේෂයෙන්ම මහින්ද චින්තනයට ස්තුතිවන්ත වෙනවා. මහින්ද චින්තනය කියන්නේ කුමක්ද? දේශීයත්වයට මුල් තැන දීමයි. දේශීයත්වය පිළිබඳ තදබල විශ්වාසයක් තැබුවා. දේශීයත්වය පාවිච්චි කරමින්, මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරමින් මේ රට ස්වයංපෝෂිත කිරීමට අලුත් චින්තනයක්, අලුත් අදහස් ඉදිරිපත් කළා. විදේශ රටවලින් ලැබෙන දේ පිළිබඳව තදබල විශ්වාසයක් නොතබා, "අපි වවමු, රට හදමු" කියන සංකල්පය ඉස්සරහට ගෙනෙන්න ක්‍රියා කරමින් සිටින රජයක් තමයි අපේ රජය. ඒක නිසා ආර්ථිකය කඩා වැටෙයිද කියන එක පිළිබඳව අද අපට කිසිම සැකයක් හිතන්න ඕනෑ නැහැ කියන එක අපි මතක් කරන්න ඕනෑ. අනෙක් රටවල් එක්ක සංසන්දනාත්මකව බලද්දී ඇත්ත වශයෙන්ම පුදුම හිතෙනවාය කියලා මම කිව්වේ ඒකයි. බෙල්ජියමේ බැංකු සම්පූර්ණයෙන් කඩා වැටිලා. යුරෝපයේ බැංකු කඩා වැටීමෙන් මුදා ගැනීමට යුරෝ මිලියන 300ක් වැය වෙතැයි අනුමාන කරනවා. ඒ වාගේම අයිස්ලන්තයේ සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. අයිස්ලන්තයේ කොම්පැනි බංකොලොත් වන එක වෙන කාරණයක්. ඒ රටත් බංකොලොත් වෙලා. ඒ මුළු රටම බංකොලොත්භාවයට පත් වුණා. [බාධා කිරීමක්] ඔබතුමා ඒක දන්නවා නම් අහගන්න කාගෙන් හරි. මොකද, මෙතුමාත් අයිස්ලන්තයට ගියා නේ. ධීවර කර්මාන්තය තමයි ඒ රටේ මූලිකම කර්මාන්තය. ඒ රටට ඉර නඟින්නේ නැහැ. හැම දාම කළුවරයි. ඒ රට සම්පූර්ණයෙන්ම බංකොලොත් වුණා. ඇයි, බංකොලොත් වුණේ? ඇමෙරිකාවත් එක්ක බැඳුණු නිසා -ඒ විවෘත ආර්ථිකයට තදබල බැඳීමක් ඇති කර ගෙන තිබුණු නිසා- ඒ කඩා වැටීම සිද්ධ වුණා. ඉතින් මේ වාගේ තමයි ලෝක ආර්ථිකය අර්බුදයකට මුහුණ දීලා තිබෙන්නේ. නමුත් අපි හොඳට කෙළින් හිට ගෙන ඉන්නවා. මෙන්න මේක තමයි අරුමය සහ පුදුමය. මේ පුදුමය සහ අරුමයට හේතු වෙලා තියෙන්නේ මොකක්ද? අතිගරු ජනාධිපතිතුමා විසින් මේ රට තුළ දේශීය චින්තනයක් ස්ථාපිත කිරීමයි. එතුමා කිව්වා, කිසිම රාජ්‍ය ආයතනයක් විකුණන්නේ නැහැ කියලා. රාජ්‍ය ආයතන කඩා

වැටෙද්දී, පෞද්ගලික අංශය කඩා වැටෙද්දී, ඒ ආයතන මිල දී ගන්න බටහිර ලෝකයේ රටවල් ඉදිරිපත් වෙද්දී අපි එදා ගත් ප්‍රතිපත්තිය නිසා අපේ රාජ්‍ය ආයතන අද රැකිලා තියෙනවාය කියන එක අපි මහත් අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. GAYANTHA KARUNATILEKA *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථා කර ගෙන ගියේ ලෝක ආර්ථිකයේ කඩා වැටීම ගැනයි. ඒ වාගේම "ක්‍රෙඩිට් ස්විස්" බැංකුව - UBS - රජයේ අරමුදල් සැපයීමෙන් බේරා ගත්තා. යෙද වූ මුදල කීයද? ඩොලර් බිලියන 60යි. පෘතුගාලය යූරෝ බිලියන 20ක් -ඩොලර් බිලියන 27ක්-, නෝර්වේ ඩොලර් බිලියන 54ක්, එක්සත් රාජධානිය පවුම් බිලියන 50ක් -ඩොලර් මිලියන 85ක්- යොදවා තමයි ඒ ටික බේරා ගත්තේ. ඒ වාගේම යුරෝපයේ තිබුණු විශාලම රක්ෂණ සමාගම වූ ඒඅයිජී වෙත පමණක් තිබූ යුරෝපීය බැංකුවල අනාවරණිත ණය අරමුදල්වල ප්‍රමාණය ඩොලර් මිලියන 300 ඉක්මවා ගියා. මේ සේරම කඩා වැටිලා. මෙහෙම ලෝකයේ හැම තැනම ආර්ථිකය කඩා වැටෙද්දී අපි කොහොමද බේරුණේ? මේක තමයි ප්‍රශ්නය. මොකද, අපි සමාජවාදී ආවරණයක් අපේ ආර්ථිකයට ලබා දීලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියත් ඒකයි. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්තියත් ඒකයි. සමාජවාදී ආවරණය තියෙන්න ඕනෑ. අද ඒක පිළිගෙන තියෙනවා. එදා රේගන් මහත්මයාගෙන් පටන් ගත්තු ආර්ථිකයට අද ජෝර්ජ් බුෂ් මහත්මයාට බැණලා වැඩක් නැහැ. මේ ආර්ථිකය කඩා වැටීම කාලාන්තරයක් තිස්සේ සිද්ධ වුණු දෙයක්.

එදා එක්සත් ජාතික පක්ෂයේ "Regaining Sri Lanka" කියන වැඩ පිළිවෙළෙහි මොකක්ද, තිබුණේ? ඒකේ සම්පූර්ණයෙන්ම තිබුණේ පෞද්ගලික අංශය තමයි -දෙවියන් වහන්සේ තමයි- ගැලවුම්කරුවා කියන එකයි. ආර්ථිකයේ ගැලවුම්කරු පෞද්ගලික අංශයයි කියන එකයි. අපි කිව්වා, ඒක එහෙම නොවෙයි කියා. ගැලවුම්කරු වශයෙන් සඳහන් කළා විතරක් නොවෙයි, රාජ්‍ය සේවය සුළු කොට තකා රාජ්‍ය සේවකයන් බඳවා ගැනීමත් අත් හිටවූවා. අද අපි මොනවාද කරලා තිබෙන්නේ? රාජ්‍ය සේවය පුළුල් කර තිබෙනවා; දෙලක්ෂ පණස්දාහක් රාජ්‍ය සේවයට බඳවා ගෙන තිබෙනවා. පොඩි ගණනක් නොවෙයි. රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් නිසා රාජ්‍ය පඩි බිලේ වැඩි වීමක් තිබෙනවා. ඒක රජය විසින් දරා ගන්නවා. අන්න, රාජ්‍ය සේවය ශක්තිමත් කර තිබෙන හැටි. ඒ වාගේම ශක්තිමත් කර තිබෙන රාජ්‍ය සේවයේ ඉන්න අයත් මේ ගැන කල්පනා කරන්නට ඕනෑ. ඒ රාජ්‍ය සේවකයන් කෙරෙහි තිබුණු විශ්වාසය ජනාධිපතිතුමා නිතර නිතර තහවුරු කර තිබෙනවා. මේ අර්බුදකාරී අවස්ථාවේ දී මේ තරම්වත් ආර්ථිකය ශක්තිමත් තත්ත්වයකින් ගෙන යන එක පුදුම වන්නට ඕනෑ කාරණයක්ය කියන එක අපි අවධාරණය කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හොඳයි, අප මෙහෙම සිතා බලමු. සාමකාමී වාතාවරණයක් තිබෙද්දී රටක රජයකට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නට පුළුවන්. ඊළඟට සංවර්ධනයත් ආරක්ෂා කරන්නට පුළුවන්. ඒ වාගේම සංවර්ධනයත් කර ගෙන යන්න පුළුවන්. නමුත් යුදධයක් තිබෙද්දී කොහොමද ඒවා කරන්නේ? යුද්ධයක් තිබෙද්දී ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නේ කොයි ආකාරයෙන්ද? යුද්ධයක් තිබෙද්දී සංවර්ධනයක් කරන්නේ කොහොමද? යුද්ධය මානුෂික විධියට කොහොමද කරන්නේ? ඒක ආණ්ඩුවකට ලොකු ගැටලුවක්. නමුත් අපේ ජනාධිපතිතුමා යුද්ධය තිබෙද්දී, යුද්ධය මානුෂික ආකාරයෙන් කරන්න සමත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, හමුදාපතිවරු, ආරක්ෂක ලේකම්තුමා සාමාන්‍ය ජනතාවට හානියක් නොවන විධියට යුද්ධය කර ගෙන යනවා. කොහොමද කියා බලන්න. අද ප්‍රභාකරන්ටත් කන්න දෙන්නේ අපේ ආණ්ඩුවයි. මේ ගෙන යන කෑම ටිකයි එයා ගන්නේත්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1982 වර්ෂයෙන් පස්සේ උතුරේ ජන සංගණනයක් කරලා නැහැ. 1982න් පස්සේ ජන සංගණනයක් කළා නම් ඔච්චර ජනතාවක් උතුරේ ඉන්න විධියක් නැහැ. බොහොම සුළු කොටසක් ඉන්න ඕනෑ. ඇයි, එහේ ඔක්කොම අය මෙහෙ නේ ඉන්නේ. වත්තල විසිඑක්දාහක් ඉන්නවා. වැල්ලවත්තේ තව කොටසක් ඉන්නවා; එංගලන්තයේ තව කොටසක් ඉන්නවා; ඕස්ට්‍රේලියාවේ තව කොටසක් ඉන්නවා; ඉන්දියාවේ තව කොටසක් ඉන්නවා. උතුරේ ජනතාව මේ ප්‍රශ්නය නිසා තැන් තැන්වලට ගිහිල්ලා. එහේ ඔච්චර ජනගහනයක් නැහැ. නමුත් වාර්තා වන්නේ විශාල ජන සංඛ්‍යාවක් ඉන්නවාය කියලායි. ඒ වාර්තා අනුව අනුමාන කරලායි අපි ආහාර තොග යවන්නේ. මේවා කවුද පාවිච්චි කරන්නේ? තමිල්නාඩුවේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමිය වන ජයලලිතා මහත්මිය කියා තිබුණා, ඉන්දියාවෙන් යවන ආහාර ටිකත් සමහර විට එල්ටීටීඊ එක අතට යන්නට පුළුවන්ය කියා. දැන් ඒක තේරුම් අරගෙන තිබෙනවා.

මේ යුද්ධය කරන්නේත් ඒ විධියට මානුෂික පැත්ත බලබලායි. නැත්නම් යුද්ධය අවසන් කරන්නට පුළුවන්. සිවිල් ජනතාවගේ පැත්ත නොකතා හිටියා නම් යුද්ධය අවසාන කරන්නට පුළුවන්. නමුත් ප්‍රභාකරන් සිවිල් ජනතාව ගැන හිතන්නේ නැහැ. බස්වල බෝම්බ පුපුරවනවා. ඉස්කෝලවල බෝම්බ පුපුරවනවා. ඒ වාගේම දේශපාලනඥයෝ මරා දමනවා. තමන්ගේම අය මරා දමනවා. මෙවැනි කාලයකයි ආණ්ඩුව යුද්ධයත් හරියට ප්‍රජාතන්ත්‍රවාදිව කරන්නේ. ප්‍රජාතන්ත්‍රවාදිව යුද්ධයත් කර ගෙන, සංවර්ධනයත් කර ගෙන, ආර්ථිකයත් කඩා වැටෙන්නේ නැතිව කරනවා නම් හරියට මේක ලොකු අරුම පුදුමයක් නේද? ලෝකයේ නව වන පුදුමය ද, දහ වන පුදුමය ද කිය මා දන්නේ නැහැ. ආර්ථික විග්‍රහයේ මේක තමයි ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාගෙන් හෝ ඇහුවොත් කියාවි අන්ධ, ගොළු හා බිහිරි මිනිහෙකු මේ ලෝකයේ උපදින්නට බැහැයි කියා. එක්කෝ අන්ධ, ගොළු වන්නට ඕනෑ නැත්නම් බිහිරියි, අන්ධයි වන්නට ඕනෑ. අන්ධ, ගොළු, බිහිරි තුනම ඇතිව මිනිසකු උපදින්නට බැහැ. නමුත් අපේ රජය හැම ආකාරයකින්ම නිසියාකාර කටයුතු කර ගෙන යනවා. ඒ ගැන අපි ආඩම්බර වන්නට ඕනෑ. හරියට බැලුවොත් මොනවාද අපට ආණ්ඩුවට කියන්නට තිබෙන්නේ? ආණ්ඩුවට කියන්නට කථාවක් නැත. ආණ්ඩුව ඉතාමත් සාර්ථකව ආර්ථිකය කළමනාකරණය කරනවා. ආර්ථික කළමනාකරණය අතින් අද රට ඉතා හොඳ තත්ත්වයක තිබෙනවාය කියන එක අපි කියන්නට ඕනෑ.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය අස්ථාවර හා තිරසාරකමින් තොරයි කියලායි බෙහෝ දෙනෙක් විවේචනයේදී කියන්නේ. මේක ඇත්තද? සත්‍යය තත්ත්වය නම් ශ්‍රී ලංකාව ශක්තිමත් සහ තිරසාර ආර්ථික වර්ධනයක් ලබමින් සිටිනවාය කියන එකයි. 2002 වර්ෂයේ සිට සියයට 6ක සාමාන්‍ය ආර්ථික වර්ධන වේගයකින් යනවා. පොඩි වැඩක්ද? 2005, 2006 සහ 2007 යන අනුගාමී වර්ෂවල දී සියයට 6 ඉක්මවා වර්ධන වේගයක් තිබෙනවා. මොකක්ද මේකට එක්සත් ජාතික පක්ෂය කියන්නේ? ඒක නැහැයි කියනවාද? මොනවාද මේකට කියන්නට පුළුවන්? වර්ධන වේගයක් නැහැ කියන්නට පුළුවන්ද? එහෙම නම් මහ බැංකු වාර්තා බොරුද? හොඳ ආර්ථික වර්ධන වේගයක් මේකේ

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

තිබෙනවා. [බාධා කිරීමක්] මේක හොඳට අහ ගන්න. අනෙක් පැත්තෙන් බලන්න. 2008 වර්ෂය සඳහා පමණක් සියයට 6ක ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා විතරක් නොව, 2009 වර්ෂය වෙද්දී මේක සියයට 6 ඉක්මවා යනවාය කියන පුරෝකථනයක් තිබෙනවා.

ඊළඟට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කලාපයේ සමගාමී රටවල් එක්ක සංසන්දනාත්මකව බලද්දී B හා BB ස්වෛරීත්ව ණය වර්ගීකරණ ලබා ඇති රටවල් අභිබවා ගොස් තිබෙනවා. මේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ දත්ත අනුවයි මා කියන්නේ. අපි මොනවා කිව්වාත් ඒ විදේශ මිනුම් දඬුත් එක්ක සංසන්දනාත්මකව බලද්දී වර්ධනයක් තිබෙන බව අපිට පෙනෙනවා. ඇත්ත වශයෙන්ම Central Bank එකේ මහත්වරුන්ට අපි ලොකු ගෞරවයක් දක්වන්න ඕනෑ. මේ ගැන පුරෝකථනය කරලා ඒ තත්ත්වය ඇති කර ගන්න අපේ ජනාධිපතිතුමාත් එක්ක එකතු වෙලා ඒ අය කරන වැඩ පිළිවෙළ ගැන මගේ ලොකු පැහැදීමක්, හෘදයංගම හැඟීමක් තිබෙනවා. ඒ අය එහෙම නොකළා නම් අපේ රට ඉවරයි.

ඊළඟට, අපි දෙන දේවල් බලන්න. පොඩි ගණනක්ද දෙන්නේ? අපි පොහොර සහනාධාරය දෙනවා. ඒකට අපි පොඩි ගණනක්ද දෙන්නේ? විශාල වශයෙන් අපි පොහොර සහනාධාරය දෙනවා. මම ගණන් බැලුවා. අපි යූරියා හොණ්ඩරයක් ගන්නේ රුපියල් 4,500ට. දෙන්නේ රුපියල් 350ට. එතකොට සහනාධාරය විතරක් රුපියල් 4,150යි. අපි මඩ පොහොර හොණ්ඩරයක් ගන්නේ රුපියල් 5,000ට. දෙන්නේ රුපියල් 350ට. එතකොට සහනාධාරය රුපියල් 4,650ක්. බණ්ඩි පොහොර හොණ්ඩරයක් ගන්නේ රුපියල් 6,500ට. දෙන්නේ රුපියල් 350ට. සහනාධාරය විතරක් රුපියල් 6,150යි. සාමාන්‍යයෙන් හෙක්ටෙයාරයකට රුපියල් 47,162ක සහනාධාර දෙනවා. සාමාන්‍යයෙන් අක්කර එක, තුන, පහ විධියට තමයි අපි සහනාධාර දෙන්නේ. අක්කර පහක් විතර ගොවිතැන් කරද්දී අපි රුපියල් ලක්ෂ දෙකක විතර සහනාධාර දෙනවා. ඒක අවුරුද්දෙන් බෙදලා මාසයකට ලැබෙන සහනාධාරය කීයද කියා බලන්න කෝ. පොඩි ගණනක්ද මේ සහනාධාර විධියට දෙන්නේ? එතකොට ඒ වාගේ කී දෙනෙකුට ලැබෙනවාද? කෘෂිකර්මයේ යෙදෙන සියයට හතළිස්පහකට දැන් සහනාධාර ලැබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් එළවලුවලටත් ඒ සහනාධාරය දෙන්න හදනවා.

ඒ දවස්වල වී කිලෝවක් කීයද? දැන් වී කිලෝවක් කීයද? පසු ගිය මැතිවරණ කාලයේ මට මැදිරිගිරිය ප්‍රදේශය බලන්න දීලා තිබුණා. මම එහි ගියා. මොකක්ද වුණේ? එදා ඡන්ද අටසීයකින් දාහකින් දිනපු ආසන දැන් ඡන්ද අටදාහකින් තමයි දිනන්නේ. මොකක්ද ඒකට හේතුව? ඒ මිනිස්සු කියනවා, "දැන් තමයි අපිට සහතික මිලක් ලැබෙන්නේ, දැන් තමයි ගොවියා රජ වෙන්නේ" කියලා. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා වගා සංග්‍රාමය සඳහා කුඹුරට බැස්සාම හාස්‍යයට ලක් කළා; නිකම් බොරු 'ෂෝ' කිව්වා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? එතුමා ඔප්පු කර තිබෙනවා, මේ රට දියුණු කරන්න ඕනෑ නම් සමාජවාදී ආවරණයක් යටතේ ආර්ථිකය කළමනාකරණය කරමින් දේශීය නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ බව. දේශීය නිෂ්පාදනය වැඩි කරන්න නේද මේ සෙස් බද්ද දමා තිබෙන්නේ. ඒ සෙස් බද්දේ අරමුදල් පාවිච්චි කරලා කෘෂිකර්මය නඟා සිටුවන්න පුළුවන්. දැන් අපි ඒ තත්ත්වයට වැටිලා තිබෙනවා. ඒ නිසා මොන තරම් ප්‍රශ්න තිබුණත් අපි උපකල්පනය කරනවා, පුරෝකථනය කරනවා ලංකාවේ ආර්ථිකයට හානියක් වන්නේ නැහැ කියා. ලංකාවේ ආර්ථිකයට හානියක් වනවා නම් වන්න තිබුණේ එක්සත් ජාතික පක්ෂය බලයේ හිටියා නම් තමයි. එහෙම නම් මේ වෙන කොට ඇමෙරිකාවට වෙච්ච දේ තමයි වෙන්නේ. ඒ ගැන කථාවක් නැහැ. ඒ නිසා ඒ ගොල්ලන්ට මේ පිළිබඳව තර්ක කරන්න බැහැ. උදාහරණ මොනවාද? අතීතය බලමුද?

1982 ජනාධිපතිවරණයේදී හෙක්ටර් කොබ්බෑකඩුව මහත්මයා තමුන්ට තිබුණු අක්කර පනහත් දුන්නා. තමුන්ට තිබුණු දේපොළත් දුන්නා. එහෙම දීලා අක්කර පනහේ සීමාව ඇති කරලා ඡන්දය ඉල්ලන්න යාපනයට ගියා. එතුමා ඡන්දය ඉල්ලද්දී කුමාර් පොන්නම්බලම් මහත්මයාත් ඡන්දය ඉල්ලුවා. විජේවීරත් ඉල්ලුවා. ඒ වාගේම කොල්වින් ආර්. ද සිල්වාත් ඉල්ලුවා. ඒ සේරම අය ඡන්දය ඉල්ලුවත් යාපනයේ මිනිස්සු ඡන්දය දුන්නේ කාටද? හෙක්ටර් කොබ්බෑකඩුව මහත්මයාට. මොකද එතුමා කිව්වා, "අපි ආවොත් -ආර්ථිකය කළමනාකරණය කරනවා කියලා ඔබාමා කිව්වා වාගේ- කවදාවත් පිට රටින් ආහාර ගෙනෙන්නේ නැහැ" කියා. එහෙම කිව්වාම මිනිස්සු තොග පිටින් ඇවිල්ලා ඡන්දය දුන්නා. යාපනය, කෝපායි, මානිපායි, කයිට්ස් ජනතාව ඡන්දය දුන්නා. එතුමා ගම්පහින්, කළුතරින්, කොළඹින්, නුවර එළියෙන් පරදිද්දී උතුරු පළාතේ මිනිස්සු ඡන්දය දුන්නා. හේතුව මොකක්ද? එදා ඔහු විශ්වාසයක් තැබුවා, මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න නම් කෘෂි ක්ෂේත්‍රයට මුල් තැනක් දෙන්න ඕනෑ කියා. ජනාධිපතිතුමා පොහොර සහනාධාරය දෙන්න විතරක් රුපියල් මිලියන 48,000ක් -ඒක කොච්චර නිවැරදිද කියා මම දන්නේ නැහැ- මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. අපි කල්පනා කරන්න ඕනෑ අපේ රට දියුණු කරන්න තිබෙන මාර්ග ගැන.

දැන් ඉන්දියාව නේද පොඩ්ඩක් ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ. චීනයේ එක පවුලකට එක ළමයයි කියලා යෝජනාවක් ගෙනාවා. අද චීනයේ මිලියන 400ක් වැඩිහිටි ජනතාව ඉන්නවා. ඉන්දියාවේ මිලියන 400ක් තරුණ කොටස් ඉන්නවා. එම නිසා ඉන්දියාව කවදා හෝ දවසක චීනයත් පරදවා ගිහින් ලෝකයේ ප්‍රධානියා වෙයි කියා අපේ මතයක් තිබෙනවා. ඒ නිසා අපි ඉන්දියාව එක්ක හොඳ සම්බන්ධතාවක් තියා ගන්න උත්සාහ කරනවා. අපේ ජයග්‍රහණයෙන් පස්සේ ජනාධිපති උපදේශක වශයෙන් බැසිල් රාජපක්ෂ මහත්මයා නැඟෙනහිර සංවර්ධනය කරලා ඉන්දියාවට ගිහිල්ලා මොකක්ද කළේ? එතුමා ගිහිල්ලා පෙන්නුවා නැඟෙනහිර සංවර්ධනය කරපු හැටි. ඊයේ පෙරේදා ඇති වෙච්ච අර්බුදයේදී ඒ කරපු වැඩ කොටස් පෙන්නුවා. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කර තිබෙන හැටි පෙන්නුවා. ඉස්සර වෙලාම පළාත් පාලන මැතිවරණය තිබ්බා. පළාත් සභාව ජයග්‍රහණය කරලා ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන අයට -හිටපු ත්‍රස්තවාදී කණ්ඩායමකට- පරිපාලනය භාර දීලා පෙන්නුවාම ඒ ගොල්ලෝ හිතුවා, මේක තමයි ඇත්ත කියලා. ඒ නිසා ඉන්දියාවත් අද අපෙන් පාඩම් ඉගෙන ගන්නවා. අපෙන් ගුරුහරුකම් ගන්න පෙලඹිලා තිබෙනවා. මේ ජනාධිපතිතුමාගේ චින්තනයේ හැටියට අපිට ඇමෙරිකාවටත් ගුරුහරුකම් පෙන්වන්න පුළුවන් වෙලා තිබෙනවා. එතුමා විශ්වාස කළේ නැහැ, ලෝක බැංකුවේ තිබෙන ප්‍රතිපත්ති, ණය ලබා දීමට ලෝක බැංකුව කරන ඒ යෝජනා සහ ඒ ක්‍රියාවලිය. එතුමා අනික් පැත්තත් බැලුවා. එතුමාට පුළුවන්කම තිබුණා ඉරානයෙන් තෙල් ටික ගන්න. ඉරානයෙන් තෙල් ටික ගන්නවා විතරක් නොවෙයි, අරමුදල් සොයා ගන්නා තෙක් හය මාසයක් අපට ණයට තෙල් ලබා දෙන්නත් ඉරානය අද එකඟ වෙලා තිබෙනවා. ඉරානය එක්ක කථා කරන්න කවුරුත් භය වෙලා හිටපු වෙලාවේ, ඉරානය කොන් කරපු වෙලාවේ, අපේ ජනාධිපතිතුමා එහේට ගිහින් කථා කළා. මෙන්න මේක තමයි අපේ විදේශ ප්‍රතිපත්තිය. අපේ විදේශ කටයුතු ඇමතිතුමා ඒ පිළිබඳව විශාල කාර්ය භාරයක් කළා. හැම දෙනාම කිව්වා එතුමාගේ වියදම් වැඩියි කියලා. වියදම් වැඩි මොකක්ද? එල්ටීටීඊ එක යුද්ධය වෙනුවෙන්, තමන්ගේ ප්‍රචාරයන් වෙනුවෙන් කොපමණ වියදම් කරනවාද? නමුත් ජේවීපී එකේ මන්ත්‍රීතුමා ඉතාමත්ම නරක විධියට ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය විවේචනය කළා. මේ වාගේ ජනාධිපතිතුමකු අපි ආරක්ෂා කරන්නේ නැද්ද? මේ විදේශ කටයුතු ඇමතිතුමා පොඩි ගණනක් වියදම් කරලා, මේ රටේ කීර්තිය වෙනුවෙන් තමන්ගේ ශ්‍රම දායකත්වය ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපට තිබෙන යුද්ධ දෙකෙන් එකක් තමයි, විදේශ ප්‍රචාරක යුද්ධය. ප්‍රචාරක යුද්ධය ජයග්‍රහණය කරන්න එතුමා පාවිච්චි කරපු මුදල බොහොම සොච්චමක්. ඒකෙන් ලැබෙන ප්‍රතිලාභත් එක්ක කරපු වියදම බැලුවොත්, දශම, දශම, දශම ගණනක් විධියට තමයි අපි එය දකින්නේ. එම නිසා වැරදි ආකල්ප, වැරදි චිත්‍ර, වැරදි තොරතුරු මත මේ කරන විවේචන ඉතාමත්ම පහත් කොට සලකනවා විතරක් නොවෙයි, අපි ඒවා ප්‍රතික්ෂේප කරනවාය කියන එකත් ප්‍රකාශ කරන්න ඕනෑ.

එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඇමෙරිකාව කඩා වැටෙද්දී, මා නම් පෞද්ගලිකව උපකල්පනය කරනවා, මේකෙන් විශාල වාසියක් අපට ලැබේවිය කියා. මොකක්ද ලැබෙන වාසි? ඒ ගොල්ලන්ගේ කොම්පැනි මෙහේට එන්න ඕනෑ. දැනටමත් ඉන්දියාවට විශාල ප්‍රමාණයක් ඇවිත් තිබෙනවා. අපි outsource කරන්න පටන් ගෙන තිබෙනවා. චීනය නිෂ්පාදන ඒකකයක් වශයෙන් කටයුතු කරද්දී, ඉන්දියාව සේවා ඒකකයක් වශයෙන් තමන්ගේ ආර්ථිකය හදා ගෙන තිබෙනවා. එම නිසා දැන් බටහිර රටවල් සේවා ඒකකයට ඉතා විශාල වශයෙන් පිවිසෙනවා. ටෙලිෆෝන් යනාදී නොයෙකුත් දේවල් outsource කරන්න පටන් ගෙන තිබෙනවා. අපේ නිවැරැදි ආර්ථික කළමනාකරණයත්, ආර්ථික ප්‍රතිපත්තියත් නිසා ලබන අවුරුද්ද මීටත් වඩා සුබ දායක අවුරුද්දක් වේවායි කියන එක අපේ ප්‍රාර්ථනාව බව මේ අවස්ථාවේදී සටහන් කරන්න ඕනෑ.

එපමණක් නොවෙයි. මා කියන්න ඕනෑ, පසු ගිය අවුරුදු පහ තුළ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ආයෝජන සියයට 26කින් වැඩි වී තිබෙන බව. මුළු ආයෝජන වියදමින් පෞද්ගලික අංශයේ ආයෝජන සියයට 81යි. එය 2007 වසර තුළ පමණක් සියයට 14කින් වැඩි වී තිබෙනවා. කොහොමද, නැහැයි කියන්නේ? මොන තර්කද තිබෙන්නේ? කොයි විධියටද ඒක නැහැයි කියන්නේ?

ඊළඟට විශේෂිත ඉලක්කගත ආයෝජනයද ඇතුළත්ව මුළු රාජ්‍ය අංශයේ ආයෝජන 2007 වසර තුළ පමණක් සියයට 19කින් වැඩි වී තිබෙනවා. කැපී පෙනෙන අංශ වූයේ ඉදි කිරීම්, නිමැවුම්, විදුලි සංදේශ, විනෝද, ප්‍රවාහන හා විදුලිබල යන අංශයි. සමස්තයක් වශයෙන් සියයට 19ක වැඩි වීමක් පෙන්නුම් කරනවා.

ඒ වාගේම ඔය ගොල්ලන් ඒ කාලයේ කිව්වා, ව්‍යාපාරික විශ්වාසය ශීඝ්‍ර ලෙස පහත වැටීම හේතුවෙන් කොටස් වෙළෙඳ පොළ ඉවරයි කියා. මොකක්ද ඇත්ත තත්ත්වය? කොටස් වෙළෙඳ පොළ තුළ යහපත් ලෙස හැසිරීමක් තිබෙනවා. බැංකුවලින් ඉස්සර අපි ගත්ත reservesවලින් සියයට එකක් එළියට දැම්මා. ඒ නිසා අපට පුළුවන් වුණා, ඔය වැටීම, කැඩීම නතර කර දමන්න. හැම පැත්තෙන්ම බලද්දී ආර්ථිකය නරක් වෙලා නැහැ. ආර්ථිකය හොඳ තත්ත්වයට පත් වී තිබෙනවාය කියන එක සටහන් කරන්න ඕනෑ.

ඒ වාගේම විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයෝ දැන් මුදල් එවීමට කැමැත්තක් දක්වන්නේ නැහැයි කිව්වා. නමුත් විදේශ ප්‍රේෂණ සැලකිය යුතු මට්ටමකින් ශීඝ්‍රයෙන් වර්ධනය වී තිබෙනවා. එය 2006 දී සියයට 7.6යි; 2007 දී සියයට 7.7යි. එතකොට ඒකේ වැඩි වීමක් පෙන්නුම් කරනවා.

තරගකාරිත්වය තවදුරටත් පවත්වා ගෙන යෑමට රුපියලේ අගය අඛණ්ඩව අවප්‍රමාණය කළ යුතුයි කියන මතය තමයි තිබුණේ. නමුත් සත්‍යය නම්, තරගකාරිත්වය පවත්වා ගෙන යෑමට නම් ඵලදායිතාව වර්ධනය කළ යුතුයි. ඒක තමයි අද විද්වතුන්ගේ මතය වෙලා තිබෙන්නේ. ඉතින් මේවා ගැන බලද්දී ආර්ථිකය ගැන අපට සතුටු වෙන්න පුළුවන්. ගෝලීය වශයෙන් බලද්දීත්, අනෙක් අංශවලින් බලද්දීත් අපට ලොකු සතුටක් දැනෙනවා. ලැබී තිබෙන හොඳ තත්ත්වය ගැන අපි සන්තෝෂ වෙනවා.

2008 අය වැයෙන් ආරක්ෂක වියදම සියයට 20කින් වැඩි කර තිබෙනවා. එය සත්‍යයයි. ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කරන වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවා. උදාහරණයක් කිව්වොත්, දැන් කොන්ක්‍රීට් පාරවල් තමයි හැම තැනම හැදෙන්නේ. ඉස්සර මොකක්ද වෙලා තිබුණේ? තාර දමලා පාර හදනවා. ඒක නඩත්තුව සඳහා සියයට 40ක් වියදම් වෙනවා. ඉදිරියේදී අපිට එම සියයට 40ත් ඉතිරි කර ගන්න මහින්ද චින්තනය යටතේ අලුත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. ඒ පාරවල් කොන්ක්‍රීට් කරන්න කියා අපි යෝජනා කළා. අද ඒක සාර්ථකව ඉදිරියට යමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් රටක බිඳ වැටීමට හේතුව තමයි පරිභෝජනය සඳහා වැඩි ගණනක් වියදම් කිරීම. ඇමෙරිකාවේ ආර්ථිකය බිඳ වැටීමට එක හේතුවක් තමයි නිදහස් ආර්ථිකය විසින් ඇමෙරිකාවට උරුම කළ නිදහස් පරිභෝජනය. ඒ අය කියනවා, ආසියාවේ පොහොසත්ම මිනිස්සු ඉන්නේ කනත්තේ කියලා. එහෙම කියලා අවඥාවට ලක් කළා. ආසියාවේ පොහොසත්ම මිනිස්සු ඉන්නේ කනත්තේ ලු. හේතුව මොකද? ආසියාවේ පොහොසත්ම මිනිස්සු කන්නේ බොන්නේ නැතිව දරුවන්ට ඉතිරි කරලා නිකම්ම මැරිලා යනවා ලු. ඒ මිනිස්සු ඉන්නේ කනත්තේ කියනවා. ඇමෙරිකාවේ මිනිස්සු හොඳට කාලා බීලා, අවශ්‍ය ප්‍රමාණයට වඩා ණය වෙලා, ප්‍රමාණයට වඩා නාස්ති කරලා, තමන්ගේ ආදායමට වඩා වියදම් කරලා ජීවත් වෙනවා. එක් කෙනෙකුට කාර් පහයි. ගෙවල් පහයි. ක්‍රෙඩිට් කාඩ් දහයයි. ඒ පරිභෝජන රටාව තමයි ඒ බැංකු බංකොලොත් කරලා තිබෙන්නේ. ඒ අතින් අපි සන්තෝෂ වන්න ඕනෑ. අපේ ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමන්ලා ඒ කාලයේ කිව්වේ කුමක්ද? දේශීයත්වයට මුල් තැන දෙන්න කියලායි. අපි ඒකට මුල් තැන දෙනවා. එදා ජේවීපී එක අපිත් එක්ක බැඳෙන විට ගත් ඒ නිගමනවල යථාර්ථය අද ඉෂ්ට වෙමින් පවතිනවා. ඒ නිසා මේකට ජේවීපී එකට විරුද්ධ වෙන්න බැහැ. අද අපේ පරිභෝජන රටාව නිසා තමයි පිටිවලට බද්දක් දමලා, කුරක්කන් හරි කාපන් කියන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි දේශීය පලතුරු නිෂ්පාදනයට පොහොර සහනාධාරය ලබා දීලා තිබෙන්නේ; එළවලුවලට ලබා දීලා තිබෙන්නේ. එළවලුත් පිට රටින් ගෙන්වනවා. කංකුං පිට රටින් ගෙන්වනවා. එයාර්පෝට් එකට ගිහිල්ලා බලන්න, එයාර් ලංකා කේටරින් එකට මේවා ටොන් කීයක් පිට රටින් ගෙන්වනවාද කියලා? දැන් මේවා නවත්වන්න රජය හොඳ මැදිහත් වීමක් කර තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ආණ්ඩුව පැත්තෙන් අපි කියනවා අපේ පරිභෝජන රටාව වෙනස් කරන්නට, යථාර්ථයක් ඇති පරිභෝජන රටාවක් බවට පත් කරන්නට මේ අය වැය ලේඛනය සකස් කර තිබෙන බව.

පිටි ගැන මහා ලොකු අඳෝනාවක් කිව්වා, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා. එතුමා සීනි ගැනත් මහා ලොකු අඳෝනාවක් කිව්වා. හකුරු හදන්න යන්නේ තල් ගස් වවලාද කියලා ඇහුවා. ඇයි, මේ තිබෙන තල් ගස් ටික මැද ගත්තාම මොකක්ද වෙන්නේ? එවැනි මහා මුග්ධ, යථාර්ථයක් නොවන, අසත්‍ය චින්තනවල සිටින අයට කවදාවත් මේ රට දියුණු කරන්නට බැහැ. දියුණු කරනවා නම්, දියුණු කරන්නට පුළුවන් වන්නේ අපි යන මේ පාරේ ගියොත් පමණයි. මම හැම දාමත් කියන්නේ ආර්ථිකයට සමාජවාදී ආවරණයක් අවශ්‍ය බවයි. ඒ සමාජවාදී ආවරණයක් තිබුණොත් විතරයි ආර්ථිකය ගොඩ ගන්න පුළුවන්. ඒක අපේ ජනාධිපතිතුමා ඉතා ලස්සනට කරනවා; ඉතා හොඳට කරනවා. එතකොට ඇමෙරිකාව හඬන කොට අපට සිනා සිසී ඉන්න පුළුවන්. ඉස්සර ඇමෙරිකාවට හෙම්බිරිස්සාවක් හැදුණොත් අපට උණ සන්නිපාතය හැදෙනවා. දැන් ඇමෙරිකාව හඬද්දී අපට සිනා සිසී ඉන්න පුළුවන්. අද ලංකාවේ මිලට වඩා ලාභයට ඇමෙරිකාවේ ගෙවල් තිබෙනවා. ලක්ෂ පනහට, හැටට, හැත්තෑවට ලොකු ගෙවල් විශාල ප්‍රමාණයක් විකුණන්න තිබෙනවා. මොකද, අනවශ්‍ය පරිභෝජන රටාවත්, අනවශ්‍ය ණය ප්‍රමාණයත් නිසා. ඒ අය ඩොලර් එකක් තිබෙන විට, ඩොලර් තුනක් ණයට දෙන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ගෙන යනවා. නමුත් අපි එහෙම නොවෙයි. කාලීනව කල්පනා කරලා ඉදිරි දැක්මක් ඇතිව, එවැනි දේවලට මහජනයා පෙලඹෙන්නේ නැති විධියට ක්‍රියා කරන්න Central Bank එකට පුළුවන් වෙලා තිබෙනවා. සක්විති ළඟ සල්ලි තැන්පත් කරපු අයට මොකද වුණේ කියලා දැක්කා නේ. පොලී ගන්න තිබෙන තද බල ආශාව, තද බල වුවමනාව නිසා අනවසර විධියට හම්බ කර ගත් සල්ලිත් එතැන ආයෝජනය කරලා ලොකු බලාපොරොත්තුවක් ඇති කර ගත්තා. අද ඒ බලාපොරොත්තු කඩ වෙලා. අපට කියන්න පුළුවන් අපි යන ගමන සාර්ථකයි, නිවැරදියි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට මේ අය වැය ලේඛනය ගැන ලොකු ප්‍රශංසාවක් කරන්න පුළුවන්. ඒ වාගේම අපේ දරිද්‍රතාවත් දැන් අඩු වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් 1990

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

- 91 කාලයේ ශ්‍රී ලංකාවේ තිබුණු නාගරික සහ ග්‍රාමීය දරිද්‍රතාව පසු ගිය වසර කීපය තුළ සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගන්නට පුළුවන් වුණා. 1990-91 සියයට 26.1යි. 1995 - 96 කාලයේ සියයට 28.8යි. 2002 දී සියයට 22.7යි. 2006 - 07 වෙද්දී ඒක සියයට 15.2ට අඩු කර ගන්නට පුළුවන් වුණා. නාගරික ප්‍රදේශවල දරිද්‍රතාව 1990 - 91දී සියයට 16.3යි. 1995 – 96 දී සියයට 14.0යි. 2002 දී සියයට 7.9යි. 2006 - 2007 වර්ෂ වෙද්දී සියයට 6.7යි. ඒ වාගේම, 1990 -1991 දී ග්‍රාමීය දරිද්‍රතාව සියයට 29.5ක් තිබුණා. 1995 - 1996 දී සියයට 30.9ක් තිබුණා. 2002 දී සියයට 24.7යි. 2006 -2007 දී සියයට 15.7යි. තමුන්නාන්සේලාගේ ප්‍රදේශයේ - වතුවල නම් - පොඩ්ඩක් වැඩි වෙලා තිබෙනවා. සියයට 20.5යි; සියයට 38.4යි; 2001 දී සියයට 30යි. දැන් සියයට 32ක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා ඒ පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වලා වැඩ කර ගෙන යනවාය කියා එතුමා නිතරම ප්‍රකාශ කරනවා.

ආර්ථික වර්ධනය දැන් අපට දැනෙනවා. සේවා වියුක්ති අනුපාතය මෙතෙක් වාර්තා වුණු අඩුම අගයක්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මට විනාඩි 35ක් තිබුණා නේ. ඒ විනාඩි 35ම ඉවරද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒ විනාඩියත් අත අරින්න බැහැ නේ.

සේවා වියුක්ති අනුපාතයේ මෙතෙක් වාර්තා වූ අඩුම අගය වන සියයට 5.1, 2008 ප්‍රථම කාර්තුව තුළ පහත වැටී තිබෙනවා. ජංගම දුරකථන භාවිතය බලන්න. 2008 ජුනි මාසය අවසන් වන විට දසලක්ෂ නවයක් පමණ ජංගම දුරකථන අරන් තිබෙනවා. 2008 ජූලි මාසය අවසන් වන විට ලංකාවේ දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව ලක්ෂ 12යි. නව වාසස්ථාන, ගොඩනැඟිලි, තනි පුද්ගල නිවාස, සෑම මාවතකම ඉදිකිරීම් සිද්ධ වෙමින් පවතිනවා.

ඒ විතරක් නොවෙයි. 2007 වර්ෂය තුළ ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 1,617යි. නැද්ද? ඒක ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ. අපේ පරිභෝජන රටාව තුළ -අප කන දෙය, බොන දෙය- තමයි මේ සියලු දෙය සිද්ධ වන්නේ. අප කන්න ඕනෑ කොහොමද, බොන්න ඕනෑ කොහොමද? පළවෙනුව බාටා - දෙවනුව පාසලට. එතකොට කෑම රස කරන්න අජිනෝමොටෝ කිව්වාම - අපේ රේණුකා හේරත් මන්ත්‍රීතුමියට, අපේ අමරා පියසීලි රත්නායක මන්ත්‍රීතුමියට ඕක කිව්වාම - එතුමියත් ඒවා පොඩ්ඩක් දමලා අපරාදේ පරිභෝජන රටාව වෙනස් කර ගෙන නිකම් නැති නාස්ති වෙලා යනවා. එවැනි දේවල් නොකර මේ පරිභෝජන රටාව හදා ගත්තොත් අපේ රටට ස්වයංව නැඟී සිටින්න පුළුවන්. [බාධා කිරීමක්] රසවත් කාලය ගිහින් නේ?

**ගරු අමරා පියසීලි රත්නායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அமரா பியசீலி ரத்நாயக்க)
(The Hon. (Mrs.) Amara Piyaseeli Ratnayake)
මොකක්ද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කෑම රස කරන්න අජිනෝමොටෝ දමන්න ඕනෑය කියා රේණුකා හේරත් මන්ත්‍රීතුමිය කිව්වොත් එහෙම, එතකොට ඔබතුමියත් ඒකට පෙලඹෙනවා.

**ගරු අමරා පියසීලි රත්නායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அமரா பியசீலி ரத்நாயக்க)
(The Hon. (Mrs.) Amara Piyaseeli Ratnayake)
නැහැ, නැහැ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ආ, එහෙම දමන්නේ නැහැ? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
අවසන් කරන්න ගරු ඇමතිතුමා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කෙසේ වෙතත්, මේ සේරම විකාර. දැන් ඇති වෙලා තිබෙන මනෝ සිතුවිලි. මේ අපේ මනෝ විජයරත්න ඇමතිතුමා නිසා නොවෙයි. අර අපට දායාද කළ ඇමෙරිකන් සිතුවිලි ටික තමයි මේකට මුල් වෙලා තිබෙන්නේ. මේ සිතුවිලිත් එක්ක බද්ධ වුණු පක්ෂයක් ලංකාවේ තිබෙනවා නම් ඒ පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි කියා අපට කියන්න පුළුවන්. පෞද්ගලික අංශය සියයට සියයක් විශ්වාස කරන, රාජ්‍ය තන්ත්‍රය විශ්වාස නොකරන, ඒ වාගේම ආර්ථිකයට සිද්ධාලේප ගාන පක්ෂයක් ඒක. සිද්ධාලේප ගෑවාම මදුරුවන් කාලා කහනවාට වඩා ලොකු දැවිල්ලක් එනවා නේ. බොරුවට ඒ කාලයට සිද්ධාලේප ගාලා ඒ වාගේ ආර්ථිකයක් ඇති කරපු එක්සත් ජාතික පක්ෂය ගැන නම් කවදාවත් මේ රටේ ගොවි ජනතාව විශ්වාස කරන්නේ නැහැ. මේ දෙන සහනත්, මේ ගෙන යන වැඩ පිළිවෙළත්, මේ යුද්ධයට කරන මානුෂික මෙහෙයුමත් -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. අවසන් කරන්න ගරු ඇමතිතුමා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
-ඒ වාගේම, දෙමළ ජනතාව වෙනුවෙන් පෙනී සිටීමත් නිසා අපේ රජය තව අවුරුදු ගණනාවක් යනතුරු හොල්ලන්නවත් හම්බ වන්නේ නැහැය කියන එක අප කියනවා. මේ ජනාධිපතිතුමා තවත් වර්ෂ ගණනක් ඉන්නවා. විදේශ ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය අද ඇගැයීමට ලක් වෙලා තිබෙන නිසා අප එතුමාටත්, විශේෂයෙන්ම නැඟෙනහිර පළාත සංවර්ධනය කිරීම ගැන උපදේශකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 3.37]

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Vajira Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංඛ්‍යා ලේඛන ගැන මොකුත් අදහස් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, ටික වෙලාවයි - විනාඩි කීපයක් පමණයි - ඉතිරි වෙලා තිබෙන්නේ. වෙලාව ගොඩක් කැපිලා තිබෙනවා. මගේ මිත්‍ර ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා දීර්ඝ විස්තරයක් කිව්වා. විවිධ අය අදහස් ගණනාවක් ඉදිරිපත් කළා. කෙසේ වෙතත්, සමස්ත අය වැය දිහා බැලුවාම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඉලක්කම්වලින් මහජනතාවට සත්‍යය ලැබෙනවාද? මහජනතාවට මේ ඉලක්කම්වලින් නියමිත ප්‍රයෝජනය ලැබෙනවාද? මහජනතාව පැත්තක තියලා මේ සභා ගැබේ වැඩ කරන සේවකයන් ගනිමු. මේ සභා ගැබේ වැඩ කරන සේවකයන්ටවත් මේ සංඛ්‍යා ලේඛනවලින් ඔවුන්ගේ අවශ්‍යතාව ඉෂ්ට වනවාද? මා දන්නා විධියට සත්‍ය තොරතුර නම් එහෙම ඉෂ්ට වන්නේ නැහැ කියන එක. මේ සමස්ත අය වැය දිහා බැලුවාම නොයෙක් කථා, ඉතිහාසයේ චෝදනා ඉදිරිපත් කරන්න පුළුවන්. පී. දයාරත්න ඇමතිතුමා - හිටපු සෞඛ්‍ය ඇමතිතුමා - මේ ගරු සභාවේ විනාඩියක් හරි හිටියා නම් ඇත්තටම හොඳයි. මොකද, එතුමා ඊයේ අදහස් ඉදිරිපත් කිරීමේදී කිව්වා, රාජ්‍ය අංශයට එකම සේවකයකුවත් ගත්තේ නැහැ කියා. ඒක වැරදියි. දයාරත්න ඇමතිතුමා හෙද සේවයට, අනිකුත් සේවාවන්වලට සේවකයන් බඳවා ගත්තා. මා ළඟ අදාළ ලේඛන තිබෙනවා. 4,000කට ආසන්න ප්‍රමාණයක් එදා අපි බඳවා ගත්තා. රාජ්‍ය අංශය ගැන විවිධ චෝදනා ඉදිරිපත් කළ නිසායි මම ඒ කරුණු කිව්වේ. එදා හිටපු රාජ්‍ය පරිපාලන විෂය භාර ඇමතිවරයා හැටියට මම කියන්න කැමතියි, තාක්ෂණ නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණය අපි එදා බඳවා ගත්ත බව. පරිපාලන සේවයට අවශ්‍ය කරන භාරසිය ගණනක් නිලධාරින් අපි බඳවා ගත්තා. සමහර විට අපි අනවශ්‍ය බඳවා ගැනීම් කළේ නැහැ කියන එක මම පිළිගන්නවා. ඒක ඇත්ත. හැබැයි, රාජ්‍ය යන්ත්‍රය හසුරු වන්න අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව අපි එදා බඳවා ගත්තා.

අපේ ඇමතිතුමා සක්විති ගැන කිව්වා. මට ඇත්තටම මේ ආණ්ඩුව ගැන කියන්න තිබෙන්නෙත් මේ ආණ්ඩුවයි සක්විතියි අතර ලොකු වෙනසක් නැහැ කියන එකයි. මොකද, සක්විති ගැන එතුමා සඳහන් කළා. සක්විති අවම වශයෙන් රටේ නීතිරීති සහ රෙගුලාසි පද්ධතීන්ට පිටින් වැඩ කළ පුද්ගලයෙක්. හැබැයි, රාජ්‍ය යන්ත්‍රයට කොහෙත්ම අයිතියක් ලැබෙන්නේ නැහැ, සක්විති ආකාරයෙන් වැඩ කරන්න. උදාහරණයක් හැටියට ගත්තොත් සක්විති ළඟ තැන්පත් කළ මුදල් මිනිස්සු ගිහින් ඉල්ලුවාම සක්විතිට දෙන්න බැහැ. හැබැයි, අද ලංකා බැංකුවේ, මහජන බැංකුවේ, එන්එස්බී එකේ ලංකාවේ සල්ලි දමා තිබෙන මිනිස්සු ඔක්කොම ගිහින් countersවලින් සල්ලි ඉල්ලුවොත් කඩදාසි කොළවල මුදල් සඳහන් වෙලා තිබෙනවා. හැබැයි, දෙන්න බැහැ. එතකොට සක්විති නම් අත් අඩංගුවට ගත්තාට කමක් නැහැ. හැබැයි, ලංකා බැංකුවේ, මහජන බැංකුවේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ නිලධාරීන් අත් අඩංගුවට ගන්න එපා. මොකද, සල්ලි නැහැ. ලංකාවේ සියලුම countersවලට ගිහිල්ලා කිව්වොත් කරුණාකර අපි තැන්පත් කර තිබෙන සල්ලි දෙන්න කියා, දෙන්න පුළුවන්කමක් නැහැ. ඒකයි, සක්විතියි, ආණ්ඩුවයි අතර තිබෙන වෙනස. සක්විති ඒක කළාට කමක් නැහැ. ආණ්ඩුවක් ඒක කරන්න හොඳ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මෙහි සඳහන් වෙන කරුණු කාරණා එකක්වත් ක්‍රියාවට නංවන්න පුළුවන් ඒවා නොවෙයි. ඒකයි මම මේ සභා ගැබේ වැඩ කරන අපේ සේවකයන් ගැන සඳහන් කළේ. අපි පාර්ලිමේන්තුව ගනිමු. දැන් මේ අය වැය ලේඛනයේ සඳහන් වෙනවා, සමස්ත රාජ්‍ය සේවකයන්ට අවශ්‍ය කරන ආපදා ණය මුදල දෙලක්ෂ පනස්දාහකට සීමා කරනවාය කියලා. ඉස්සර නම් දෙලක්ෂ හැත්තෑදාහක්, එහෙම නැත්නම් ලක්ෂ තුනක්, ලක්ෂ තුනහමාරක් තමන්ගේ වැටුප අනුව ගන්න පුළුවන්කම තිබුණා. දැන් ඒක එක පැත්තකින් සීමා කර තිබෙනවා. අනෙක් පැත්තෙන් හැම අය වැයකදීම ආපදා ණය ගැන කථා කරනවා. නිදහසින් පසුව මේ පාර්ලිමේන්තුවේ විවාද කරන 62 වැනි අය වැයයි මේ. එතකොට අද 62 වැනි අය වැයට ආවාම, දැන් අය වැය තුනක හතරක සඳහන් වුණු එකම ආපදා ණයක්වත් තවම ගන්න බැරි වෙලා තිබෙනවා. මම කියන මේ කරුණු බොරු නම් ඊළඟ කථාවේදී ආපසු එය නිවැරදි කරන්න කෝ. මේ පාර්ලිමේන්තුවේ සේවකයන් 2007 මාර්තු මාසයේ ඉදිරිපත් කළ ආපදා ණය ඉල්ලුම් පත්‍රයට අනුව අද වෙනකම් ඒ ණය මුදල් ලබා දෙන්න පුළුවන් වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ 2007 මාර්තු මාසයේ ඉඳලා ආපදා ණය ඉල්ලපු සේවක සංඛ්‍යාව තුන්සිය ගණනක් ඉන්නවා. දැනට ණය මුදල් දීලා තිබෙන සංඛ්‍යාව අනූනවය යි. අනෙක් අයට ආපදා ණය අද වෙනකම් ලැබිලා නැහැ. දැන් අය වැය මෙහෙම අපට ගෙන යන්න පුළුවන්. සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තොත්, 2004න් පසුව ආපදා ණය ලබා දී නැහැ. පොලිස් දෙපාර්තමේන්තුව ගත්තොත් ආපදා ණය ලබා දී නැහැ. එතකොට මේ වගේ සුරංගනා කථා අය වැයට ඇතුළත් කරලා කියන්න පුළුවන්, අපි ආපදා ණය ලබා දෙනවාය කියලා. පාර්ලිමේන්තු සේවකයන් 2007 මාර්තු මාසේ ඉදිරිපත් කරපු ආපදා ණය ඉල්ලුම් පත්‍රවලට අද වෙනකම් ණය ලබා දී නැහැ. පාර්ලිමේන්තුවේ සේවකයන් දැනට අවුරුදු තුනකට පෙර ඉල්ලුම් කර තිබුණු ආපදා ණය ඉල්ලුම් පත් සඳහා මුදල් ගෙව්වේ දැනට මාස තුනකට උඩදීයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතින් මේවා කියවන්න පුළුවන්, හැබැයි මේවා ප්‍රායෝගික නැහැ. පාර්ලිමේන්තු සේවකයන් ඉල්ලා තිබෙන එම ආපදා ණය මුදල් ටික ගෙවන්න අද ඕනෑ වෙනවා, රුපියල් බිලියන 1.5ක්. ඔන්න, ඉස්සෙල්ලාම මුදල් අමාත්‍යාංශය, පාර්ලිමේන්තුවේ සේවකයන්ගේ ආපදා ණය ටික ගෙවන්න රුපියල් බිලියන 1.5ක් එවන්න. ඊළඟට, ඉතිරි මුදල් ටික ගෙවන්න තව රුපියල් බිලියන 1.5ක් විතර ඕනෑ. එතකොට ඉලක්කම් විජ්ජාව, ඉලක්කම් සංඛ්‍යා ලේඛන නොයෙක් දේවල් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, ප්‍රායෝගිකව මේ අය වැය එහෙම ක්‍රියාත්මක කරන්න පුළුවන් කමක් නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපට චෝදනා කරන්නට පුළුවන්, එක්සත් ජාතික පක්ෂය හැටියට අපි අරක කළේ නැහැ, මේක කළේ නැහැ කියලා. හැබැයි, එකක් හොඳට මතක තබා ගන්නට ඕනෑ. ලෝකය ගැන කථා කරනවා, දේශීය ආර්ථිකය ගැන පාර්ලිමේන්තුවේ අය වැය කථාවේ ඉදිරිපත් කරනවා. ලෝකයේ තිබෙන ප්‍රශ්න නිසා මෙහි සහන දෙන්න බැහැයි කියලා කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1970-77 බලන්න. මේ අය වැයෙන් අපට තවත් චෝදනාවක් කරනවා. විශ්‍රාමිකයන්ගේ විශ්‍රාමික වැටුප එක්සත් ජාතික පක්ෂය අහෝසි කළා ලු. පසුගිය දා පැවැති "විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම" පිළිබඳව සභාව කල් තැබීමේ යෝජනාව විවාදයේදී කරුණු ඉදිරිපත් කරමින් මා කිව්වා, විශ්‍රාමිකයන්ගේ මොනවා හරි අහෝසි කරන්න එක්සත් ජාතික පක්ෂය ලියවිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා නම් කරුණාකරලා එය ඉදිරිපත් කරන්නය කියලා. අපි අලුත් වැඩ සටහනක් පිළිබඳව කල්පනා කළා. 2003, 2004 වර්ෂවල රාජ්‍යය අංශයේ රැකියා සඳහා බඳවා ගත් අය වෙනුවෙන් වෙනම ක්‍රමයක් අපි කල්පනා කළා. අලුත් විධියකට යන්න අපි කල්පනා කළා. ඉතිහාසය දිහා බැලුවාම, විශ්‍රාම වැටුප අහෝසි කළේ අපි නොවෙයි, 1972 දීයි. ඒ කාලයේ හිටපු රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති සහ අධිකරණ ඇමති ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්මයා තමයි විශ්‍රාම වැටුප අහෝසි කළේ. පාර්ලිමේන්තුවේ හැන්සාඩ්වල තිබෙනවා. ඒ අහෝසි කළාම තමයි එක්සත් ජාතික පක්ෂය පාරට බැස්සේ. 1976 දී විශ්‍රාමිකයන් පාරට බැස්සාම, ඒ ආණ්ඩුව විසුරුවන්න කලින් විශ්‍රාම වැටුප ආපසු ස්ථාපනය කළා. ඊට පසුව 1977 බලය ලබා ගත්තාට පසුව ආපසු විශ්‍රාම වැටුප ලබා දුන්නා. දැන් මේ අය වැය ලේඛනයෙන් විශ්‍රාමිකයන්ට රුපියල් පන්සිය ගණනක් ලැබෙනවාය කියලා තිබෙනවා. අපි එදා විෂය භාර ගෙන සිටින කොට බිලියන ගණනක් වෙන් කරලා, 1997 දෙසැම්බර් මාසේ 31ට සංශෝධනය කරලා, 1991.01.01ට ඉතුරු

[ගරු වජිර අබේවර්ධන මහතා]

කරලායි අපි ගියේ. එදා ඒ සල්ලි ගෙවන කොට ඒ පිළිබඳව සාකච්ඡාවට බන්දුල ගුණවර්ධන මහත්මයාත් මා සමඟ සහභාගි වුණා. එදා හිටපු මුදල් ඇමතිවරයා, චොක්සි මහත්මයාත් සහභාගි වුණා.

එදා මේ පාර්ලිමේන්තුවේ කොච්චර කෑ ගැහුවාද? පාර්ලිමේන්තුවට වග කියන්න මුදල් ඇමති කෙනෙක් ඕනෑ යි කිව්වා. බලන්න, ඇමතිවරුන් එකසිය ගණනක් සිටින තැන මුදල් ඇමති කෙනෙකු පත් කර ගන්න බැහැ. ඒ කියන්නේ විශ්වාස කළ හැකි පුද්ගලයෙකු නැහැ. දැන් බලන්න, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පැවැති 1994 සිට 2001 නොවැම්බර් මාසය දක්වා මේ පාර්ලිමේන්තුවට වග කියන්න මුදල් ඇමති කෙනෙකු නොසිටි නිසා, අපි එදා චොක්සි ඇමතිතුමාව මුදල් ඇමතිවරයා හැටියට පත් කළා. දැන් අද කෝ මුදල් ඇමති කෙනෙක්? අද මේ එකසිය ගණනක ඇමති මණ්ඩලයක් පත් කර සිටියත්, පාර්ලිමේන්තුවේ මුදල් ඇමතිකමට පත් කරන්න සුදුසු කෙනෙකු නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමස්ත අය වැය පොත දිහා බලලා නම් නොයෙක් කරුණු කාරණා කියන්නට පුළුවන්. මේ පොතේ තිබෙන කරුණු අනුව ලූණු කැටේ ඉඳලා සියලුම ද්‍රව්‍ය මිල ඉහළ යන අය වැයක් මේක. ලූණු කැටයටත් සියයට 10ක බද්දක් අය කරනවා. එක පැත්තකින් දේශීය ආර්ථිකය; අනෙක් පැත්තෙන් ලෝකයේ ප්‍රශ්න නිසා කන්න දෙන්න බැහැයි කියනවා. මේක 1970-77 දීත් කිව්වා. 1970-77දී කිව්වා, මේ ලෝකයේ ආර්ථික කඩා වැටීමක් තිබෙනවා, ඒ නිසා තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ කියලා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ කියා එදා පෝලිම් යුගය හැදුවා. සීවුරු දෙන්නත් පර්මිට් හැදුවා. සිමෙන්ති කොට්ටය බෙදන්නත් පර්මිට් හැදුවා. පාරවල්වල මුර පොළවල් හදා හාල් පොලු, මිරිස් පොලු ඔක්කෝම දමලා මුළු ලෝකයේම ආර්ථිකය කඩා වැටිලාය කියන කොට 1977 දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා රට බාර අර ගෙන මාස දෙකෙන් පෝලිම් නැති කළා. කඩ බක්කිත් පිරෙව්වා. ප්‍රශ්නත් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පක්ෂයක් හැටියට අපි කියන්න කැමැතියි, අපි ලෝකයත් එක්ක වැඩ කරන දේශපාලන පක්ෂයක් කියලා. දේශීය අය වැයක් ඉදිරිපත් කරන ගමන් ලෝකයේ ප්‍රශ්න පාර්ලිමේන්තුවට කියන්න එපා. ඒ ප්‍රශ්න ඉදිරිපත් කරලා බේරෙන්න බැහැ. අපට අදත් කියන්න තිබෙන්නේ 70-77 යුගයේදී මිනිස්සු කුණු බක්කි කැවා වාගේ, 77 දී අපේ පක්ෂය රට බාර අර ගෙන මාස කිහිපයකින් කුණු බක්කි වහලා දැම්මා වාගේ එක්සත් ජාතික පක්ෂය වගකීම බාර ගන්න ලෑස්තියි කියලායි. මොකද, අපේ මිත්‍ර ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා මේ පක්ෂයට චෝදනා කරනවා. ඒකේ තේරුමක් නැහැ. එහෙම චෝදනා කරන්න එපා. දේශීය ආර්ථිකයෙන් මේ ප්‍රශ්න විසඳන්න බැහැ. ලෝකය දිහා බලා වැඩ කරන්න තිබෙනවා. ලෝකයේ තිබෙන රැල්ල අනුව කල්පනා කරන්න තිබෙනවා. ලෝකයේ සංවර්ධනය දිහා බලා වැඩ කරන්න තිබෙනවා. එහෙම නැතිව දේශීය ආර්ථිකයක් ගෙනෙනවා නම් අපට කියන්න තිබෙන්නේ හරි හොඳයි, ගෙනෙන්නය කියන එකයි. එතකොට මහජනතාවට අවශ්‍ය සහයෝගය ලැබෙයි.

දැන් බලන්න, තේ වගාවට මේ අය වැයෙන් සහනයක් හම්බ වෙනවාද? තේ ගස් අඩි 8ක් 10ක් උසට වවා ගන්න පුළුවන්. පාන් පුච්චන්න අවශ්‍ය දරවලට රබර් ගස් යොදා ගන්න පුළුවන්. එතකොට අද තේ වගාවට සහනයක් නැහැ; රබර් වගාවට සහනයක් නැහැ; කෝපි වගාවට සහනයක් නැහැ; එන්සාල් වගාවට සහනයක් නැහැ. මොනවාටවත් සහනයක් නැහැ. සමස්ත ලෝකයේම ආර්ථිකය කඩා වැටෙනවාය කියා විහිළු කතා සපයන එකෙන් නම් මේ ප්‍රශ්න විසඳන්න බැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒකයි මම කිව්වේ වැඩි ඈතට යන්නේ නැතුව ඉස්සෙල්ලා පාර්ලිමේන්තු සභා ගැබේ ප්‍රශ්න විසඳා ගන්නය කියා. මේ ආයතනයේ සේවකයන් ආපදා ණය ඉල්ලා දැන් අවුරුදු දෙකකට වැඩියි. 2008 මාර්තු මාසය වන කොට අවුරුදු දෙකයි. මේක නම් ඇත්ත තත්ත්වය, මේක නම් ඉලක්කම්වල තිබෙන සැබෑ තත්ත්වය ඉස්සෙල්ලා ඒ සඳහා විසඳුමක් සොයා ගත යුතුව තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා මේක සමස්ත ප්‍රජාවගෙන් කිසිම කෙනකුට කිසිම සහනයක් ලැබෙන්නේ නැති අය වැයක්ය කියන එකයි කියන්න තිබෙන්නේ. දිගින් දිගටම මේ අපරාධය කර ගෙන යන එක ගැන අපි එච්චර කලබල වෙන්නේ නැහැ. බොහොම හොඳින් මේක කර ගෙන යන්න. මේ ආණ්ඩුවේ පාලනය දිගටම තිබුණොත් තේ ගස් අඩි 7ක්, 8ක් උසට වවා ගන්න පුළුවන්. කවදා හරි ආයෙත් ආණ්ඩුවක් ආවාම තේ ගස් කප්පාදු කරලා දළු කඩන්න හදා දෙන්න පුළුවන්. ඒක තමයි පක්ෂයක් හැටියට අපේ වගකීම වන්නේ. ඒ නිසා සමස්ත රාජ්‍ය සේවකයාටත්, විශ්‍රාමිකයාටත් ලූණු ඇටයේ ඉඳලා සියලුම සුබෝපභෝගික භාණ්ඩවලටත් බදු පනවා, බදු බරවලින් දුවන්න හදන ආණ්ඩුවක් මේක. මේක, දේශයේ ආර්ථිකය ගැන කල්පනා කරලා බද්දෙන් දුවන්න හදන ආණ්ඩුවක් නම් මට කියන්න තිබෙන්නේ බොහොම අමාරු කාලයක් තමයි උද්ගත වෙන්න තිබෙන්නේ කියායි. පාන් ගෙඩියේ මිල ආපසු වැඩි වෙන්න ඉඩ තිබෙනවා. ලූණු පැකට් එකේ මිල වැඩි වෙන්න ඉඩ තිබෙනවා. එදා වේල හරිහම්බ කර ගෙන කන ඔක්කොම අන්ත අමාරු තත්ත්වයකට පත් වෙන්න ඉඩ තිබෙනවා. කෙනකුට මේ දිහා බලා තාවකාලිකව සතුටු වෙන්න පුළුවන්. නොයෙක් කරුණු කියන්න පුළුවන්. ඩීසල් මිල අච්චර අඩු කළාය කියන්න පුළුවන්. පෙට්‍රල් මිල අච්චර අඩු කළාය කියන්න පුළුවන්. ලෝකයේ තත්ත්වය ඊට වැඩිය ගොඩක් පල්ලෙහාට ඇවිල්ලා තිබෙනවාය කියන්න පුළුවන්. හැබැයි වැරදි ආර්ථික කළමනාකරණයක් ගෙන යන ආණ්ඩුවක් මේ තත්ත්වය තව තවත් ගෙන යනවාය කියන්නේ මේ රටේ අහිංසක ජනතාව තව තවත් 'කබලෙන් ළිපට ඇදලා දැමීමක්'. එවැනි අය වැයක් හැටියට තමයි අපට මේ ගැන සඳහන් කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා තමයි අපි පක්ෂයක් හැටියට කියන්නේ අපි මේ අය වැයට විරුද්ධයි කියා. මේකට අපට සහයෝගය දෙන්න බැහැ. මේක ප්‍රායෝගික නැහැ. මේක කරන්න බැහැ. සාධාරණ විවේචනයකට එනවා නම්, සාධාරණව කතා කරනවා නම් අපට මේ ගැන කරුණු කියන්න පුළුවන්.

එක්සත් ජාතික පක්ෂය විශ්‍රාම වැටුප අහෝසි කළාලු. කරුණාකරලා ඒ ලියවිල්ල ඉදිරිපත් කරන්නය කියා මා කියනවා. ආණ්ඩුවක් gossipවලට වැඩ කරන්න හොඳ නැහැ. ආණ්ඩුවක් කට කතාවලට වැඩ කරන්න හොඳ නැහැ. ආණ්ඩුවක් වැඩ කරන්න ඕනෑ කෙළින්. අපි අනුගමනය කරපු ප්‍රතිපත්ති තිබෙනවා. අපේ ප්‍රතිපත්ති මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නොවෙයි. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති අපේ ප්‍රතිපත්ති නොවෙයි. අපේ ප්‍රතිපත්ති අනුව අපි සකස් කරපු රට විනාශ වන එක විතරයි මේ ආණ්ඩුවෙන් සිද්ධ වන්නේ. මේ අය වැයේ තිබෙන එකම යෝජනාවක්වත් ප්‍රයෝගිකව ක්‍රියාත්මක කරන්න බැහැ. මේ අය වැය ක්‍රියාත්මක කරන්න නම් ලෝක ආර්ථිකයත් එක්ක එකතු වෙලා වැඩ කරන්න ආණ්ඩුව ලෑස්ති වෙන්න ඕනෑ. අනික් අතට ආණ්ඩුව කියනවා, මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ යුද්ධය නිසාය, මේක යුද්ධයක් තිබෙද්දී ගෙනෙන අය වැයක්ය කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පක්ෂයක් හැටියට අපි කිහිප වතාවක් යුද්ධය ගැන ප්‍රකාශ කළා. අපේ ත්‍රිවිධ හමුදාව ගිහිල්ලා මාල දිවයින ඇල්ලුවාය කිව්වත් අපි පිළිගන්නවා අපේ ත්‍රිවිධ හමුදාවට ඒක පුළුවන්ය කියලා. අපේ ත්‍රිවිධ හමුදාව ගිහිල්ලා තමිල්නාඩුව අල්ලනවාය කිව්වොත් අපේ ත්‍රිවිධ හමුදාවට ඒක කරන්න පුළුවන් කියලාත් අපි පිළිගන්නවා. නමුත් භාෂා දෙකක් කථා කරන අයගේ ප්‍රශ්නය යුද්ධ කරලා කවදාවත් විසඳා ගන්න බැහැ. මොනම හේතුවක් නිසාවත් ආයුධවලින් මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ. යුද්ධ කරන කණ්ඩායම් ඒක හොඳට මතක තියා ගන්න ඕනෑ. අද, කරුණා, සමාජගත වුණේ අද පිල්ලෙයාන් සමාජගත වුණේ, එක්සත් ජාතික පක්ෂය එදා සාම ගිවිසුම අත්සන් කරපු නිසායි. අපි මේ ආණ්ඩුවෙන් මේ ප්‍රශ්නය අහනවා. අවුරුදු දෙකක් යුද්ධ කළා. සමාජගත වුණු කරුණාගෙ නම අපට කියන්න බලන්න. සමාජගත වුණු පිල්ලෙයාන්ගෙ නම අපට කියන්න බලන්න. අපි එකක් හොඳට මතක තියා ගන්න ඕනෑ. ඒ අවුරුදු දෙකේ, එදා ඔවුන් එල්ටීටීඊ සංවිධානයේ. කරුණා කියන්නේ EPRLF කෙනෙක් නොවෙයි; වෙන සංවිධානයක

කෙනෙක් නොවෙයි. කරුණා කියන්නේ එල්ටීටීඊ සංවිධානයේ කෙනෙක්. එතකොට පිල්ලෙයාන් කියන්නේත් එල්ටීටීඊ සංවිධානයේ කෙනෙක්. දැන් බලන්න, අපේ ආණ්ඩුවක් කාලයේ කරුණා පාර්ලිමේන්තුවට ගෙනාවා නම්, ලිප්ටන් වටරවුමේ ඔළුවෙන් හිට ගෙන දඟලනවා අපට බලන්න තිබුණා. බලන්න, පිල්ලෙයාන්. පිල්ලෙයාන් මහ ඇමති වුණා. ඒක හොඳයි. හැබැයි පිල්ලෙයාන් මහ ඇමති වුණේ කොහොමද? අපි ඒ පළාතේ ගියා නේ. පිල්ලෙයාන්ගේ කඳවුරුවලට යුද හමුදාවෙන්, ගුවන් හමුදාවෙන් සහ පොලීසියෙන් තුවක්කු අල්ලා ආරක්ෂා කර ගෙන තිබෙනවා. ඊයේ පත්තරේ කියා තිබුණා, ඒ ගොල්ලන්ව ආරක්ෂක සේවයට ඇතුළු කරනවා කියලා. අපි කියන්නේ නැහැ, මේක නරකයි කියලා. අපි ඊට එහාට කල්පනා කරලා වැඩ කරපු දේශපාලන පක්ෂයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කල්පනා කරලා බලන්න. පිල්ලෙයාන්ට සුදු අන්දලා මහ ඇමති කරන්න පුළුවන් නම්, ප්‍රභාකරන්ටත් සුදු අන්දලා මහ ඇමති කරලා එහේ තිබෙන ඔහුගේ හමුදා කඳවුරුවලට ත්‍රිවිධ හමුදාවෙන් ආරක්ෂාව දීලා මේ ප්‍රශ්නය අර ගෙන යන කොට කොහොමද වෙන්නේ? යුද්ධ කරලා වෙනත් ක්‍රමයකට මරලා හෝ විනාශ කරලා හෝ මේ ප්‍රශ්නය ඉවර කරන්න පුළුවන් කියලා කවුරු හරි හිතනවා නම් ඒක පුංචි වැරදීමක්. නිදහසෙන් පස්සේ වැරදිච්ච දේ හදා ගන්න තිබෙනවා. භාෂාවන් දෙකක් කථා කරන අයට වෙඩි තියලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. භාෂා දෙකක් කථා කරන අයට වෙඩි තියලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා කවුරු හරි හිතනවා නම් ඒක පුංචි වැරදීමක්. මට වෙලාව නැති නිසා මා මේ කාරණය කියන්න කැමැතියි. එක පැත්තකින් කියනවා, මේ අය වැය යුද්ධයට සම්බන්ධ අය වැයක් කියලා. අනෙක් පැත්තෙන් කියනවා, ලෝක ආර්ථිකය කඩා වැටුණු නිසා ඊට මුහුණ දෙය අය වැයක්ය කියලා. මට කියන්න තිබෙන්නේ මේ කරුණු දෙකම අසත්‍යයක් කියලායි. ඒ නිසා වග කිව යුතු දේශපාලන පක්ෂයක් හැටියට, වග කිව යුතු විරුද්ධ පක්ෂයක් හැටියට අපි කියන්න කැමැතියි, 1970-1977 ලබා ගන්න බැරිය කියපු විසඳුම අපි මාස කිහිපයකදී ලබා දුන්නාය කියන එක. ආයෙත් මාස කිහිපයකදී විනාශ කරන රට නැවත සකස් කර දෙන්න අවශ්‍ය පරිසරයත් අද එක්සත් ජාතික පක්ෂයට -විරුද්ධ පක්ෂයට- තිබෙනවාය කියන එක ප්‍රකාශ කරන අතරම, මේ සමස්ත අය වැයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 3.53]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තෙන්ම දේශීය ආර්ථිකයට එහෙම නැත්නම් දේශීයත්වයට මුල් තැන දෙමින් විශේෂයෙන්ම ග්‍රාමීය අංශයේ සංවර්ධනයට මූලිකත්වය දෙමින් අපේ අතිගරු ජනාධිපතිතුමා මුදල් ඇමති හැටියට ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනය, විපක්ෂය මොනවා කිව්වත් මේ රටේ ජනතාවට සැබෑ සේවාවක් මේ රටට සැබෑ සංවර්ධනයක් ඇති කරන අය වැයක්ය කියන එක අපි මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

විපක්ෂයේ ආසන දිහා බැලුවාම, විපක්ෂය විකල්ප අය වැය ඉදිරිපත් කළත් මොන යෝජනා ගෙනාවත් අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා හැරෙන්නට විපක්ෂය නියෝජනය කරන්නට වෙන කවුරුවත් නැති බව පෙනෙනවා. [බාධා කිරීමක්] ඒක විපක්ෂයේ වගකීම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රධාන විපක්ෂය හැටියට විකල්ප අය වැය යෝජනා ඉදිරිපත් කළාට අද මේ අවස්ථාවේදී විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක් විතරක් ඉන්නවා. මේ අවස්ථාවේදී විපක්ෂයේ වගකීම ඉෂ්ට කරන්නේ එක මන්ත්‍රීවරයායි. විකල්ප අය වැය යෝජනා ගෙනාවාට වැඩක් වෙන්නේ නැහැ. මෙතැන ඉඳ ගෙන තමන්ගේ යුතුකම හා වගකීම ඉෂ්ට කරන්නයි ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට වෙන් කර තිබෙන මුදල පසු ගිය වර්ෂයට වඩා වැඩියි කියලා. එහෙම වැඩි කරලා නැහැ. මා මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය බැලුවොත් වැඩි වෙලා තිබෙන්නේ - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාවේ ගණපූරණයක් නැහැ.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present –*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කර ගෙන යන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

බලන්න, මේ ගරු සභාවේ දැන් එක්සත් ජාතික පක්ෂයෙන් ඉන්නේ එක් කෙනකු විතරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගත්තාම එය ඉතා විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවාය කියා. එවැනි කිසිම වැඩි වීමක් වෙලා නැහැ. ගිය අවුරුද්දට වඩා වැඩි වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 35ක් විතරයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එය රුපියල් මිලියන 3,100 දක්වායි වැඩි වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මූලික අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකා පදනම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජාතික පර්යේෂණ සභාව ආදී ජනතාවට සේවය කරන මෙවැනි ආයතන 10ක් තිබෙන්නේත් මේ වැය ශීර්ෂය යටතේයි. ඒ අනුව තමයි 2009 වෙන කොට රුපියල් මිලියන 3,100ක් වෙන්නේ. මෙය වැරැදි විධියට පෙන්වන්න, අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයේ විශාල වැඩි වීමක් තිබෙනවාය කියා පෙන්වන්න විපක්ෂය උත්සාහ කළා. එහි එවැනි වැඩි වීමක් නැහැ. අය වැය ඇස්තමේන්තුව පෙරළලා ඒ වැය ශීර්ෂය දිහා බැලුවොත් එය පැහැදිලිව පෙනෙනවා. එතුමාගේ කොටසෙහි වැඩි වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 35ක් විතරයි. ගිය අවුරුද්දේ රුපියල් මිලියන 2,533යි. මේ අවුරුද්දේ රුපියල් මිලියන 2,538ක් වාගේ ප්‍රමාණයක් තමයි වෙන්නේ. එම නිසා එසේ වැරැදි විධියට පෙන්වා දීමට යෑම හොඳ නැති දෙයක්ය කියන එක අප කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා එක්සත් ජාතික පක්ෂයේ අය කථා කරලා, විකල්ප අය වැය ඉදිරිපත් කරලා කරුණු ඉදිරිපත් කළා. මේ කොළවල ගහලා තිබෙන ඒවා විතරයි මේ අය වැයේ තිබෙන්නේ, පෙන්වන්නය කියා ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජන සවිය ජනතාවට ලබා දෙනවාය කියා ජනසවි ප්‍රතිලාභීන්ට මේ මා අතේ තිබෙනවා වාගේ සහතිකයක් එදා දුන්නා; ජන සවිය certificate එකක් දුන්නා. මෙහි අත්සන් කර තිබෙන්නේ භාණ්ඩාගාරයේ ලේකම්තුමායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අදාළ රුපියල් 25,000 මුදල එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කවදාවත් දුන්නේ නැහැ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව

[ගරු ලලිත් දිසානායක මහතා]

අපට චෝදනා කළාට ජන සවියේ මුදල වන මේ රුපියල් 25,000 සමෘද්ධි ලාභීන්ට දුන්නාද කියා අප තමුන්නාන්සේගෙන් අහනවා. මේ කොළවල ගහලා, අත්සන් කරලා - [බාධා කිරීමක්] රුපියල් 250ක පොලියක් දුන්නා. පොලිය - [බාධා කිරීමක්] රුපියල් 25,000 ගන්න ගියාම කවුරුවත් දුන්නේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක්සත් ජාතික පක්ෂය චෝදනා කරනවා අපේ ආණ්ඩුව මේවා කොළවල ගහලා විතරයි තිබෙන්නේ කියා. [බාධා කිරීමක්] ඒ කාලයේ අපේ පැත්තේ. [බාධා කිරීමක්] මේ දැන් මා අතේ තිබෙන්නේ ජන සවිය සහතිකයයි. රුපියල් 25,000ක් දෙනවාය කිව්වා. රුපියල් 250ක් දුන්නා. එපමණයි. නමුත් කවදාවත් රුපියල් 25,000 ගන්න ගියාට එය ගන්න හම්බ වුණේ නැහැ. ඒ නිසා අපට චෝදනා කරන්න එන්න එපාය කියන එක අප කියන්න ඕනෑ.

වැය ශීර්ෂයන්හි කපා හැරීම් සිදු වෙලා තිබෙනවාය කියා විපක්ෂයෙන් කියැවුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප කියන්න ඕනෑ ඒ වැය ශීර්ෂයන් කපා හැරීම නොවෙයි සිදු වෙලා තිබෙන්නේ කියා. මා උදාහරණයක් කියන්නම්. අය වැය ඇස්තමේන්තු පොතේ 401 වන පිටුවේ තිබෙන අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය බලන්න. එහි ක්‍රියාත්මක ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ ව්‍යාපෘතියට ගිය අවුරුද්දේ රුපියල් මිලියන 1,380ක මුදල් වෙන් කිරීමක් කර තිබෙනවා. ඒ ව්‍යාපෘතිය අවසන් වුණාට පස්සේ එය 2009ට ආපසු ගෙන ගිහිල්ලා වැඩක් වෙන්නේ නැහැ. ඒ හිස් වීම නිසා වන අඩු වීම පමණයි. එය කපා හැරීමක් නොවෙයි. අපි හිතමු ප්‍රාග්ධන වියදම් අතර ඉදි කිරීම් තිබුණාය කියා. ඒ අදාළ ව්‍යාපෘතිය නිම වුණාට පස්සේ නැවත නැවත ඒවා අවශ්‍ය වන්නේ නැහැ. මේ වැය ශීර්ෂවලින් කපා හැරලා වෙනත් අමාත්‍යාංශවලට එසේ නැත්නම් ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට මුදල් දාලා තිබෙනවාය කියා වැරැදි ආකාරයට පෙන්වන්න යනවා. ඒ මතය වැරැදිය කියන එක අප කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද උදෙන්ම විවාදය පටන් ගත්තු අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වේ මොනවාද? එතුමා දැන් මෙතැන නැහැ. එතුමා මොනවා කියලාද විවාදය පටන් ගත්තේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශපාලනඥයකු කියන්නේ කවුද? ඔහු යම් න්‍යායන් දැන ගන්න පුළුවන්. ඔහුට දැනුම තිබෙන්න පුළුවන්. නමුත් ඒ දැනුම ප්‍රායෝගිකව මේ රටේ ජනතාවට දැනෙන විධියට ක්‍රියාත්මක කරන්න අවශ්‍ය හැකියාව, ශක්තිය තිබෙන්න ඕනෑ. කවුරු මොනවා කිව්වත් වසර 30කට වඩා වැඩි තමන්ගේ ප්‍රායෝගික දැනුම ජනතාවට දැනෙන විධියට ක්‍රියාත්මක කරපු නායකයා අපේ අතිගරු ජනාධිපතිතුමාය කියන එක අප කියන්න ඕනෑ.

එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා කිව්වා අය වැයකදී මූලිකම දේ ජනතාවගේ ආරක්ෂාවය කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු 30ක් මේ රටේ තිබුණු ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය ඉවත් කර දමලා අද එය අවසන් කරන තත්ත්වයට ගෙන එන්නට අතිගරු ජනාධිපතිතුමාට හැකියාව, ශක්තිය ලැබී තිබෙනවා. එය කාටවත් නැහැ කියන්න බැහැ. ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරමින්, ජනතාවට ආරක්ෂාව ලබා දෙමින් ත්‍රස්තවාදයට යට වුණු නැඟෙනහිර ඇතුළු ප්‍රදේශවල පරිපාලන ක්‍රම මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඇති කර තිබෙනවා. මේ රටේ ත්‍රස්තවාදයෙන් යට වෙලා තිබුණු වගා නොකළ භූමි ප්‍රමාණයන් මේ රටේ ගොවීන්ට, පුරවැසියන්ට වගා කරන්න පුළුවන් තත්ත්වයට පත් කර තිබෙනවා. නැඟෙනහිර පළාත වාගේ ප්‍රදේශ මේ රටේ සංවර්ධනයට දායක කර ගැනීමට හැකි වන පරිදි ශක්තිමත් කර තිබෙන්නේ අපේ නායකතුමා වන අතිගරු ජනාධිපතිතුමාය කියන එක අප කියන්න ඕනෑ. එහෙම නම් එතුමාගේ ඒ ප්‍රායෝගික අය වැය ගැන අපි ඇත්තෙන්ම අද කථා කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා පැහැදිලිවම කිව්වේ මොකක්ද? මේ අය වැයේ කිසිම දෙයක් නැහැයි කිව්වා. එතුමා වෙළෙඳ ඇමති කාලයේ එදා මේ රටේ සාමාන්‍ය ජනතාවට, මධ්‍යම පන්තියේ ජනතාවට බඩු ටික ගන්න තිබුණු සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව වහලා දැම්මා. ඒ වහපු තොග වෙළෙඳ සංස්ථාව වෙනුවට අද අතිගරු ජනාධිපතිතුමා, බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත් සමඟ එකතු වෙලා විශේෂ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා Co-op City වෙළෙඳ සල් විවෘත කළා. ගිය වර අය වැයෙන් එක සමුපකාර ප්‍රාදේශිකයකට රුපියල් ලක්ෂ 10ක් ලබා දෙන්න කටයුතු කර තිබුණා. ඒවා ලැබුණා. මගේ අරණායක ආසනයේ සමුපකාර ව්‍යාපාරයට ඒක ලැබුණා. අපි Co-op City වෙළෙඳ සල් විවෘත කළා. රුපියල් ලක්ෂ 10 ලැබුණේ නැහැයි කියලා කියන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමා සමුපකාර ව්‍යාපාරය වෙනුවෙන් ඒ කටයුතු සඳහා ලබන අවුරුද්දටත් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. මෙම වෙළෙඳ සල් 300කට වැඩි ප්‍රමාණයක් දැන් ක්‍රියාත්මක වෙනවා. මේ වෙළෙඳ සල් තවදුරටත් ව්‍යාප්ත කිරීමට ගම් මට්ටමින් mini Co-op City වෙළෙඳ සල් 1,000ක් ආරම්භ කිරීමට රුපියල් මිලියන 300ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. අපි ස්තුතිවන්ත වෙනවා, අතිගරු ජනාධිපතිතුමන්ට. මේක නැහැයි කියලා කියන්න බැහැ. මේ රටේ Co-op City වෙළෙඳ සල් 300ක් ආරම්භ කර තිබෙනවා. රුපියල් ලක්ෂ 10 බැගින් සමුපකාරවලට ලැබුණා. එහෙම නම් විපක්ෂය කියන විධියට මේක කොළයකට සීමා වුණු දෙයක් නොවෙයි. මේවා ප්‍රායෝගිකව ඉටු කර තිබෙනවා. මෙම පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට මොනවා හරි දෙයක් හම්බ වුණේ නැහැයි කියලා ඒක රටට සම්බන්ධ කරන්න යනවා. එහෙම නොවෙයි. ඒ සමුපකාර ව්‍යාපාරවලට යොදවපු මුදලින් Co-op City වෙළෙඳ සල් ආරම්භ කරලා අඩු ආදායම් ලබන ජනතාවට, මධ්‍යම පන්තියේ ජනතාවට ඒ ප්‍රතිලාභය ගන්නට කටයුතු කර තිබෙනවාය කියන එක අප කියන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි අපි කියන්න ඕනෑ, පසු ගිය කාලයේ මේ රටේ ප්‍රධාන ප්‍රශ්නයක්ව තිබුණු අධ්‍යාපනය ගැන. අධ්‍යාපනය පැත්ත ගත්තාම ගුරුවරුන්ව වැරදි පැත්තට යොමු කරලා තිබුණා. මේ රටේ රාජ්‍ය සේවකයාගේ අවම වැටුප රුපියල් 7,500 සිට රුපියල් 11,000 දක්වා වැඩි කළා. ඒ වාගේම අපේ රිචර්ඩ් පතිරණ අධ්‍යාපන ඇමතිතුමාගේ කාලයේදී විශේෂ වූ වැටුප් ක්‍රමයක් ගුරුවරුන් සම්බන්ධයෙන් ඇති කළා. ගුරුවරයාට ආත්ම ගෞරවයකින් යුතුව කටයුතු කරන්න පුළුවන් විධියේ වැටුප් ක්ෂේත්‍රයක් සකස් කළා. එදා වැඩ වර්ජනය කළේ වැටුප් වැඩි කරන්න කියලායි. පසු ගිය කාලයේ අධ්‍යාපන අමාත්‍යතුමාට තිබුණු ප්‍රශ්නය තමයි වැටුප් විෂමතාව ඉවත් කරන්නය කියන ඉල්ලීම. ඒත් කමක් නැහැ. ඒ සඳහාත් මිලියන ගණනක ප්‍රතිපාදන මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවාය කියන එක කියන්න ඕනෑ. රාජ්‍ය සේවකයාගේ අභිමානය ආරක්ෂා කරන්න මුදල් ප්‍රතිපාදන වෙන් කර දීම ගැන අපි අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, පසු ගිය කාලයේදී නියම වේලාවට උත්තර පත්තර පරීක්ෂා නොකිරීම නිසා අහිංසක ශිෂ්‍යයන්ට විශාල ප්‍රශ්නයක් ඇති වුණා. ඔවුන්ට නියම වේලාවට ප්‍රතිඵල ලබා ගැනීමට බැරි වුණා. නමුත් අද ඒ වැටුප් විෂමතාවන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ අය වැයෙන් වෙන් වෙලා තිබෙනවායි කියන එක අපි කියන්න ඕනෑ. එහෙම නම් රටේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන තේරුම් අරගෙන තිබෙනවා. තේරුම් අරගෙන ජනතාවට ඇහුම් කන් දී තිබෙනවා; රාජ්‍ය සේවකයාට ඇහුම් කන් දීලා තිබෙනවා. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමාට මුදල් අමාත්‍යවරයා හැටියට ඒ වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මේ අය වැය ලේඛනයෙන් සම්පූර්ණයෙන්ම වෙන් කරන්නට ශක්තියක් ඇති වෙලා තිබෙන්නේ. එතුමා ඒ ඇහුම් කන් දීම කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කවුරු මොනවා කිව්වත් අද මේ රටේ විශාල සංවර්ධනයක් සිද්ධ වෙනවා. දියුණු වන රටක් හැටියට මාර්ග අවශ්‍යතාව අපට තිබෙනවා. විපක්ෂය නැහැයි කියලා කිව්වාට, මේ අය වැය ලේඛනය කොයි තරම් ප්‍රායෝගිකද කියන එක මම කියන්න ඕනෑ. එහි පැහැදිලිව කියා තිබෙනවා, මාර්ග ඉදි කිරීමේදී වන්දි ගෙවීමට රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙන බව. ඒ ගෙවීමේදී රුපියල් ලක්ෂ 10කට අඩු වන්දි මුදල් කෙළින්ම ගෙවන්නට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙනවා. ඊට වැඩි වන මුදල් සඳහා යම් වග

කීමක් ඒ පුද්ගලයාට දෙන්නට භාණ්ඩාගාර බිල්පත්වලින් ඒ මුදල් ගෙවන්නට කටයුතු කර තිබෙනවා. බලන්න, එන ගැටලුවලට මුහුණ දෙන අන්දම කොයි තරම් ප්‍රායෝගිකද කියලා. එක පැත්තකින් මාර්ග ඉදි වීම ඉක්මන් කරන්නට ඕනෑ. ඒ වගේම අදාළ ඉඩම් ලාභියාට යම් කිසි ප්‍රතිපාදනයක් ඉක්මනින් ලැබෙන්න ඕනෑ. මෙන්න මේ විධියට රටේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නවලට ප්‍රායෝගිකව ගැළපෙන ආකාරයට මේ අය වැය තුළ අදාළ යෝජනාවන් අනුමත වෙලා තිබෙනවායි කියන එක අපි කියන්න ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ප්‍රධාන වශයෙන් විදුලිය ප්‍රශ්නය තියෙනවා. අද පවතින විදුලි අර්බුදය ගත්තාම කවුරු මොනවා කිව්වත් මම හිතන්නේ අද ගල් අඟුරු විදුලි ව්‍යාපෘතිය අවශ්‍ය වෙලා තියෙනවාය කියායි. ඒ සඳහා ඉහළ කොත්මලේ විදුලි ව්‍යාපෘතියත්, ඒ වාගේම නොරොච්චෝලේ විදුලි ව්‍යාපෘතියත් ආරම්භ කර තිබෙනවා. එදා ආරම්භ කරන්න බැරිව කල් දමාපු එක අද ආරම්භ කරලා ඉදිරියට තව වසර ගණනාවකින් ඒ විදුලි අර්බුදය විසඳීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් අවශ්‍ය පිළියම් යොදා තිබෙනවා. බලන්න, ඒ තුළින් විදුලි බිල අඩු කරන්න පුළුවන්. මොකද, ලෝකයේ ජල විදුලි අර්බුදයට විකල්පයක් වශයෙන් තිබෙන දේ තමයි ගල් අඟුරු. එහෙම නම් අපි එතැනට යන්න ඕනෑ. අද ඒ ව්‍යාපෘති තුළට ගිහිල්ලා ඉදිරියේදී විදුලි බිල අඩු කිරීම සඳහා, විදුලිය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා යම් සැලැස්මක් ඇති කර තිබෙනවා. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ ප්‍රධාන වාරි මාර්ග ව්‍යාපෘති ගත්තාම විශේෂයෙන්ම මොරගහකන්ද වාරි මාර්ග ව්‍යාපෘතිය මහවැලි යෝජනා ක්‍රමය යටතේ අද වන විට ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා දේශීය වශයෙන් වෙන් කරන්න ඕනෑ මිලියන ගණනක මුදල පසු ගිය අය වැයෙන් ලබා දීලා ඒ කටයුතු සාර්ථක කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම එම සංවර්ධන යෝජනා ක්‍රමවලදී උමා ඔය ව්‍යාපෘතිය ගෙන බැලුවොත් ඉරාන රජයේ මුදල් අරගෙන දිගම උමඟ හරහා ඉදි කරන වාරි ව්‍යාපෘතිය අද ආරම්භ කරලා තිබෙනවා. හම්බන්තොට වරායේ වැඩ කටයුතු චීන රජයේ මුදල් ලබා ගෙන අද ආරම්භ කරලා තිබෙනවා. මේවා කාටවත් නැහැයි කියලා කියන්න බැහැ. මේවා පොත්වල විතරක් තිබෙන කරුණුය කියලා කියන්න බැහැ. එහි ගියාම ඇස් දෙකෙන් බලා ගන්න පුළුවන්. මොකද, විපක්ෂය සෑම වේලාවේම කියන්නේ මේවා වෙන්නේ නැහැ, මේවා ලැබෙන්නේ නැහැ කියලායි. අතිගරු ජනාධිපතිතුමා ගිය සංචාරවලින් ඒ විදේශ රටවල් එක්ක තිබෙන සම්බන්ධතාවන් දියුණු කර ගෙන ඒ අනුව තමයි මේ මුදල් ප්‍රතිපාදන අද ලබා ගන්නට කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා අප කාටවත් මේවා නැහැයි කියලා කියන්න බැහැ. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම එතුමා මෙවර අය වැයෙන් සැබෑ තත්ත්වයක් බවට පත් කරන්නට කටයුතු කර තිබෙනවාය කියන එක කියන්නට ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මෙම අය වැයෙන් අඩු ආදායම් ලබන පවුල්වල වයස අවුරුදු 01 සිට 05 දක්වා වූ දරුවන් සඳහා මාසිකව රුපියල් 200ක කිරි සඳහා දීමනාවක් ලබා දීමට කටයුතු කිරීම ගැන. එය 2009 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වීමට නියමිතයි. මේ සඳහා රුපියල් මිලියන 900ක මුදලක් වෙන් කරලා තිබෙනවා. මෙතෙක් මේ රටේ පාසල් ශිෂ්‍යයින් සඳහා ලබා දුන් නිල ඇඳුම් ඒ වාගේම පොත් ටික මේ කිසිම දෙයක් යුද්ධයක් තිබුණාය කියලා වෙනස් කරලා නැහැ. ඒවා ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ කටයුතුත් පෙන්වා තිබෙනවා. ඒක නැහැයි කියලා කියන්න බැහැ, ඒවා කප්පාදු කරලා නැහැ. එහෙම නම් මේ මුදලත් ලැබෙන්නේ නැහැයි කියලා විපක්ෂයට චෝදනා කරන්න බැහැ. මොකද, ඒ අය හැම කථාවකදීම මේවා ලැබෙන්නේ නැහැය, මේවා ඉලක්කම් විතරය කියලා කිව්වා. නමුත් ඒවා යථාර්ථයන් බවට පරිවර්තනය කරලා තියෙනවාය කියලා අපි කියන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකද, මේ කරුණු ප්‍රායෝගිකව එතුමා කල්පනා කර බලා මේ රටේ ජනතාවට අවශ්‍ය ආකාරයට තමයි සකස් කරලා තියෙන්නේ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උසස් අධ්‍යාපනය ගැනත් කියන්න ඕනෑ. උසස් අධ්‍යාපනයේ නියැලෙන ශිෂ්‍යයන් සඳහා විශේෂයෙන්ම නව විශ්වවිද්‍යාල පිහිටුවා තිබෙනවා. [බාධා කිරීමක්] එදා 1958 දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේ විද්‍යෝදය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ආරම්භ කරලා මෙරටේ උසස් අධ්‍යාපනයට පිවිසෙන ගමේ දරුවන්ට වැඩි අවස්ථාවක් ඇති කරලා දුන්නා. 1970 සිට1977 දක්වා වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය සමයේ විශේෂයෙන්ම යාපනයේ විශ්වවිද්‍යාලය ඇති කරලා මෙරටේ තවත් වැඩි ප්‍රමාණයකට උසස් අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව ලබා දුන්නා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමන් ඒක ඉදිරියට ගෙන යමින් කටයුතු කරනවා. විශේෂයෙන්ම එතුමාගේත් සම්බන්ධයක් තිබෙන විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පනස් වසරක සැමරුම නිමිත්තෙන් රුපියල් මිලියන 100ක් විද්‍යෝදය විශ්වවිද්‍යාලයට එහෙම නැත්නම් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට වෙන් කර දීම ගැන එම විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන උපාධිය ලැබූ ශිෂ්‍යයකු හැටියට මමත් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා කළ ගුණ දන්නා කෙනකු හැටියට මේ හැම දෙයක්ම, හැම කරුණක්ම අමතක නොකර ජාතියේ නායකයා හැටියට ඒ කටයුතු කරනවා. එතුමා අය වැය යෝජනාවල විශේෂයෙන් ඒක සඳහන් කර තිබෙන්නේ මෙහෙමයි:

"අපේ රටට ශාස්ත්‍ර ඥානයෙන් පුනර්ජීවයක් ලබා දුන් විද්‍යෝදය විශ්වවිද්‍යාලය නමින් ආරම්භ කරන ලද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය නමින් ආරම්භ කළ කැලණිය විශ්වවිද්‍යාලයේ පනස් වැනි සැමරුම ලබන වර්ෂයට යෙදී තිබෙනවා. මෙම උත්කර්ෂවත් අවස්ථාව අගය කිරීම සඳහා පවත්වනු ලබන වැඩසටහන් වෙනුවෙන් රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට යෝජනා කරනවා."

ඒ විධියට හැම අංශයක් ගැනම දැනීමක් තිබෙන, අවබෝධයක් තිබෙන, ජනතාවගේ අවශ්‍යතා ගැන අවබෝධයක් තිබෙන නායකයෙක් අපට ලැබී තිබීම ගැන අප සතුටු වන්නට ඕනෑ. මේ අය වැයේදී සෑම අංශයකටම අවශ්‍ය අවධානය යොමු කර තිබීම තුළ එතුමා ඒ කාරණය පෙන්නුම් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රෝහල් හා සෞඛ්‍ය අංශය ගත්තාම කවුරු මොනවා කිව්වත් පළාත් සභාවක හිටපු සෞඛ්‍ය ඇමතිවරයා හැටියට මා දන්නවා, මේ වෙන් කළ මුදල් පළාත් සභාව හරහා අපට ලැබුණ බව. එසේ මුදල් ලැබීම තුළ සබරගමුව පළාත් සභාව මඟින් දිස්ත්‍රික් රෝහල් විශාල සංඛ්‍යාවක් උසස් තත්ත්වයට පත් කරලා - මූලික රෝහල් බවට පත් කරලා - ඒ තුළින් වැඩි සේවාවක් ජනතාවට ලබා දීමට කටයුතු කළා.

විශේෂයෙන්ම මේ රටට වැදගත් ආදායම් මාර්ගයක් වන්නේ තේ කර්මාන්තය හා රබර් කර්මාන්තයයි. විශේෂයෙන් තේ කර්මාන්තය ආශ්‍රිතව තිබෙන වතු රෝහල් රජයට පවරා ගෙන සංවර්ධනය කිරීම සඳහා විශාල වැඩ කොටසක් කර තිබෙනවා. අඩු පාඩුකම් තිබෙන වතු රෝහල් නවීකරණය කිරීම සඳහාත්, ගිලන් රථ ලබා දීම සඳහාත් රුපියල් මිලියන 350ක් වෙන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළාත් සභාවේ හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයකු හැටියට මා බොහොම පැහැදිලිව මේ ගැන දන්නවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කියන්නේ මේවා කොළවලට විතරක් සම්බන්ධයි කියලායි. නැහැ. එහෙම කියන විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මා කියනවා, අපේ පළාතට එන්නයි කියා. පසු ගිය අවුරුද්දේ වතු රෝහල් සඳහා මිලියන 50ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වතු රෝහල් සංවර්ධනය කරන්නට දැනට CECB ආයතනය හරහා අප ඇස්තමේන්තු කැඳවා ඒ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. එහෙම නම් ඒ කටයුතු ඉදිරියට ගෙන යන්නට අතිගරු ජනාධිපතිතුමා තවත් මිලියන 350ක් වෙන් කර තිබෙනවා. අය වැයෙන් සඳහන් කර තිබුණු දෙය පසු ගිය අවුරුද්දේ ක්‍රියාවට නංවලා ඉතිරිය කරන්නටයි මේ මුදල් ප්‍රතිපාදන ලැබී තිබෙන්නේ. එම නිසා මෙය කොළයට පමණක් සීමා වුණු දෙයක්ය කියා කාටවත් කියන්නට බැහැ.

[ගරු ලලිත් දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ජාතික සවිය", "ගම නැඟුම" වැඩ සටහන ගැන කියන්නට ඕනෑ. අද මේ රටේ ගමට හිතැති ගම දියුණු කරන්නට ඕනෑකම තිබෙන, ගමේ මහජන නියෝජිතයා ශක්තිමත් කරන්නට ඕනෑය කියන යම් කිසි නායකයකු හිටියා නම් ඒ අතිගරු ජනාධිපතිතුමාය, ඒ වාගේම මේ රටට පහළ වුණු යම් කිසි නායකයකු ඒ සඳහා වැඩසටහනක් දියත් කළා නම් ඒ අතිගරු ජනාධිපතිතුමාගේ "ජාතික සවිය", "ගම නැඟුම" වැඩසටහන්ය කියා අපි කියන්නට ඕනෑ. එදා ගමට යන්නට තිබුණු අඩි පාර අද කොන්ක්‍රීට් පාරක් වෙලා තිබෙනවා. මෙවර අය වැයෙන් මේ රටේ හැම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ 20ක් වන සේ ප්‍රතිපාදන වෙන් කරන්නට එතුමා කටයුතු කර තිබෙනවා. එහෙම නම් මේවා කළේ නැහැ කියා කියන්නට බැහැ. පසු ගිය අවුරුද්දේ - ප්‍රායෝගිකව අපි දන්නවා- "ජාතික සවිය", "ගම නැඟුම" වැඩසටහන් යටතේ හැම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ පහක් වෙන් වන කොට ශ්‍රම දායකත්වය සියයට විස්සයි. එතකොට මුදල තුන්ලක්ෂ හැත්තෑපන්දහසක් විතර වෙනවා. ඉතිරි සියයට විස්ස ශ්‍රම දායකත්වයෙන්. එතකොට හැම වසමකටම "ජන සභාව", ඒ කියන්නේ ගමේ පුංචි මිනිහා ඇති කර ගත් සභාව තුළින් යෝජනා එන්නේ. කොළඹින් නොවෙයි යෝජනා යන්නේ. ගමෙනුයි යෝජනා එන්නේ. ගමේ යෝජනාව ක්‍රියාවට නඟන්නට අතිගරු ජනාධිපතිතුමාගේ "ජාතික සවිය", "ගම නැඟුම" වැඩසටහන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. එහෙම නම් ඒක කොළඹට සීමා වුණේ නැහැ. මේ කොළඹට වෙන් කළ මුදල - ඒ ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශය හරහා වෙන් වුණු මුදල - ගමට ගලා ගෙන ගිහින් තිබෙනවා. මේ රටේ සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම ප්‍රතිපාදන ලබා දී සංවර්ධනය කරන්නට කටයුතු යොදා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගොඩනැඟිලි මං මාවත් ඇති කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. රාජ්‍ය නායකයකු හැටියට ජනතාවගේ සාරධර්මත් දියුණු කළ යුතුයි. ගොඩනැඟිලි, පාලම් මේ සියල්ල ඉදි වනවාත් එක්කම අපේ සාරධර්මත් දියුණු වන්නට ඕනෑ. වෙනත් කිසිම අය වැයක නොතිබුණු ආකාරයකට "මතට තිත" වැඩසටහන යටතේ ඒ සඳහා විශේෂ වූ ප්‍රතිපාදන වෙන් කිරීම ගැන අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ. ප්‍රධාන වශයෙන් අපේ චර්යාධර්ම දියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් "ජාතික සවිය", "ගම නැඟුම" වැඩසටහන්වල තිබෙනවා. එතුමා ගොඩනැඟිලි ඉදි කිරීම පමණක් නොවෙයි ඉන් ඔබ්බට ගිය ජනතාවගේ චර්යා ධර්මයන් දියුණු කිරීම සඳහා ද කටයුතු කර තිබෙනවා.

විශේෂයෙන් "ගම නැඟුම" වැඩසටහන යටතේ ගමේ දියුණුව සඳහා විදුලිය, ග්‍රාමීය විදුලිය, ග්‍රාම ජල සම්පාදනය, ග්‍රාමීය ණය යෝජනා ක්‍රම, සුළු වාරිමාර්ග යොජනා ක්‍රම, නිවාස යෝජනා ක්‍රම, ප්‍රජා සංවර්ධනය මේ සියලු කටයුතු සඳහා 2009 වර්ෂයේදී රුපියල් මිලියන දහතුන්දහස් පන්සියපහළොවක් වෙන් කර තිබෙනවා. මේක ප්‍රායෝගික වශයෙන් වැදගත් වෙනවා. සමෘද්ධි ව්‍යාපාරය යටතේ සමෘද්ධි කලාප තිබෙනවා. ඒ කලාපවලින් තෝරා ගත් නිවාස නැති වැන්දඹු පවුල් සඳහා -ඒ වැන්දඹුවන් සඳහා- නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. මේක බොහොම ප්‍රායෝගිකයි. අසරණ තත්ත්වයට පත් වුණ අයට තමයි මේ ප්‍රතිලාභය යන්නේ. ඒ නිසා මේ වැඩසටහන් යටතේ ගමට ප්‍රයෝජනවත් වන වැඩ කොටසක් ක්‍රියාත්මක වනවාය කියලා අපි කියන්න ඕනෑ. එහෙම නම් විපක්ෂය මොනවා කිව්වත් අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ මේ හතර වැනි අය වැය ලේඛනයෙන් මේ රටට ගැළපෙන, දේශීයත්වය අගය කරන අය වැයක් ඉදිරිපත් කිරීම ගැන අපි එතුමාට අපේ ශුභාශිංසනය පිරිනමන්න කැමැතියි. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. ඊ ළඟට ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා.

[අ.භා. 4.20]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - தொழில் உறவுகள், மனிதவலு அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Labour Relations and Manpower)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි පරිසරයක් තුළ ලෝක ආර්ථික සමාජ අර්බුදයක් ඇති වෙලා තිබෙන වෙලාවේ ඒ අර්බුදයෙන් ලංකාවටත් ගැලවෙන්න බැහැ. සමස්ත ලෝකය හැටියට වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වය බලපානවා. ඒ වාගේම ලෝකයේ අර්බුද හතරක් තුළින් අපට ගමන් කිරීමට සිදු වෙලා තිබෙනවා.

එක අර්බුදයක් තමයි මේ තෙල් මිල ප්‍රශ්නය. තෙල් මිල ප්‍රශ්නය ලෝකයේ සෑම රටකම සමාජ තීරු තුළ මහා අර්බුදයක්, ගැටලුවක් ඇති කර තිබෙනවා. ලෝකයේ දියුණු රටවලට විකල්ප බලශක්ති නිෂ්පාදනය කරමින් ගමන් කරන්න සිද්ධ වුණා. ඒ එක ප්‍රශ්නයක්.

ඊළඟට ආහාර හිඟය පිළිබඳව, ඒ සමඟම මිල ඉහළ යාම පිළිබඳව ඇති වෙච්ච අර්බුදය. එහෙම සිදු වන කොට පොහොර මිල ඉහළ යනවා. පොහොර මිල ඉහළ යන කොට නිෂ්පාදන මිල ඉහළ යනවා. ඒ අනුව ආහාරවල මිල ඉහළ යනවා. ඒ වාගේම තෙල් මිල වැඩි වීමෙන් ප්‍රවාහන ගාස්තු ඉහළ යන නිසා ඒ අර්බුදය තවත් වැඩි වෙනවා. මේ අනුව ලෝකයේ දියුණු රටවලුත් විකල්ප බලශක්තිවලට ධාන්‍යයත් පාවිච්චි කරන්න යෙදුණාම ඒ තත්ත්වය තවත් දරුණු පැත්තට හැරෙනවා. අද ලෝකය තුළ ඇමෙරිකාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය ආදී යුරෝපීය රටවලටත්, ආසියාවේ රටවලටත්, අනෙකුත් රටවලටත් මේ අර්බුදය බලපා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළේ කොටස් සීමා වෙලා තිබෙනවා. ඉල්ලුම අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම භාණ්ඩ වෙළෙඳාම පිළිබඳ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. රැකිරක්ෂා නැති වෙලා තිබෙනවා. ඇමෙරිකාවේ ලක්ෂ 10කට වැඩි පිරිසක් රක්ෂාවෙන් දොට්ට දමා තිබෙනවා. මේ විධියට සමස්ත ලෝකය හැටියට මේ අර්බුදය බලපා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ලෝකයේ පරිසර වෙනසක් ඇති වෙගන යනවා. ඒක තුන් වැනි කාරණය. ඒ අනුව ස්වාභාවික විපත් වැඩි වෙලා තිබෙනවා. ස්වාභාවික විපත් -කුණාටු, ජල ගැලීම් ඒ වාගේම සුනාමි ආදී නොයෙක් ආකාරයේ ස්වාභාවික විපත්- වැඩි වෙලා තිබෙනවා. ලෝකයේ නොයෙක් රටවල් මේ තත්ත්වයට දැඩි ලෙස මුහුණ පාලා තිබෙනවා. අපේ ලංකාවත් සුනාමියට මුහුණ පෑවා. ගෙවල්, ගොඩනැඟිලි ලක්ෂ 2ක් පමණ විනාශ වුණා; ජීවිත 42,000ක් පමණ විනාශ වුණා. මේවා නැවත ගොඩ නඟන්න සිද්ධ වුණා. ඒ, සුනාමියෙන් අපි බැට කාපු හැටි. මේක අපි අත් දැකලා තිබෙනවා. ලෝකයේ පරිසර වෙනසත් එක්ක ස්වාභාවික විපත් වැඩි වීම තුන් වන කාරණාවයි.

හතර වැනි කාරණාව තමයි, ලෝකයම මුහුණ දී තිබෙන ත්‍රස්තවාදී ගැටලුව. ඒ ත්‍රස්තවාදී ගැටලුවෙන් ලංකාව අවුරුදු 30කට වැඩි කාලයක් තිස්සේ පීඩාවට පත් වෙමින් සිටිනවා. මෙන්න මෙහෙම තත්ත්වයක් තිබෙන වෙලාවක, එවැනි පරිසරයක් තුළ ලෝකයේ ඇති වෙලා තිබෙන අර්බුදයන් තුළින් අපේ රට තුළ තිබෙන අර්බුදයන් තුළින් ඒවාත් එක්ක එකට මේ ආර්ථික පරිසරයත් ගත්තාම ඉතාම නරකම යුගයකට ලංකාවටත් -මේකේ කොටස්කාරයෙක් හැටියට ලෝක ප්‍රජාවගේ කොටස්කාරයෙක් හැටියට- මුහුණ දෙන්න සිද්ධ වෙනවා. එහෙම නරක වෙලාවක්. ඒක අපේ තේවලට බලපානවා; රබර්වලට බලපානවා; ඇඟලුම්වලට බලපානවා; තවත් ඒවාට බලපානවා. එහෙම පරිසරයක් තුළ අතිගරු ජනාධිපතිතුමා සහන ගොඩක් සලසමින් මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළාය කියන එකත් පුදුම ආශ්චර්යයක්.

දැන් ලෝකයම අරගෙන බලන්න. ඇමෙරිකාවේ එහෙම වුණාට ඇමෙරිකාව ගැන කථා කරලා වැඩක් නැහැ ඒ වාගේම ලෝකයේ තෙල් මිල වැඩි වුණාට අපි තෙල් මිල ගැන කථා කරන්න ඕනෑ නැහැ කියා විපක්ෂය පත්තරවලට නොයෙක් ප්‍රකාශයන් කරනවා. තෙල් පිටින් ගෙන්වනවා නම්, මිල වැඩි වෙලා නම් අපි ඒ අර්බුදයට මුහුණ පානවා. අපි මුහුණ පෑවා. එහෙම තියෙද්දී මේවායෙන් ගැලවිලා යන්න උපදෙස් දෙන්න කාටවත් පුළුවන්කමක් නැහැ. එහෙම අර්බුදයක් ලෝකයේ තියෙද්දි තමයි ඒ පරිසරය තුළ අපි මේ තත්ත්වයට මුහුණ පාලා තිබෙන්නේ. ලෝකයේ වෙනත් රටවල සේවකයෝත් රක්ෂාවලින් දොට්ට දමන වේලාවේ විශාල වශයෙන් පඩි වැඩි වීම් කරන්න පුළුවන් පරිසරයක් මේ රට තුළවත්, ලෝකයේවත් ඇති වෙලා නැහැ. ඇමෙරිකාවේ ලක්ෂ ගණන් සේවකයෝ රක්ෂාවලින් ඉවත් කරන වෙලාවක, තවත් රටවල මුදල් අවප්‍රමාණය වෙලා, කොටස් වෙළෙඳ පොළ කඩා වැටිලා ආර්ථික අර්බුදයකට මුහුණ පා තිබෙන වෙලාවක, කොයි රටකවත් පඩි වැඩි කිරීම් ඉල්ලීම සාධාරණ නැහැ. මේ පවතින අර්බුදය තුළ තිබෙන තත්ත්වය රැක ගෙන යන්න, තිබෙන තත්ත්වය ගොඩ නඟා ගෙන යන්න පුළුවන්ද? එවැනි තත්ත්වයකට තමයි ලෝකයම පැමිණ තිබෙන්නේ. එවැනි වේලාවක අපේ ජනාධිපතිතුමා පඩි වැඩි කිරීමක් කර තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, නිශ්ශබ්ද වන්න. මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මුලසුනට පැමිණෙනවා ඇති.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු පියංකර ජයරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு பியங்கர ஜயரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. PIYANKARA JAYARATNE] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කථාව කර ගෙන යන්න.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
හොඳයි. මේ අර්බුදයන් තුළ ජීවන තත්ත්වයට ගැළපෙන පරිදි රක්ෂාවල් රැක දෙන්න වැඩ පිළිවෙළක් සකස් කිරීමට උත්සාහ කිරීම තමයි යුතුකම වන්නේ. ඒ පැත්ත ගැන කල්පනා කරලායි ජනාධිපතිතුමා රාජ්‍ය සේවකයන්ට දීමනාවක් දී තිබෙන්නේ; ඒ වාගේම විශ්‍රාමිකයන්ට දීමනාවක් දී තිබෙන්නේ.

අපේ රටේ සංවර්ධනයට ත්‍රස්තවාදය විශාල ලෙස බලපානවා. එය සංවර්ධනයට විශාල බාධාවක්; මහා විනාශකාරී තත්ත්වයක්. මේ රටේ ත්‍රස්තවාදය ඇති කළේ මේ රට බෙදා වෙනම රාජ්‍යයක් ඇති කර ගන්නයි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලයේ වේවා, ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ වේවා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කාලයේ වේවා, වර්තමාන ජනාධිපතිතුමාගේ කාලයේ වේවා ඔවුන්ට අවශ්‍ය වේලාවක සාකච්ඡාවට ඇවිත් ගැලවිලා ගියා මිසක් සාකච්ඡා මඟින් මේ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වුණා.

එවැනි පරිසරයක් තුළ මේ රටේ සංවර්ධනය අවුරුදු 50කින් පමණ පස්සට ගිහිනුයි තිබෙන්නේ. රටේ භීතියක් තිබෙන්නේ. රටේ භීෂණයක් තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තුළ මේ අවුරුද්දේ සියයට 6.5ක සංවර්ධන වේගයක් රැක ගැනීමත්, පසු ගිය අවුරුද්දේ සියයට හතක සංවර්ධන වේගයක් රට තුළ ඇති කර ගැනීමත් එක්තරා පුදුම ශක්තියක් හැටියට අපට සලකන්න වෙනවා.

ඒ වාගේම තව කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ රටේ ත්‍රස්තවාදී ක්‍රියාවන් පිළිබඳව පත්‍රවල පළ වන කොට රට රටවල රූපවාහිනීවල විකාශනය වන කොට සංචාරකයන්ගේ පැමිණීම නතර වෙනවා; අඩු වෙනවා; ඒ වාගේම ආයෝජකයන්ගේ පැමිණීමත් අඩු වෙනවා. ජාත්‍යන්තර වශයෙන් එවැනි පරිසරයක් තිබෙනවා.

ඒ වාගේම උතුරු - නැඟෙනහිර ප්‍රදේශවල පවතින ත්‍රස්තවාදී ක්‍රියාවන් මුල් කර ගෙන ඒ ප්‍රදේශවල ගොවියෝ ගොවි පොළවල් අත හැර තිබෙනවා; ඒ ප්‍රදේශවල කර්මාන්ත වැහිලා තිබෙනවා; ඒ ප්‍රදේශවල කිරි හරක් ඇති කිරීම නතර වෙලා තිබෙනවා; හෝටල් වැහිලා තිබෙනවා; බොහෝ පිරිසක් ඒ ප්‍රදේශවල පාසල්වල සහ වෙනත් තැන්වල අවතැන් වෙලා සිටිනවා. එමඟින් රජයට නඩත්තු කරන්න පිරිසක් ඇති වුණා. ඒ වාගේම ඒ ප්‍රදේශවල සටන් කරන හමුදාවන්ටත්, ත්‍රස්තවාදීන්ටත්, අවතැන් වූවන්ටත් කන්න දෙන්න රජයට විශාල වියදමක් දරන්න තමයි සිද්ධ වුණේ. එහෙම පරිසරයක් තිබීම නිසා ඒ පළාත් දෙකේ සංවර්ධනයෙන් අපට ලැබිය යුතු ආදායම, නිෂ්පාදනය අපේ ජාතික ආදායමට, ජාතික නිෂ්පාදනයට එකතු වුණේ නැහැ. ඒ නිෂ්පාදනයට හිටපු පිරිස භීෂණයට පත් වෙලා, වැඩ කරන්න බියෙන් සිටියා; ඔවුන් අවතැන් වෙලා පාසල්වල, කෝවිල්වල පදිංචි වෙලා සිටියා. මෙවැනි තත්ත්වයක් තමයි, ඒ ප්‍රදේශවල තිබුණේ. එහෙම පරිසරයක් තුළ අපේ රටේ කොටසක සංවර්ධනය විනාශ වෙලා ගියා. එහෙම තිබියදී සියයට හතක සංවර්ධනයක් ඇති කර ගන්න පුළුවන් වීම ආශ්චර්යවත් වැඩක් හැටියටයි මා කල්පනා කරන්නේ. අවුරුදු ගණනාවක්ම සියයට තුනක, හතරක සංවර්ධන වේගයක් තමයි තිබුණේ.

රටකට සාමය, සංවර්ධනයට ප්‍රධාන සාධකයක් වාගේම, අත්‍යවශ්‍යවූත් දෙයක්. ඒ සාමය ඇති කර ගන්න නොයෙක් ආණ්ඩු, නොයෙක් ජනාධිපතිවරු උත්සාහ කළා. මේ මුළු කාලය තුළ ප්‍රේමදාස ජනාධිපතිතුමා සහ මැති ඇමතිවරු රාශියක්, හමුදාපතිවරු, අහිංසක ජනතාව, පූජකවරු, ආදී විශාල පිරිසක් වාගේම දේපොළත් විනාශ වුණා. ඒ ප්‍රශ්නය විසඳා ගන්න බැරිව සිටින වෙලාවේ ඇති වූ තත්ත්වයන් පාවිච්චි කරලා, ද්‍රවිඩ ජනතාවට විරුද්ධව නොව, ඒ ජනතාවට හානියක් කිරීමට නොව, ඔවුන්ගේ අයිතිවාසිකම් වැළැක්වීමට නොව, ත්‍රස්තවාදය අවසන් කිරීම සඳහා, මේ විනාශයෙන් රට බේරා ගැනීම සඳහා , මේ ත්‍රස්තවාදයෙන් රට බේරා ගැනීම සඳහා වර්තමාන ජනාධිපතිතුමා මානුෂික මෙහෙයුමක් කරලා නැඟෙනහිර පළාත මුදා ගත්තා; නිදහස් කර ගත්තා. ප්‍රජාතන්ත්‍රවාදය ඇති කළා. පළාත් පාලන ඡන්දය පැවැත්වූවා. පළාත් සභා මැතිවරණය පැවැත්වූවා. පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කරලා, පිල්ලෙයාන් ප්‍රධාන ඇමති බවට පත් වුණා. දැන් ඒ ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු කෙරෙනවා. මහා මාර්ග හැදෙනවා; කර්මාන්ත හැදෙනවා. ගොවි පොළවල වැඩ කෙරෙනවා. අද මේ සියල්ල කෙරී ගෙන යනවා. දැන් ඒ ප්‍රදේශවල ධනය මේ රටට එකතු වෙනවා. එහෙම එකතු වෙන කොට දකුණේ සංවර්ධනය සියයට 7ක් නම්, ලබන අවුරුද්ද තුළ ඒක සියයට 8ක් වෙන්නට ඉඩ තිබෙනවාය කියා අපට හිතන්න පුළුවන්කම තිබෙනවා. ආණ්ඩුව මේ ත්‍රස්තවාදය අවසන් කර නැඟෙනහිර නවෝදය වැඩ පිළිවෙළට ප්‍රමුඛත්වය දීලා ක්‍රියාත්මක කර ගෙන යනවා.

ඒ වාගේම, ජනාධිපතිතුමා පැහැදිලිව ප්‍රකාශ කරන්නේ, දැන් වුවත් ප්‍රමාද නැහැ, ආයුධ බිම තියලා එන්න පුළුවන් කියලායි. එහෙම එතුමා ත්‍රස්තවාදීන්ට ආරාධනා කරනවා. දැන් වුණත් පරක්කු වැඩි නැහැ එන්න කියලා එතුමා ආරාධනා කරනවා. එහෙම නැත්නම් යුදමය වශයෙන් දණ ගස්වන්න වනවාය කියලා එතුමා කියනවා. ඒක පැහැදිලියි. ඒක ප්‍රායෝගික තත්ත්වයක්. ඒ අනුව මේවාට වියදම් කරන්නට ඕනෑ. ත්‍රස්තවාදය මර්දනය කරන්නට ඒ ගන්නා පියවරවලට වියදම් කරන්න ඕනෑ. අහස්

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

යාත්‍රා ඕනෑ; හෙලිකොප්ටර් ඕනෑ; නැව් ඕනෑ; බෝට්ටු ඕනෑ; තුවක්කු ඕනෑ; යුද ටැංකි ඕනෑ; ඒ සඳහා පුද්ගලයන් ඕනෑ; යුද භටයන් ඕනෑ. ඒ සියල්ල සඳහා වියදම් කරන්නට ඕනෑ. දැන් එතුමා නැඟෙනහිර ප්‍රතිඵල පෙන්වා තිබෙනවා. උතුරේ ප්‍රතිඵල පිළිබඳව එතුමා මේ ගරු සභාව තුළදී ප්‍රකාශ කළේ දැන් ඒ ප්‍රශ්නය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයකට විතරක් සීමා වෙලා තිබෙනවාය, වැඩි දවසක් යන්න ඉස්සර වෙලා ඒකත් අවසාන වනවා කියලායි. දැන් අපි ඒ ප්‍රශ්නයත් විසඳා ගෙන ඒ ප්‍රදේශයේත් ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්නට කටයුතු කරනවා. ඒ අය කල් ඇතිව විසඳුමකට එනවා නම් ඒකටත් ආරාධනා කර තිබෙනවා. හොඳ ප්‍රජාතන්ත්‍රවාදියකු හැටියට එතුමා කියනවා, ඒ ප්‍රදේශයත් අපේ රටේම කොටසක්, ඒ ජනතාව අපේම කොටසක්, ඒ ජනතාව ජාතියේ කොටසක් කියලා. ඒ සියලු දෙනාම බලා ගැනීම මගේ වග කීමක්ය කියා එතුමා කියනවා. එතුමා එහෙම කල්පනා කරලා වැඩ කරනවා. එතුමා බලයට එන කොට බොහෝ දෙනා සිතුවේ, බොහෝ දෙනා කල්පනා කළේ, එතුමා ගැන දුන්න පින්තූරය වුණේ, එතුමා ජාතිවාදියෙක්ය, ආගම්වාදියෙක්ය, පටු කල්පනාව තිබෙන කෙනෙක්ය කියලායි. නැහැ. එතුමා මේ වැඩ පිළිවෙළ යටතේ ඒ ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් දෙන්න ලෑස්තියි. දේශපාලන විසඳුමක් දෙන්න ආරාධනා කරමින් ඒ කැඳවීම කරනවා. ඒ ආකාරයට කටයුතු කර ගෙන යන ගමන ජයග්‍රහණය කරලා, ත්‍රස්තවාදීන් යටතේ පීඩා විඳින දුවිඩ ජනතාව නිදහස් කර ගෙන සංවර්ධන වැඩ කරන අතර, ප්‍රජාතන්ත්‍රවාදීව ප්‍රාදේශීය සභා ඡන්ද, පළාත් සභා ඡන්ද පවත්වලා නැඟෙනහිර වාගේම උතුරු ප්‍රදේශයේත් ඒ තත්ත්වය ඇති කරන්න අවශ්‍ය තැනට ගමන් කරමින් තිබෙනවා. ඒකට තමුන්නාන්සේලා විරුද්ධද? ඒකට වියදම් නොකර පුළුවන්ද? ඒක නතර කරන්නද? ලෝක ආර්ථිකයේ මහා අර්බුදයක් -අවුලක්- තියෙද්දී මුදල් අමාරුකම් තිබෙන යුගයක, රැකී රක්ෂාවලින් දොට්ට දමන යුගයක, මේ යුද්ධයටත් වියදම් කරමින්, මේ රට සංවර්ධනය කරන්න, සාමය ඇති කරන්න, සුබ සාධනය ඇති කරන්න ජනාධිපතිතුමා ක්‍රියා කර ගෙන යනවා. මේ ප්‍රශ්නය ඉක්මනින් ඉවර වුණාම විශාල සංවර්ධන ගමනකට මහා දොර විවෘත වනවා. අවුරුදු පනහක් තිස්සේ මෙතෙක් වූ පසු බැසීමට වඩා වේගයකින් ඉස්සරහට යන්න, ඒ සංවර්ධනයේ මහා දොර විවෘත කරන්න එතුමා කටයුතු කර ගෙන යනවා. අතීතයේ හිටපු කිසිම ජනාධිපතිවරයකුටවත්, ජනාධිපතිනියකටවත් ඒ තීරණය ගන්න බැරි වෙලා තිබුණා. ඔවුන්ට ඒ වාගේ ඍජු බවක් තිබුණේ නැහැ; ඒ වාගේ අධිෂ්ඨානයක් තිබුණේ නැහැ; ඒ වාගේ ජාතික ඕනෑකමක් තිබුණේ නැහැ. මෙතුමා ජාතික යුතුකමක් හැටියට ඒ කාර්යය තමන් අතට අර ගෙන කර ගෙන යනවා. ඒක ඉතාම වැදගත් දෙයක් හැටියට අප කල්පනා කරන්න ඕනෑ. විපක්ෂයේ යුතුකම මේකට සහයෝගය දෙන එකයි. පඩි වැඩි වැඩියෙන් දෙන්න පුළුවන්. එහෙම නම් යුද්ධය නතර කරන්න ඕනෑ. ඒකට යන වියදම් අයින් කරන්න ඕනෑද?

ඒ වාගේම සුබසාධන වැඩ කර ගෙන යනවා. අධ්‍යාපනයට කරන වියදම කපා නැහැ; සෞඛ්‍යයට කරන වියදම කපා නැහැ; සමෘද්ධියට කරන වියදම කපා නැහැ. ඒ වාගේම පාසල් දරුවන්ට පොත් පත් අච්චු ගහන්න යන වියදම කපා හැර නැහැ. විශ්වවිද්‍යාල සංවර්ධනය කරන්න වෙනම වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම, නැණසල දියුණු කරන්න කටයුතු කරනවා. ඒ සියලු දේවල් මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙනවා. අපේ කාර්මික අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාල ඇති කරලා තවත් මුදල් වියදම් කරමින්, කාර්මික ශිල්ප ඥානය ලබා දීමට, තාක්ෂණය දියුණු කිරීමට වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. ඒවා කර ගෙන යනවා.

ඒ විතරක් නොවෙයි. සෞඛ්‍ය අංශය සංවර්ධනය කරන්න කටයුතු යොදා තිබෙනවා. දිස්ත්‍රික්කවල තිබෙන වතු රෝහල් රජයට අර ගෙන ඒවා දියුණු කරන්න කටයුතු කර ගෙන යන බව කියා තිබෙනවා. ඒ වාගේම සෞඛ්‍යය අංශයෙන් නොදියුණු පැතිවලට විශේෂයෙන් මුදල් වෙන් කරලා, ඒ අංශ දියුණු කිරීමටත් කටයුතු සූදානම් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේමයි පොහොර සහනාධාරය. පොහොර සඳහා යන වියදම රුපියල් 6,000ක්ව තියෙද්දී රුපියල් 350ට දෙන පොහොර සහනාධාරය ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යනවා. 6,000න් 350 අඩු කරලා බලන්න. එතකොට කීයද? රුපියල් 5,650යි. රුපියල් 5,650ක් පාඩු විඳ ගෙන ඒ සහනය දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒකත් කරනවා. ඒක සංවර්ධනය නොවෙයිද? හෙක්ටයාර එකකට පොහොර සඳහා රුපියල් 47,000ක් යනවා ලු. ඒ විධියට ගොවියාට තැන දීලා ගොවියා රජ කරවන්න නම් ආදායම වැඩි කරන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය තමයි ඒ කාලයේ වී අලෙවි මණ්ඩලය වසා දමලා ඒක විනාශ කරලා දැම්මේ. ඊට පස්සේ ඒක විනාශ වෙලා ගියා. ඒ එක්කම වී ගන්න රාජ්‍ය ආයතනයක් නැතිව ගියා. දැන් ඒ වැඩ පිළිවෙළත් අපි කර ගෙන යනවා. තමුන්නාන්සේලාට රුපියල් 30ට, 35ට [බාධා කිරීමක්] ඔව්, අමාරු තමයි. බත් කෑමත් වියදම් වැඩි තමයි. නමුත් ලෝකයේ අනික් රටවල මීට වඩා වියදම වැඩියි. මතක තියා ගන්න. අපි මේ රටේ ආහාර නිෂ්පාදනය වැඩි කරන්න, කුරහන්, කව්පි, මෙනේරි වගාවන්වල දියුණුවක් ඇති කරන්න පියවර අරගෙන තිබෙනවා. ඉරිඟු වගාව දියුණු කරන්න පියවර අරගෙන තිබෙනවා. මේ ආහාර පිළිබඳ ප්‍රශ්නය අද ලෝක අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. ලෝකය කොයි තරම් දියුණු වුණත් තවමත් සියයට 50ක් බඩගින්නේ ඉන්නේ. මේ තත්ත්වය මේ රටේත් ඇති වන්න තිබුණා. තෙල් මිල මහා වේගයෙන් ඉහළට ගිය වෙලාවේ, මේ රටේ ආහාර හිඟයක් ඇති වෙයි කියා හිතලා අපේ ජනාධිපතිතුමා ඉන්දියාවට කථා කරලා ඉන්දියාවෙන් හාල් ගෙන්වා ගන්න කටයුතු කළා. ඒ කාලයේ ඉන්දියාවෙන් හාල් පිට රටවලට යැවීම තහනම් කරලායි තිබුණේ. ඒ වෙලාවේ අපේ ජනාධිපතිතුමා එහේ අගමැතිතුමාට කථා කරලා මෙහාට හාල් ගෙන්වා ගන්න කටයුතු කළා. තවත් රටවලින් ගෙන්වා ගත්තා. වාසනාවට අපි වවමු - රට නඟමු වැඩ පිළිවෙළ යටතේ පුරන් වෙච්ච කුඹුරු වවමු කියන වැඩ පිළිවෙළ අද ආරම්භ වෙලා තිබෙනවා. අතිරේක ආහාර වර්ගත් වවනවා. ඒක නිසා අපට බඩගින්නේ ඉන්න වුණේ නැහැ. අප කාටවත් මැරෙන්න වුණේ නැහැ. ඒ තත්ත්වයට මේ රට ගෙනැල්ලා, ඒ සියලු වියදම් දරමින් මේ කටයුතු කර ගෙන යනවා.

ඒ වාගේම පාරවල් හදනවා. අධිවේගී මාර්ග, මහා මාර්ග, දුම්රිය මාර්ග, ගුවන් පාලම් හැදීම ආදී ඔක්කෝම වැඩ කර ගෙන යනවා. ඒ පහසුකම් සපයන්නේ නොමිලේ. මිනිස්සු ඒවායේ යන්නේ නොමිලේ. වාහන යන්නේ නොමිලේ. ඒ පිළිවෙළට සකස් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අද දැදුරුඔය ව්‍යාපෘතිය, මොරගහකන්ද ව්‍යාපෘතිය, ඒ වාගේම යාන් ඔය ව්‍යාපෘතිය, උමා ඔය ව්‍යාපෘතිය ආරම්භ කර සංවර්ධන කටයුතු කර ගෙන යනවා. කෘෂි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා, ආහාර වගාවට මඟ පෙන්වීම සඳහා මේ වැඩ පිළිවෙළ කර ගෙන යනවා. ඒවා සුබසාධන වැඩ. ඒවා ඔක්කොම යහපතට කරන වැඩ.

පිට රටින් මුගුණුවැන්න, කංකුං ගෙනෙන්න කටයුතු කරනවා නම් ඒකට මුදලක් වැඩි කරන එක, ඒකට බද්දක් දමන එක නරකයි කියන්න පුළුවන්ද? මේ රටේ තිරිඟු වගාව කරන්න බැහැ. අපි පොඩි කාලයේ PL 480 ගිවිසුම යටතේ තිරිඟු ගෙනැත් අපට නිකම් බෙදුවා. ඇමෙරිකාව අපට ඒවා දුන්නා, ආධාර හැටියට. අපට පිටි කවලා පුරුදු කළා. පාන් කවලා පුරුදු කළා. පාන්වලට වඩා බත් ගුණයි. බත් හොඳයි. බත් කන අයට ලෙඩ අඩුයි. ඒ තත්ත්වය තුළත් අපි පිටිවලට හුරු වුණා. හැබැයි, වැඩේ ලේසියි. බේකරිකාරයා හදලා දෙනවා. අපිට තිබෙන්නේ ගිහිල්ලා ගෙනෙන එක විතරයි. වගා කරන එක ටිකක් අමාරු වෙන්න පුළුවන්. නමුත් අපේ රට ස්වයංපෝෂිත කරන්න පුළුවන් තිරිඟුවලින්ද, හාල්වලින්ද? ඒක නිසා අපේ කුඹුරු ටික ගොවිතැන් කරන්න අපේ ගොවියාට ශක්තිය දීලා, ගොවියාගේ ආදායම වැඩි කර දුන්නාම තමයි ගොවියා වැඩ කරන්නේ. කොයි එක් කෙනෙක්වත් වැඩ කරන්නේ නැහැ, තමන්ට ඒ කරන වෘත්තියෙන් ලාභයක් නැත්නම්, ආදායමක් නැත්නම්, වැඩි ප්‍රයෝජනයක්

නැත්නම්. ඒ ගොවියාට ඒ ආදායම සොයා ගන්න තමයි රුපියල් 350ට පොහොර දෙන්නේ. අද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇති කරලා, ගොවිජන සේවා මධ්‍යස්ථාන ඇති කරලා ගමට කෘෂි සංවර්ධන නිලධාරියෙක් දමලා කෘෂි සේවා පවත්වා ගෙන යන්නේ ඒ නිසායි. නොමිලේ සේවා සපයන වැඩ පිළිවෙළක් තමයි මේ ඇති කර තිබෙන්නේ. මේවා සුබසාධන වැඩ.

ඊළඟට මොකක්ද? සංවර්ධන වැඩ. විදුලි බලාගාර හදනවා. දැන් විදුලි බලාගාර කීයක් හැදෙනවාද? මේවා අල්ල අල්ලා ප්‍රමාද කර කර හිටපු ඒවා. හැම ආණ්ඩුවෙන්ම එහෙමයි. යූඑන්පී එකේ හිටපු ආනන්ද කුලරත්න මහත්මයා මුල් ගල් තිබ්බා; පෝස්ටර්ස් ගැහුවා. නමුත් හම්බන්තොට වරාය හැදෙන්නේ නැහැ; හැදුණේ නැහැ. දැන් අපේ මේ ජනාධිපතිතුමා ආවාට පස්සේ හම්බන්තොට වරාය හැදෙනවා. ගිහිල්ලා ඒක බලන්න. ඒක රහසක් නොවෙයි. වරායන්, ගුවන් තොටු පොළවල්, ධීවර වරායන් හැදෙනවා. මේවා රටේ සංවර්ධන වැඩ. මදි පුංචිකම් තිබෙන්න පුළුවන්. අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. මහවැලිය කරන කොටත් ඔහොම තමයි. හොරකම් කරනවා කියලා විපක්ෂය කිව්වා. එහෙත් මහවැලිය හැදුණාම හොඳයි නොවැ. නේද? එහෙම අඩු පාඩුකම් නැතෙයි කියා මම කියන්නේ නැහැ. නමුත් මේවා සංවර්ධන වැඩ. මේ ජනාධිපතිතුමාගේ කාලයේ කෙරෙන සංවර්ධන වැඩ. කොයි එක් කෙනාගේ කාලයේද මේවා කළේ? මෙන්න මේ විධියේ වැඩ පිළිවෙළක් දැන් කර ගෙන යනවා. මහා සංවර්ධනයක්, දැවැන්ත සංවර්ධනයක් කර ගෙන යනවා. මේ සංවර්ධනයට යොදන මුදල කපන්නද? ත්‍රස්තවාදයට විරුද්ධව කටයුතු කරන්න වෙන් කර තිබෙන මුදල කපන්නද? සුබසාධන මුදල කපන්නද? මොකක්ද කරන්න කියන්නේ? ලෝකයේ මහා අර්බුදයක් තිබෙනවා. අපිත් ඒ මහා අර්බුදයේ කොටස්කාරයෝ. අපේ ආර්ථිකයත් ගැටී ගැටී යන්නේ ඒ අර්බුදයේ කොටස් තිබෙන නිසා. මේ තත්ත්වය තුළ මානුෂිකව කල්පනා කරලා තමයි මේ ජනාධිපතිතුමා මේ පඩි වැඩි කිරීම දුන්නේ. අනික් අයටත් සහන වැඩි කරලා දුන්නේ. ඒ වාගේම විශ්‍රාමිකයන්ටත් වැඩි කර දුන්නේ. ඒ වාගේම අනෙක් කටයුතු ගැනත් තමුන්නාන්සේලා දන්නවා. අපේ වැට් බද්ද- [බාධා කිරීමක්] දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ වාඩි වෙන්න. පසුව කථා කරන්න. [බාධා කිරීමක්] කට වහ ගෙන වාඩි වෙන්න. මගේ කථාව කර ගෙන යන්න මට ඉඩ දෙන්න. කාගේවත් කථාවලට මා ඇඟිලි ගැහුවේ නැහැ. කට වහ ගෙන ගරු සභාවේ වාඩි වෙලා ඉන්න. ඒක සම්ප්‍රදායයක් හැටියට ඉගෙන ගන්න. බොරුවට දොඩ වන්න එපා.

මේ අනුව මා තමුන්නාන්සේලාට මතක් කරන්නේ මේකයි. මේ සියලු වැඩ කටයුතු පිළිබඳව තමුන්නාන්සේලා අපි කවුරුත් කල්පනා කරන්නට ඕනෑ. කුඩා පරිමාණයේ කර්මාන්ත කරන අය සඳහා විදුලි බිල අඩු කරලා තිබෙනවා. ඒ වාගේම කර්මාන්තශාලා කරන අයට සහන දීලා තිබෙනවා. ඒ වාගේම වී ගොවිතැන සඳහා සහන දීලා තිබෙනවා. තේ වවන්නන් සඳහා සහන ලබා දීලා තිබෙනවා. රබර් වවන්නන්ට සහන ලබා දීලා තිබෙනවා. ඒවායේ මදිකම් තිබෙන්නට පුළුවන්. [බාධා කිරීමක්] පුළුවන් නම් ඔබතුමාගේ පැත්තෙන් ටිකක් දෙන්න කෝ. ඒවා පිළිබඳව මේ විධියට කටයුතු කර තිබෙනවා. තමුන්නාන්සේලා කවුරුත් දන්නවා, මේ රටේ මේවා නිකම් ඓශ්වර්යයක් වගෙයි. පුදුම සහගත ආණ්ඩුවක් මේක. පුදුම සහගත ජනාධිපතිතුමෙක්. මේවා ඔක්කොම අද පවත්වා ගෙන යනවා. සුබ සාධනයයි, සංවර්ධනයයි, මේ යුද්ධයයි කරමින් අර ජාත්‍යන්තර ආර්ථික අර්බුදයකට -හතර අර්බුදයකට- මුහුණ පාගෙන මේ කටයුතු ටික ගොඩ නඟා ගෙන යනවා. ඒක කාටවත් නැහැයි කියන්ට පුළුවන්කමක් නැහැ. ඒ වාගේම අද උතුරට "උතුරු වසන්තය" කියලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට එතුමා සැලසුම් කර ගෙන යනවා. එම වැඩ පිළිවෙළ දැනටමත් ආරම්භ කර ක්‍රියාත්මක කර ගෙන යනවා.

එදා යූඑන්පී එකෙන් සියයට 20ක වැට් බද්දක් පනවා තිබුණා. සමහර ඒවාට සියයට 15ක වැට් බද්දක් පනවා තිබුණා. ඒ සියයට 15ක වැට් බද්ද අඩු කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ වැට් බද්ද අඩු කිරීම නිසා සෑම භාණ්ඩයකටම, සෑම සේවාවකටම සියයට 3ක සහනයක් ලැබෙනවා. සෑම කෙනෙකුටම, සෑම පුරවැසියකුටම ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. එය කාටවත් නැහැයි කියලා කියන්නට පුළුවන් කමක් නැහැ.

විපක්ෂයේ තමුන්නාන්සේලා විකල්ප අය වැය ලේඛනයක් ඉදිරිපත් කළා. හැබැයි මාධ්‍යවත් ඒක පිළිගත්තේ නැහැ. වැඩි ප්‍රසිද්ධියකුත් නැහැ. මොකද, විහිළුවක් නිසා. අද අපේ රට රැක ගන්න, සුබ සාධන කටයුතු සඳහා මුදල් වෙන්කර තිබෙනවා. ගමේ කටයුතු කරගෙන යන්න රුපියල් මිලියන 13,000ක් වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 13,500ක් වෙන් කර ගෙන අද "ගම නැඟුම" වැඩ පිළිවෙළ කර ගෙන යනවා. ඒ අනුව පාරවල්වලට කොන්ක්‍රීට් දැමීම ආදී කටයුතු කරනවා. ඒ වාගේම ආර්ථික සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, ආධ්‍යාත්මික සංවර්ධනය යන මේ තුන් ආකාරයේ සංවර්ධනයක් මිනිසුන් තුළ ඇති කරන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම "මතට තිත" වැඩ පිළිවෙළ මඟින් මිනිසුන් සදාචාර සම්පන්න කරලා, යහපත් සංස්කෘතියක්, පුණ්‍යවන්ත ගෙදරක් ඇතිකර, ආර්ථිකයෙන් සපිරුණු, ඒ වාගේම සුචරිතයෙන් සපිරුණු, සංවර්ධනය වුණු ගමක් හදන්නයි සැලසුම් කර තිබෙන්නේ. ඒකයි එතුමා කිව්වේ, පවුලෙන් පවුලට සංවර්ධන සැලැස්මක් හදලා දීලා, ව්‍යාපෘතියක් හදලා දීලා, ඒ පවුල ගොඩ ගන්නවාය කියලා. ගමේ ඒ පවුල් ටික ගොඩ ආපුවාම, ඒ ගම හැදෙනවා. ගම හැදුණාම රට හැදෙනවාය කියන එක කිව්වේ ඒකයි. "පුද්ගලයා හදා රට හදමු" කියලා එදා අපේ මහා නායක හාමුදුරුවන් කිව්වා. ආධ්‍යාත්මික පැත්තෙන් කල්පනා කරලයි උන්වහන්සේ එදා එහෙම කිව්වේ. පුද්ගලයාත් හදලා, පුද්ගලයා යහපත් කරලා, පවුලත් යහපත් කරලා, පවුලේ සංවර්ධනය ඇති කරලා, ගමත් සංවර්ධනය කරලා, රටත් සංවර්ධනය කරන වැඩ පිළිවෙළක් කර ගෙන යන්න තමයි අද අපි කටයුතු කර තිබෙන්නේ.

අපි විශේෂයෙන්ම කල්පනා කර බැලුවොත්, මේ අය වැය ලේඛනයෙන් සෑම ක්ෂේත්‍රයකටම බෙදී යන සේවයක් තිබෙනවා; ක්‍රීඩා කරන අයටත් අවස්ථාවක් තිබෙනවා, කලාකරුවන්ටත් අවස්ථාවක් තිබෙනවා. සියලු දෙනාටම මේ අවස්ථාව තිබෙනවා. ගොවීන්ටත් අවස්ථාවක් තිබෙනවා, කර්මාන්තකරුවන්ටත් අවස්ථාවක් තිබෙනවා. මේ රටේ කර්මාන්ත සංවර්ධනය, කෘෂිකර්ම සංවර්ධනය, ඒ සෑම පැත්තක්ම ආවරණය වන පිළිවෙළට මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා. මේක සර්වාංග වෙදකමක් වගෙයි. සර්වාංග වෙදකමක් වාගේ, මේ තිබෙන අර්බුදවලට නියම වෙදකමක් ආරම්භ කර තිබෙනවා. දේශීය කර්මාන්තය ගොඩ නඟා ගෙන, අපට තිබෙන තත්ත්වය රැක ගෙන ඉදිරියට යන්න පුළුවන් ක්‍රමයක් ඇති කර තිබෙනවා. ඒ වාගේම පසු ගිය කාලයේදී -1977 දී- ඇති කළ විවෘත ආර්ථිකය නිසා අපේ බොහෝ කර්මාන්ත, අපේ මිනිසුන් ආරම්භ කරපු ව්‍යාපාර ඔක්කෝම විනාශ වෙලා ගියා. ඒවා දැන් නැවත ඇති කරලා දෙන්න ඕනෑ. ඒ වාගේම එතුමා කියනවා, අද අපි නිෂ්පාදනය කරන්නේ අපේ කිරි අවශ්‍යතාවෙන් සියයට 25යි කියා. අපි දැන් එය ඉතා ඉක්මනින්, වේගයෙන් සියයට 50 දක්වා වැඩි කර ගන්න ඕනෑ. ඒ අනුව පශු සම්පත් වර්ධනය කරන්න අවශ්‍ය කටයුතු සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම දැන් තිබෙන කිරි පිටි මිල වැඩි වෙන්න නොවෙයි, කිරි පිටි ගෙන්වන මිනිසුන් ලබන ලාබයෙන් කොටසක් ගන්න තමයි බද්දක් හැටියට මුදලක් නියම කරලා තිබෙන්නේ. අපට කිරි හරක් හදන්න බැරි කමක් නැහැ. අද අපි ඒ කර්මාන්තයෙන් ඉවත් වෙලා ගිහින්. ඇයි ඒ? ටින් කළ වියළි කිරි පිටි ගෙනල්ලා "ටක, ටක" ගාලා හදා දෙන වැඩ පිළිවෙළට මුළු රටම ඇදී ගිහින් තිබෙනවා. රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්න මේ වාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපේ තරුණයන්ට තරුණියන්ට රක්ෂා දෙන්න මේ ව්‍යාපාර පටන් ගන්න ඕනෑ. කෘෂි ව්‍යාපාර පටන් ගන්න ඕනෑ. අනිකුත් කර්මාන්ත, ව්‍යාපාර පටන් ගන්න ඕනෑ. කිරි උතුරන ලංකාවක් හදන්නයි ජනාධිපතිතුමා අදහස් කරලා තිබෙන්නේ. මේක කිරි උතුරන අය වැයක් බවට පත් කරන්නයි මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාත් මේකට සම්බන්ධ වෙන්න ඕනෑ.

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

ඒ වාගේම සමුපකාර ව්‍යාපාරය වැටි වැටී තිබුණා. සමුපකාරය ගොඩ ගන්න ගරු ඇමතිතුමාට පසු ගිය අය වැය ලේඛනයෙනුත් සල්ලි දුන්නා. මොනවාටද? සුපිරි වෙළෙඳ සල් පටන් ගන්නයි. අද සමුපකාර දියුණු කරන්න ඒ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ගමේ තිබෙන බඩු ටික අර ගෙන, පිටින් ගෙනෙන බඩු ටික ගැමියාට දෙන වැඩ පිළිවෙළ සකස් කරන්නයි ඒ මඟින් බලාපොරොත්තු වන්නේ. ඒ වැඩ පිළිවෙළයි ක්‍රියාත්මක කරන්න යන්නේ. ලබන අවුරුද්දේ පටන් ගමේ සංවර්ධනය සඳහා ලක්ෂ 20ක් බැගින් දෙන්න මේ අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ලක්ෂ 20ක් වසමකට දෙන්නයි යන්නේ. දැනට අවුරුද්දකට ලක්ෂ 5ක්වත් වසමකට ලැබෙන්නේ නැහැ. ඒ වාගේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුටවත් ලක්ෂ 5ක් ලැබෙන්නේ නැහැ. අද මේ ජනාධිපතිතුමා ගම නංවන වැඩ පිළිවෙළට, ගම ඉදිරියට ගන්න කරන වැඩ පිළිවෙලට, ගැමි ජනතාව නංවන්න කර ගෙන යන මේ වැඩ පිළිවෙළට -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමනි, නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් ගමේ කෙනෙක්, මමත් ගමේ කෙනෙක්. අපේ ගම්වල තත්ත්වය ඉදිරියට ගන්නා එක ගැනයි මා කතා කරමින් සිටියේ. ගමක දියුණුවට ලක්ෂ 20ක් දෙන්න අද මේ අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඊට අමතරව එහි තවත් කොටස් තිබෙනවා. නිවාස ඉදිකිරීම සඳහා, විදුලිය ලබා දීම සඳහා, පාරවල් තැනීම සඳහා, ස්වයං රැකියා ඇති කිරීම සඳහා ආදී වශයෙන් ගමේ දියුණුවට වැඩ රාශියක් සකස් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ මඟින් යටිතල පහසුකම් සංවර්ධනය වෙනවා; ආර්ථිකය සංවර්ධනය වෙනවා. ඒ වාගේම ඒ ගැමියන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති වනවා. යහපත් පුද්ගලයන් හදලා, යහපත් පවුලක් හදලා, ඒ පවුල සඳහා ව්‍යාපෘතියක් සකස් කර දුන්නාම හොඳ පවුල් තුළින් ඒ ගමම මහා සංවර්ධනයකට යොමු වෙනවා. ගම් ටික හැදුණාම රට හැදෙනවා. "මිනිසා හදා රට හදමු"ය කියා මඩිහේ පඤ්ඤාසීහ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ කිව්වා. උන් වහන්සේ එසේ කිව්වේ ආධ්‍යාත්මික පැත්ත මුල් කර ගෙනයි. ජනාධිපතිතුමා ගම හදන වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙන්නේ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, ඒ වාගේම ආධ්‍යාත්මික සංවර්ධනය යන තුන් කාර්යයම ඉෂ්ට කිරීමේ අරමුණෙනුයි. මේක ලෙහෙසි වැඩක් නොවන බව ඇත්තයි. නරක අතට යොමු වුණු මිනිස්සු ඉක්මනින් හොඳ පැත්තට ගන්න බැහැ. ඒකට අපි පන්සලත් සම්බන්ධ කර ගන්න ඕනෑ. ඒ සියලු දෙනාම සම්බන්ධ කර ගෙන ඒ කටයුත්ත කරන්න අපි ලැහැස්ති කර තිබෙනවා. ඒ වගේම මුළු ගමම එකතු කරන්න ජන සභාවක් ඇති කරලා ඒ ජන සභාව මඟින් මේ සංවර්ධන කටයුතු කර ගෙන යන්න වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තුළ කර්මාන්ත දියුණුව ඇති කළ හැකියි. විශාල කර්මාන්ත ඇති කළ හැකියි. මහා මාර්ග හැදීම, මහා විදුලි බලාගාර හැදීම, මහා වරායවල් හැදීම කළ හැකියි. පහළ මට්ටමට ගිහිල්ලා -grassroots level එකටම ගිහිල්ලා- මේ වගේ සංවර්ධන ක්‍රියා දාමයක් කවදාවත්ම කරලා නැහැ. ලෝක ආර්ථික අර්බුදයත් එක්ක පැටලිලා තිබෙන අපේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න ඕනෑ. පශු සම්පත් දියුණු කරන්න ඕනෑ. සීනි කර්මාන්තය දියුණු කරන්න ඕනෑ. තේ සහ රබර් කර්මාන්තය ගොඩ ගන්න ඕනෑ. ඒ වගේම කර්මාන්තකරුවන් මුහුණ පා තිබෙන ඒ මහා ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්න ඕනෑ. ඒ සියලු පැති කල්පනා කරලා මේ අය වැය ලේඛනය සකස් කර තිබෙනවා. අපේ රට තුළ තිරසාර විසඳුමකට එන්න නම් අපේ නිෂ්පාදන වැඩි දියුණු කර ගන්න ඕනෑ. ඵලදායිතාව නමැති දර්ශනය ඇතිව -ඒ අරමුණ ඇතිව- මේ කටයුතු ටික කර ගෙන යන්න ඕනෑ. ඵලදායිතාව වර්ධනය කරන්න ඕනෑ. ඒක පුද්ගලයාගෙන් ගෙදරට, ගෙදරින් ගමට, ගමෙන් රටට, කාර්යාලයෙන් කාර්යාලයට, පාසලෙන් පාසලට, රෝහලෙන් රෝහලට, වැඩ පොළෙන් වැඩ පොළට, ගොවි පොළෙන් ගොවි පොළට ඇති කරන්න ඕනෑ. ඒ අරමුණු තුළින් මේ රට ගොඩ නැඟීමේ වැඩ පිළිවෙළට යන්න ඕනෑ. සංවර්ධනයට සාමය අවශ්‍යයි. රටක ජාතික සංවර්ධනයට සාමය අනිවාර්යයි. සාමයත් ඇති කරලා සුබ සාධනයත් රැක ගෙන, සංවර්ධනයත් ඇති කර ගෙන ඉදිරියට යාමේ ගමන් මාර්ගයක් අද සොයා ගෙන තිබෙනවා; විවෘත කර ගෙන තිබෙනවා. ඇත්තටම ජනාධිපතිතුමා ගෙන යන මේ වැඩ පිළිවෙළ ඓශ්වර්යයි. මේ කාර්යයෙන් අපි බලාපොරොත්තු වන්නේ මොකක්ද? රට මුහුණ පා තිබෙන අර්බුදවලට විසඳුමකුයි. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ රටවල් විශාල ප්‍රමාණයක සංචාරය කර තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේට ඒ රටවල්වල තත්ත්වයන් ගැන අවබෝධයක් තිබෙනවා. ඇමෙරිකාව වැනි ධනවත් රටකටත් මේ ආර්ථික අර්බුද තත්ත්වය ඔරොත්තු දුන්නේ නැත්නම් අපේ වගේ පොඩි රටවල්වලට මෙය ඔරොත්තු දෙයිද? අපේ රටවලට ඊට වඩා බලපෑම් එනවා. ගරු කථානායකතුමනි, ලොකු අය කඩා වැටෙන කොට පොඩි අය උඩට තමයි වැටෙන්නේ. එහෙම වෙලාවක මේ තත්ත්වය බේරා ගන්න පුළුවන් වුණේ කල් ඇතිව මේකට සූදානම් වුණු නිසයි; එක්තරා සූදානමක් තිබුණු නිසයි. ඒක නිසා මේ අය වැය ලේඛනය සර්වාංග වෙදකමක් වගෙයි. සෑම පැත්තකින්ම සාර්ථක වෙන්න උත්සාහයක් කර තිබෙනවා. කලබල වෙන්න ඕනෑ නැහැ. අපි බලා සිටිමු. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.00 වූයෙන් කටයුතු අත් හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2008 නොවැම්බර් 08 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.***

*அப்பொழுது, பி.ப. 5.00 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2008 நவம்பர் 08, சனிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Saturday, 08th November, 2008.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

# විදේශ විනිමය නීති උල්ලංඝනය කිරීම
## அந்நியச் செலாவணிச் சட்ட மீறுகை
## VIOLATION OF FOREIGN EXCHANGE LAWS

**ඩුලිප් විජේසේකර මහතා**
(மாண்புமிகு டுலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekara)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙන ඒමට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ අනුව මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"වරප්‍රසාද ලත් පුද්ගලයකු රටේ විදේශ විනිමය නීති උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව මාධ්‍ය මඟින් අනාවරණය වී ඇත.

එම තොරතුරුවලට අනුව ඇමෙරිකන් ඩොලර් තිස්ලක්ෂයක මුදලක් නීති විරෝධී ලෙස රටට ගෙන්වා ගැනීමත් සමඟම ඒ තුළින් රටට අහිතකර වන ලෙස කටයුතු කිරීමටද, විදේශ විනිමය පාලනය කිරීමේ පනතට විරුද්ධව කටයුතු කර ඇති බව ද හෙළි වී තිබේ. මෙය බරපතළ තත්ත්වයකි.

මේ සම්බන්ධ තොරතුරු පාර්ලිමේන්තුවට හෙළි කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට දන්වන ලෙස ද, මේ පරීක්ෂණ තුළින් අනාවරණය වී ඇති කරුණු පාර්ලිමේන්තුවට දැනුම් දෙන ලෙස ද යෝජනා කර සිටිමි.

මෙම පුද්ගලයාට විරුද්ධව ඇති චෝදනාව ශ්‍රී ලංකා මහ බැංකුවේ පරීක්ෂණ වාර්තාවට අනුව පාර්ලිමේන්තුවට දැනුම් දෙන ලෙසත්, ඔහුට විරුද්ධව ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා ලෙසත් පාර්ලිමේන්තුවට යෝජනා කරමි."

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙම යෝජනාව පිළිබඳ විවාදයේදී කිසිම අවස්ථාවක ස්ථාවර නියෝග කඩ වීමක් නොසිදු වනු ඇතැයි කියා මා බලාපොරොත්තු වෙනවා.

**ඩුලිප් විජේසේකර මහතා**
(மாண்புமிகு டுலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekara)
හොඳමයි, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ස්ථිර කරන්නේ කවුද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (විදුලිබල අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே - மின்வலு அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Power)
ගරු කථානායකතුමනි, ගරු ඩුලිප් විජේසේකර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින් මේ පිළිබඳව විශේෂයෙන්ම මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න අප කැමැතියි. ගරු කථානායකතුමනි, 2006 දෙසැම්බර් මාසයේ Standard Chartered කියන බැංකුවට ඩොලර් මිලියන තුනක් - ඩොලර් ලක්ෂ තිහක මුදලක්- Nexia කියන සමාගමේ ගිණුමට ලැබී තිබුණා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා ඔය කියවන්නේ මොකකින්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කියවන්නේ මොකකින්ද කිව්වේ ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකකින්ද ඔබතුමා ඔය කියන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කියන්නේ නම් කටින්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ යෝජනාව - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order. ලංකාවේ බැංකු නීතිය අනුව කිසිම වෙලාවක බැංකුවක තිබෙන කාරණාවක් සම්බන්ධව - [බාධා කිරීමක්] එය රහස්‍ය තොරතුරක් විධියට අප ආරක්ෂා කරනවා. අප දැන ගන්න කැමැතියි - [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මා මේ කියෙව්වේ පත්තරයෙන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අප දැන ගන්න කැමැතියි - [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම කොහොමද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කටින් කිව්වේ ඇහෙන් පත්තරය බලලායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කාරණා මෙසේ ඉදිරිපත් කරද්දී - [බාධා කිරීමක්] එහෙම නම් ඒ පුද්ගලයන් කවුද කියා කරුණාකර පාර්ලිමේන්තුවට හෙළිදරවු කරන්න. දැන් ප්‍රශ්නයක් මතු වෙනවා කවුද මේ අය කියා. එහෙම කියන්නේ නැතිව - [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මා මේ කථා කරන්නේ 2007 නොවැම්බර් මාසයේ විසි වැනි දා "ලංකාදීප" පත්තරයෙන්. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කොහේවත් තිබෙන ඒවා ගෙනැල්ලා මෙහෙම පාර්ලිමේන්තුවේ කථා කරන්න පුළුවන්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
2007 නොවැම්බර් මාසයේ විසි වැනි දා - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, කරුණාකර ඔබතුමා මේ සම්බන්ධයෙන් තීන්දුවක් දෙන්නය කියා මා ගෞරවයෙන් ඉල්ලනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ යෝජනාව සනාථ කරන කිසිම ලියවිල්ලක් ඉදිරිපත් කර තිබුණේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, 2007 නොවැම්බර් මාසයේ විසි වැනි දින "ලංකාදීප" පත්තරයේ තොරතුරක් ආශ්‍රයෙන් තමයි මා මේ කථා කරන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය අපට ඉදිරිපත් කළේ නැහැ නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ. මේ සිද්ධිය සම්බන්ධයෙන් පත්තරවල පළ වූ තොරතුරුත් සම්බන්ධ කර ගෙන තමයි මා මේ කථා කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා නම් කරුණාකර එය ඉදිරිපත් කරන්න පුළුවන්. මෙහෙම විවාද කරන්න බැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මා මේ තොරතුරු ටික සභාගත කරන්නම් ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ, සභාගත කරන ලියවිල්ල මොකක්ද කියා මුලින්ම මා බලන්න ඕනෑ. ඒක මට බලන්න දෙන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට දුන්නාම මට ඒක කියවන්න බැරි වෙනවා නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ, මා එය බලන්න ඕනෑ නේ. මේ මොනවාත් කිසිම සටහනක් නැතිව මා - [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, ඔබතුමා මෙය බලලා ආපසු මට ලැබෙන්න සැලැස්සුවොත් හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආණ්ඩු පක්ෂයේ අපේ ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා. ඒ සියලු දෙනාම මෙය දන්නවා. මේ පාර්ලිමේන්තුව තුළ මේ කරන විහිළුව මොකක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොකක්ද විහිළුව?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, මා අහන්නේ කොහොමද මෙසේ ඉදිරිපත් කරන්නේ කියායි. ඔබතුමන්ලා දන්නවා නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා — මගේ මිත්‍රයා - තමුන්නාන්සේ තමයි මේ රටේ දූෂණයට විරුද්ධව එක්සත් ජාතික පක්ෂයෙන් ලොකුවටම කෑ ගහන මන්ත්‍රීතුමා. තමුන්නාන්සේ දූෂණයට, වංචාවට විරුද්ධව - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වංචාවක් සිදු වෙලා නම් මා අත් දෙකම ඔසවනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් අත් දෙකම ඔසවලා ඉඳ ගන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වංචාවක් සිදු වෙලා තිබෙනවා නම් ඔබතුමා කියන එකට සියයට දෙසීයක් මා එකඟයි. මා කියන්නේ මේකයි. ඔබතුමන්ලාට පරීක්ෂණයක් කරන්න පුළුවන්. ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තිබෙනවා. ඒ පරීක්ෂණයට අදාළ කාරණාත්, තමුන්නාන්සේ ඔය කථා කරන කරුණුත් දැන් මා ළඟ තිබෙනවා. ඕනෑ නම් අපි යෝජනාවක් කරමු. මා එයට සූදානම්. ඒ කාරණය ඔප්පු කරන්න. තමුන්නාන්සේලාට ආණ්ඩුවත් තිබෙනවා. ඉතින් එය ඔප්පු කරන්න. එහෙම ඔප්පු වෙලා නැහැ. කිසිම කාරණයක් ඔප්පු වෙලා නැතුව - [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කාරණය ඔප්පු කිරීම සඳහා මේ වෙන කොට පරීක්ෂණයක් පැවැත්වෙනවා. මේ වෙන කොට මහ බැංකුවේ පරීක්ෂණයක් පැවැත්වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මං නේ තමුන්නාන්සේට කියන්නේ. තමුන්නාන්සේ කොහොමද නැහැ කියන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් ඒ පුද්ගලයන් අත් අඩංගුවට අර ගන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කොහොමද, නැහැ කියන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රටේ නීතිය ක්‍රියාත්මක කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේ හැම එකම දන්නවා වාගේ කථා කරනවා. තමුන්නාන්සේ කොහොමද දන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මං දන්නවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මහ බැංකුව තමුන්නාන්සේගේද? [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මං දන්නවා. තමුන්නාන්සේ කියන විධියට නිකම් බොරුවට - [බාධා කිරීමක්] මේවා ක්‍රියාත්මක කරන්න බැහැ - [බාධා කිරීමක්] මේ ගරු සභාව ඇතුළේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයට වෙලා - [බාධා කිරීමක්] තමුන්නාන්සේ දන්න දෙයක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, නිකම් වල් පල් ගෙනැල්ලා මේ ගරු සභාව ඇතුළේ - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලාට ආණ්ඩුවක් තිබෙනවා. CID එක තමුන්නාන්සේලාගේ අතේයි තිබෙන්නේ. තමුන්නාන්සේ ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Nexia කියන සමාගමට ඩොලර් මිලියන තුනක මුදලක් - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොරු ඉන්නවා නම් අල්ලලා එළියට දාන්න. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඩොලර් මිලියන තුනක මුදලක් ලැබී තිබුණා Standard Chartered කියන බැංකුවට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කැත වැඩ කරන්න දෙන්න එපා මේ සභාව ඇතුළේ. මොන විකාරයක්ද? සම්පූර්ණයෙන්ම කැත වැඩක් මේක. මෙහෙම කථා කරන්න මොකක්ද තිබෙන අයිතිය? [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේ මුදල් ආවේ කොහොමද කියන එක පිළිබඳව මහ බැංකුව හොයා බැලුවා ගරු කථානායකතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මං ඔබතුමාගෙන් ඉල්ලන්නේ කරුණාකර මෙය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නය කියායි. මෙය සම්පූර්ණ වැරැදියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේ සම්බන්ධයෙන් මහ බැංකුව සොයා බැලීමේදී මේ මුදල Nexia සමාගමට නොවෙයි ආවේ, මේ මුදල ආවේ වෙනත් පුද්ගලයකුට කියන එක Nexia කියන සමාගම මහ බැංකුවට දැනුම් දුන්නා. ඒ අනුව ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් විදේශ ආයෝජනයක් - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවයි තිබෙන්නේ. ඒ පරීක්ෂණය කරන්න. අපත් අත ඔසවන්නම්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පොඩ්ඩක් ඉඳ ගන්න කෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අප ඒ ටික කරන්නම්. අත ඔසවන්න ඉස්සෙල්ලා මේ ගැන කථා කරලා ඉවර වෙන කල් ඉන්න කෝ. පස්සේ අත ඔසවන්න කෝ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙය සම්පූර්ණ වැරැදියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොකක්ද වැරැද්ද? [බාධා කිරීමක්] ඉතින් වැරැදි නම් තමුන්නාන්සේලාගේ පැත්තෙන් කථා කරන කොට නිවැරැදි කරන්න කෝ. ඔබතුමන්ලාට විනාඩි පහළොවක් තිබෙනවා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒකට ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මේ මුදල එන්න ඕනෑ - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, කරුණාකර මෙය නතර කරන්න. මේ මොකක්ද? [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමනි, මේ යෝජනාව පිළිබඳව මා ඔබතුමා සමඟ දවාලේත් සාකච්ඡා කළා. [බාධා කිරීමක්] පොදු මූල්‍ය පාලන බලය පාර්ලිමේන්තුවට තිබෙන නිසා විශේෂයෙන්ම රටට වැදගත් දෙයක් පිළිබඳව මන්ත්‍රීවරයකුට ප්‍රශ්නයක් නඟන්න තිබෙන අයිතිය ආරක්ෂා කර දෙන එක එක් කාරණයක්. හැබැයි මේ සාකච්ඡාව තුළ කිසිම ආකාරයකින් ස්ථාවර නියෝගවලින් පැහැදිලිව කියා තිබෙන විශේෂිත වූ යෝජනාවක් තුළින් කෙරෙන තාලයේ දෙයක සඳහනක් වෙන්නේ නැහැ කියන සහතිකය තිබෙන්න ඕනෑ. ඒකයි මම විශේෂයෙන්ම මෙය අහන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඉදිරිපත් කරලා තිබෙන මේ යෝජනාව විශේෂිතවම යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ චර්යාව හෝ හැසිරීම පිළිබඳ වූ යෝජනාවක් බව බැලූ බැල්මට පෙනෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. පොදු ප්‍රශ්නයකුයි අදාළ මන්ත්‍රීතුමා යොමු කර තිබෙන්නේ. පුවත් පත්වලින් සහ වෙනත් මාධ්‍ය ආයතනවලින් විනිමය වංචාවක් පිළිබඳව - මේ පිළිබඳව - ප්‍රශ්නයක් මතු කරලා තිබුණා. ඒ පිළිබඳව රජයේ ස්ථාවරය දැන ගැනීමටයි අවශ්‍යව තිබෙන්නේ. මේ ප්‍රශ්නය ආවාම අපේ සභානායක කාර්යාලයෙන් ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමාටත් මේ සම්බන්ධව දැන්වූවා, මේ පිළිබඳව මහ බැංකුවේ ස්ථාවරය මොකක්ද කියන එක පාර්ලිමේන්තුවට දන්වන්න කියලා. ඒක අපේ යුතුකමක්. ඒ අනුව මෙතුමා ප්‍රශ්නය නැඟුවාට පසුව, ඊට අදාළ කරුණු කිව්වාට පසුව ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා මේ පිළිබඳව නීතියෙන් පිටතට යන්නේ නැතුව නීතිය තුළ - ඒවායේ රහස්භාවයන් තිබෙනවා නම් ඒවා ආරක්ෂා කරන ආකාරය එතුමා දන්නවා. - පාර්ලිමේන්තුවට දන්වාවී. අපි එතෙක් ඉඳිමු ගරු කථානායකතුමනි. ඒ අවස්ථාවේදී ඔබතුමාට හැඟෙනවා නම් මේක නීතියෙන් පිට යනවා කියලා ඒ කාරණය ගැන ඔබතුමාට තීන්දුවක් දෙන්න පුළුවන්. නමුත් මන්ත්‍රීතුමාගේ අයිතියත් රකිමින්- [බාධා කිරීමක්] ඔබතුමා දන්නවා, පත්තරවල පළ වන මෙවැනි දේවල් පිළිබඳව විපක්ෂයෙන් විවිධ දේවල් කියනවාය කියා. අහවල් පත්තරයේ මේක තිබුණා ආදී වශයෙන් මෙවැනි යෝජනා දිගටම ඇවිත් තිබෙනවා. ඒ නිසා ඒ මන්ත්‍රීතුමාගේ වරප්‍රසාදය රැක දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් අපි විවාදය ගෙන යමු කියා ඉල්ලනවා. නමුත් එහිදී ස්ථාවර නියෝගවලට එරෙහිව යමක් කෙරෙනවා නම් ඔබතුමාට හැම විටම බලය තිබෙනවා ඒක අයින් කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ඒ මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද රකිනවා වාගේම මේ පාර්ලිමේන්තුවේ වෙනත් මන්ත්‍රීවරයකුගේ වරප්‍රසාද රකින්නත්, ඒ වාගේම මම බැඳී සිටින බව ආණ්ඩු පක්ෂයේ ගරු නියෝජ්‍ය ප්‍රධාන සංවිධායකතුමාගේ අවධානයට ලක් කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ලංකාවේ බැංකු නීතිය අනුව යම් කිසි මුදල් හුවමාරුවක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒ පුද්ගලයන්ගේ නම් ගම් සඳහන් කිරීම, ඒවා ඉදිරිපත් කිරීම-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තවම නමක් ගමක් ආවේ නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, ඒක තමයි,-[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉතින් ඇයි අපි ඒ ගැන කථා කරන්නේ? [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මන්ත්‍රීතුමා, කරුණාකරලා තොප්පිය දා ගන්න හදන්න එපා. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ආයතනයේ නම ඉදිරිපත් කිරීමත් සම්පූර්ණ වැරදියි. මේ ආයතනයේ නම දැන් කිව්වා. ඒක සම්පූර්ණ වැරදියි. [බාධා කිරීමක්] ඒකයි මම කියන්නේ. මෙහෙම දෙයක් තිබෙනවා නම් අපේ මුදල් ඇමතිතුමා - රටේ ජනාධිපතිතුමා - ඉන්නවා. මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා ඉන්නවා. එතුමන්ලාට පුළුවන්, මේවාට සම්බන්ධ අදාළ පුද්ගලයෝ වංචාවලට - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. වංචාවලට සම්බන්ධ වෙලා තිබෙනවා නම් ඔවුන්ට විරුද්ධව කටයුතු කරන්න කියලා අපි අත් දෙකම උස්සලා කියනවා. කිසි ගැටලුවක් නැහැ. මෙහෙම මඩ ගහන්න එපා. ඒකයි මම කියන්නේ. ඔබතුමන්ලා වැඩ කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කාඩ්බෝඩ් වීරයෙක් වෙන්න එපා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේක මන්ත්‍රීතුමාගේ වරප්‍රසාදයක්; ඇසීමේ අයිතියක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, මම කාඩ්බෝඩ් වීරයෙක් නොවෙයි. මට කාඩ්බෝඩ් වීරයෙක් වෙන්න ඕනෑ නැහැ. ගරු කථානායකතුමනි, මම කාටවත් කඩේ යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලන්නේ මෙයයි: මේ අදාළ ආයතනයේ නම, මේ පුද්ගලයන්ගේ නම් ගම් එළිදරවු කිරීම බැංකු නීතියට සම්පූර්ණයෙන් පටහැනියි. ඒවා පාවිච්චි කරන්න හදන්නේ අපේ පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, මේක ඉදිරියට ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්න එපායි කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. බැංකුවේ නම - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නම කිව්වා. ඒ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, මහ බැංකුවේ අධිපතිතුමා ඉන්නවා, මුදල් ඇමතිතුමා ඉන්නවා, මුදල් නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. කරුණාකරලා එතුමන්ලාට කියන්න ඕනෑ,- [බාධා කිරීමක්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඉදිරිපත් කරන අවස්ථාවේදීත්- [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අරගෙන ගිහිල්ලා හිරේ දාන්න. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේ මහ ලොකු වීරයෙක් වගේ කථා කරනවා. තමුන්නාන්සේ තොරතුරු දැන ගෙනද කථා කරන්නේ? [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, අපි දන්නවා. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේ මහ ලොකුවට පත්තරවල තියෙන ඒවා කථා කරනවා. තමුන්නාන්සේ භාගයක් අසත්‍ය ප්‍රකාශ කරන්නේ. තමුන්නාන්සේ නිකම් ජනමාධ්‍යවලට කථා කරනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේ නිකම් බොරුවට කෑ ගහන්න එපා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමා- [බාධා කිරීම්] කරුණාකර නිශ්ශබ්ද වෙන්න. [බාධා කිරීම්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මේක බැංකුවල රහස්‍යතාව පිළිබඳව ප්‍රශ්නයක් නම් ඒ පිළිබඳව රජය මඟින් පිළිතුරු දෙන අවස්ථාවේදී ඒවා හෙළි කරන්න අපි බැඳිලා නැහැ. බැඳිලා නැති තත්ත්වයක් තියෙනවා නම් අපි එසේ කරන්නේ නැහැ. නමුත් අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා පෙන්වා දුන්නේ, ජනමාධ්‍යවල මේ පිළිබඳව විශාල ප්‍රචාරයක් ගෙන ගිහිල්ලා තිබෙනවා, මෙවැනි දෙයක් සමහර විට නිලධාරි මට්ටමෙන් යටපත් කිරීමක් වෙලා තිබෙනවා ද දන්නේ නැහැ, ඒ සමස්ත ක්‍රියාවලිය පිළිබඳව රජයේ අවධානය යොමු කරන්නය කියායි. [බාධා කිරීම්] ඒ අයිතිය එතුමාට තියෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ වාගේම- [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නිලධාරීන් ඒ ගොල්ලන්ගේමයි. නිලධාරීන් ආණ්ඩුවේ. මේක පාර්ලිමේන්තුවේ- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය අහ ගන්නයි හදන්නේ කථාව. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි, ඇයි? [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න. දැන් ගරු නියෝජ්‍ය ප්‍රධාන සංවිධායකතුමා පුවත් පත් පදනම් කර ගෙනයි මේක සඳහන් කරන්නේ. මම මේ පුවත් පත ඔබතුමාගෙන්ම ගෙන්වා ගෙන බැලුවා. බලන කොට පැහැදිලිවම මෙහි යම් කිසි ගරු මන්ත්‍රීවරයකුගේ නමක් සඳහන් කරලා තියෙනවා. එතකොට ඔබතුමාට තේරෙනවා, ස්ථාවර නියෝගවලිනුත් ඉතාම පැහැදිලිව

[කථානායකතුමා]

ආරක්ෂාව ලැබෙනවා. පාර්ලිමේන්තුවේ කථා කරන කොට අපි එහෙම කෙනකුට බලපාන තාලයේ ප්‍රකාශයක්- [බාධා කිරීම්] ඔබතුමා ඒ සීමාව තුළ ඉන්නය කියලා මා නැවතත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි. මම කිසි දෙයක් කිව්වේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා වන පරිදි, එහෙම කිසිම දෙයක් නොවෙන්න අපි කියන්නේ මේ පිළිබඳව-[බාධා කිරීම්] අපට මහ බැංකුව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා, මේක පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් වේවිද කියලා. ඒකයි අපි කියන්නේ, මේ විනිමය වංචාව පිළිබඳව හොයා බලන්නය කියලා. එච්චරයි. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තියෙනවා. දැන් ඔබතුමා අතට ගරු ඇමතිතුමා ඉදිරිපත් කරපු සභාගත කරන්න තිබෙන ලියවිල්ලක් තියෙනවා. එතකොට එවැනි ලිපියක්- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඉතින් ඒක සභාගත කරනවා ද, නැද්ද කියන එක පිළිබඳව තීන්දු ගන්නේ මම.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මම දන්නවා. නමුත් මගේ ප්‍රශ්නය මේකයි. ඒ සභාගත කරන්න කියලා දීපු ලිපියේ නැත්නම් ප්‍රවෘත්ති පත්‍රයේ කාගේ හරි මන්ත්‍රීවරයකුගේ නමක් සඳහන් වෙලා තියෙනවා ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තියෙනවා. නිශ්චිතවම තියෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

දැන් මේ යෝජනාව ගෙනැවිත් තියෙන කොට, ඒ පත්‍රය පදනම් කරගෙන කථා කරන කොට අපට බොහොම පැහැදිලියි, මේකේ අරමුණ මොකක්ද කියලා. එක්තරා මන්ත්‍රීවරයකුට විරුද්ධව-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඒක රටටම පැහැදිලියි. ඔබතුමාට විතරක් නොවෙයි. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, ඒක බොහොම පැහැදිලියි. දැන් ඔබතුමාගේ අතේ තියෙන ලියැවිල්ලේ - සභාගත කරන්නය කියලා දුන්නු ලියවිල්ලේ- කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකුගේ නමක් තියෙනවා නම් එහෙනම් ඒ මන්ත්‍රීවරයාට විරුද්ධව තමයි ඒ ගරු මන්ත්‍රීවරයා පිළිබඳව තමයි සාකච්ඡා කරන්නේ. වෙන එකක් පිළිබඳව නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් මේකට කිසිම සඳහනක් නොකර ඔබතුමා කථාව ගෙන යන්න. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

නැහැ, ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්] ඔබතුමා අතේ තියෙනවා- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

නැහැ, බලමුකෝ එතුමා කථා කරන හැටි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, ඔබතුමා අතේ ලියවිල්ලක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අපි බලමු. එතුමා මේක පදනම් කර ගන්නේ නැතිව,- [බාධා කිරීම්] මම කිව්වා, මේ ගැන කිසිම සඳහනක් වෙන්නේ නැහැ, මේක හැන්සාඩ් ගත වෙන්නේ නැහැ, ඒ මොකක්වත් වෙන්නේ නැහැය කියා. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

බොහොම ස්තුතියි. හිටපු ගරු කථානායකතුමනි, වාඩි වෙන්න. තමුන්නාන්සේට වඩා හොඳ දැනුමක් ගරු කථානායකතුමාට තියෙනවා. පොඩ්ඩක් ඉඳ ගන්න. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

නැහැ, මම කියන්නේ හැන්සාඩ් ගත වන එක ගැන නොවෙයි. දැන් ඒ ලියවිල්ල ඔබතුමාට ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කරපු කඩදාසියේ එහෙම නැත්නම් කොළයේ තියෙනවා, නමක්. ඒක හැන්සාඩ් එකට යනවාය කියන එක නොවෙයි ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

නැහැ, කොතැනටවත් යන්නේ නැහැ. සභාගත වන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් වෙන්නේ, ඒ ගරු මන්ත්‍රීතුමාට විරුද්ධව මේක සනාථ කරන්න තමයි මේ ප්‍රවෘත්ති පත්‍රයෙන් ඒ නම ඉදිරිපත් කළේ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාගත වෙන්නේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මගේ වේලාව මට ඕනෑ. ඔබතුමා මට වේලාව දෙනවා ද? ගරු කථානායකතුමනි, ඔබතුමා - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙහෙම ප්‍රශ්න මතු වෙනවා. එතකොට අපි කල්පනාවෙන් කටයුතු කරන්න ඕනෑ. ඒකෙන් තේ අපි පත්තරය ලබන්නේ. ඒ නිසා කලබල වෙන්න එපා. [බාධා කිරීම්] මේ ගැන කිසිම සඳහනක් වාචිකව, අකුරෙන්, කට හඬින් මොකකින්වත් වුණේ නැහැ. අපේ සභාවේ කටයුතු කෙරෙන්නේ වචන මාර්ගයෙන්. ඒ වචන කිසිවකින් සඳහන් වුණේ නැහැ. [බාධා කිරීම්] ඒ ලියවිල්ල මම සභාගත කරන්නෙත් නැහැ. ඒකට එතුමා එකඟ වුණා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මේ විනිමය වංචාව පිළිබඳ කාරණය මේ රටේ සියලු දෙනාගේම අවධානය යොමු විය යුතු කාරණයක්. ඊට හේතුව තමයි මේ Nexia කියන සමාගමට මේ මිලියන 30ක මුදලක් ලැබුණත්, මේ මුදල Nexia සමාගමේ නොවෙයි කියන එක ඒ Nexia සමාගම විසින් පැහැදිලි කරලා තිබීම. මේ මුදල වෙන කෙනකුගේ අවශ්‍යතාවක් මත මේ සමාගමට ආවාය කියන එක Nexia සමාගම කිව්වා. ඒ වාගේම ඒ පුද්ගලයාගේ බැංකු ගිණුම් කටයුතු සියල්ලම කරන්නේ "නෙක්සියා" කියන සමාගමයි. එම නිසා "නෙක්සියා" සමාගමට මේ ඩොලර් මිලියන තුනක මුදල එව්වාය කියා ඒ ගොල්ලො කිව්වා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ලියවිල්ල සභාගත කරන්නේ නැහැ. එතුමා ඒකට එකඟ වුණා. ඒ එකඟත්වය මත දැන් මේක සභාගත කෙරෙන්නේත් නැහැ. අපි යමු. දැළි පිහියක් උඩ යන ගමනක් මේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් විදේශීය ආයෝජනයක් සඳහා මුදල් එවන කොට එවන්න ඕනෑ, SIERA කියන ගිණුමටයි. ඒ සඳහා වෙනම account එකක් තිබෙනවා. SIERA කියන ගිණුමක් තියෙනවා. ඒ ගිණුම හරහායි සාමාන්‍යයෙන් විදේශ ආයෝජනයක් සඳහා මේ මුදල් එවන්නට ඕනෑ. මේ මුදල එවා තිබෙන පුද්ගලයා මීට ප්‍රථම ලංකාවට- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා පොඩ්ඩක් ඉන්න. මේ රීති ප්‍රශ්නයක්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, ඕක හැන්සාඩ් එකට යන්නේ නැති වුණාට දැන් ඔබතුමාට සනාථ කර ඉවරයි මේ යෝජනාවෙන් කථා කරන්නේ කා ගැනද කියන එක.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ගැන ද? [බාධා කිරීම්] පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ගැනද සඳහන් කරන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේක පදනම් කර ගන්නේ නැහැ කියා දැන් එතුමා කිව්වා. මා කිව්වා, මේකේ මන්ත්‍රීවරයෙකුගේ නම සඳහන් වෙලා තිබෙනවාය කියා. එතුමා මට සහතික වුණා, මෙය පදනම් කර ගන්නේ නැතිවයි කියන්නේ කියා. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් හැන්සාඩ් ගත කරන්නය කියලායි ඔබතුමාට දුන්නේ. ඒක බොහොම පැහැදිලියි නෙ. [බාධා කිරීම්] දැන් ඔබතුමාගේ තීරණයක් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපට ප්‍රශ්නයක් නැහැ. මේක සභාගත කරන්නය කියා දුන්නාම, කා ගැනද කථා කරන්නේ කියා ඔබතුමා දැන් සනාථ කර තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාගත කරන්නේ නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක වෙනම ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාගත කරන්නේ නැහැ කියන සහතිකය එතුමා දුන්නා. ඒකට ගැළපෙන විධියට මම මුද්‍රිත මාධ්‍යටත් - පුවත් පත්වලටත් -, විශේෂයෙන්ම විද්‍යුත් මාධ්‍යටත් කියනවා, මේ පිළිබඳව සටහන් කිරීමෙන් වළකින්නය කියා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මේ මුදල එවූ පුද්ගලයා මීට කලිනුත් ලංකාවට මහ බැංකුව හරහා විශාල ආයෝජන සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. මුදල් ගනුදෙනු කර තිබෙනවා. හැබැයි, කවදාවත් ඔහු මේ ආකාරයට මුදල් එව්වේ නැහැ. මේ විදේශ විනිමය ප්‍රමාණය එව්වේ නැහැ. ඔහු මේ විදේශ විනිමය එවනවා නම් එවන්න ඕනෑ SIERA කියන ගිණුම හරහායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පාර්ලිමේන්තුවෙන් සටහන් වෙන්නේත් නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
වැරදි ගිණුමකින්, අයථා ලෙස වංචනික ලෙස මහ බැංකුව හරහා මේ මුදල් එවීම තුළින් විශාල විනිමය වංචාවක් වෙලා තිබෙනවාය කියන එක ගැන ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ හැම අකුරක් ගානේම මම බලනවා, හැන්සාඩ් වාර්තාව.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, හැන්සාඩ් වාර්තාව එන්නේ කල් ගිහිල්ලා. මේ කරන කථාව මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුව පැත්තෙන් රෙකෝඩ් කරනවා. රෙකෝඩ් කර අද හවසට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
Mr. Speaker)
නැහැ. එහෙම ඉඩ දෙන්නේ නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අයිටීඑන් එකෙයි, රූපවාහිනියෙයි යනවා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හෙට දමනවා ඊට පස්සේ. [බාධා කිරීම්] ඒකට ඉඩ දෙන්න එපා ගරු කථානායකතුමනි. [බාධා කිරීම්] විහිළුවට ලක් කරනවා මේ පාර්ලිමේන්තුව,-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැනට මේක රෙකෝඩ් වෙනවා. [බාධා කිරීම්] මේ කථාව රෙකෝඩ් වෙනවා. තමුන්නාන්සේ හැන්සාඩ් එකට දෙන්නේ නැති වන්නට පුළුවන්. [බාධා කිරීම්] සභාගත කරන්නේ නැති වන්නට පුළුවන්. [බාධා කිරීම්] නමුත් අද -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ජනාධිපතිතුමා ගැන ඒ ගොල්ලන්ට කථා කරන්නට පුළුවන්. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අද අයිටීඑන් එකෙයි, රූපවාහිනියෙයි මේ කථාව යනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේ ගොල්ලො බබාලා වෙන්න හදනවා. මේ ගොල්ලො කිරි බොන බබාලා වෙන්න හදනවා. [බාධා කිරීම්] කැබිනට් මණ්ඩලයේ කැබිනට් පත්‍රිකා ගැන කතා කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුදල් ඇමතිතුමා ගැන කථා කරන්න පුළුවන්. ජනාධිපතිතුමා ගැන කථා කරන්න බැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ජනාධිපතිතුමා ගැන මේ ගොල්ලො කොච්චර කථා කරනවා ද? ජනාධිපතිතුමාට මොන තරම් දෝෂාරෝපණය කරනවාද මේ ගොල්ලො මේ පාර්ලිමේන්තුවේ? මෙතැන සුදනෝ වෙන්න හදනවා. මහ ලොකුවට රූපවාහිනියට ගිහින් ලොකුවට දූෂණ ගැන කථා කරනවා. ඊයේ ජනාධිපතිතුමාව බදා ගෙන හිටියේ. [බාධා කිරීම්] ඉම්බා. ජනාධිපතිතුමාව ඉම්බා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂයට මිනිත්තු පහක් කල් දෙනවා. ඊළඟට නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමාගේ පිළිතුරු කථාව.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට ඔබතුමා කථා කරන්න ඉඩ දුන්නේ නැහැ. විපක්ෂයට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරන්න දෙයක් නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට විනාඩියක් කථා කරන්න දෙන්න. විනාඩියෙන් මා අවසන් කරනවා. විනාඩියක් කතා කරන්න දෙන්න. ගරු කථානායකතුමනි, මේ කාරණය ගැන මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේක සම්පූර්ණයෙන්ම විනිමය වංචාවක්. මේ පිළිබඳව මහා බැංකුවේ පරීක්ෂණයක් පැවැත්වෙනවා. මහ බැංකුවේ Exchange Control Department එකේ මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වෙනවා. රහස් පොලීසියේ මේ පිළිබඳව විභාගයක් කළා. ඒකෙනුත් සාධාරණයක් වුණේ නැහැ. [බාධා කිරීම්] එම නිසා, ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මහ බැංකුව හරහා මේ පරීක්ෂණය අහවර කරලා, - [බාධා කිරීම්] මේ විනිමය වංචා කළ පුද්ගලයාට විරුද්ධව වහාම කටයුතු කරන්නය කියා මුදල් අමාත්‍යාංශයෙන් අප ඉල්ලීමක් කරනවා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ විවාදය සම්බන්ධ වන්නට අවස්ථාව ලබා දීම ගැන. අද දවසේ මේ ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන්

අපට කථා කරන්නට අවශ්‍ය කාරණා ගණනාවක් තිබෙනවා. මේ රටේ තිබෙන්නේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවක්. [බාධා කිරීම්] මේකේ මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා විධියට අපේ රංජිත් සියඹලාපිටිය මැතිතුමා කටයුතු කරනවා. එතකොට මේ වාගේ කාරණා සම්බන්ධව- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කථාවයි දැන් සටහන් වෙන්නේ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා, මේ වාගේ විවාදයක් ගෙනල්ලා, ඒ විවාදයට අදාළ කාරණා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කොට - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ, ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකතුමා- [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ විවාදයට අදාළ කාරණා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කොට යම් කිසි සත්‍යතා තිබෙන කාරණා ඉදිරිපත් කරන්නට ඔවුන්ට හැකියාව තිබෙනවා. මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ මේකයි. මේ රජයේ ඇමතිවරු ඉන්නවා. මේ රජයේ පොලිස් දෙපාර්තමේන්තුව තිබෙනවා. මේ රජයේ ශ්‍රී ලංකා මහ බැංකුව තිබෙනවා. මේ කාරණා ටික සියල්ල සලකා බලා ඔවුන් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරන්න කියා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා. [බාධා කිරීමක්] ඒ පරීක්ෂණය කරන්න අවශ්‍ය කාරණා තමුන්නාන්සේලා ළඟ තිබෙනවා. නමුත් මේකෙන් සිද්ධ වෙන්නේ මොකක්ද? [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව කියා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට කොහෙන් හරි කුණු ගොඩක් ගෙනල්ලා මේක පාවිච්චි කරමින් අද රෑට රූපවාහිනියේ දමනවා. ගුවන් විදුලියෙනුත් කියනවා. උදේ ඉඳන් රෑ වෙනකම් මේක දමනවා. මේ ඉදිරිපත් කරපු කාරණය සම්බන්ධව කිසිම වැදගත් තොරතුරක් මේ ආණ්ඩුවට නැහැ. මේ වාගේ තොරතුරක් ගෙනල්ලා මෙතැන කථා කරලා අද රෑට රූපවාහිනියෙයි, ගුවන් විදුලියෙයි, අනෙක් නාළිකාවලයි දමලා මේ කරන්න හදන්නේ වෙන කාරණයක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයටත්, අපිටත් අපේ මන්ත්‍රීවරුන්ටත් මඩ ගැහීමේ ව්‍යාපාරයක්. ඇත්තටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාවේ මේ වාගේ කාරණා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ පිළිබඳව එබඳු ප්‍රචාරයක් කිසිම ආකාරයකින් කරන්නේ නැහැ. මම ඒ සහතිකය දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලන්නේ අන්න ඒ කාරණය. මොකද, අපි ඉල්ලනවා, මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්නය කියා. මේ සම්බන්ධව මහ බැංකුව කරපු පරීක්ෂණ ගණනාවක තොරතුරු මෙතැන තිබෙනවා. මම ඕනෑ නම් සභාගත කරන්නම්. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ගරු මුදල් ඇමතිතුමා. [බාධා කිරීම්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, [බාධා කිරීම්] මට කථා කරන්න දෙන්න කෝ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මුදල් ඇමතිතුමා. [බාධා කිරීම්] රීති ප්‍රශ්නයක්ද? [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපි අහනවා කා ගැනද පරීක්ෂා කරන්න කිව්වේ කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අනාගත නායකයා වාඩි වෙන්න. [බාධා කිරීම්]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, මගේ අවස්ථාව ලබා දෙන්න. [බාධා කිරීම්]

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - விமான சேவைகள் பிரதி அமைச்சர்)
( The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of Aviation)
මේ මන්ත්‍රීතුමා කැමැතියි, මේ යෝජනාව ගෙනාවාට. අපි දන්නවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමාටත්, යෝජනාව ස්ථිර කරපු අපේ අමාත්‍යතුමාටත්.

මේ යුගය, විදේශ විනිමය ගැන වැඩිවැඩියෙන් සැලකිය යුතු යුගයක්. අද ලෝකයේ ආර්ථික අවපාතයක් ඇති වෙලා තිබෙනවා. ඊයේ අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය යෝජනාවලියේ 47 වැනි ඡේදයෙනුත් සම්පූර්ණයෙන් කියන්නේ වැඩිවැඩියෙන් විදේශ විනිමය සොයා ගැනීම සඳහා අපි ගත යුතු ක්‍රියා මාර්ග ගැනයි. මේ ගරු සභාවේ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන් විපක්ෂය බොහෝ විට අහනවා අපේ විදේශ සංචිතය කීයද, අපේ රුපියලේ අගය කීයද කියා. විදේශ විනිමයත් එක්ක ඉතා සෘජුව බැඳුණු ප්‍රශ්න තමයි අහන්නේ. හැබැයි මම පුදුම වෙනවා, විදේශ විනිමය වංචාකරුවෙක් ගැන කථා කරන්න සූදානම් වෙන මොහොතේ මේ සභාව මෙතරම් කලබලයට පත් වීමට හේතුව මොකක්ද කියා.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ගරු කථානායකතුමනි, 1953 විනිමය පාලන පනත විශේෂයෙන් ගෙනාවේ අපේ රටේ විදේශ විනිමය ආරක්ෂා කර ගන්නයි. මෙහි අරමුණ වුණේ මම කිව්ව ආකාරයටම අපේ විදේශ සංචිතය ආරක්ෂා කර ගැනීමයි; අපේ දේශීය රුපියල ආරක්ෂා කර ගැනීමයි. මේක රජයකට විශාල වග කීමක් වුණා. මේ පනත තවත් ශක්තිමත් කර ගන්න 1977 දී සංශෝධන ඇතුළත් කළා. විශේෂයෙන්ම විදේශ සම්පත් ආරක්ෂා කර ගැනීමේ වගකීමත් රජයකට තිබෙනවා. විදේශ විනිමය වංචාවක් කියන්නේ ගරු කථානායකතුමනි සාමාන්‍ය වරදක් නොවෙයි; සාමාන්‍ය පික්පොකට්කාරයෙක් කරන වරදක් නොවෙයි; සාමාන්‍ය ගමේ ඉන්න පොල් හොරෙක් කරන වරදක් නොවෙයි. ජාතියට කරන වරදක් තමයි විදේශ විනිමය වරදක් කියන්නේ. ඒක ජාතියට ද්‍රෝහී වීමක්. ජාතියේ අයිතිවාසිකම උදුරා ගැනීමක් හැටියටයි, විදේශ විනිමය වංචාවක් අපි දකින්නේ. ඒක අපි විශේෂයෙන්ම මේ ගරු සභාවට ප්‍රකාශ කළ යුතුයි, ගරු කථානායකතුමනි. කවුරුන් කළත් ඒක බරපතළ වරදක්. ඒකයි මම පුදුම වුණේ. මේ ගරු සභාවේ හැම දාම අහන ප්‍රශ්නය, මගෙන් හැම දාම පුන පුනා අහන ප්‍රශ්නය, විදේශ සංචිත කොපමණ තිබේද කියන එක. ඇයි විදේශ සංචිතය අඩු වෙන්නේ කියලා අහනවා. ඇයි අපේ රුපියලේ අගය අඩු වෙන්නේ කියලා අහනවා. හැබැයි, ඒකට හේතු වෙන විදේශ විනිමය වංචාවක් ගැන අපේ මන්ත්‍රීතුමෙක් මගෙන් අහන කොට ඒකට උත්තර දෙන්න මගේ තිබෙන අයිතියත් උදුරා ගන්න හදනවා. [බාධා කිරීමක්] කරුණාකර, වාඩි වෙන්න. [බාධා කිරීමක්] කරුණාකර, වාඩි වෙන්න. [බාධා කිරීම්] මේ වරදට ගරු කථානායකතුමනි, රුපියල් 2,000කට නොඅඩු දඩයක් හෝ කළ වරදේ වටිනාකම -මුදල් වෙන්න පුළුවන්. රත්රන් වෙන්න පුළුවන්. රිදී වෙන්න පුළුවන්- වාගේ තුන් ගුණයක දඩයක් පනවන්න හෝ එසේ නැත්නම් අධිකරණයට යන්න ශ්‍රී ලංකා මහ බැංකුවට අයිතිය තිබෙනවා. අධිකරණය තුළින් ඊට එහා ගිය ක්‍රියා මාර්ග ගන්න පුළුවන්. [බාධා කිරීමක්] විනිමය පාලන පනතේ 50 (1) වගන්තිය අනුව කටයුතු කෙරෙනවා. මේ සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යම් පරීක්ෂණයක් කෙරෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ වෙන කොටත් විවිධ පුද්ගලයින් පිළිබඳ පරීක්ෂණ කර ගෙන යනවා. ඒවා හෙළි කිරීමේ අයිතියක් අපිට නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමාට මම ඒක වග කීමෙන් යුතුව කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මම ඒක වග කීමෙන් කියනවා. ඒවා හෙළි කිරීමේ අයිතියක් අපිට නැහැ. හැබැයි, මේ පරීක්ෂණවලට භාජන වන පුද්ගලයින් කුමන තරාතිරමක වුණත්, කුමන ශක්තියක් ඔවුන් දැරුවත්, කුමන සමාජ පන්තියක ඔවුන් හිටියත්, ඒ කාරණා ඔප්පු වූ වහාම ගත හැකි ඉතාම ඉහළ ක්‍රියා මාර්ග -මම කිව්වා වාගේ මේක ජාතියට ද්‍රෝහී වීමක්- ගන්න මුදල් අමාත්‍යාංශය හැටියට අපි සූදානම් කියන එක ඉතා වග කීමෙන් මම මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.25ට, 2008 ඔක්තෝබර් 24 වන දින සභාසම්මතිය අනුව 2008 නොවැම්බර් 08 වන සෙනසුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 5.25 மணிக்கு பாராளுமன்றம், அதனது 2008 ஒக்ரோபர் 24 ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2008, நவம்பர் 08, சனிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 5.25 p.m. until 9.30 a.m. on Saturday, 08th November, 2008 pursuant to the Resolution of the Parliament of 24th October, 2008.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | **:** | **From 9.30 a.m. to 5.25 p.m. on 07.11.2008** |
| **Final set of manuscripts Received from Parliament** | **:** | **6.45 p.m. on 15.11.2008** |
| **Printed copies dispatched** | **:** | **18.11.2008 Morning** |

**දායක මුදල්: පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු.2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 5, කිරුළපන, මායා මාවත. අංක 132 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30දා ට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.**

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 132, மாயா அவெனியு, கிருளப்பனை, கொழும்பு 5** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப் பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscription : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATION BUREAU, No. 132, Maya Avenue, Kirulapone, Colombo 5. The fee should reach him on or before November 30 each year . Late application for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.